208 වන කාණ්ඩය - 2 වන කලාපය
தொகுதி 208 - இல. 2
**Volume 208 - No. 2**

2012 මැයි 09 වන බදාදා
2012 மே 09, புதன்கிழமை
**Wednesday, 09th May, 2012**

# පාර්ලිමේන්තු විවාද
(හැන්සාඩ්)

# பாராளுமன்ற விவாதங்கள்
(ஹன்சாட்)

# PARLIAMENTARY DEBATES
(HANSARD)

## නිල වාර්තාව
அதிகார அறிக்கை
OFFICIAL REPORT

(අශෝධිත පිටපත /பிழை திருத்தப்படாதது /Uncorrected)

# අන්තර්ගත ප්‍රධාන කරුණු

**ප්‍රශ්නවලට වාචික පිළිතුරු**

**පෞද්ගලිකව දැනුම් දීමෙන් ඇසූ ප්‍රශ්නය:**

පුරාවස්තු සොරකම

**වරප්‍රසාද :**

2012 මැයි 09 'ඩේලි මිරර්' වාර්තාව

**ක්‍රමෝපාය සංවර්ධන ව්‍යාපෘති පනත :**

නියමය

**කල් තැබීමේ යෝජනාව:**

යුද්ධය නිසා හානියට පත් උතුරු නැගෙනහිර දෙමළ ජන ජීවිත යළි ගොඩ නැඟීම

---

# பிரதான உள்ளடக்கம்

**வினாக்களுக்கு வாய்மூல விடைகள்**

**தனி அறிவித்தல்மூல வினா:**

தொல்பொருள் திருட்டு

**சிறப்புரிமை:**

2012.05.09 ஆந் திகதிய 'டெய்லி மிரர்' அறிக்கை

**செயல்நுணுக்க அபிவிருத்தி கருத்திட்டங்கள் சட்டம்:**

கட்டளை

**ஒத்திவைப்புப் பிரேரணை:**

யுத்தத்தினால் பாதிப்புற்ற வடக்கு, கிழக்கு தமிழ் மக்களின் வாழ்வை மீளக் கட்டியெழுப்புதல்

---

# PRINCIPAL CONTENTS

ORAL ANSWERS TO QUESTIONS

QUESTION BY PRIVATE NOTICE:

Theft of Artefacts

PRIVILEGE:

"Daily Mirror" Report of 9th May 2012

STRATEGIC DEVELOPMENT PROJECTS ACT:

Order

ADJOURNMENT MOTION:

Rebuilding of lives of war-affected Tamils in North and East

# පාර්ලිමේන්තුව
# பாராளுமன்றம்
# PARLIAMENT

***2012 මැයි 09 වන බදාදා***
*2012 மே 09, புதன்கிழமை*
*Wednesday, 09th May, 2012*

***අ. භා. 1.00ට පාර්ලිමේන්තුව රැස් විය. නියෝජ්‍ය කථානායකතුමා [ගරු චන්දිම වීරක්කොඩි මහතා] මූලාසනාරූඪ විය.***
*பாராளுமன்றம் பி.ப. 1.00 மணிக்குக் கூடியது. பிரதிச் சபாநாயகர் அவர்கள் [மாண்புமிகு சந்திம வீரக்கொடி] தலைமை வகித்தார்கள்.*
*The Parliament met at 1.00 p.m.,* MR. DEPUTY SPEAKER [THE HON. CHANDIMA WEERAKKODY] *in the Chair.*

## ලිපි ලේඛනාදිය පිළිගැන්වීම
## சமர்ப்பிக்கப்பட்ட பத்திரங்கள்
## PAPERS PRESENTED

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා (ජලසම්පාදන හා ජලාපවහන අමාත්‍යතුමා සහ ආණ්ඩු පාර්ශ්වයේ ප්‍රධාන සංවිධායකතුමා)**
(மாண்புமிகு தினேஷ் குணவர்தன - நீர்வழங்கல், வடிகால மைப்பு அமைச்சரும் அரசாங்கத் தரப்பின் முதற்கோலாசானும்)
(The Hon. Dinesh Gunawardena - Minister of Water Supply and Drainage and Chief Government Whip)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමා වෙනුවෙන්, 2011 වර්ෂය සඳහා ශ්‍රී ලංකා මහ බැංකුවේ වාර්ෂික වාර්තාව; සහ 2009 වර්ෂය සඳහා ලංකාපුත්‍ර සංවර්ධන බැංකුවේ වාර්ෂික වාර්තාව මම ඉදිරිපත් කරමි.

මෙම වාර්තා මුදල් හා ක්‍රම සම්පාදන කටයුතු පිළිබඳ උපදේශක කාරක සභාවට යොමු කළ යුතු යැයි මම යෝජනා කරමි.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

2010 වර්ෂය සඳහා ජාතික අධ්‍යාපන කොමිෂන් සභාවේ වාර්ෂික වාර්තාව.- [අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍ය ගරු දි. මු. ජයරත්න මහතා වෙනුවට ගරු දිනේෂ් ගුණවර්ධන මහතා]

***සභාමේසය මත තිබිය යුතුයයි නියෝග කරන ලදී.***
*சபாபீடத்தில் இருக்கக் கட்டளையிடப்பட்டது.*
*Ordered to lie upon the Table.*

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මා මේ අවස්ථාවේදී සඳහන් කරන්නට කැමතියි, 2011 වර්ෂය සඳහා ශ්‍රී ලංකා මහ බැංකුවේ වාර්ෂික වාර්තාව, අනුගමනය කළ යුතු සියලු පිළිවෙත් ප්‍රකාරව හා නීතිරීති හා සම්ප්‍රදාය ප්‍රකාරව ඉදිරිපත් වී තිබෙන බව. එසේ නොවන බවට විරුද්ධ පක්ෂය විසින් හදිසි කලබලකාරී තත්ත්වයක් ඊයේ ගරු සභාවේ ඇති කරන්නට උත්සාහ දැරුවා. ඒ ගැන මා කනගාටු වෙනවා. මේ වාර්තාව මුද්‍රණය කිරීම, ඉදිරිපත් කිරීම, පාර්ලිමේන්තුවට ගෙන ඒම, සභා ගර්භයට ගෙන ඒම කියන අවස්ථා රාශියක් තිබෙන බව එතුමන්ලා දැන දැනත් එසේ කලබලකාරී තත්ත්වයක් ඇති කිරීම ගැන මා කනගාටු වෙනවා.

2006 වර්ෂය සඳහා ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලයේ පරිපාලන වාර්තාව.- [ අධ්‍යාපන අමාත්‍ය ගරු බන්දුල ගුණවර්ධන මහතා වෙනුවට ගරු දිනේෂ් ගුණවර්ධන මහතා]

***සභාමේසය මත තිබිය යුතුයයි නියෝග කරන ලදී.***
*சபாபீடத்தில் இருக்கக் கட்டளையிடப்பட்டது.*
*Ordered to lie upon the Table.*

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, වැවිලි කර්මාන්ත අමාත්‍යතුමා වෙනුවෙන්, 2009 වර්ෂය සඳහා තුරුසවිය අරමුදලේ වාර්ෂික වාර්තාව මම ඉදිරිපත් කරමි.

මෙම වාර්තාව වැවිලි කර්මාන්ත කටයුතු පිළිබඳ උපදේශක කාරක සභාවට යොමු කළ යුතු යැයි මම යෝජනා කරමි.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

2010 වර්ෂය සඳහා වැවිලි කර්මාන්ත අමාත්‍යාංශයේ වාර්ෂික කාර්ය සාධන වාර්තාව. - [වැවිලි කාර්මාන්ත අමාත්‍ය ගරු මහින්ද සමරසිංහ මහතා වෙනුවට ගරු දිනේෂ් ගුණවර්ධන මහතා]

***සභාමේසය මත තිබිය යුතුයයි නියෝග කරන ලදී.***
*சபாபீடத்தில் இருக்கக் கட்டளையிடப்பட்டது.*
*Ordered to lie upon the Table.*

#

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ආර්ථික සංවර්ධන අමාත්‍යතුමා වෙනුවෙන්, 2008 සහ 2009 වර්ෂ සඳහා ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලයේ වාර්ෂික වාර්තා ; සහ

2008 සහ 2009 වර්ෂ සඳහා ශ්‍රී ලංකා සමෘද්ධි අධිකාරියේ වාර්ෂික වාර්තා මම ඉදිරිපත් කරමි.

මෙම වාර්තා ආර්ථික සංවර්ධන කටයුතු පිළිබඳ උපදේශක කාරක සභාවට යොමු කළ යුතු යැයි මම යෝජනා කරමි.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

## පෙත්සම්
## மனுக்கள்
## PETITIONS

**ගරු සී.බී. රත්නායක මහතා (පුද්ගලික ප්‍රවාහන සේවා අමාත්‍යතුමා)**
(மாண்புமிகு சீ. பி. ரத்நாயக்க - தனியார் போக்குவரத்துச் சேவைகள் அமைச்சர்)
(The Hon. C.B. Rathnayake - Minister of Private Transport Services)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මම කටුගස්තොට, කලුගල පාර, අංක 128/7 යන ලිපිනයෙහි පදිංචි එච්. කේ. ඩී. ඩබ්ලිව්. එම්.ජේ.බී. හපුහින්න මහතාගෙන් ලැබුණු පෙත්සමක් පිළිගන්වමි.

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)

ගරු (මහාචාර්ය) තිස්ස විතාරණ මහතා - පැමිණ නැත.

**ගරු සුසන්ත පුංචිනිලමේ මහතා (ධීවර හා ජලජ සම්පත් සංවර්ධන නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு சுசந்த புஞ்சிநிலமே - கடற்றொழில், நீரக வளமூலங்கள் அபிவிருத்தி பிரதி அமைச்சர்)
(The Hon. Susantha Punchinilame - Deputy Minister of Fisheries and Aquatic Resources Development)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මම පහත සඳහන් පෙත්සම් දෙක පිළිගන්වමි.

(1) රත්නපුර, රෝහල පාර, අංක 65 යන ලිපිනයෙහි පදිංචි ජී.ඒ. එරන්දතී කුමාරිහාමි මහත්මියගෙන් ලැබුණු පෙත්සම; සහ

(2) බදුල්ල, හිඟුරුගමුව, බෝගහවත්ත, අංක 92/2 යන ලිපිනයෙහි පදිංචි ටී.ජී. රන්ජිත් පීරිස් මහතාගෙන් ලැබුණු පෙත්සම.

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)

ගරු රෝහිත අබේගුණවර්ධන මහතා - පැමිණ නැත.

ගරු සී.පී.ඩී. බණ්ඩාරනායක මහතා - පැමිණ නැත.

ගරු ලසන්ත අලගියවන්න මහතා - පැමිණ නැත.

**ගරු රෝහණ දිසානායක මහතා (ප්‍රවාහන නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு ரோஹண திசாநாயக்க - போக்குவரத்து பிரதி அமைச்சர்)
(The Hon. Rohana Dissanayake - Deputy Minister of Transport)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මම මාතලේ, පුල්ලයාර් කෝවිල් පාර, අංක 14 යන ලිපිනයෙහි පදිංචි ජේ.සී. දංගම්පොල මහතාගෙන් ලැබුණු පෙත්සමක් පිළිගන්වමි.

**ගරු ලලිත් දිසානායක මහතා (සෞඛ්‍ය නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு லலித் திசாநாயக்க - சுகாதார பிரதி அமைச்சர்)
(The Hon. Lalith Dissanayake - Deputy Minister of Health)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මම දෙවනගල, ගොඩැල්ල, අල්පිටිය යන ලිපිනයෙහි පදිංචි එස්.පී. කීර්තිසේන මහතාගෙන් ලැබුණු පෙත්සමක් පිළිගන්වමි.

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)

ගරු තිස්ස අත්තනායක මහතා - පැමිණ නැත.

**ගරු අජිත් කුමාර මහතා**
(மாண்புமிகு அஜித் குமார)
(The Hon. Ajith Kumara)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මම පහත සඳහන් පෙත්සම් දෙක පිළිගන්වමි.

(1) රජගම, රණපනාදෙනිය, අංක 338 ඒ. යන ලිපිනයෙහි පදිංචි කේ. ඇක්මන් ද සිල්වා මහතාගෙන් ලැබුණු පෙත්සම; සහ

(2) මාඉටිපේ, ගාල්ල, දෙවන පටුමග, උඩුමුල්ලවත්ත, අංක 245/19 යන ලිපිනයෙහි පදිංචි මනෝජ් නුවන් කුමාර මාඉටිපේ මහතාගෙන් ලැබුණු පෙත්සම.

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)

ගරු (පූජ්‍ය) අතුරලියේ රතන හිමි - පැමිණ නැත.

**ගරු මොහාන් ප්‍රියදර්ශන ද සිල්වා මහතා**
(மாண்புமிகு மொஹான் பிரியதர்ஷன த சில்வா)
(The Hon. Mohan Priyadarshana De Silva)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මම ගාල්ල, දංගෙදර, මල්වත්ත පන්සල පාර, 6/13 යන ලිපිනයෙහි පදිංචි එම්.එච්.කේ. කුමාර උදයරත්න මහතාගෙන් ලැබුණු පෙත්සමක් පිළිගන්වමි.

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)

ගරු (වෛද්‍ය) රමේෂ් පතිරණ මහතා - පැමිණ නැත.

***ඉදිරිපත් කරන ලද පෙත්සම් මහජන පෙත්සම් පිළිබඳ කාරක සභාවට පැවරිය යුතු යයි නියෝග කරන ලදී.***

*சமர்ப்பிக்கப்பட்ட மனுக்களைப் பொதுமனுக் குழுவுக்குச் சாட்டக் கட்டளையிடப்பட்டது.*

*Petitions ordered to be referred to the Committee on Public Petitions.*

## ප්‍රශ්නවලට වාචික පිළිතුරු
## வினாக்களுக்கு வாய்மூல விடைகள்
## ORAL ANSWERS TO QUESTIONS

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)

ප්‍රශ්න අංක 2-1273/'11-(2), ගරු බුද්ධික පතිරණ මහතා.

**ගරු බුද්ධික පතිරණ මහතා**
(மாண்புமிகு புத்திக பதிரண)
(The Hon. Buddhika Pathirana)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, එම ප්‍රශ්නය මා අහනවා.

**ගරු අර්ල් ගුණසේකර මහතා (වැවිලි කර්මාන්ත නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு ஏர்ல் குணசேக்கர - பெருந்தோட்டக் கைத்தொழில் பிரதி அமைச்சர்)
(The Hon. Earl Gunasekara - Deputy Minister of Plantation Industries)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, වැවිලි කර්මාන්ත අමාත්‍යතුමා වෙනුවෙන් මම මේ කාරණය ප්‍රකාශ කරනවා. මෙය අපේ අමාත්‍යාංශයට අදාළ ප්‍රශ්නයක් නොවෙයි. මම හිතන හැටියට මෙය කුරුඳු කම්හලක් වෙන්න ඇති. අපට ආරංචි විධියට මෙය කුරුඳු කම්හලකට හඳුපු එකක්. ඒ නිසා මා හිතන හැටියට මෙය සුළු අපනයන භෝග ප්‍රවර්ධන අමාත්‍යාංශයෙන් ඇසිය යුතු ප්‍රශ්නයක්.

**ගරු බුද්ධික පතිරණ මහතා**
(மாண்புமிகு புத்திக பதிரண)
(The Hon. Buddhika Pathirana)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මම මේ ප්‍රශ්නය යොමු කළේ මෙය දක්ෂිණ සංවර්ධන අධිකාරියෙන් ඉදි කළ ව්‍යාපෘතියක් නිසායි. පැහැදිලිවම මේ තේ කර්මාන්තශාලාව සම්බන්ධයෙන් ඔබතුමාට එහා පැත්තේ සිටින ගරු ලක්ෂ්මන් යාපා අබේවර්ධන අමාත්‍යවරයා දන්නවා ඇති.

**ගරු අර්ල් ගුණසේකර මහතා**
(மாண்புமிகு ஏர்ல் குணசேக்கர)
(The Hon. Earl Gunasekara)

එතුමාගෙන් අහන්න.

**ගරු බුද්ධික පතිරණ මහතා**
(மாண்புமிகு புத்திக பதிரண)
(The Hon. Buddhika Pathirana)

ගරු නියෝජ්‍ය ඇමතිතුමා කියනවා නම් මේ ප්‍රශ්නය එතුමාගේ අමාත්‍යාංශයට අදාළ නැහැයි කියලා, ඒ සම්බන්ධයෙන් මා මේ පාර්ලිමේන්තුවේ අවධානය යොමු කරවනවා. මම ඉතා පැහැදිලිව කියනවා, මෙතැන එහෙම තත්ත්වයක් තිබෙනවා කියලා. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ ප්‍රශ්නය අදාළ තැනට යොමු කරලා මට පැහැදිලි පිළිතුරක් ලබා දෙන්නය කියලා මා ඉල්ලා සිටිනවා.

**ගරු අර්ල් ගුණසේකර මහතා**
(மாண்புமிகு ஏர்ல் குணசேக்கர)
(The Hon. Earl Gunasekara)

ඒක අදාළ අමාත්‍යාංශයෙන් අහන්න. අපේ අමාත්‍යාංශයට කිසිම සම්බන්ධයක් නැහැ.

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)

අදාළ අමාත්‍යාංශයට යොමු කරන්න.

***ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.***
*வினாவை மற்றொரு தினத்திற் சமர்ப்பிக்கக் கட்டளையிடப்பட்டது.*
*Question ordered to stand down.*

## දික්ඕවිට ධීවර වරාය ඉදි කිරීම : වන්දි
## திக்ஓவிட்ட மீன்பிடித் துறைமுக நிர்மாணம் : நட்டஈடு
## CONSTRUCTION OF DIKOVITA FISHERIES HARBOUR : COMPENSATION

1728/'11

4. **ගරු අනුර දිසානායක මහතා**
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)

ධීවර හා ජලජ සම්පත් සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය- (2):

(අ) (i) දික්ඕවිට ධීවර වරාය ඉදි කිරීම නිසා නිවාස අහිමි වූ සංඛ්‍යාව කොපමණද;

(ii) ඔවුන්ට වන්දි මුදල් ලබා දුන්නේද;

(iii) එසේ නම්, එක් එක් අය වෙනුවෙන් ලබා දුන් වන්දි මුදල් වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) එම ධීවර වරාය ඉදි කිරීමේදී නිවාස අහිමිවූවන් සඳහා නිවාස ඉදිකර දී තිබේද;

(ii) එසේ නම්, එම නිවාස ඉදි කරනු ලැබූ සමාගම කවරේද;

(iii) එම සමාගම තෝරා ගත් ක්‍රමවේදය කවරේද;

(iv) එක් එක් නිවාසයේ ඉඩ ප්‍රමාණය හා ඉදි කිරීම සඳහා වැය කළ මුදල කොපමණද;

(v) ඉදි කරන ලද නිවාස පුපුරායෑම් හා ගිලා බැසීම්වලට ලක්ව තිබේද;

(vi) එසේ නම්, එම තත්වයන් නිවැරදි කිරීම සඳහා යොදන පිළියම් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

கடற்றொழில், நீரக வள மூலங்கள் அபிவிருத்தி அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) திக்ஓவிட்ட மீன்பிடித் துறைமுகம் நிர்மாணிக்கப் பட்டமையால் வீடுகளை இழந்தோரின் எண்ணிக்கை யாது;

(ii) இவர்களுக்கு நட்டஈட்டுத் தொகை வழங்கப் பட்டதா;

(iii) அவ்வாறாயின் ஒவ்வொருவருக்கும் வழங்கப் பட்ட நட்டஈட்டுத் தொகை வெவ்வேறாக எவ்வளவு

என்பதை அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) (i) இம்மீன்பிடித் துறைமுகத்தை நிர்மாணிக்கின்ற போது வீடுகளை இழந்தோருக்கு வீடுகள் அமைத்துக் கொடுக்கப்பட்டுள்ளதா;

(ii) அவ்வாறாயின் இவ்வீடுகளை நிர்மாணித்த கம்பனி யாது;

(iii) இக்கம்பனி தேர்ந்தெடுக்கப்பட்ட முறைமை யாது;

(iv) ஒவ்வொரு வீட்டினதும் பரப்பளவு மற்றும் நிர்மாணிப்பதற்கு செலவாகிய பணத்தொகை யாது;

[ගරු අනුර දිසානායක මහතා]

(v) அமைக்கப்பட்ட வீடுகள் வெடிப்புக்களுக்கும் மூழ்குதல்களுக்கும் உள்ளாகியுள்ளதா;

(vi) அவ்வாறாயின் இந்நிலைமையை சீர்செய்ய மேற்கொள்ளப்படும் தீர்வுகள் யாவை

என்பதை அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(இ) இன்றேல், ஏன்?

asked the Minister of Fisheries and Aquatic Resources Development:

(a) Will he state-

(i) the number of persons who have lost their houses owing to the construction of the fisheries harbour at Dikovita;

(ii) whether they have been paid compensation; and

(iii) separately the amount paid to each of the aforesaid persons, if they have been paid compensation?

(b) Will he inform this House-

(i) whether houses have been constructed for those who have lost their houses owing to the construction of the aforesaid fisheries harbour;

(ii) if so, the company which constructed the aforesaid houses;

(iii) of the procedure followed in selecting the above-mentioned company;

(iv) the floor area and the cost of construction of each of those houses;

(v) whether the constructed houses have cracked and caved in; and

(vi) if so, the measures that will be taken to remedy that situation?

(c) If not, why?

**ගරු (වෛද්‍ය) රාජිත සේනාරත්න මහතා (ධීවර හා ජලජ සම්පත් සංවර්ධන අමාත්‍යතුමා)**
(மாண்புமிகு வைத்திய கலாநிதி ராஜித சேனாரத்ன - கடற்றொழில், நீரக வளமூலங்கள் அபிவிருத்தி அமைச்சர்)
(The Hon. (Dr.) Rajitha Senaratne - Minister of Fisheries and Aquatic Resources Development)

(අ) (i) 33යි. (අනවසර නිවාස 18 හා සින්නක්කර ඔප්පු සහිත නිවාස 15කි.)

(ii) ඔව්.

1. අනවසර නිවාස 18 වෙනුවෙන් එක් නිවසක වටිනාකම රුපියල් 1,287,078.55ක් වටිනා පොකුරු නිවාස 18ක් සාදා ලබා දී ඇත.

2. සින්නක්කර ඔප්පු සහිත නිවාස 06ක් සඳහා එක් නිවසකට පර්චස් 06ක ඉඩමක් සහ රුපියල් 1,991,736.77ක් වටිනා නිවස බැගින් නිවාස 06ක් සාදා ලබා දී ඇත.

3. වන්දි වශයෙන් සින්නක්කර ඔප්පු සහිත නිවාස ලබා ගැනීමට අකමැති වූ අය සඳහා වන්දි යෝජනා ක්‍රමය අනුව වන්දි මුදල් ලබා දී ඇත.

(iii) ඔව්. වන්දි මුදල් ලබා දුන් අය පහත පරිදි වේ.

| අනු අංකය | නම | මුදල (රු.) |
|---|---|---|
| 01 | යූ.ඩී. එලිසබෙත් | 918,750.00 |
| 02 | එම්.ජී. මාලනී අයිරාංගනී | 1,097,760.00 |
| 03 | ජේ.ඒ.ඩී. ශිරෝමි සංජීවනී | 696,199.15 |
| 04 | ජේ.ඒ.ඩී. රෝයි නෙල්සන් | 1,006,931.50 |
| 05 | ලිලී පෙරේරා | 113,712.50 |
| 06 | එම්.ඩී.ආර්.පී. ගුණවර්ධන | 3,505,216.95 |
| 07 | එච්.ඩබ්ලිව්.එල්. ෆුනැන්ඩර් | 772,500.00 |
| 08 | ජී.පී. විජේසූරිය | 2,065,986.75 |
| 09 | ඩබ්ලිව්.පී. ජෙසිකා චාන්දනී පෙරේරා (අජිත් නිශාන්තගේ බිරිඳ) | 1,279,253.70 |

(ආ) (i) ඔව්.

(ii) නිවාස ඉදි කිරීම සඳහා සැප්කෝ කන්ස්ට්‍රක්ෂන්ස් සමාගමට භාර දී තිබුණි.

(iii) ලංකා ධීවර වරාය නීතිගත සංස්ථාව විසින් පුවත් පත්වල පළ කර ටෙන්ඩර් කැඳවා සුදුසු ආයතනයක් තෝරා ගැනීම මඟින්.

(iv) පොකුරු නිවාස සඳහා එක් නිවසක් වර්ග අඩි 550ක් වන අතර, එක් නිවසක් ඉදි කිරීම සඳහා වැය කළ මුදල රුපියල් 1,287,078.55යි. ඒ අනුව නිවාස 18ක් සඳහා වැය කළ මුළු මුදල රුපියල් 23,167,413.90යි.

මධ්‍යම පාන්තික නිවාසයක වර්ග ප්‍රමාණය වර්ග අඩි 850ක් වන අතර, එක් නිවසක වටිනාකම රුපියල් 1,991,736.77යි. ඒ අනුව මධ්‍යම පාන්තික නිවාස 6ක් සඳහා වැය කළ මුළු මුදල රුපියල් 11,950,420.62යි.

(v) ඔව්.

(vi) පුපුරා යාම හා ගිලා බැසීමට ලක්ව තිබූ නිවාස විධිමත්ව සකස් කර එම තත්ත්වය නිවැරදි කර ඇත.

(ඇ) අදාළ නොවේ.

**ගරු අනුර දිසානායක මහතා**
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි. මම හිතන විධියට විටින් විට අමාත්‍යවරු මාරු කිරීමේ වාසියකුත් තිබෙනවා. [බාධා කිරීමක්] නැහැ, නැහැ. මම කියන්නේ ඒක හොඳ වාසියක්. මාරු කරන කොට පරණ ඒවා ටිකක් පිරිසිදුව එනවා. අලුත් ඒවා ගන්න ගියාම තමයි ටිකක අමාරු. කොහොම වුණත් එතුමා පිරිසිදුව ඒ පිළිතුර ලබා දීම පිළිබඳව ස්තුතිවන්ත වෙනවා.

ගරු ඇමතිතුමනි, සකස් කරන ලද නිවාස අලුත්වැඩියාවට භාජනය කරලා තිබෙන්නේ එම පාද මතම පිහිටායි. ඒක වෙනස් කිරීමකට ලක් කරලා නැහැ. ඒ නිසා ඒ අලුත්වැඩියා කිරීමෙන් පසු ස්ථිර ලෙසම එය ස්ථිර නිවාසයක් බවට පත් වෙයිද කියන සැකයක් එම ප්‍රදේශවාසීන් මතු කරමින් තිබෙනවා. මොරටුව විශ්වවිද්‍යාලයෙනුත් පරීක්ෂණයක් කළා.

**ගරු (වෛද්‍ය) රාජිත සේනාරත්න මහතා**
(மாண்புமிகு வைத்திய கலாநிதி ராஜித சேனாரத்ன)
(The Hon. (Dr.) Rajitha Senaratne)
ගරු මන්ත්‍රීතුමනි, මොරටුව විශ්වවිද්‍යාලයෙන්ම තමයි ඒක කළේ. නමුත් ඒ ස්ථානය ගොඩ කරලා නිවාස හදන්න කියලා ඉක්මන් කරලා තිබෙනවා. එතකොට අර පස් තද වෙලා තිබුණේ නැහැ. ඒක තමයි ප්‍රශ්නය වෙලා තිබුණේ. අපි කළේ මොකක්ද? අපි දෙවන වරට හදන කොට, මොරටුව විශ්වවිද්‍යාලයෙන් කිව්වා, "දැන් ඒක හරි." කියලා. එහෙම කියලා, ඒ ගොල්ලන්ම තමයි දුන්නේ, "මේක මෙතැනින් කරන්න, මේ තැන්වලින් concrete columns දාලා, strengthen කරලා මේ නිවාස හදන්න" කියලා. අපි ඇහුවා, "මේ නිවාසම හදනවාද, නැත්නම් කඩලා අලුතෙන් හදනවාද?" කියලා. නමුත් ඒ ගොල්ලෝ කිව්වා, "එහෙම දෙයක් අවශ්‍ය නැහැ" කියා.

**ගරු අනුර දිසානායක මහතා**
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
ඒ වෙනුවෙන් අතිරේක වියදමක් අමාත්‍යාංශයෙන් දැරුවාද?

**ගරු (වෛද්‍ය) රාජිත සේනාරත්න මහතා**
(மாண்புமிகு வைத்திய கலாநிதி ராஜித சேனாரத்ன)
(The Hon. (Dr.) Rajitha Senaratne)
නැහැ. මෙය project එකෙන් නේ.

**ගරු අනුර දිසානායක මහතා**
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
ඔව්, එතකොට තිබෙන ප්‍රශ්නය මෙයයි. ටෙන්ඩර් කැඳවීමේදී තමුන්නාන්සේලා හොඳම ලාභ සමාගම තෝරා ගත්තා කියලා හිතමු.

**ගරු (වෛද්‍ය) රාජිත සේනාරත්න මහතා**
(மாண்புமிகு வைத்திய கலாநிதி ராஜித சேனாரத்ன)
(The Hon. (Dr.) Rajitha Senaratne)
ඔව්.

**ගරු අනුර දිසානායක මහතා**
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
හැබැයි ඒ ලාභ සමාගමෙන් අවශ්‍ය වන ප්‍රමිතීන්වලින් යුතු නිවාස ලබා දුන්නේ නැහැ. අවශ්‍ය වන ප්‍රමිතීන්ට අනුව ලබා නොදීම නිසා තමයි ගිලා බැසීමක් සිද්ධ වුණේ.

**ගරු (වෛද්‍ය) රාජිත සේනාරත්න මහතා**
(மாண்புமிகு வைத்திய கலாநிதி ராஜித சேனாரத்ன)
(The Hon. (Dr.) Rajitha Senaratne)
නැහැ.

**ගරු අනුර දිසානායක මහතා**
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
ඒ අනුව නැවත මුදල් වියදම් කරන්න වෙලා තිබෙන්නේ ව්‍යාපෘතියට. ඒක කිසිසේත්ම සාධාරණ නැහැ.

**ගරු (වෛද්‍ය) රාජිත සේනාරත්න මහතා**
(மாண்புமிகு வைத்திய கலாநிதி ராஜித சேனாரத்ன)
(The Hon. (Dr.) Rajitha Senaratne)
නැහැ, ඒක නොවෙයි.

**ගරු අනුර දිසානායක මහතා**
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
ඉදි කරන ලද ඒ සමාගමෙන් අය කර ගැනීමක් කරනු ලැබුවාද?

**ගරු (වෛද්‍ය) රාජිත සේනාරත්න මහතා**
(மாண்புமிகு வைத்திய கலாநிதி ராஜித சேனாரத்ன)
(The Hon. (Dr.) Rajitha Senaratne)
නැහැ. මොරටුව විශ්වවිද්‍යාලයෙන් වාර්තාවක් ඉදිරිපත් කරලා කිව්වා, මේක පුපුරා යෑමට ප්‍රධාන හේතුව ඉක්මන් කරලා මේ නිවාස හැදීම, ඒ ගොල්ලෝ කියපු තරමට අවශ්‍ය කාල පරිච්ඡේදය තියා ගන්න බැරි වීම කියලා. සමහර නිවාසවල - ඒ කියන්නේ තට්ටු දෙකේ නිවාසවල- අඩුපාඩු ඉදිරිපත් කරලා තිබුණා. ඒවා ඒ සමාගමටම හදන්න කියලා කිව්වා.

**ගරු අනුර දිසානායක මහතා**
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
ඊළඟට තිබෙන ප්‍රශ්නය මෙයයි ඇමතිතුමා. ඇමතිතුමා හෝ අමාත්‍යාංශයේ ලේකම්වරයා හෝ ගිහිල්ලා පස පරීක්ෂා කරලා බලලා නොවෙයි නේ ගේ හදන්න කියලා කියන්නේ. ඒකටත් තමුන්නාන්සේගේ අමාත්‍යාංශයේ ඊට අදාළ තාක්ෂණ නිලධාරීන් ඉන්නවා. ඒ තාක්ෂණ නිලධාරීන් තමයි සහතික කළ යුතු වන්නේ, මේ පොළව දැන් ස්ථාවර නිවාසයක් සකස් කිරීම සඳහා සුදුසු මට්ටමේ තිබෙනවායි කියලා. එහෙම නම් ඒ කාර්ය භාරය සිද්ධ වෙලා නැහැ.

**ගරු (වෛද්‍ය) රාජිත සේනාරත්න මහතා**
(மாண்புமிகு வைத்திய கலாநிதி ராஜித சேனாரத்ன)
(The Hon. (Dr.) Rajitha Senaratne)
ඔව්.

**ගරු අනුර දිසානායක මහතා**
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
ඒ නිසා ව්‍යාපෘතියෙන් අතිරේක මුදලක් මේ වෙනුවෙන් වැය කරන්නට සිද්ධ වෙලා තිබෙනවා?

**ගරු (වෛද්‍ය) රාජිත සේනාරත්න මහතා**
(மாண்புமிகு வைத்திய கலாநிதி ராஜித சேனாரத்ன)
(The Hon. (Dr.) Rajitha Senaratne)
ඔව්.

**ගරු අනුර දිසානායක මහතා**
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
ඒ වැය කිරීම නිසා සිදු වූ පාඩුවට වග කිය යුතු නිලධාරියෙක් තවම සොයා ගෙන නැද්ද?

නිලධාරියකු හෝ දේශපාලකයා හෝ හිටපු ඇමතිතුමා හෝ සොයා ගන්න ඕනෑ නේ.

**ගරු (වෛද්‍ය) රාජිත සේනාරත්න මහතා**
(மாண்புமிகு வைத்திய கலாநிதி ராஜித சேனாரத்ன)
(The Hon. (Dr.) Rajitha Senaratne)
නැහැ. ඒ ව්‍යාපෘතිය භාරව ඉන්නේ ඩෙන්මාර්ක් රජයයි. ඒ ගොල්ලෝ ඒ පාඩුව විඳ ගත්තා. ඒකෙන් අපට අලාභයක් වුණේ නැහැ.

**ගරු අනුර දිසානායක මහතා**
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
හැබැයි අපට ණයක් හැටියට ඒක තිබෙනවා.

**ගරු (වෛද්‍ය) රාජිත සේනාරත්න මහතා**
(மாண்புமிகு வைத்திய கலாநிதி ராஜித சேனாரத்ன)
(The Hon. (Dr.) Rajitha Senaratne)
මොකක්ද?

**ගරු අනුර දිසානායක මහතා**
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
ඒ ව්‍යාපෘතියේ ඉතිරි කොටස ණය හැටියට තිබෙනවා.

**ගරු (වෛද්‍ය) රාජිත සේනාරත්න මහතා**
(மாண்புமிகு வைத்திய கலாநிதி ராஜித சேனாரத்ன)
(The Hon. (Dr.) Rajitha Senaratne)
නමුත් ඒ කොටසමයි තිබෙන්නේ. ශත 05ක්වත් වැඩි කරලා නැහැ.

**ගරු ජෝන් අමරතුංග මහතා**
(மாண்புமிகு ஜோன் அமரதுங்க)
(The Hon. John Amaratunga)
මේ වරාය හදලා කොපමණ කල් වනවාද?

**ගරු (වෛද්‍ය) රාජිත සේනාරත්න මහතා**
(மாண்புமிகு வைத்திய கலாநிதி ராஜித சேனாரத்ன)
(The Hon. (Dr.) Rajitha Senaratne)
වරායක් නිකම් හැදුවාට වැඩක් නැහැ. වරායට පහසුකම් දෙන්න ඕනෑ. මුල් අවස්ථාවේදී මා ගිහින් බලන කොට වරායට cool rooms නැහැ; ice plants නැහැ; fuel facility නැහැ; basin එක මීටර් තුනහමාරයි තිබුණේ; pier එක මදියි; breakwater නැහැ. අපි තීන්දුවක් ගෙන තිබුණා, මීට පස්සේ මීටර් 5කට වඩා අඩු කිසිම වරායක් හදන්නේ නැහැයි කියලා. ඒ සියලුම කරුණු ගැන අපි සාකච්ඡා කළා. ඒ මුදලටම ඒ කටයුතු කරන්න ඒ ගොල්ලෝ එකඟ වුණා. ඒක බොහොම අමාරුවෙනුයි කර ගත්තේ. මුලදී එකඟ වුණා. ඊට පස්සේ බැහැයි කිව්වා. මා contract එක cancel කළා. ඊට පස්සේ ඒ ගොල්ලෝ ඇවිල්ලා ඒ මුදලටම ඒ වැඩ කටයුතු කළා. ඒකට කාලය ගත කළා.

දෙවන කාරණය මේකයි. ඔබතුමා දන්නවා, එහා පැත්තේ තිබෙන anchorage එක. ඒකත් CECB එකෙන් සම්පූර්ණයෙන් වැරැදි විධියටයි හදලා තිබුණේ. දැන් තිබෙන්නේ arch එක හදන එකයි. ඒ ගොල්ලෝ ඒ arch එක හදන්න පටන් ගත්තා. නමුත් එකේ design එක වැරැදියි. එම නිසා අපි ඒක ප්‍රතික්ෂේප කළා. දැන් ඒ ගොල්ලෝ කියනවා, මුදල් අමාත්‍යාංශයත් එක්ක සාකච්ඡා කරලා ඒක ආණ්ඩුවෙන් කර ගන්න කියලා.

ඒක ඒ ගොල්ලන් හදන්න ඕනෑය කියන ප්‍රතිපත්තියේ අපි තදින්ම ඉන්නවා. සීනෝර් සමාගමේ සභාපතිතුමාට මම අද කිව්වා, "දැනටමත් මේකට ඒ ගොල්ලන් ප්‍රමාද වැඩියි. ඒ ගොල්ලන්ගේ වැරැද්ද. ඒ නිසා වහාම මේක නවත්වන්න. ඩෙන්මාර්ක්වල MT Hojgaard සමාගමට භාර දීලා තිබුණු ඔලුවිල් වරායේ වැඩ කටයුතු ප්‍රමාද නිසා අනෙක් සියලු ඒවා cancel කළා. මීට පස්සේ කිසිම එකකට ඒ ගොල්ලන්ව consider කරන්න බැහැ." කියලා මගේ අත්සනින් යවන්න වහාම ලිපියක් ලැස්ති කරලා දෙන්නය කියලා.

**ගරු ජෝන් අමරතුංග මහතා**
(மாண்புமிகு ஜோன் அமரதுங்க)
(The Hon. John Amaratunga)#
ගරු ඇමතිතුමනි, ඒ වරාය අසාර්ථකයි. ඒක ක්‍රියාත්මක කරන්න බැහැ.

**ගරු (වෛද්‍ය) රාජිත සේනාරත්න මහතා**
(மாண்புமிகு வைத்திய கலாநிதி ராஜித சேனாரத்ன)
(The Hon. (Dr.) Rajitha Senaratne)
වරාය අසාර්ථක නැහැ.

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
ගරු මන්ත්‍රීතුමා, ඒ පිළිබඳව වෙනම විවාදයක් ගන්න.

## ගාල්ල මහමෝදර රෝහලේ වර්තමාන තත්ත්වය : විස්තර

காலி மஹமோதர வைத்தியசாலையின் தற்போதைய நிலைமை: விபரம்

PRESENT CONDITION OF GALLE MAHAMODARA HOSPITAL : DETAILS

1775/’11

5. **ගරු අජිත් කුමාර මහතා**
(மாண்புமிகு அஜித் குமார)
(The Hon. Ajith Kumara)
සෞඛ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (2) :

(අ) ගාල්ල මහමෝදර රෝහලේ,

(i) ක්‍රියාත්මක වාට්ටු හා අනෙකුත් අංශ කවරේද;

(ii) සුනාමි ව්‍යසනයේදී සිදු වූ හානි කවරේද;

(iii) රෝගීන්ට ප්‍රතිකාර කිරීමට සුදුසු තත්ත්වයක් තිබේද;

(iv) වර්තමාන ස්ථානයේ වෙනසක් කිරීමට තීරණය කර තිබේ නම්, ඊට අදාළව ගෙන ඇති විකල්ප ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) කරාපිටිය රෝහල ආසන්නයේ මාතෘ හා ළමා රෝහලක් ඉදි කිරීම අරඹා තිබේ නම්, එය ආරම්භ කළ දිනය, ඊට ඇස්තමේන්තුගත මුදල හා වත්මන් ප්‍රගතිය;

(ii) රෝහල් සැලැස්ම අනුව එහි අඩංගු අංශ පිළිබඳ විස්තර;

කවරේද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) එම රෝහල ඉදි කිරීමට,

(i) මුදල් ලබා දුන් හෝ ලබා දීමට අපේක්ෂිත පුද්ගලයන් හෝ ආයතන;

(ii) දැනට ලබා දී ඇති මුදල;

(iii) මුදල් වැය කර ඇති ආකාරය;

(iv) වැය නොකර ඉතිරි වූ මුදල සහ එම මුදල් යෙදවූ කාර්යය;

(v) දැනට රජයේ ප්‍රතිපාදන වෙන්කර තිබේ නම්, එම මුදල;

කවරේද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) (i) එම රෝහල ඉදි කිරීමේදී මූල්‍ය වංචාවක් හෝ දූෂණයක් සිදු වී තිබේද;

(ii) එසේ නම්, ඊට අදාළව පරීක්ෂණයක් පවත්වා නිසි ක්‍රියාමාර්ග ගන්නේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඉ) නොඑසේ නම්, ඒ මන්ද?

சுகாதார அமைச்சரைக் கேட்ட வினா:

(அ) காலி மஹமோதர வைத்தியசாலையில்,

(i) தொழிற்படு நிலையிலுள்ள வாட்டுகள் மற்றும் ஏனைய பிரிவுகள் யாவையென்பதையும்;

(ii) சுனாமி பேரழிவினால் ஏற்பட்ட சேதங்கள் யாவையென்பதையும்;

(iii) நோயாளிகளுக்கு சிகிச்சை செய்வதற்குப் பொருத்தமான நிலைமை உள்ளதா என்பதையும்;

(iv) தற்போதைய இடத்தை மாற்றுவதற்கு தீர்மானித் திருப்பின் இதற்கமைவாக மேற்கொள்ளப் பட்டுள்ள மாற்று நடவடிக்கைகள் யாவையென் பதையும்

அவர் குறிப்பிடுவாரா?

(ஆ) (i) கராபிட்டிய வைத்தியசாலைக்கு அண்மையில் மகப்பேற்று மற்றும் சிறுவர்களுக்கான வைத்திய சாலையொன்றை நிர்மாணித்தல் ஆரம்பிக்கப் பட்டிருப்பின் அது எப்போது ஆரம்பிக்கப்பட்டது என்பதையும், அதற்கான மதிப்பீட்டுத்தொகை எவ்வளவென்பதையும், தற்போதைய முன்னேற்றம் யாதென்பதையும்;

(ii) வைத்தியசாலை திட்டமிடலின் பிரகாரம் அதில் அடங்கியுள்ள பிரிவுகள் பற்றிய விபரம் யாதென்பதையும்

அவர் குறிப்பிடுவாரா?

(இ) மேற்படி வைத்தியசாலையை நிர்மாணிப்பதற்கு,

(i) பணம் வழங்கிய அல்லது வழங்குவதற்கு எதிர்பார்க்கின்ற நபர்கள் அல்லது நிறுவனங்கள் யாதென்பதையும்;

(ii) தற்போது வழங்கப்பட்டுள்ள பணத்தொகை யாதென்பதையும்;

(iii) பணம் செலவழிக்கப்பட்டுள்ள விதம் யாதென் பதையும்;

(iv) செலவழிக்கப்படாது எஞ்சியுள்ள பணத்தொகை மற்றும், அப்பணத்தொகை செலவழிக்கப்பட்ட கருமங்கள் யாதென்பதையும்;

(v) தற்போது அரச நிதி ஏற்பாடுகள் ஒதுக்கப் பட்டிருப்பின் அப்பணத்தொகை யாதென்பதை யும்

அவர் குறிப்பிடுவாரா?

(ஈ) (i) மேற்படி வைத்தியசாலையை நிர்மாணிக்கின்ற போது நிதி மோசடிகள் அல்லது ஊழல்கள் இடம்பெற்றுள்ளதா என்பதையும்;

(ii) ஆமெனில், இது தொடர்பாக விசாரணை நடாத்தி உரிய நடவடிக்கைகளை எடுப்பாரா என்பதையும்

அவர் குறிப்பிடுவாரா?

(உ) இன்றேல், ஏன்?

asked the Minister of Health:

(a) Will he state, in relation to the Galle Mahamodara Hospital;

(i) wards and other units functioning at present;

(ii) the damages caused by the Tsunami;

(iii) whether the condition prevailing is conducive enough to treat patients; and

(iv) if a decision has been taken to shift it to some other place, the alternative arrangements that have been made in relation to it?

(b) Will he state-

(i) if the construction of a children's and maternity hospital has been started close to the Karapitiya Hospital, the date it was started, the estimated cost and its current progress; and

(ii) according to the plan of the hospital, the details of the units in it?

(c) Will he state-

(i) the names of persons or institutions that provided or are expected to provide funds for the construction of this hospital;

(ii) the amount given so far;

(iii) how the monies have been spent;

(iv) the balance that remained and the activities for which it was used; and

if government allocations have been made what that amount is?

(d) Will he state-

(i) whether a financial fraud or misappropriation has taken place in the construction of this hospital; and

(ii) if so, whether suitable action will be taken upon an investigation in that regard?

(e) If not, why?

**ගරු ලලිත් දිසානායක මහතා (සෞඛ්‍ය නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு லலித் திசாநாயக்க - சுகாதார பிரதி அமைச்சர்)
(The Hon. Lalith Dissanayake - Deputy Minister of Health)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, සෞඛ්‍ය අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර දෙනවා.

(අ) (i) ක්‍රියාත්මක වාට්ටු හා අනෙකුත් අංශ

පෙර ප්‍රසව වාට්ටු 03

පසු ප්‍රසව වාට්ටු 04

නාරිවේද වාට්ටු 01

නාරි පසු ශල්‍ය වාට්ටු 01

දැඩි සත්කාර ඒකකය

ළදරු දැඩි සත්කාර ඒකකය

විශේෂිත ළදරු දැඩි සත්කාර ඒකකය

අර්ධ සාපල්‍යතා ඒකකය

වෙනත් ප්‍රතිකාර ඒකක

ශල්‍යාගාර 02

සූතිකාගාර 03

ලේ බැංකුව

ලිංගාශ්‍රිත රෝග මර්දන ඒකකය

අතුරු වෛද්‍ය පහසුකම්

වෛද්‍ය රසායනාගාරය (නවීන සියලුම පහසුකම් සහිතව)

x කිරණ අංශය

විද්‍යුත් ඛන්තු රේඛණ අංශය

බාහිර රෝගී අංශය

සෑම දිනකම (සෙනසුරාදා, ඉරිදා සහ රජයේ ප්‍රසිද්ධ නිවාඩු දින ඇතුළුව හා දිවා විවේකය ඇතුළුව) පෙර වරු 7.00 සිට පස් වරු 8.00 දක්වා අඛණ්ඩව ප්‍රතිකාර කිරීම.

දන්ත සායනය

සෞඛ්‍ය අධ්‍යාපන ඒකකය

පෙර ප්‍රසව නාරිවේද හා ළදරු විශේෂඥ සායනය

අර්ධ සාපල්‍යතා හා සුවනාරි සායනය

මව්කිරි කළමනාකරණ ඒකකය

(ii) වසර 100ක් පමණ පැරණි දෙමහල් ගොඩනැඟිලි 02ක් සහ වසර 60ක් පමණ පැරණි තෙමහල් ගොඩනැඟිලි 01ක් විනාශ විය.

(iii) ඔව්. වාට්ටු අංක 11 (නාරිවේදී වාට්ටුව) හැර අනෙකුත් සියලුම වාට්ටු සායනික හා සායනික නොවන සියලු පහසුකම් සහිතව පවතින අතර, ඉතා ඉහළ මට්ටමකින් පවත්වා ගෙන යයි.

(iv) සුනාමි ව්‍යසනය නිසා මේ රෝහලේ බොහෝ ගොඩනැඟිලි අබලන් තත්ත්වයට පත් වීම හේතු කොට ගෙන කරාපිටියේ නව රෝහලක් ඉදි කිරීම ආරම්භ කෙරිණි.

(ආ) (i) එය ආරම්භ කළ දිනය 2005 දෙසැම්බර් 27 යුරෝ මිලියන 5.9ක් ජර්මනියේ හෙල්මුට් කෝල් මාතෘ රෝහල් පදනම (Helmut Kohl Maternity Hospital Foundation) මඟින් ලබා දී තිබුණු අතර, ඉතිරි වැඩ කටයුතු සඳහා ශ්‍රී ලංකා රජය මඟින් රුපියල් මිලියන 500ක් වැය කළ යුතුව තිබුණි.

2010 වසර අවසාන වන විට අත්තිවාරම සම්පූර්ණ කර තිබුණි.

(ii) ඔව්.

ඇඳන් 600කින් සමන්විත මාතෘ රෝහලක් ඉදි කිරීම.

එහි රෝගීන් 800කට පහසුකම් සැලසිය හැකි පරිදි බාහිර රෝගී ප්‍රතිකාර අංශයක් ස්ථාපනය කිරීම.

රෝහලේ උපදේශන අංශය ස්ථාපනය කිරීම.

වෛද්‍යවරුන්ගේ හා කාර්ය මණ්ඩලයේ නිල නිවාස ස්ථාපනය කිරීම.

කසළ බැහැර කිරීමේ ඒකක ස්ථාපනය කිරීම.

මෘත ශරීරාගාර ඒකකය ස්ථාපනය කිරීම.

රථගාල් හා අනෙකුත් පහසුකම් වැඩිදියුණු කිරීම.

(ඇ) (i) ජර්මනියේ හෙල්මුට් කෝල් මාතෘ රෝහල් පදනම (Helmut Kohl Maternity Hospital Foundation)

(ii) ජර්මනියේ හෙල්මුට්කෝල් මාතෘ රෝහල් පදනම මඟින් ශ්‍රී ලංකාවේ ජර්මන් තානාපති කාර්යාලය හරහා යුරෝ මිලියන 5.9ක මුදලක් සෞඛ්‍ය අමාත්‍යාංශයේ මැදිහත් වීමකින් තොරව Senok Trade Combine Limited වෙත සෘජුවම ලබා දී ඇත.

(iii) ජර්මනියේ හෙල්මුට් කෝල් මාතෘ පදනම විසින් සෘජුවම අදාළ කොන්ත්‍රාත්කරු සමඟ ගනුදෙනු සිදු කර ඇති බැවින් මුදල් වැය කර ඇති ආකාරය පිළිබඳව නිශ්චිත සඳහන් කිරීමක් කිරීම අපහසුය.

(iv) ඉහත (ii) හා (iii) අනුව අමාත්‍යාංශය මේ සඳහා මැදිහත් වී නොමැති නිසා නිශ්චිතව සඳහන් කළ නොහැක.

(v) බදු සහන ලබා දීම සඳහා මිලියන 80ක් 2012 වසර සඳහා වෙන් කර ඇත.

(ඈ) (i) මීට අදාළ පැමිණිල්ලක් අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව වෙත ලැබී ඇති බව වාර්තා වේ.

(ii) අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව වෙත ලැබී ඇති පැමිණිල්ල පිළිබඳව එම සභාව මඟින් විමර්ශනයක් සිදු කෙරෙමින් පවතී.

(ඉ) පැන නොනඟී.

**ගරු අජිත් කුමාර මහතා**
(மாண்புமிகு அஜித் குமார)
(The Hon. Ajith Kumara)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මෙය ඔබතුමාත් නියෝජනය කරන දිස්ත්‍රික්කයේ තිබෙන ඉතා බරපතළ ප්‍රශ්නයක්. මේ ගැන සවිස්තර වාර්තාවක් දීම ගැන මම ගරු නියෝජ්‍ය ඇමතිතුමාට ස්තුතිවන්ත වෙනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මගේ පළමුවෙනි අතුරු ප්‍රශ්නය මෙයයි. මෙම කොන්ත්‍රාත් එක දීලා තිබෙන්නේ "සෙනොක්" කියන ආයතනයටයි. අප දන්නා විධියට මේ "සෙනොක්" කියන ආයතනය ගොඩනැඟිලි ඉදි කිරීම් ගැන පරිචයක් තිබෙන ආයතනයක් නොවෙයි. ඒ වාගේම මෙම

ආයතනය ඉදි කර තිබෙන්නේ අත්තිවාරම පමණයි. අප දන්නා විධියට ඒ සඳහා ගෙවලා තිබෙන ගාස්තුව රුපියල් මිලියන 20ක් පමණ වෙනවා. මේ ඉදි කිරීම් සඳහා යුරෝ මිලියන 5.7ක් වැනි විශාල මුදලක් ලබා දීලා තිබෙනවා.

ගරු නියෝජ්‍ය ඇමතිතුමනි, ඔබතුමාගේ පිළිතුරේ ප්‍රකාශයට පත් වුණා මෙම වැය කිරීම් සහ ඒ ගෙවීම් පිළිබඳව නිශ්චිත උත්තරයක් අපට දෙන්න බැහැ කියලා. ඒ නිසා අප මේ කාරණය දැන ගන්න කැමැතියි. එහෙම නම් "සෙනොක්" සමාගමට මේ කොන්ත්‍රාත්තුව භාර දුන්නේ මේ ඉදි කිරීම් පිළිබඳව වගකීම සෞඛ්‍ය අමාත්‍යාංශය භාර ගන්නේ නැතිව නේද? ඒ අධීක්ෂණ වගකීම සෞඛ්‍ය අමාත්‍යාංශය දැරුවේ නැත්තේ ඇයි? අපට විශාල මුදලක් ලැබිලා තියෙද්දිත් මේ ඉදි කිරීම අතරමඟ නවතා දමන්න සිද්ධ වුණේ ඒ අඩු පාඩු නිසා නේද?

**ගරු ලලිත් දිසානායක මහතා**
(மாண்புமிகு லலித் திசாநாயக்க)
(The Hon. Lalith Dissanayake)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ වගකීම භාර ගන්න සෞඛ්‍ය අමාත්‍යාංශය හෙල්මුට් කෝල් පදනම සමඟ සාකච්ඡා කළාට ඔවුන් ඒකට අපට එකඟත්වය දුන්නේ නැහැ. අපි CECB ආයතනයෙන් රුපියල් මිලියන 850ක ඇස්තමේන්තුවක් සකස් කරලා තිබුණා. කීප වතාවක් සාකච්ඡා තිබුණා. නමුත් ඔවුන් ඒක අපට දුන්නේ නැහැ. ඔවුන් මේ කටයුතු "සෙනොක්" ආයතනයට තමයි පවරා දී තිබෙන්නේ. ඒ කටයුත්තට ශ්‍රී ලංකා රජය හැටියට duty-free waivers දෙන්න රුපියල් මිලියන 80ක මුදලක් දීලා තිබෙනවා. ඔවුන් precast concrete භාවිත කරමින් තමයි අත්තිවාරම දමා තිබෙන්නේ. ඒ සඳහා අවශ්‍ය duty-free waivers අපි ලබා දී තිබෙනවා. නමුත් අපිට මේ සම්බන්ධයෙන් මැදිහත් වීමක් කරන්න බැහැ. මොකද, ඒක අදාළ ආයතනය පෞද්ගලික කොන්ත්‍රාත්කරුට ලබා දී තිබෙන නිසා. නමුත් මෙහිදී රජය හැටියට මේ සම්බන්ධයෙන් වෙනත් ආධාර, උපකරණ අපට ලබා ගන්න පුළුවන්කම ලැබුණා. සෞඛ්‍ය අමාත්‍යාංශය හැටියට ඒ මුදල, ඒ උපකරණ ලබා ගන්න කටයුතු කර තිබෙනවා.

**ගරු අජිත් කුමාර මහතා**
(மாண்புமிகு அஜித் குமார)
(The Hon. Ajith Kumara)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, රජයේ ඉඩමක සෞඛ්‍ය දෙපාර්තමේන්තුවට අදාළ ගොඩනැඟිල්ලක් හදන්න හෙල්මුට් කෝල් පදනමට ඕනෑ විධියට කටයුතු කරන්න සෞඛ්‍ය අමාත්‍යාංශය නිදහස දීලා තිබෙන බව ඉතා පැහැදිලියි. එහෙම නම් මේ රජයේ වගකීම ඉෂ්ට කර නැහැයි කියන එක එතුමාගේ පිළිතුරෙනුත් පැහැදිලියි. එතුමාගේ පිළිතුරෙත් සඳහන් වුණා.-

**ගරු ලලිත් දිසානායක මහතා**
(மாண்புமிகு லலித் திசாநாயக்க)
(The Hon. Lalith Dissanayake)
වගකීම පැහැර හැරීමක් නැහැ. එහෙම කියන්න එපා.

**ගරු අජිත් කුමාර මහතා**
(மாண்புமிகு அஜித் குமார)
(The Hon. Ajith Kumara)
කොහේ හරි ආයතනයකට -

**ගරු ලලිත් දිසානායක මහතා**
(மாண்புமிகு லலித் திசாநாயக்க)
(The Hon. Lalith Dissanayake)
කොහේ හරි ආයතනයක් නොවෙයි. තමුන්නාන්සේ දන්නවා නේ මේක ආවාට ගියාට වුණු වැඩක් නොවන බව. රුපියල් මිලියන ගණනක් දෙන්න තියෙනකොට ඒ ආයතනයත් එක්ක කථා කරලා සෞඛ්‍ය අමාත්‍යාංශය ඇස්තමේන්තු හදලා කටයුතු කළේ. සෞඛ්‍ය අමාත්‍යාංශයට එහෙම චෝදනා කරන්න එපා. අපි වගකීම පැහැර හැරලා නැහැ. අපෙන් කෙරෙන්න ඕනෑ කටයුත්ත කළා. එහෙමයි. සාමූහික ගිවිසුමක් යනකොට ඒ ගොල්ලන් විශ්වාස කර අපි දෙන්න ඕනෑ. අපි ගිවිසුම් දමන්න, කොන්දේසි දමන්න ගිහින් ඒ ගොල්ලන් හැරිලා ගියා නම් තමුන්නාන්සේලා කියයි, "ඔන්න සෞඛ්‍ය අමාත්‍යාංශයෙන් කොන්දේසි දමන්න ගියා. ඒ මිනිසුන්ට ගිවිසුම් ගහන්න, උපදෙස් දෙන්න ගිය නිසා ඒ මිනිස්සු දමලා ගියා" කියා. ඒ නිසා එහෙම කියන්න එපා. එහෙම අපේ අමාත්‍යාංශයට චෝදනා කරන්න එපා.

**ගරු අජිත් කුමාර මහතා**
(மாண்புமிகு அஜித் குமார)
(The Hon. Ajith Kumara)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මා දෙවන අතුරු ප්‍රශ්නය ඇහුවේ නැහැ. අහන්න කලින් එතුමා කලබල වුණා.

**ගරු ලලිත් දිසානායක මහතා**
(மாண்புமிகு லலித் திசாநாயக்க)
(The Hon. Lalith Dissanayake)
කලබල වුණේ නැහැ. තමුන්නාන්සේ මගේ අමාත්‍යාංශය ගැන චෝදනාවක් කළ නිසා ඒකට උත්තර දුන්නා. නියෝජ්‍ය අමාත්‍යවරයා හැටියට ඒක මගේ වගකීම.

**ගරු අජිත් කුමාර මහතා**
(மாண்புமிகு அஜித் குமார)
(The Hon. Ajith Kumara)
තවම මගේ අතුරු ප්‍රශ්නය ඉවර නැහැ. මා ඔබතුමාට අභියෝග කරනවා, ඒ වාගේම ඉල්ලීමක් කරනවා, පුළුවන් නම් සෞඛ්‍ය අමාත්‍යාංශයේ උපදේශක කාරක සභාවේදී මේ පිළිබඳව වුණු සාකච්ඡාවල සටහන් මේ පාර්ලිමේන්තුවට දැන ගන්න ඉදිරිපත් කරන්න කියලා.

මම අහන අතුරු ප්‍රශ්නය මෙයයි. ඔබතුමාගේ උත්තරේදී මේ ගැන කියැවුණා. එහෙම නම් රජය, රජයේ ඉඩමක රජයේ කටයුත්තක් සඳහා නිසි වග කීමෙන් යුතුව කටයුතු කළේ නැහැ කියන එක තමයි මගේ විවේචනය. මගේ විතරක් නොවෙයි ප්‍රදේශයේ කාගේත් විවේචනය එයයි. මේ රෝහලට අදාළව ලබා දෙන්න නියමිත වෙච්ච උපකරණ ප්‍රමාණයක් තිබුණා. ඒ උපකරණ ලැබුණාද, ඒවා ලැබුණා නම් ඒවාට කළේ මොකක්ද කියලා දැන ගන්න කැමැතියි.

**ගරු ලලිත් දිසානායක මහතා**
(மாண்புமிகு லலித் திசாநாயக்க)
(The Hon. Lalith Dissanayake)
මෙය ප්‍රශ්නයට අදාළ නැහැ, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. උපකරණ සම්බන්ධයෙන් මන්ත්‍රීතුමා වෙනම ප්‍රශ්නයක් අහන්න.

ඊළඟට කියන්න ඕනෑ, මේ සම්බන්ධයෙන් අතිගරු ජනාධිපතිතුමාත් මැදිහත් වෙලා දැනට මේ කටයුතු සඳහා අවශ්‍ය මුදල් ලබා ගන්න දකුණු පළාත් ආණ්ඩුකාරතුමිය, ජර්මන් තානාපතිතුමා සහ අදාළ අංශ සමඟ සාකච්ඡා කොට තියෙනවාය කියලා. දැනට වැඩ කටයුතු ආරම්භ කරලා ඉදි කිරීම් කටයුතු සම්පූර්ණ කර ගැනීමට ජර්මනියේ පුනර්නිර්මාණ බැංකුවෙන් - KfW කියන බැංකුවෙන්- යුරෝ මිලියන 28ක ණයක් ලබා ගැනීමට අතිගරු ජනාධිපතිතුමා කැබිනට් අනුමැතිය ලබා ගැනීම සඳහා කැබිනට් පත්‍රිකාවක් දාලා 2011.04.05 දින අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබා ගෙන තියෙනවා. වාර්ෂිකව සියයට 2ත් සියයට 2.5ත් අතර පොලී අනුපාතයක් මත මෙම ණය මුදල වසර දෙකක සහන කාලයක් ඇතුළත වසර 12කින් ගෙවා නිම කිරීමට තමයි බලාපොරොත්තු වන්නේ. ඊළඟට මෙම යෝජිත ණය මුදලට

[ගරු ලලිත් දිසානායක මහතා]

අමතරව ඉදි වන නව වාට්ටු සඳහා යූරෝ මිලියන 4.5ක පිරිවැයකින් යුතු අවශ්‍ය වෛද්‍ය උපකරණ මිල දී ගැනීම සඳහා ජර්මනියේ හෙල්මුට් කෝල් පදනම විසින් ප්‍රදානයක් ලෙස යූරෝ මිලියන 3ක මුදලක් ලබා දීමට එකඟ වෙලා තියෙනවා. රුපියල් මිලියන 80ක බදු සහන ලබා දුන්නේ 2012 වසරේ ඒ කටයුතු සඳහායි.ඒ අනුව සෞඛ්‍ය අමාත්‍යාංශය මෙම කටයුත්ත 2018 දී අවසන් කරන්නට බලාපොරොත්තු වනවා.

මන්ත්‍රීතුමා කියන විධියට සෞඛ්‍ය අමාත්‍යාංශයත්, අපේ අතිගරු ජනාධිපතිතුමාත් මෙම වගකීම පැහැර හැරලා නැහැ. ජර්මන් හෙල්මුට් කෝල් ආයතනය මෙම රෝහලේ කටයුතු සිදු කිරීම පැත්තක දමා තිබුණු මොහොතක, දකුණු පළාතේ ජනතාව වෙනුවෙන් අතිගරු ජනාධිපතිතුමා මුල් වෙලා, Cabinet Paper එකක් ඉදිරිපත් කරලා, සහන පොලියකට ණය මුදලක් ලබා ගෙන මෙම කටයුතු ආරම්භ කරන්නට එතුමා මුදල් අමාත්‍යතුමා හැටියට කටයුතු කරලා තිබෙනවා. ඒ කටයුතුත් දැනට ක්‍රියාත්මක වෙමින් පවතිනවා. ඒ නිසා සෞඛ්‍ය අමාත්‍යාංශය වගකීම් පැහැර හරිමින් කටයුතු කරලා නැහැ. මේ අහිමි වන්නට යන පහසුකම ජනතාව වෙනුවෙන් කොයි ආකාරයෙන් හරි ලබා දෙන්නට අතිගරු ජනාධිපතිතුමාත්, සෞඛ්‍ය අමාත්‍යාංශයත් කටයුතු කරලා තිබෙනවා. ඒ නිසා පැහැර හැරීම් කරලා, ලිස්සලා ගිහින් නැහැ. අපට තිබුණා, හෙල්මුට් කෝල් ආයතනය මෙය අත් හැර දැම්මා, දැන් සුනාමියත් ඉවරයි කියලා නිකම් ඉන්න. නමුත් අපි එහෙම කරලා නැහැ. අතිගරු ජනාධිපතිතුමා ඇතුළු සෞඛ්‍ය අමාත්‍යාංශය මේ සඳහා අවශ්‍ය කටයුතු කරලා තිබෙනවා.

**ගරු අජිත් කුමාර මහතා**
(மாண்புமிகு அஜித் குமார)
(The Hon. Ajith Kumara)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, එතුමාගේ පිළිතුරේම පරස්පරයක් තිබුණා. එතුමා ප්‍රශ්නයට දුන් පිළිතුරේ දී කිව්වා, "උපකරණ වගයක් ලැබුණා" කියලා. "ඒ උපකරණවලට මොකද වුණේ, කොහේටද ඒවා දුන්නේ?" කියලා මා අහපු අතුරු ප්‍රශ්නයේදී එතුමා කිව්වා, "ඒක මේ ප්‍රශ්නයට අදාළ නැහැ" කියලා. ඒ නිසා මා උපදේශක කාරක සභාවේ දී හෝ උත්තරයක් බලාපොරොත්තු වනවා, මේ උපකරණවලට මොකද වුණේ කියලා. මේ ගොඩනැඟිල්ල ආරම්භ කරන්න කටයුතු කළේ, 2005.12.27 වැනිදා. මේ වෙන කොට එහි විශාල ප්‍රමාදයක් සිදු වෙලා තිබෙනවා. මේ ප්‍රදේශයට දැන් එය වසංගතයක් බවට පත් වෙලා තිබෙනවා. ඒ නිසා රජයේ වග කීමක් තමයි මේ කටයුත්ත ඉෂ්ට කරන එක.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මගේ තුන්වැනි අතුරු ප්‍රශ්නය මෙයයි. මේ තත්ත්වය තුළ මහමෝදර රෝහල හැදෙනවාද, නැද්ද කියන ප්‍රශ්නය තිබෙනවා. ඒ කරුණ විවිකිච්ඡාවක තිබෙන්නේ. කරාපිටියේ රෝහලක් හැදෙන්නට නියමිත නිසා නවීකරණය වන්නේත් නැහැ. ඒ එක්කම දැනට අවුරුද්දකට විතර කලින් මහමෝදර රෝහලේ වහලත් කඩා ගෙන වැටුණා. මෑත කාලයේ දී එම රෝහලේ දරුවන් මිය යෑම පිළිබඳව - ඒවා ඇත්ත වුණත්, නැති වුණත් - විවිධ කථා බහ පැතිරුණා. මෙම තත්ත්වය යටතේ මහමෝදර රෝහල දිගටම පවත්වාගෙන යනවාද, එය පැත්තකට දමලා තබන්නේ නැතිව, අලුත් රෝහල ආරම්භ වන තුරු එහි නවීකරණ කටයුතු කරනවාද කියලා මා දැන ගන්න කැමැතියි.

**ගරු ලලිත් දිසානායක මහතා**
(மாண்புமிகு லலித் திசாநாயக்க)
(The Hon. Lalith Dissanayake)

ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමා උපකරණ සම්බන්ධව සඳහන් කළා. රොටරි සමාජයෙන් ලැබුණු උපකරණ වගයක් මහමෝදර රෝහල වෙත ලබා දෙන්න කටයුතු කරලා තිබෙනවා.

මහමෝදර රෝහල සම්බන්ධයෙන් මන්ත්‍රීතුමා වෙනම ප්‍රශ්නයක් අහනවා නම් අපි අවශ්‍ය උත්තර ලබා දෙන්න කටයුතු කරනවා.

**ගරු අජිත් කුමාර මහතා**
(மாண்புமிகு அஜித் குமார)
(The Hon. Ajith Kumara)

මගේ ප්‍රශ්නයේ මහමෝදර රෝහල ගැන තිබෙනවා. මම අහන්නේ, "මහමෝදර රෝහල මේ තත්ත්වයෙන්ම තියනවාද, එහෙම නැත්නම් කරාපිටිය රෝහල හැදෙන තෙක් මහමෝදර රෝහල නවීකරණය කරනවාද?" කියලායි. මම හිතන විධියට ඒ අතුරු ප්‍රශ්නයට ඔබතුමාට තිබෙන අවබෝධයෙන් මේ වෙලාවේ උත්තරයක් දෙන්න පුළුවන්. මොකද, පසු ගිය දවස්වල මේ රෝහලේ සිද්ධි ගණනාවක් වුණා.

**ගරු ලලිත් දිසානායක මහතා**
(மாண்புமிகு லலித் திசாநாயக்க)
(The Hon. Lalith Dissanayake)

පසු ගිය කාලයේ මහමෝදර රෝහලේ නොමේරූ ළදරු ඒකකයේ යම් කිසි සිද්ධියක් වෙලා, ඒ සම්බන්ධයෙන් අවශ්‍ය කටයුතු සෞඛ්‍ය අමාත්‍යාංශය ඉදිරිපත් වෙලා කළා. ඒ රෝහලේ අදාළ ප්‍රතිසංස්කරණ කටයුතු කරලා නැවත මහ ජනතාව වෙනුවෙන් සේවය ලබා දීමට කටයුතු කළා. ඊට අමතරව මහමෝදර රෝහලේ අනෙකුත් කටයුතු සම්බන්ධයෙනුත් අවශ්‍ය කටයුතු අවශ්‍ය වෙලාවේදී කරන්නට අමාත්‍යාංශය පියවර ගන්නවා. ඒක-

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)

මහමෝදර රෝහලේ කටයුතු පවත්වා ගෙන යනවා.

**ගරු අජිත් කුමාර මහතා**
(மாண்புமிகு அஜித் குமார)
(The Hon. Ajith Kumara)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, උපදේශක කාරක සභාවේදී මේ පිළිබඳව සම්පූර්ණ සාකච්ඡාවක් කරන්න අවස්ථාවක් දෙන්න කියලා මා යෝජනාවකුත් ඉදිරිපත් කරනවා.

**ගරු ලලිත් දිසානායක මහතා**
(மாண்புமிகு லலித் திசாநாயக்க)
(The Hon. Lalith Dissanayake)

අපි දැනට සම්පූර්ණ තොරතුරු ඉදිරිපත් කරලා තිබෙනවා නේ. නැවත උපදේශක කාරක සභාවේදී-

## මැද පෙරදිග රටවලට යන ශ්‍රමිකයන් : නීති ආධාර
## மத்திய கிழக்கு நாடுகளுக்குச் செல்லும் ஊழியர்கள்: சட்ட உதவி
## MIGRANT WORKERS TO MIDDLE EAST : LEGAL AID

1909/'11

6. **ගරු රන්ජන් රාමනායක මහතා**
(மாண்புமிகு ரன்ஜன் ராமநாயக்க)
(The Hon. Ranjan Ramanayake)

විදේශ රැකියා ප්‍රවර්ධන හා සුබ සාධන අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (3):

(අ) (i) විදේශ රැකියා සඳහා මැද පෙරදිග රටවලට යන බොහෝ ශ්‍රමිකයන්ට එම රටවල ක්‍රියාත්මක වන ෂරියා නීතිය සහ අනෙකුත් නීති රීති පිළිබඳව දැනුවත්භාවයක් නොමැති බවත්;

(ii) එම හේතුව නිසා විදේශ රැකියාවල යෙදීමේදී ඔවුන්ට විවිධ ගැටලුවලට මුහුණ පෑමට සිදුවී ඇති බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) මැද පෙරදිග රටවල නීති රීති පිළිබඳ නොදැනුවත්කම හේතුවෙන් එම රටවල නීතිය යටතේ වරදකරුවන් වන ශ්‍රී ලාංකික ශ්‍රමිකයන් හට නීති ආධාර ලබා ගැනීමේ වැඩ පිළිවෙළක් තිබේද;

(ii) නොඑසේ නම්, එවැනි වැඩ පිළිවෙළක් හඳුන්වා දී එම ශ්‍රමිකයන්ට ඇති වන ගැටලු මග හැරවීමට කටයුතු කරන්නේද;

(iii) එසේ නම්, එවැනි වැඩ පිළිවෙළක් හඳුන්වා දෙන දිනය කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

வெளிநாட்டு வேலைவாய்ப்பு ஊக்குவிப்பு, நலனோம்புகை அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) வெளிநாட்டுத் தொழில்வாய்ப்புகளுக்காக மத்திய கிழக்கு நாடுகளுக்குச் செல்கின்ற பெரும்பாலான ஊழியர்களுக்கு அந்நாடுகளில் அமுலில் உள்ள ஷரிஆ சட்டம் மற்றும் ஏனைய சட்டங்கள் தொடர்பான அறிவு இல்லை என்பதையும்;

(ii) இதன் காரணமாக, வெளிநாட்டுத் தொழில்களில் ஈடுபடும்போது இவர்களுக்கு பல்வேறு சிக்கல்களுக்கு முகம்கொடுக்க நேரிட்டுள்ள தென்பதையும்

அவர் அறிவாரா?

(ஆ) (i) மத்திய கிழக்கு நாடுகளின் சட்டங்கள் தொடர்பில் அறிவின்மை காரணமாக அந்நாடு களின் சட்டங்களின் கீழ் குற்றவாளியாக்கப் படுகின்ற இலங்கை ஊழியர்களுக்கு சட்ட உதவி வழங்கும் வேலைத்திட்டமொன்று உள்ளதா என்பதையும்;

(ii) இன்றேல், அவ்வாறான வேலைத்திட்ட மொன்றை அறிமுகப்படுத்தி மேற்படி ஊழியர்கள் எதிர்நோக்குகின்ற சிக்கல்களைத் தவிர்ப்பதற்கு நடவடிக்கை எடுப்பாரா என்பதையும்;

(iii) அவ்வாறாயின், அத்தகைய வேலைத்திட்டத்தை அறிமுகப்படுத்துகின்ற திகதி யாது என்பதையும்

அவர் குறிப்பிடுவாரா?

(இ) இன்றேல், ஏன்?

asked the Minister of Foreign Employment Promotion and Welfare:

(a) Is he aware that-

(i) many workers who migrate to the Middle East countries for foreign employment do not possess knowledge on the Sharia Law and other laws in force in those countries ; and

(ii) as a result they encounter many problems while being engaged in foreign employment?

(b) Will he state-

(i) whether there is a programme for seeking legal aid for Sri Lankan migrant workers who are found guilty under the laws of the Middle East countries due to their lack of knowledge regarding laws of those countries ;

(ii) if not, whether action will be taken to introduce such a programme to enable migrant workers to avoid problems faced by them ; and

(iii) if so, the date on which such a programme will be introduced?

(c) If not, why?

**ගරු ඩිලාන් පෙරේරා මහතා (විදේශ රැකියා ප්‍රවර්ධන හා සුබ සාධන අමාත්‍යතුමා)**
(மாண்புமிகு டிலான் பெரேரா - வெளிநாட்டு வேலைவாய்ப்பு ஊக்குவிப்பு, நலனோம்புகை அமைச்சர்)
(The Hon. Dilan Perera - Minister of Foreign Employment Promotion and Welfare)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ප්‍රශ්නයට පිළිතුර මෙයයි.

(අ) (i) මැද පෙරදිග විදේශ රැකියා සඳහා යන අයට කාර්යාංශය මඟින් ලබා දෙන පුහුණු සැසිවලදී මැද පෙරදිග රටවල ක්‍රියාත්මක ෂරියා නීතිය සහ අනෙකුත් නීති ගැන අවබෝධයක් ලබා දෙයි.

(ii) මෙම නීතිය දැන දැනත් එම රටේ නීතිය කඩ කරන අවස්ථා බොහෝ විට වාර්තා වී ඇත. (උදා. අනාචාරයේ හැසිරීම නිසා කස පහරවල් 110ක් ගසන බව පුහුණුවීම්වලදී දැනුවත් කර ඇත.)

(ආ) (i) ඔව්.

ජෝර්දානයේ ශ්‍රී ලංකා දූත මණ්ඩලයේ කම්කරු හා සුබසාධන අංශය සඳහා කොන්ත්‍රාත් පදනම මත නීතිඥවරුන් බඳවා ගෙන ඇත. අනෙක් රටවල දූත මණ්ඩල මඟින් අවශ්‍ය අවස්ථාවලදී නීතිඥ සේවා ලබා ගනු ලැබේ.

ඉහත ආකාරයට එකී රටවල සේවය කරන ශ්‍රී ලාංකික විගමනික සේවය, ප්‍රජාව වෙත නීති ආධාර සැපයීමට ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය මේ වන විටත් ක්‍රියා කර ඇත.

(ii) පැන නොනඟී.

(iii) පැන නොනඟී

(ඇ) පැන නොනඟී.

**ගරු රන්ජන් රාමනායක මහතා**
(மாண்புமிகு ரன்ஜன் ராமநாயக்க)
(The Hon. Ranjan Ramanayake)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි ගරු ඇමතිතුමා කිව්වා, විදේශගත වන ශ්‍රමිකයන්ට ෂරියා නීතිය පිළිබඳ අවබෝධයක් ලබා දෙනවා කියලා. නමුත් මේ අවස්ථාවේදී මම මේ කාරණය අහන්න කැමැතියි. මුත්තූර්වල රිසානා නෆීක් කියන ඒ දැරිය - ඒ දැරිවිය පිට රට යන අවස්ථාව වනකොට ඉස්කෝලේ යන වයසේ දැරිවියක්- මේ රටේ "අක්බාර් ඒජන්සි" කියන ඒජන්සි එකෙන්

[ගරු රන්ජන් රාමනායක මහතා]

තමයි හොර පාස් පෝට් එකක් හදලා, ව්‍යාජ වයසක් යොදලා පිට රට යැව්වේ. ෂරියා නීතිය යටතේ අවුරුදු හතක් තිස්සේ සිරගත කර තබන්නට ඒ දැරිවිය කළ වරද මොකක්ද කියලා මම අහනවා. 2005 පෙබරවාරි මාසයේ තමයි සවුදි අරාබියේ හිර ගෙදරක ඒ දැරිවිය සිරගත කර තිබෙන්නේ. ඒ අවුරුදු හත තිස්සේ අපේ ගරු ඇමතිතුමා එක වතාවක් කිව්වා, ඒ සිර දඬුවම අත් හිටෙව්වා කියලා. ගරු ජනාධිපතිතුමා ගිහින් සවුදි අරාබියේ රජතුමා සමඟ කථා කළාය කිව්වා. ඒ පාසල් ශිෂ්‍යාව අවුරුදු හතකින් පසු අද මහ ගැහැණියක් වෙලා. අවුරුදු හතක් තිස්සේ ඇය තවම හිරේ ඉන්නවා. ගරු ඇමතිතුමා වරක් කිව්වා, ඒ හිර දඬුවම අත් හිටෙව්වා කියලා.

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
අතුරු ප්‍රශ්නය අහන්න.

**ගරු රන්ජන් රාමනායක මහතා**
(மாண்புமிகு ரன்ஜன் ராமநாயக்க)
(The Hon. Ranjan Ramanayake)
මම අහන්නේ ඒ දැරිවිය නිදහස් කරන්නේ කවදාද, ඒ දැරිවිය ලංකාවට එන්නේ කවදාද කියලායි.

**ගරු ඩිලාන් පෙරේරා මහතා**
(மாண்புமிகு டிலான் பெரேரா)
(The Hon. Dilan Perera)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ සිද්ධිය පිළිබඳව මීට පෙර ප්‍රශ්න දෙකක් අහපු අවස්ථාවේ මම පිළිතුරු දීලා තිබෙනවා. නමුත් මෙතුමාගේ ප්‍රශ්නයටත් පිළිතුරු දිය හැකියි.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ දැරිවිය ඒ රටේ තිබෙන ෂරියා නීතිය අනුව තව ළදරුවකුගේ මරණය සම්බන්ධයෙන් තමයි වැරදිකාරිය වෙලා ඉන්නේ. සාමාන්‍යයෙන් ඒ නීතිය යටතේ වැරදිකාරයා වෙලා ඉන්න කෙනෙක් අවුරුදු දෙක තුනක් යනකොට මරණ දණ්ඩනයට ලක් වෙනවා. මේ ගරු මන්ත්‍රීතුමා අහන්නේ, මරණ දණ්ඩනයට ලක් නොවී අවුරුදු හතක් ඉන්නේ ඇයි කියන ප්‍රශ්නයයි. ඒකයි මෙතුමාට තිබෙන කැක්කුම.

**ගරු රන්ජන් රාමනායක මහතා**
(மாண்புமிகு ரன்ஜன் ராமநாயக்க)
(The Hon. Ranjan Ramanayake)
නැහැ. ඒක නොවෙයි මා අහන්නේ.[බාධා කිරීමක්]

**ගරු ඩිලාන් පෙරේරා මහතා**
(மாண்புமிகு டிலான் பெரேரா)
(The Hon. Dilan Perera)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ප්‍රශ්නයක් ඇසුවාම මා පිළිතුරු දෙන්නට ඕනෑ. එතුමාට අවශ්‍ය විධියට මට පිළිතුරු දෙන්නට බැහැ. එතුමා වෙන ප්‍රශ්නයක් දාලා එතුමාට අනවශ්‍ය ප්‍රශ්නයකුත් ඒ තුළින් අහනවා නම්, එතුමා කල්පනාකාරීව පිළිතුර අහන්නට සූදානම් වන්නට ඕනෑ.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඒ රටේ තිබෙන නීතියට අප ගරු කරන්නට ඕනෑ. හැබැයි ඒ නීතිය යටතේ මරණ දණ්ඩනයට ලක් වෙච්ච කෙනකු සාමාන්‍යයෙන් අවුරුදු දෙක තුනක් යනකොට මරණ දණ්ඩනයට ලක් වන තත්ත්වය තුළ දැන් අවුරුදු හතක් තිස්සේත් එය ක්‍රියාත්මක නොවී පවතින්නේ අතිගරු ජනාධිපතිතුමාගේ ඉල්ලීමට ඇහුම්කන් දීම නිසයි. ඒ වාගේම අපේ රටේ තානාපතිවරු -දැනට තුන් දෙනෙකු විතර ඒ රටේ තානාපති කාර්යාලවල හිටියා.- ඒ රටවල ඇමෙරිකන් තානාපති කාර්යාලය, ඒ රටවල යුරෝපා සංවිධානයේ තානාපති කාර්යාල හරහා කළ ඒකාබද්ධ සන්දේශය නිසයි. ඒ සියලු කාරණා එක්ක තමයි මේ දැරිවියගේ මරණ දණ්ඩනය තවදුරටත් ක්‍රියාත්මක නොවී පවතින්නේ. අප උත්සාහ කරන්නේ මේ දැරිවියව මරණ දණ්ඩනයෙන් ගලවා ගන්නයි. ඒ දැරිවිය අවුරුදු හතක් තිස්සේ ඒ රටේ ඒ විධියට ඉන්න එක පිළිබඳව අප එක පැත්තකින් සතුටු වන්නට ඕනෑ. ඇයි හේතුව? නැත්නම් මරණ දණ්ඩනය ක්‍රියාත්මක වෙනවා. ෂරියා නීතිය යටතේ මරණ දඬුවම ක්‍රියාත්මක වෙනවා. දැන් ඒ ක්‍රියාත්මක වීම නවත්වා ගෙන ඉන්නවා. එසේ නවත්වා ගැනීමට හැකියාව ලැබී තිබෙන්නේ, අතිගරු ජනාධිපතිතුමා යැවූ ලිපිය නිසයි; අපේ තානාපතිවරු ඒ රටවලට ගිහින් ඒ සම්බන්ධයෙන් කටයුතු කළ නිසයි.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඒ වාගේම ළඟදී අපේ රටේ පාර්ලිමේන්තු මන්ත්‍රී කණ්ඩායමක් ඒ රටට ගියා. ගිහින් රිසානා දැරිවියගේ අතින් මරණයට පත් වුණාය කියන ඒ කුඩා ළදැරියගේ දෙමව්පියන් ඉන්න ගමට ගියා. ගමට ගියාට ඒ දෙමව්පියන් හමු වන්නට බැරි වුණා. නමුත් ඒ දෙමව්පියන්ගේ දෙමව්පියන් හමු වුණා. හමු වෙලා ඒ හරහා ෂරියා නීතිය යටතේ සමාව ලැබීම සඳහා වන ප්‍රධාන කොන්දේසිය වෙච්ච ඒ සමාව ලැබීම සඳහා ඒ අදාළ දෙමව්පිය දෙදෙනාගෙන් කෙසේ හෝ කැමැත්ත ප්‍රකාශ කරවා ගන්නට ඕනෑ. ඒ කාරණයට තමයි මේ උත්සාහ කරන්නේ. ඒ කාරණයට උත්සාහ කරනකොට ඒ උත්සාහයට බාධා කරන්නට තමයි මේ හදන්නේ. තානාපති කාර්යාල ඉස්සරහට ගිහින් පිකට් කළාට ඒ දෙමවුපියන්ගෙන් කැමැත්ත ලැබෙන්නේ නැහැ. එසේ පිකට් කළාම ඒ රටේ මිනිස්සු හිතන්නේ ෂරියා නීතියට එරෙහිව පිකට් කළාය කියායි. ෂරියා නීතිය මුස්ලිම් භක්තිකයන් විශ්වාස කරන්නේ දේව නීතියක් කියායි; "Divine law" කියායි. ඒක මුස්ලිම් අයගේ පිළිගැනීමයි. ඒ ගොල්ලෝ භක්තිමත්ව හිතන්නේ ඒක දේව නීතියක් කියායි. ඒ දේව නීතියට එරෙහිව ගිහින් පිකට් කළාම කැමැත්ත ගන්න එකත් තව කල් දානවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ එක එක gigolo මහත්වරුන්ට ඕනෑ ඕනෑ විධියට මේ වැඩේට මුහුණ දෙන්න බැහැ. ඒ නිසා මේ කැක්කුම මේ දැරිවියව මරණ දණ්ඩනයෙන් බේරා ගැනීමට කරන කටයුත්තට එරෙහිවයි. ඒකයි මේ ප්‍රශ්නය තිබෙන්නේ.

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
දෙවැනි අතුරු ප්‍රශ්නය.

**ගරු රන්ජන් රාමනායක මහතා**
(மாண்புமிகு ரன்ஜன் ராமநாயக்க)
(The Hon. Ranjan Ramanayake)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, එතුමා, එතුමාගේම නම කිව්වා, "gigolo" කියලා. මම ඒක අනුමත කරනවා. එතුමා gigolo කෙනෙක් කියලා මුළු ලංකාවම දන්නවා. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, එතුමා සාවද්‍ය තොරතුරු රැසක් කිව්වා. ඇත්තෙන්ම -

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
ගරු මන්ත්‍රීතුමනි, දැන් අවස්ථාව තිබෙන්නේ අතුරු ප්‍රශ්න අහන්නයි, විවාදයකට නොවෙයි. ඒ නිසා ඔබතුමා දෙවැනි අතුරු ප්‍රශ්නය අහන්න.

**ගරු රන්ජන් රාමනායක මහතා**
(மாண்புமிகு ரன்ஜன் ராமநாயக்க)
(The Hon. Ranjan Ramanayake)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මගේ දෙවැනි අතුරු ප්‍රශ්නය හොර ඒජන්සිකරුවරුන් අත් අඩංගුවට ගැනීම පිළිබඳවයි. මුදල් හා ක්‍රම සම්පාදන කටයුතු පිළිබඳ උපදේශක කාරක සභාවේදී මම ගරු ජනාධිපතිතුමාට කථා කරලා කිව්වා, මේ දැරියව යවපු Omar Travels කියන ඒජන්සිය තවම blacklist කරලා නැහැ කියලා. එතකොටයි දන්නේ අපේ හකීම්-

**ගරු ඩිලාන් පෙරේරා මහතා**
(மாண்புமிகு டிலான் பெரேரா)
(The Hon. Dilan Perera)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, නැවත මට කියන්න තිබෙන්නේ මෙයයි. මේ පාර්ලිමේන්තුවේ සම්ප්‍රදායක් තිබෙනවා. පාර්ලිමේන්තුවේ ප්‍රශ්න අහන විධියක් තිබෙනවා. පාර්ලිමේන්තුවේ එක ප්‍රශ්නයක් අහලා අතුරු ප්‍රශ්න විධියට ලෝකයේ තිබෙන හැම ප්‍රශ්නයක් ගැනම අහන්න බැහැ.

**ගරු රන්ජන් රාමනායක මහතා**
(மாண்புமிகு ரன்ஜன் ராமநாயக்க)
(The Hon. Ranjan Ramanayake)
මම මේ ප්‍රශ්නයක් යොමු කරන්නේ. ඒකට මට ඉඩ දෙන්නය කියන්න. එතුමාට කේන්ති ගියාට හරි යන්නේ නැහැ. මේ විදේශ රැකියාවට අදාළ ප්‍රශ්නයක්.

**ගරු ඩිලාන් පෙරේරා මහතා**
(மாண்புமிகு டிலான் பெரேரா)
(The Hon. Dilan Perera)
මේ රිසානාගේ සිද්ධියට අදාළ ආයතනය උසාවියෙන් තහනම් කරලායි තිබෙන්නේ. ඒ නිසා මේ තිබෙන ප්‍රශ්නය ඒක නොවෙයි.

**ගරු රන්ජන් රාමනායක මහතා**
(மாண்புமிகு ரன்ஜன் ராமநாயக்க)
(The Hon. Ranjan Ramanayake)
ඒ තහනම් කළේ-

**ගරු ඩිලාන් පෙරේරා මහතා**
(மாண்புமிகு டிலான் பெரேரா)
(The Hon. Dilan Perera)
මේ අහන ප්‍රශ්නයේ තිබෙන්නේ ෂරියා නීතිය ඉගැන්වීම සම්බන්ධයෙනුයි. අතුරු ප්‍රශ්න අහන්නේ වෙන එකක් සම්බන්ධවයි.

**ගරු රන්ජන් රාමනායක මහතා**
(மாண்புமிகு ரன்ஜன் ராமநாயக்க)
(The Hon. Ranjan Ramanayake)
ෂරියා නීතිය සම්බන්ධ ප්‍රශ්නය ඉවරයි. දැන් අහන්නේ ෂරියා නීතිය ගැන නොවෙයි, ඒජන්සි ගැනයි. තමුන්නාන්සේට තේරෙන්නේ නැද්ද?

**ගරු ඩිලාන් පෙරේරා මහතා**
(மாண்புமிகு டிலான் பெரேரா)
(The Hon. Dilan Perera)
ඉතින් ඒජන්සි ගැන අහන්න බැහැ. මේ ප්‍රධාන ප්‍රශ්නයෙන් අහලා තිබෙන්නේ, ඒජන්සි ගැන නොවෙයි.

**ගරු රන්ජන් රාමනායක මහතා**
(மாண்புமிகு ரன்ஜன் ராமநாயக்க)
(The Hon. Ranjan Ramanayake)
නැහැ, නැහැ. මේ දෙවැනි අතුරු ප්‍රශ්නයයි.

**ගරු ඩිලාන් පෙරේරා මහතා**
(மாண்புமிகு டிலான் பெரேரா)
(The Hon. Dilan Perera)
ගරු මන්ත්‍රීතුමාට ඕනෑ, ඕනෑ දේවල් අහන්න බැහැ.

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
ගරු මන්ත්‍රීතුමනි, අතුරු ප්‍රශ්නයක් ඇසිය හැක්කේ අසනා ලද ප්‍රධාන ප්‍රශ්නයෙන් පැන නැගෙන කරුණක් මත පමණයි.

**ගරු රන්ජන් රාමනායක මහතා**
(மாண்புமிகு ரன்ஜன் ராமநாயக்க)
(The Hon. Ranjan Ramanayake)
මම අහන්නේ ඒකයි.

**ගරු ඩිලාන් පෙරේරා මහතා**
(மாண்புமிகு டிலான் பெரேரா)
(The Hon. Dilan Perera)
ඒක තේරෙන්නේ නැහැ, මේ gigoloට.

**ගරු රන්ජන් රාමනායක මහතා**
(மாண்புமிகு ரன்ஜன் ராமநாயக்க)
(The Hon. Ranjan Ramanayake)
Omar Travels කියන්නේ මේ දැරියව යවපු ඒජන්සියයි. ඒ දැරිය යවපු ඒජන්සිය තහනම් කරන්න අවුරුදු හයහමාරක් ගියා.

**ගරු ඩිලාන් පෙරේරා මහතා**
(மாண்புமிகு டிலான் பெரேரா)
(The Hon. Dilan Perera)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අධිකරණයට ගිහිල්ලා තහනම් කරලායි තිබෙන්නේ. දැන් අහන්නේ තහනම් කළේ ඇයි කියලාද?

**ගරු රන්ජන් රාමනායක මහතා**
(மாண்புமிகு ரன்ஜன் ராமநாயக்க)
(The Hon. Ranjan Ramanayake)
මම අහන්නේ, අවුරුදු හයහමාරක් ගියේ ඇයි කියලායි.

**ගරු ඩිලාන් පෙරේරා මහතා**
(மாண்புமிகு டிலான் பெரேரா)
(The Hon. Dilan Perera)
අවුරුදු හයහමාරක් ගියේ නැහැ. තාවකාලිකව තහනම් කරලා ඊට පස්සේ ඒ තාවකාලික තහනම ස්ථිර තහනමකට පත් කරලායි තිබෙන්නේ.

**ගරු රන්ජන් රාමනායක මහතා**
(மாண்புமிகு ரன்ஜன் ராமநாயக்க)
(The Hon. Ranjan Ramanayake)
මෙකට සාක්ෂියි, ගරු ජනාධිපතිතුමා. මම එතුමාට කිව්වාම-

**ගරු ඩිලාන් පෙරේරා මහතා**
(மாண்புமிகு டிலான் பெரேரா)
(The Hon. Dilan Perera)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මුලින්ම පාර්ලිමේන්තුවට එන කොට ඇඳ ගෙන ආවේ හැට්ට. හැට්ට මාරු කරලා ඇඳුම් අඳින්න උගන්වන්න සිද්ධ වුණා. දැන් මේ පාර්ලිමේන්තුවේ ප්‍රශ්න අහන්නත් උගන්වන්න වෙලා තිබෙනවා, මේ gigoloට.

**ගරු රන්ජන් රාමනායක මහතා**
(மாண்புமிகு ரன்ஜன் ராமநாயக்க)
(The Hon. Ranjan Ramanayake)
ඒවා අදාළ නැහැ, මේකට.

**ගරු ඩිලාන් පෙරේරා මහතා**
(மாண்புமிகு டிலான் பெரேரா)
(The Hon. Dilan Perera)
මේ එක එක gigolosලා ගිහිල්ලා තැන් තැන්වල gigolo වැඩ කළාට පාර්ලිමේන්තුවේ ප්‍රශ්න අහන ක්‍රමයෙන් පිට පනින්න බැහැ.

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමා අසන ලද ප්‍රධාන ප්‍රශ්නයෙන් පැන නඟින අතුරු ප්‍රශ්නයක් අහන්න. දෙවැනි අතුරු ප්‍රශ්නය ඉතාම කෙටියෙන් අහන්න. මෙය කථාවක් පවත්වන්න අවස්ථාවක් කර ගන්න එපා. කාලය බොහොම සීමා සහිතයි.

**ගරු රන්ජන් රාමනායක මහතා**
(மாண்புமிகு ரன்ஜன் ராமநாயக்க)
(The Hon. Ranjan Ramanayake)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, කරුණාකරලා තේරුම් ගන්න. මම වාද කරනවා නොවෙයි. Omar Travels කියන්නේ, ෂරියා නීතිය යටතේ දඬුවම් විඳින රිසානා නෆීක් යවපු ඒජන්සියයි. එතකොට කොහොමද ඒක අදාළ නැති වෙන්නේ?

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
ගරු මන්ත්‍රීතුමා, ඔබතුමා අසන ලද ප්‍රධාන ප්‍රශ්නයෙන් පැන නඟින ප්‍රශ්නයක් අහන්න. අහන්න තිබෙන ප්‍රශ්නය ඉතාම කෙටියෙන් ගරු ඇමතිතුමාගෙන් අහන්න.

**ගරු රන්ජන් රාමනායක මහතා**
(மாண்புமிகு ரன்ஜன் ராமநாயக்க)
(The Hon. Ranjan Ramanayake)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මම අහන්නේ, මේ ශ්‍රමිකයින්ට මෙච්චර වැරදි සිදු වන ඒජන්සි තහනම් කරන්න, නීතියෙන් blacklist කරන්න ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය, විදේශ රැකියා ප්‍රවර්ධන හා සුබසාධන අමාත්‍යාංශය සහ කම්කරු හා කම්කරු සබඳතා අමාත්‍යාංශය මෙපමණ කාලයක් ගන්නේ ඇයි කියලායි.

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
මෙපමණ කාලයක් ගන්නේ මොකද? That is the Question.

**ගරු අල්හාජ් ඒ.එච්.එම්. අස්වර් මහතා**
(மாண்புமிகு அல்ஹாஜ் ஏ.எச்.எம். அஸ்வர்)
(The Hon. Alhaj A.H.M. Azwer)
Sir, I rise to a point of Order.

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
What is the point of Order?

**ගරු අල්හාජ් ඒ.එච්.එම්. අස්වර් මහතා**
(மாண்புமிகு அல்ஹாஜ் ஏ.எச்.எம். அஸ்வர்)
(The Hon. Alhaj A.H.M. Azwer)
Sir, my point of Order is, if he is asking about the agency, there is a court case regarding it and the relevant people have been apprehended. Therefore, it is *sub judice*.

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
That is not a point of Order. Hon. Minister, you may answer the Question. Order, please!

**ගරු ඩිලාන් පෙරේරා මහතා**
(மாண்புமிகு டிலான் பெரேரா)
(The Hon. Dilan Perera)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මීට පෙර වතාවකදී අපේ ගරු හසන් අලි මන්ත්‍රීතුමා මේ ගැන ප්‍රශ්නයක් අහලා, අපේ ගරු රවි කරුණානායක මන්ත්‍රීතුමා මේ පිළිබඳවම අතුරු ප්‍රශ්න දෙකක් අහලා මම පිළිතුරු දීලා තිබෙනවා. ඉන් පසුව මම විදේශගත වෙලා ඉන්න අවස්ථාවකදී මේ සභාවේ මේ ප්‍රශ්නය මතු වුණු වෙලාවකදී ගරු රවුෆ් හකීම් අධිකරණ ඇමතිතුමා ඒ ප්‍රශ්නයට පිළිතුරු දීලා තිබුණා. ඉන් පසුව ගරු ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමාත් මේ ප්‍රශ්නය මතු වුණු වෙලාවක පිළිතුරු දීලා තිබුණා. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඕනෑම වරදක් කිරීම සම්බන්ධයෙන්, -මේ වරද සම්බන්ධයෙන් විතරක් නොවෙයි ඕනෑම වරදක් කිරීම සම්බන්ධයෙන්- ඕනෑම ආයතනයකට එරෙහිව යම් කිසි ආකාරයක පැමිණිල්ලක් ආවාම -මම මේ අමාත්‍යාංශය භාර ගත්තාට පස්සේ, මම මේ අමාත්‍යාංශය භාර අරගෙන අවුරුද්දයි- මම මුලින්ම කරන්නේ තාවකාලිකව ඒ අයගේ licence එක අත් හිටවලා, ඉන් පසුව inquiry එකක් තියලා ස්ථිරවම තහනම් කරනවාද, නැද්ද කියන තීන්දුවට එන එකයි. ඒ නිසා මම මේ අමාත්‍යාංශය භාර ගත්තාට පසුව පැහැදිලිවම අවශ්‍ය කරන පියවරයන් අරගෙන තිබෙනවා. ඒ පියවරයන් අරගත්ත නිසා තමයි සමහර gigolosලාට මේ කැක්කුම.

**ගරු අල්හාජ් ඒ.එච්.එම්. අස්වර් මහතා**
(மாண்புமிகு அல்ஹாஜ் ஏ.எச்.எம். அஸ்வர்)
(The Hon. Alhaj A.H.M. Azwer)
බයිස්කෝප් නටන්න. බයිස්කෝප්. වන් ෂොට්. මීට වඩා හොඳයි ඒක.

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
අතුරු ප්‍රශ්න අංක තුන.

**ගරු රන්ජන් රාමනායක මහතා**
(மாண்புமிகு ரன்ஜன் ராமநாயக்க)
(The Hon. Ranjan Ramanayake)
එතුමාට කේන්ති යනවා. ඒක කවුරුත් දන්නවා. ඒවා මම ගණන් ගන්නේ නැහැ.

**ගරු ඩිලාන් පෙරේරා මහතා**
(மாண்புமிகு டிலான் பெரேரா)
(The Hon. Dilan Perera)
මට කේන්ති යන්නේ නැහැ.

**ගරු රන්ජන් රාමනායක මහතා**
(மாண்புமிகு ரன்ஜன் ராமநாயக்க)
(The Hon. Ranjan Ramanayake)

මාගේ තුන්වන අතුරු ප්‍රශ්නය. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, පසු ගිය කාලය තිස්සේම ජෝර්දාන තානාපති කාර්යාලයේ අපේ ශ්‍රමිකයින් දෙසීය ගණනක් හිර වෙලා ඉන්නවා. ඒකට සාක්ෂි තිබෙනවා. අපේ නියෝමාල් පෙරේරා නියෝජ්‍ය ඇමතිතුමා, නිමල් සිරිපාල ද සිල්වා ඇමතිතුමා, බුද්ධික පතිරණ මන්ත්‍රීතුමා සහ ජෝන් අමරතුංග මන්ත්‍රීතුමා ඒ තානාපති කාර්යාලයට ගියා. එතැන 265 දෙනෙක් හිටියා. එහි තානාපතිවරයා ලෙස ඉන්නේ ගාමිණී රාජපක්ෂ මහත්මයා. එතුමා සමඟත් මම කථා කළා. තවමත් මේ තානාපති කාර්යාලයේ safe house එකේ ප්‍රශ්නය විසඳිලා නැහැ. මගේ ප්‍රශ්නය මෙයයි. අනෙක් සියලුම රටවල් -ඉතියෝපියාව, ඉන්දුනීසියාව, පිලිපීනය, බංගලාදේශය, ඉන්දියාව වාගේ රටවල්- ජෝර්දානයට ශ්‍රමිකයින් යැවීම තහනම් කර තිබියදී අපි පමණක් අපේ ශ්‍රමිකයින් ඩොලර් 200 වැටුපට යවලා දුක් විඳින්නට ඉඩ සලස්වන්නේ ඇයි?

**ගරු ඩිලාන් පෙරේරා මහතා**
(மாண்புமிகு டிலான் பெரேரா)
(The Hon. Dilan Perera)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ප්‍රශ්නයට අදාළ නොවුණත් එම අතුරු ප්‍රශ්නයට මම උත්තර දෙනවා. මාත් ගිය මාසයේ ජෝර්දානයට ගියා. මේ safe house එකටත් ගියා. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ජෝර්දානයේ ප්‍රශ්නයක් තිබෙනවා. සියලුම රැකියා අංශවලට නොවෙයි, ගෘහ සේවිකා අංශයේ ප්‍රශ්නයක් තිබෙනවා. ඒක අලුතෙන්ම මතු වුණු ප්‍රශ්නයක් හැටියටම සලකන්නෙත් නැහැ. මොකද මීට පෙරත් වරක් අපි තාවකාලිකව ජෝර්දානයට ගෘහ සේවිකාවන් යන එක තහනම් කළා. තහනම් කරලා ගාමිණී රාජපක්ෂ තානාපතිතුමාට පෙර ඒ රටේ සිටි තානාපතිතුමා අපට දුන් උපදේශයත් අරගෙන තමයි නැවත ගෘහ සේවිකාවන් යැවීම ආරම්භ කළේ.

ගෘහ සේවය සඳහා ගිය අපේ නංගිලා, මල්ලිලා දෙසීය ගණනක් ජෝර්දානයේ safe house එකේ ඉන්නවා. හැබැයි ඒ ළමයින්ගෙන් සමහර උදවියව එළියට ගැනීම සඳහා අවශ්‍ය කටයුතු අපි කරලා තිබෙනවා. පසු ගිය මාසයේත් 30ක් ආපහු ආවා. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ලංකාවේ ඉන්න සමහර ව්‍යාපාරික මහත්වරු ඒ රටවල garment factories විවෘත කරලා තිබෙනවා. ඒ නිසා ඒ safe house එකේ ඉන්න අයට ඒ garment factoriesවල මහත්වරු හරහා එහේ ඉන්න කාලය ඇතුළත යම් කිසි ආදායමක් ලබා දීමේ වැඩ පිළිවෙළකටත් තාවකාලිකව අපි ගිහිල්ලා තිබුණා. ඒ පිළිබඳවත් ඔය සමහර gigolosලා කරපු පැමිණිලි නිසා ඒකත් ඒ අයට අහිමි වෙලා තිබෙනවා. ඒ 26 දෙනෙක් ඒ රටේ කම්කරු අමාත්‍යාංශයට යොමු කරලා ඒ 26 දෙනා කම්කරු අමාත්‍යාංශය යටතේ නැවත ගෙන්වීමට වැඩ පිළිවෙළකුත් ක්‍රියාත්මක වෙනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඒ විතරක් නොවෙයි, ජෝර්දාන් රටේ safe house එකේ ඉන්න උදවියට හරියට කන්න දෙන්නේ නැහැ, හරියට බොන්න දෙන්නේ නැහැ කියලාත් මේ සමහර අය තැන් තැන්වල කෑ ගැහුවා. හැබැයි ඒ අයට තානාපතිතුමා කතා කරලා බැලුවාට පස්සේ මේ බලා ගන්නා කාලය තුළ ඉතාම හොඳින් කෑම දීලා ඔවුන්ව බලා ගන්නා බවටත් අවසානයේ ඒ කිව්ව මාධ්‍යම ප්‍රකාශ කළා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ මන්ත්‍රීතුමා කියනවා වාගේ ජෝර්දාන්වල ගෘහ සේවිකාවන් පිළිබඳව ප්‍රශ්නයක් තිබෙනවා. ඒ ප්‍රශ්නය පිළිබඳව ජෝර්දාන් රටේ කම්කරු ඇමතිතුමා එක්ක අපි සාකච්ඡා කළා. ඒ සාකච්ඡාවේ පසු සාකච්ඡාව ගිය සුමානයේ අපි ලංකාවේදී කරන්න හිටියා, ජෝර්දාන් අගමැතිතුමා එක්ක කම්කරු ඇමතිතුමා එන වෙලාවේ. නමුත් ඒ ගමන cancel වුණා. මම ඊළඟ සුමානයේ නැවත ජෝර්දාන් රටට යනවා. ගිහිල්ලා ඒ ප්‍රශ්නය විසඳා ගන්න බැරි නම් අපි අනිවාර්යයෙන්ම ගෘහ සේවිකාවන් ජෝර්දානයට යැවීම තහනම් කරන්න සූදානමෙන් ඉන්නේ. හැබැයි එහෙම කරන්නේ ඒ අයට තිබෙන අයිතිවාසිකම් පිළිබඳව අපිත් එක්ක තිබෙන සාකච්ඡාවේ ප්‍රතිඵලය අනුවයි.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඒ නිසා මේ වෙන කොට ජෝර්දාන් රටේ තිබෙන ඔය ප්‍රශ්නය සඳහා අපේ අමාත්‍යාංශය කරන්න පුළුවන් උපරිම මැදිහත් වීම කරලා තිබෙනවා. මන්ත්‍රීතුමා කිව්වා මට තරහා යනවා කියලා. මට තරහා යන්නේ නැහැ. මොකද හේතුව ප්‍රශ්න ඇහුවත් මම උත්තර දෙනවා. ප්‍රශ්න අහන්නේ නැතිව තැන් තැන්වල කෑ ගැහුවත් මම උත්තර දෙනවා.

## අලුත්ගම - ගාල්ල දුම්රිය මාර්ගය : විස්තර
அளுத்கம - காலி புகையிரத வீதி அபிவிருத்தி: விபரம்
ALUTHGAMA-GALLE RAILWAY TRACK : DETAILS

1927/'11

8. **ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
ප්‍රවාහන අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) අලුත්ගම සිට ගාල්ල දක්වා දිවෙන දුම්රිය මාර්ගය අලුත්වැඩියා කිරීමේ කටයුතු භාර දී ඇති ආයතනයේ නම කුමක්ද;

(ii) එකී ආයතනය අයත් රට කුමක්ද;

(iii) එම අලුත්වැඩියා කටයුතු සඳහා වෙන් කර ඇති ඇස්තමේන්තුගත මුදල කොපමණද;

(iv) එකී දුම්රිය මාර්ගයේ අලුත්වැඩියා කටයුතු අවසන් කරන දිනය කවරේද;

(v) එම දුම්රිය මාර්ගයේ සංවර්ධන කටයුතු අවසන් කිරීමේදී වැය වේ යැයි අපේක්ෂිත මුදල කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) අලුත්ගම සිට ගාල්ල දක්වා දුම්රිය මාර්ග අලුත්වැඩියා කොන්ත්‍රාත්තුව ලබා දීමේදී ටෙන්ඩර් කැඳවීමක් සිදු කර තිබේද;

(ii) එසේ නම්, ඒ සඳහා ලැබුණු ටෙන්ඩර් ඉල්ලුම් පත් සංඛ්‍යාව කොපමණද;

(iii) ටෙන්ඩර් ඉල්ලුම් පත් ඉදිරිපත් කළ අයගේ නම් සහ ලිපිනයන් කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?#

போக்குவரத்து அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) அளுத்கம முதல் காலி வரையிலான புகையிரத வீதியை திருத்தும் நடவடிக்கை ஒப்படைக்கப் பட்டுள்ள நிறுவனத்தின் பெயர் யாது;

(ii) மேற்படி நிறுவனம் எந்த நாட்டிற்கு சொந்த மானது;

(iii) மேற்படி திருத்த வேலைகளுக்காக ஒதுக்கப் பட்டுள்ள மதிப்பீட்டுத் தொகை எவ்வளவு;

[ගරු දයාසිරි ජයසේකර මහතා]

(iv) மேற்படி புகையிரத வீதியின் அபிவிருத்திப் பணிகள் பூர்த்தி செய்யப்படும் திகதி யாது;

(v) மேற்படி புகையிரத வீதியின் அபிவிருத்திப் பணிகள் பூர்த்தி செய்யப்படுகின்ற போது செலவாகுமென எதிர்பார்க்கப்படும் பணத்தொகை எவ்வளவு

என்பதை அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) (i) அளுத்கம முதல் காலி வரையிலான புகையிரத வீதியின் திருத்தப் பணிகளுக்கான ஒப்பந்தத்தை வழங்குகின்றபோது கேள்விப்பத்திரம் கோரப் பட்டதா என்பதையும்;

(ii) ஆமெனில், அதற்கு கிடைத்த கேள்விப் பத்திரங்களின் எண்ணிக்கை யாதென்பதையும்;

(iii) கேள்விப்பத்திரங்களை சமர்ப்பித்தவர்களின் பெயர்கள் மற்றும் முகவரிகள் யாவை யென்பதையும்

அவர் குறிப்பிடுவாரா?

(இ) இன்றேல், ஏன்?

asked the Minister of Transport:

(a) Will he inform this House -

(i) the name of the institution to which the repair work of the railway track between Aluthgama and Galle has been assigned ;

(ii) the name of country to which that institution belongs ;

(iii) the estimated amount allocated for the above mentioned repair work ;

(iv) the date on which the repair work of the aforesaid railway track will be completed ; and

(v) the amount of money expected to be spent at the completion of the development work of the aforesaid railway track?

(b) Will he state-

(i) whether tenders had been called for awarding the contract for repair work of the railway track from Aluthgama to Galle ;

(ii) if so, the number of tenders that were received ; and

(iii) the names and addresses of the persons who submitted the tenders?

(c) If not, why?

**ගරු කුමාර වෙල්ගම මහතා (ප්‍රවාහන අමාත්‍යතුමා)**
(மாண்புமிகு குமார வெல்கம - போக்குவரத்து அமைச்சர்)
(The Hon. Kumara Welgama - Minister of Transport)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මා එම ප්‍රශ්නයට පිළිතුර දෙනවා.

(අ) (i) කළුතර සිට ගාල්ල දක්වා අලුත්වැඩියා කටයුතු සඳහා භාර දී ඇත්තේ ඉන්දියානු IRCON සමාගම වෙතය.

(ii) ඉන්දියාව.

(iii) ඇමෙරිකන් ඩොලර් මිලියන 53.3යි.

(iv) 2012 අප්‍රේල් මස අවසානයේදී.

(v) සම්පූර්ණ ව්‍යාපෘතිය වෙනුවෙන් ඇමෙරිකානු ඩොලර් මිලියන 89.5ක් පමණ වැය වේ යැයි අපේක්ෂිතය.

(ආ) (i) නැත.

මෙය ඉන්දියානු රජය හා ශ්‍රී ලංකා රජය අතර අවබෝධතා ගිවිසුමකින් ඉන්දියානු රජයට අනුබද්ධිත ආයතනයක් වන IRCON සමාගමට පවරා ඇත.

(ii) අදාළ නොවේ.

(iii) අදාළ නොවේ.

(ඇ) අදාළ නොවේ.

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
ගරු ඇමතිතුමනි, මගේ මතකයේ හැටියට මෙය ඔබතුමන්ලාගේ වැඩ පිළිවෙළේ සඳහන්ව තිබුණේ පැයට කිලෝ මීටර් 100ක වේගයකින් යන්න පුළුවන් වන විධියට හදන්න බලාපොරොත්තු වනවා කියායි.

**ගරු කුමාර වෙල්ගම මහතා**
(மாண்புமிகு குமார வெல்கம)
(The Hon. Kumara Welgama)
ඇත්ත, ඇත්ත.

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
පළමුවැනි අතුරු ප්‍රශ්නය.

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
ඔව්, පළමුවැනි අතුරු ප්‍රශ්නය. ඔබතුමාම දන්නවා, මේ ආයතනයත් එක්ක ගනුදෙනු කරන කොට වෙනදා අපි සාමාන්‍ය විධියට ටෙන්ඩර් කැඳවලා කොන්ත්‍රාත් දුන්නා වාගේ කළා නම් යම් කිසි විධියකට කොන්දේසි සහිතව මෙය ඉෂ්ට කරන්න තිබුණා කියලා. මේ වන විට ඇති වෙලා තිබෙන තත්ත්වය අද ඔබතුමා දන්නවා. විශේෂයෙන් සංඥා -signal- ක්‍රමවේදයේ විශාල ප්‍රශ්නයක් තිබෙනවා. ඒ නිසා දැන් යන්නේ pilot ක්‍රමයකට. ඒ කියන්නේ එක එක අය කොඩි ගෙනැල්ලා උස්සලා තමයි දැන් මේ වැඩ කටයුතු ටික කර ගෙන යන්නේ.

ඒ විතරක් නොවෙයි, දුම්රිය වේදිකාව පිළිබඳව ලොකු ප්‍රශ්නයක් තිබෙනවා. ඒක ඔබතුමා දන්නවා ඇති. සාමාන්‍යයෙන් නඟින්න බහින්න තිබෙන ප්‍රමාණයට වැඩිය ලොකු ප්‍රශ්නයක් දුම්රිය වේදිකාව ඇතුළේ තිබෙනවා. ඒ වාගේම railway crossings, ඒ කියන්නේ හරස් මාර්ග -level crossings - පිළිබඳව ලොකු ප්‍රශ්නයක් තිබෙනවා. ඉතින්, ඒ ප්‍රශ්න තුනටම තවමත් විසඳුමක් ලැබිලා නැහැ. ඒ නිසා තමයි දැන් මෙය ලොකු ප්‍රශ්නයක් බවට පත් වෙලා තිබෙන්නේ.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඒ වාගේම දුම්රිය ස්ථාන ටික පිළිසකර කිරීම් මේ සියල්ල දැන් කරන්න සිද්ධ වෙලා තිබෙන්නේ අපේ දුම්රිය දෙපාර්තමේන්තුවට. සමස්ත වැඩ පිළිවෙළම ඒ ඉන්දියානු ආයතනයට දෙන්නේ නැතුව ඒ මාර්ගය විතරක් අලුත්වැඩියා කරන්න දීලා ඉතුරු වැඩ ටික අපේ ආණ්ඩුව භාර අරගෙන දැන් අපි ලොකු අමාරුවක වැටිලා සිටින බව ඔබතුමා පිළිගන්නවාද? නැත්නම් ඒ කටයුතුත් මේ ආයතනයටම දීලා අවසන් කරන්න යම් කිසි විධියේ වැඩ පිළිවෙළක් ඔබතුමන්ලා සකස් කරනවාද, මේ අපේක්ෂිත මුදල් ප්‍රමාණය මත?

**ගරු කුමාර වෙල්ගම මහතා**
(மாண்புமிகு குமார வெல்கம)
(The Hon. Kumara Welgama)
අපි අමාරුවේ වැටිලා නම් නැහැ. ඒක පළමුවෙන්ම කියන්න ඕනෑ.

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
හොඳයි.

**ගරු කුමාර වෙල්ගම මහතා**
(மாண்புமிகு குமார வெல்கம)
(The Hon. Kumara Welgama)
මෙහි අඩු පාඩුකම් තිබෙනවා. මම නැහැයි කියලා කියන්නේ නැහැ.

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
ඔබතුමා නොවෙයි අමාරුවේ වැටෙන්නේ, අනෙක් කට්ටිය.

**ගරු කුමාර වෙල්ගම මහතා**
(மாண்புமிகு குமார வெல்கம)
(The Hon. Kumara Welgama)
නැහැ, නැහැ. අනෙක් කට්ටිය අමාරුවේ වැටෙනවායි කියලා කියන්නේ මාත් අමාරුවේ වැටෙන එක නේ.

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
කෝච්චියට අහු වෙලා වැටෙන කට්ටිය.

**ගරු කුමාර වෙල්ගම මහතා**
(மாண்புமிகு குமார வெல்கம)
(The Hon. Kumara Welgama)
අනෙක් අය අමාරුවේ වැටෙනවා කියන්නේ මමත් ඒකට වග කියන්න එපා යැ.

නමුත් මෙකේ එකක් තිබෙනවා. මේ මාර්ගය හැදුවේ පැයට කිලෝමීටර් 100ක වේගයෙන් යන්න බව ඇත්ත. නමුත් මෙතුමා කිව්ව විධියට දුම්රිය හරස් මාර්ග පිළිබඳ ප්‍රශ්නයක් තිබෙනවා. Stations දික්කරන කතන්දර මෙකට අදාළ නැහැ. දුම්රිය stations දික් කරනවා කියලා කියන්නේ double set එක දාන එක. නැත්නම් ඕනෑ නැහැ.

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
නැහැ, දික් කරන්න නොවෙයි.

**ගරු කුමාර වෙල්ගම මහතා**
(மாண்புமிகு குமார வெல்கம)
(The Hon. Kumara Welgama)
පොඩ්ඩක් ඉන්න. මන්ත්‍රීතුමා වාඩි වෙන්න. Single set එක යන කොට ඕනෑ නැහැ. Double set එක යන කොට ටිකක් overshoot වෙනවා. ඒක නැහැ කියලා කියන්නේ නැහැ. එතකොට ඒ මඟීන් බහිනවා. ඒකේ ගැටලුවක් ඇති වන්නේ නැහැ. මෙකේ තිබෙන්නේ ප්‍රධාන ගැටලු දෙකයි. මම ඒක පිළිගන්නවා. මෙතුමා කියපු විධියට සිග්නල් ක්‍රමවේදයේ අඩු පාඩුකම් තිබෙනවා. ඒ මොකද, හුඟක් පරණ සිග්නල් ක්‍රමවේදයක් තිබෙන්නේ. අපි දැන් ඒක කර ගෙන යනවා. අර pilot කර කර යනවායි කියන එක කරන්නේ නැහැ. හදිසි අවස්ථාවකදී, විදුලිය නැත්නම් අන්න pilot කරන ක්‍රමයක් තිබෙනවා. ඒක හරි. නමුත් හැම දාම විදුලිය නැති වෙන්නේ නැහැ. දැනට දුම්රිය ගමන් කරනවා, වෙනදා විධියට. අලුත් සිග්නල් ක්‍රමයකට අපි දැන් යනවා. ඒකට ගියාට පස්සේ මේ ප්‍රශ්නය ඇති වන්නේ නැහැ.

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
මගේ ප්‍රශ්නය වුණේ ඒකත් මේ ව්‍යාපෘතියේදී ක්‍රියාත්මක වනවාද කියන එකයි.

**ගරු කුමාර වෙල්ගම මහතා**
(மாண்புமிகு குமார வெல்கம)
(The Hon. Kumara Welgama)
ඒක මේ ව්‍යාපෘතියට ඇතුළත් වෙලා තිබුණේ නැහැ. මේ ව්‍යාපෘතියට ඇතුළත් වෙලා තිබුණේ ඒ දුම්රිය මාර්ගය හදන්නයි, අලුතෙන් ගෙනා setවල sheds ටික හදන්නයි. අලුත්ගම sheds ටික හදනවා. ඒක හරි. දුම්රිය මාර්ග පද්ධතිය අලුත්වැඩියා කරන්න තමයි තිබුණේ. නමුත් සිග්නල් පද්ධතියේ වැඩ අපි කර ගෙන යනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මන්ත්‍රීතුමා නඟපු වැදගත් ප්‍රශ්නයක් තිබෙනවා. ඒ තමයි හරස් මාර්ග. දුම්රිය හරස් මාර්ග නැති නිසා හුඟක් accidents සිද්ධ වෙනවා. ඊයේ පෙරේදාත් වාද්දුවේ accident එකක් සිද්ධ වුණා. මේ ව්‍යාපෘතියට මෙය ඇතුළත් වෙලා තිබුණේ නැහැ. නමුත් අපි දැන් ආණ්ඩුවෙන් රුපියල් මිලියන 1,000ක් වෙන් කරලා tender call කරලා තිබෙනවා, මාතර සිට කොළඹට එන තෙක් සියලුම ගේට්ටු ටික Bell and Light ක්‍රමයට දමන්න. දැන් අපි ඒ කාර්යය කර ගෙන යන්න කටයුතු හරිගස්සලා තිබෙනවා. දැන් ඒකේ tender close කරලාත් ඉවරයි. මා හිතන හැටියට මේ අවුරුද්ද අවසාන වන කොට අපට ඒ කටයුතු කරන්න පුළුවන්කම ලැබෙයි. ඒක තමයි අපට තිබෙන ලොකුම ගැටලුව. දුම්රියට පැයට කිලෝමීටර් 100ක වේගයෙන් එන්න බැහැ. මොකද, හැම ගේට්ටුවක් ළඟදීම දුම්රිය slow කරන්න ඕනෑ. Slow කළේ නැත්නම් accidents සිද්ධ වනවා. ඒකයි, signal ක්‍රමයයි හරිගස්සන්න ඕනෑය කියන එක මා මේ සභාවේදී පිළිගන්නවා.

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
ගරු ඇමතිතුමා, ඒක තමයි මා කියන්නේ. ඉන්දියානු ආණ්ඩුවත් එක්ක තිබෙන යම් කිසි අවබෝධතා ගිවිසුමක් මත මේ දුම්රිය මාර්ගය හැදුවා නම් ඒ සඳහා යන මුදල් ටික මේ සමාගම්වලට අපි ආපසු ගෙවන්න එපා යැ. මා ඔබතුමාගෙන් අහනවා, ගලවපු රේල් පීලි කොහේද තිබෙන්නේ කියලා. අපට ආරංචි වුණු හැටියට ගලවපු රේල් පීලිත් මෙයට පාවිච්චි කරලා තිබෙනවා, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. මගේ ප්‍රශ්නය මෙකයි. මෙකේ තිබෙන signal ටික හදන්න ආණ්ඩුවෙන් ආපසු රුපියල් මිලියන 1,000ක් වැය කරනවා.

**ගරු කුමාර වෙල්ගම මහතා**
(மாண்புமிகு குமார வெல்கம)
(The Hon. Kumara Welgama)
නැහැ. Signal නොවෙයි, ගේට්ටු.

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
මා කියන්නේ, අලුත්ගම සිට මාතර දක්වා මාර්ගය හදන්න දෙන කොට අඩුම තරමේ මේ සමස්ත වැඩ පිළිවෙළම - Railway crossings ආදිය- ඒකට ඇතුළත් වන විධියේ වැඩ පිළිවෙළක් තිබෙන්න තිබුණා කියලායි. දැන් භාගයක් ආණ්ඩුවෙන් දමන්නයි, භාගයක් ඉන්දියාවෙන් දමන්නයි නොවෙයි නේ කරන්න තිබුණේ. ඇමතිතුමනි, ඔබතුමාගේ ප්‍රශ්නයක් නොවෙයි මා මේ කියන්නේ. නමුත් මේක මාර්ගය හදන්න දීමේදී සිද්ධ වුණු කාරණයක්. එතකොට දැන් ඔබතුමාම බලන්න. ඔබතුමා සාමාන්‍යයෙන් කෝච්චිවල, බස්වල නැඟලා යන කෙනෙක්. වෙන දා සාමාන්‍ය විධියට 7.50ට කළුතරින් පිටත් වන train එක 8.10 වනකොට කොළඹට සෙනඟ අරගෙන ආවා. දැන් හැම දාම තවත් විනාඩි 30ක් විතර ප්‍රමාද වෙලා තමයි එන්නේ. අපි කථා කළාට වැඩක් නැහැ. මේක පටන් ගන්න කොට කිව්වේ, වේගය පැයට කිලෝමීටර් 100යි කියලායි. නමුත් දැන් මේ මාර්ගය හැදුවාට පස්සේ සිද්ධ වෙලා තිබෙන්නේ කලින් ගත වුණු වෙලාවටත් වඩා වැඩි වෙලාවක් ගත වන එකයි. මේක ලොකු ප්‍රශ්නයක් බවට පත් වෙලා තිබෙනවා. මා ඒකයි ඇමතිතුමාගෙන් අහන්නේ, මේ සම්බන්ධව ඔබතුමා ගන්නා ක්‍රියා මාර්ගය කුමක්ද කියලා. යනකොටත් මේ තත්ත්වයම ඇති වෙලා තිබෙනවා. කොළඹ ඉඳලා මාතරට යනකොට රාත්‍රි අටහමාර, නවය විතර වනවා. ඉතින් මේක ලොකු ප්‍රශ්නයක්.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මඟී ජනතාව කියන්නේ තිබුණු එක තිබුණා නම් මීට වඩා හොඳයි කියලායි. වේගය පැයට කිලෝමීටර් 100 කරන්න ගිහිල්ලා තිබුණු එකත් දැන් නැති වෙලායි තිබෙන්නේ. මා ඔබතුමාගෙන් අහන්නේ මේකට ස්ථිර විසඳුමක් විධියට ඔබතුමා කරන්නේ මොකක්ද කියලායි.

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
අපේ මන්ත්‍රීතුමා අලුතින් අපේ පැත්තටත් කෝච්චියෙන් යන්න පටන් ගෙන තිබෙනවා.

**ගරු කුමාර වෙල්ගම මහතා**
(மாண்புமிகு குமார வெல்கம)
(The Hon. Kumara Welgama)
ඒ පැත්තේ මොකුත් සම්බන්ධයක් නැහැ නේ.

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
ඒක තමයි මමත් බැලුවේ. එහේ සම්බන්ධයක් නැහැ.

**ගරු කුමාර වෙල්ගම මහතා**
(மாண்புமிகு குமார வெல்கம)
(The Hon. Kumara Welgama)
එහේට යන්න එපා. මා ඉන්නවා, ඒ පැත්තේ. අපි දෙන්නාටම බැහැ. [බාධා කිරීමක්] ඔබතුමා ඒ පැත්ත බලා ගන්න. මා මගේ පැත්ත බලා ගන්නම්.

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
මේ ගාල්ල පැත්තෙන් කියන්නේ වෙන කථාවක්.

**ගරු කුමාර වෙල්ගම මහතා**
(மாண்புமிகு குமார வெல்கம)
(The Hon. Kumara Welgama)
ගාල්ල පැත්තේවත් බැහැ. දකුණේ මම ඉන්නවා. ඔබතුමා වයඹ පැත්ත බලා ගන්න.

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
දකුණට ජනාධිපතිතුමා ඉන්නවානේ. මොකටද ඔබතුමා දකුණ ගැන බලන්නේ?

**ගරු කුමාර වෙල්ගම මහතා**
(மாண்புமிகு குமார வெல்கம)
(The Hon. Kumara Welgama)
ජනාධිපතිතුමා ඉන්නවා. මමත් ඉන්නවා ඊට පහළින්.

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
හරි. ඒ පොඩි පොඩි ඒවා. ඒවා එච්චර අදාළ කාරණා නොවෙයි.

**ගරු කුමාර වෙල්ගම මහතා**
(மாண்புமிகு குமார வெல்கம)
(The Hon. Kumara Welgama)
කවුද දැන් යන්නේ ලොකු ලොකු ඒවාට? [බාධා කිරීම්] ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මෙතුමා කියන එක හරි. මෙතුමා කියන එක මා පිළිගන්නවා. මොකද, පසු ගිය දවස්වල දුම්රිය ප්‍රමාද වුණා. නමුත් ඒක හැමදාම සිද්ධ වෙන්නේ නැහැ. ඉදිරි සුමාන කිහිපයේදී ඒ වැරදි හදා ගෙන අපි දුම්රිය ධාවනය කරවනවා මීට වැඩිය ඉක්මනින්.

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
සතියකින්?

**ගරු කුමාර වෙල්ගම මහතා**
(மாண்புமிகு குமார வெல்கம)
(The Hon. Kumara Welgama)
සති දෙකකින් වැඩේ කරනවා. මොකද, දුම්රිය ගේට්ටු දමන්න ඕනෑ. එතකොට signals ටික හදන්න ඕනෑ. ඒ ටික හදනකම් හෝ ඔබතුමා කියන විධියට පුළුවන් තරම් ඉක්මනින් ගෙන යන්න දැන් සැලසුම් කරලා තියෙනවා.

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
ඒක තමයි මම ඇහුවේ. එතකොට එතැනින් පස්සේ සියයේ වේගයෙන් යන්න පුළුවන්ද?

**ගරු කුමාර වෙල්ගම මහතා**
(மாண்புமிகு குமார வெல்கம)
(The Hon. Kumara Welgama)
සියයට යන්න බැහැ. සියයට යන්නේ කොහොමද ගේට්ටු ටික දමන්නේ නැතිව. සියයට කෙසේ වෙතත් අසූවට යන්න පුළුවන්.

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
ප්‍රශ්න අංක 9, ගරු බුද්ධික පතිරණ මහතා.

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, තුන්වැනි අතුරු ප්‍රශ්නය ඇහුවේ නැහැ.

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
තුන්වැනි අතුරු ප්‍රශ්නය ඇහුවා, සියයට යන්න පුළුවන්ද කියලා. උත්තරය "බැහැ" කියලා කිව්වා. [බාධා කිරීමක්] ගරු මන්ත්‍රීතුමනි, දැන් වේලාව පස් වරු 2.00යි. ප්‍රශ්නවලට වෙන් කළ කාලයෙන් තව විනාඩි පහයි තිබෙන්නේ. ප්‍රශ්න 10ක් අහන්න තිබෙනවා.

ප්‍රශ්න අංක 9 - 1643/'11 - (1), ගරු බුද්ධික පතිරණ මහතා.

**ගරු බුද්ධික පතිරණ මහතා**
(மாண்புமிகு புத்திக பதிரண)
(The Hon. Buddhika Pathirana)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මා එම ප්‍රශ්නය අහනවා.

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අධ්‍යාපන ඇමතිතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර දීම සඳහා සති දෙකක් කල් ඉල්ලනවා.

***ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.***
*வினாவை மற்றொரு தினத்திற் சமர்ப்பிக்கக் கட்டளையிடப்பட்டது.*
*Question ordered to stand down.*

## ශ්‍රී ලංකාවේ ගුවන් තොටු පොළවල් : ආදායම
## இலங்கையிலுள்ள விமான நிலையங்கள்: வருமானம்
## AIRPORTS IN SRI LANKA: REVENUE

1711/'11

11. **ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
සිවිල් ගුවන් සේවා අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1) :

(අ) (i) ශ්‍රී ලංකාවේ ඇති ගුවන් තොටු පළ සංඛ්‍යාව කොපමණද;
(ii) ශ්‍රී ලාංකික ගුවන් සේවා නීතියට අනුව දැනට ශ්‍රී ලංකාවේ ලියාපදිංචි කර ඇති ගුවන් යානා සංඛ්‍යාව කොපමණද;
(iii) එම ලියාපදිංචි කර ඇති එක් එක් ගුවන් යානයේ නිෂ්පාදිත වර්ෂය කුමක්ද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) වර්ෂ 2006 සිට 2011 දක්වා ලියාපදිංචි කළ ගුවන් සේවා මඟින් රජය විසින් උපයන ලද ආදායම කොපමණද;

(ඇ) වර්ෂ 2006 සිට 2011 දක්වා ශ්‍රී ලංකාවේ ඇති ගුවන් තොටු පළවල් හරහා,
(i) ඇතුළු වූ හා පිට වූ මගීන් සංඛ්‍යාව කොපමණද;
(ii) එහා මෙහා යැවූ භාණ්ඩ ප්‍රමාණය කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) වර්ෂ 2006 සිට 2011 දක්වා එම ගුවන් තොටු පළවල් මඟින් රජය විසින් උපයන ලද ආදායම කොපමණද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඉ) නොඑසේ නම්, ඒ මන්ද?

சிவில் விமான சேவைகள் அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) இலங்கையிலுள்ள விமானநிலையங்களின் எண்ணிக்கையையும்;
(ii) இலங்கை விமான சேவைகள் சட்டத்தின் பிரகாரம் தற்பொழுது இலங்கையில் பதிவு செய்யப்பட்டுள்ள வானூர்திகளின் எண்ணிக்கை யையும்;
(iii) பதிவு செய்யப்பட்ட ஒவ்வொரு வானூர்தியின் உற்பத்தி செய்யப்பட்ட ஆண்டையும்

அவர் இச்சபைக்குத் தெரிவிப்பாரா?

(ஆ) 2006 இலிருந்து 2011 வரை பதிவு செய்யப்பட்ட விமானச் சேவை மூலம் அரசாங்கம் சம்பாதித்த வருமானம் எவ்வளவு என்பதை அவர் இச்சபைக்குத் தெரிவிப்பாரா?

(இ) 2006 இலிருந்து 2011 வரை,
(i) இலங்கையிலுள்ள விமான நிலையங்கள் ஊடாக உள்ளே, வெளியே சென்ற பயணிகளின் எண்ணிக்கையையும்;
(iii) இவ்விமான நிலையங்கள் வழியாக கொண்டு செல்லப்பட்ட சரக்குகளின் அளவையும்

அவர் கூறுவாரா?

(ஈ) 2006 இலிருந்து 2011 வரை விமான நிலையங்கள் மூலம் அரசாங்கம் சம்பாதித்த வருமானம் எவ்வளவு என்பதை அவர் கூறுவாரா?

(உ) இன்றேல், ஏன்?

asked the Minister of Civil Aviation:

(a) Will he inform this House-
(i) the number of airports in Sri Lanka;
(ii) the number of aircraft registered in Sri Lanka at present as per the Law; and
(iii) the year of manufacture of each of the registered aircraft?

(b) Will he state the revenue earned by the Government through the registered airlines for the years 2006 to 2011?

(c) Will he state-
(i) the throughput of passengers moved in and out of the airports in Sri Lanka; and

[ගරු රවි කරුණානායක මහතා]

(ii) the throughput of cargo that moved through the airports in Sri Lanka for the years 2006 to 2011?

(d) Will he state the revenue earned by the Government through the above airports for the years 2006 to 2011 ?

(e) If not, why?

**ගරු පියංකර ජයරත්න මහතා (සිවිල් ගුවන් සේවා අමාත්‍යතුමා)**
(மாண்புமிகு பியங்கர ஜயரத்ன - சிவில் விமானச் சேவைகள் அமைச்சர்)
(The Hon. Piyankara Jayaratne - Minister of Civil Aviation)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, එම ප්‍රශ්නයට පිළිතුර මා **සභාගත*** කරනවා.

**** සභාමේසය මත තබන ලද පිළිතුර:***
** சபாபீடத்தில் வைக்கப்பட்ட விடை :*
** Answer tabled:*

(අ) (i) 13කි.

(ii) 48කි.

(iii) ඇමුණුම A පරිදි.

(ආ)

| **වර්ෂය** | **ගුවන්යානා ලියාපදිංචියෙන් (මුල් ලියාපදිංචියෙන්) රජය උපයන ලද ආදායම (රුපියල්)** |
|---|---|
| 2006 | 0 |
| 2007 | 34,500 |
| 2008 | 20,700 |
| 2009 | 41,400 |
| 2010 | 75,900 |
| 2011 | 110,400 |
| මුළු එකතුව | 282,900 |

(ඇ) ශ්‍රී ලංකාව තුළ පිහිටි ගුවන් තොටු පොළවල් 13න් සී/ස ගුවන් තොටු පොළ හා ගුවන් සේවා (ශ්‍රී ලංකා) සමාගම යටතේ අධීක්ෂණය හා ක්‍රියාත්මක වීම සිදු වන්නේ කටුනායක පිහිටි බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන් තොටු පොළේ සහ රත්මලාන ගුවන් තොටු පොළේ පමණි. (අනෙක් ගුවන් තොටු පොළවල් 11හි අධීක්ෂණය හා ක්‍රියාත්මක වීම ශ්‍රී ලංකා ගුවන් හමුදාව යටතේ සිදු වේ.) එබැවින්, පහත ප්‍රශ්න සඳහා බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන් තොටු පොළට සහ රත්මලාන ගුවන් තොටු පොළට අදාළව පමණක් පිළිතුරු සපයා ඇත.

(i) ඇමුණුම B පරිදි.

(ii) ඇමුණුම C පරිදි.

(ඈ) ඇමුණුම D පරිදි.

(ඉ) පැන නොනඟී.

**ඇමුණුම A**

| | **ගුවන් යානා වර්ගය** | **නිෂ්පාදිත වර්ෂය** |
|---|---|---|
| 01 | එයාර් බස් ඒ 320-232 | 2006 |
| 02 | එයාර් බස් ඒ 320-232 | 2005 |
| 03 | එයාර් බස් ඒ 320-214 | 2005 |
| 04 | එයාර් බස් ඒ 320-232 | 2004 |
| 05 | එයාර් බස් ඒ 320-214 | 2011 |
| 06 | එයාර් බස් ඒ 320-214 | 2011 |
| 07 | එයාර් බස් ඒ 320-214 | 2011 |
| 08 | එයාර් බස් ඒ 320-243 | 1999 |
| 09 | එයාර් බස් ඒ 320-243 | 1999 |
| 10 | එයාර් බස් ඒ 320-243 | 1999 |
| 11 | එයාර් බස් ඒ 320-243 | 2000 |
| 12 | එයාර් බස් ඒ 320-243 | 2001 |
| 13 | එයාර් බස් ඒ 320-243 | 2004 |
| 14 | එයාර් බස් ඒ 320-243 | 2002 |
| 15 | එයාර් බස් ඒ 340-311 | 1994 |
| 16 | එයාර් බස් ඒ 340-311 | 1994 |
| 17 | එයාර් බස් ඒ 340-311 | 1995 |
| 18 | එයාර් බස් ඒ 340-312 | 2000 |
| 19 | එයාර් බස් ඒ 340-312 | 2000 |
| 20 | එයාර් බස් ඒ 340-300 | 2001 |
| 21 | එයාර් බස් ඒ 320-232 | 1999 |
| 22 | එයාර් බස් ඒ 321-231 | 2007 |
| 23 | ඩී සී 8-63 එෆ් | 1969 |
| 24 | අයි එල් - 18 ජී ආර් එම් | 1967 |
| 25 | එෆ් - 27 - 500 | 1982 |
| 26 | එෆ් - 27 - 500 | 1982 |
| 27 | සෙස්නා 208 බී | 2011 |
| 28 | බෙල් 206 ජෙට් රේන්ජර් | 1990 |
| 29 | ජී ඒ 8 ගිප්ස් එයිරෝ | 2006 |
| 30 | සෙස්නා 152 | 1978 |
| 31 | පයිපර් සෙනෙකා II | 1977 |
| 32 | සෙස්නා 152 | 1979 |
| 33 | සෙස්නා 152 | 1978 |
| 34 | රොබින්සන් ආර් 44 හෙලිකොප්ටර් | 2000 |
| 35 | ලිකොප්ටර් | 2000 |
| 35 | සෙස්නා 152 | 1979 |
| 36 | පයිපර් සෙනෙකා | 1977 |
| 37 | සෙස්නා 404 | 1981 |
| 38 | බෙල් 412 | 1985 |
| 39 | බෙල් 412 | 1985 |
| 40 | එම් ඒ 60 | 2008 |
| 41 | එම් ඒ 60 | 2008 |
| 42 | එරෝකොප්ටර් - ඒ එස් - 350 - බී 3 | 2011 |
| 43 | එරෝකොප්ටර් - ඒ එස් - 350 - බී 3 | 2011 |
| 44 | සෙස්නා 152 | 1980 |
| 45 | සෙස්නා 152 | 1983 |
| 46 | සෙස්නා 152 | 1981 |
| 47 | සෙස්නා 152 | 1979 |
| 48 | බීච් බරෝන් සී 55 | 1966 |

ඇමුණුම B

බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන් තොටු පොළ (කටුනායක) :

| වර්ෂය | මගීන් සංඛ්‍යාව (ජාත්‍යන්තර) | | එකතුව |
|---|---|---|---|
| | පැමිණීම (ඇතුළුවූ) | පිටවීම (පිටවූ) | |
| 2006 | 2,377,988 | 2,420,286 | 4,798,274 |
| 2007 | 2,455,558 | 2,443,333 | 4,898,891 |
| 2008 | 2,334,089 | 2,308,742 | 4,642,831 |
| 2009 | 2,106,318 | 2,136,044 | 4,242,362 |
| 2010 | 2,608,102 | 2,651,546 | 5,259,648 |
| 2011 | 3,056,971 | 3,088,561 | 6,145,532 |

රත්මලාන ගුවන් තොටු පොළ :

| වර්ෂය | මගීන් සංඛ්‍යාව (ගෘහස්ථ) | | එකතුව |
|---|---|---|---|
| | පැමිණීම (ඇතුළුවූ) | පිටවීම (පිටවූ) | |
| 2006 | 15,919 | 17,044 | 32,963 |
| 2007 | 52,978 | 37,581 | 90,560 |
| 2008 | 59,741 | 55,315 | 115,056 |
| 2009 | 41,962 | 43,273 | 85,235 |
| 2010 | 1,848 | 1,604 | 3,452 |
| 2011 | 2,081 | 2,085 | 4,166 |

**ඇමුණුම C**

බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන් තොටු පොළ (කටුනායක) :

| වර්ෂය | භාණ්ඩ ප්‍රවාහනය - ජාත්‍යන්තර (මෙට්‍රික් ටොන්) | | එකතුව (මෙට්‍රික් ටොන්) |
|---|---|---|---|
| | අපනයන | ආනයන | |
| 2006 | 108,903 | 62,004 | 170,907 |
| 2007 | 103,659 | 59,911 | 163,570 |
| 2008 | 97,609 | 54,345 | 151,954 |
| 2009 | 90,633 | 48,051 | 138,684 |
| 2010 | 107,039 | 60,091 | 167,130 |
| 2011 | 102,710 | 65,869 | 168,579 |

රත්මලාන ගුවන් තොටු පොළ :

| වර්ෂය | භාණ්ඩ ප්‍රවාහනය - ගෘහස්ථ (කිලෝ ග්‍රෑම්ස්) |
|---|---|
| 2008 | 719,002 |
| 2009 | 458,685 |
| 2010 | 7,006 |
| 2011 | නැත |

**ඇමුණුම D**

2006 සිට 2011 දක්වා බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන් තොටු පොළින් හා රත්මලාන ගුවන් තොටු පොළින් උපයන ලද ආදායම (රුපියල්) :

| වර්ෂය | බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන්තොටුපොළ | රත්මලාන ගුවන්තොටුපොළ | එකතුව |
|---|---|---|---|
| 2006 | 4,994,772,748 (මිලියන හාර දහස් නවසිය අනූ හතරයි, හත් ලක්ෂ හැත්තෑ දෙදහස් හත්සිය හතළිස් අටයි) | 11,764,803 (මිලියන එකොළහයි, හත් ලක්ෂ හැට හතර දහස් අටසිය තුනයි) | 5,006,537,551 (මිලියන පන් දහස් හයයි, පන් ලක්ෂ තිස් හත් දහස් පන්සිය පනස් එකයි) |
| 2007 | 6,166,439,072 (මිලියන හය දහස් එකසිය හැට හයයි, හාර ලක්ෂ තිස්නව දහස් හැත්තෑ දෙකයි) | 32,156,860 (මිලියන තිස් දෙකයි, එක් ලක්ෂ පනස් හය දහස් අටසිය හැටයි) | 6,198,595,932 (මිලියන හය දහස් එකසිය අනූ අටයි, පන් ලක්ෂ අනූපන් දහස්නවසිය තිස් දෙකයි) |
| 2008 | 6,786,739,518 (මිලියන හය දහස් හත්සිය අසූ හයයි, හත් ලක්ෂ තිස්නව දහස් පන්සිය දහඅටයි.) | 58,358,422 (මිලියන පනස් අටයි, තුන් ලක්ෂ පනස් අට දහස් හාරසිය විසි දෙකයි) | 6,845,097,940 (මිලියන හය දහස් අටසිය හතළිස් පහයි, අනූ හත් දහස් නවසිය හතළිහයි.) |
| 2009 | 6,754,687,015 (මිලියන හයදහස් හත්සිය පනස් හතරයි, හය ලක්ෂ අසූ හත් දහස් පහළොවයි.) | 41,523,467 (මිලියන හතළිස් එකයි, පන් ලක්ෂ විසි තුන් දහස් හාරසිය හැට හතයි.) | 6,796,210,482 (මිලියන හය දහස් හත්සිය අනූ හයයි, දෙලක්ෂ දහ දහස් හාරසිය අසූ දෙකයි) |
| 2010 | 7,805,006,724 (මිලියන හත් දහස් අටසිය පහයි, හය දහස් හත්සිය විසි හතරයි.) | 6,420,532 (මිලියන හයයි, හාර ලක්ෂ විසි දහස් පන්සිය තිස් දෙකයි) | 7,811,427,256 (මිලියන හත් දහස් අටසිය එකොළහයි, හාර ලක්ෂ විසි හත් දහස් දෙසිය පනස් හයයි) |
| 2011 | 9,456,313,484 (මිලියන නව දහස් හාරසිය පනස් හයයි, තුන් ලක්ෂ දහතුන් දහස් හාරසිය අසූ හතරයි) | 7,318,618 (මිලියන හතයි, තුන් ලක්ෂ දහඅට දහස් හයසිය දහඅටයි) | 9,463,632,102 (මිලියන නව දහස් හාරසිය හැට තුනයි, හය ලක්ෂ තිසි දෙදහස් එකසිය දෙකයි) |

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
ගරු රවි කරුණානායක මහතා.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, -

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
මයික් එක දමන්නකෝ.

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
ගරු රවි කරුණානායක මහතා.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ පාර්ලිමේන්තුවේ ඔබතුමා නම කියන්නම ඕනෑ ද මයික් එක දමන්න? මේක පුදුම තැනක් නේ.

ගරු ඇමතිතුමනි, සාමාන්‍යයෙන් ගුවන් තොටුපොළවල් ඇති කරන්නේ යම් විධියකින් මිනිස්සු ගමන් කරන තැන්වලටයි. නමුත් මත්තල ගුවන් තොටුපොළක් අරින්නේ එහෙම නැති තැනක. රුපියල් මිලියන කන්දරාවක් වියදම් කරලා මෙවැනි දෙයක් ඇති කරන්න හදන්නේ ඇයි?

**ගරු පියංකර ජයරත්න මහතා**
(மாண்புமிகு பியங்கர ஜயரத்ன)
(The Hon. Piyankara Jayaratne)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මීට කලිනුත් ලංකාවට දෙවැනි ජාත්‍යන්තර ගුවන් තොටුපොළක අවශ්‍යතාව තිබුණා. නමුත් සැලසුම් සකස් කළා මිසක් කිසිම රජයක් ඒක කළේ නැහැ. ඒ නිසා ඒක තේරුම් අර ගෙන අද දෙවැනි ජාත්‍යන්තර ගුවන් තොටුපොළක් ඇති කිරීම ගැන අතිගරු ජනාධිපති මහින්ද රාජපක්ෂ මැතිතුමාට අපි ස්තුතිවන්ත වන්නට ඕනෑ. ගරු මන්ත්‍රීතුමනි, එතුමා බලාපොරොත්තු වනවා ගුවන් මඟීන් සියයට 40කුත්, ගුවන් භාණ්ඩ සියයට 60කුත් ප්‍රවාහනය කරන්නට. ඒ වාගේම දැන් ආයතන හයක් මත්තලට එන්න එකඟ වෙලා තිබෙනවා.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
නැහැ, දැන් අලුතින් තිබෙන දේ මේකයි ගරු ඇමතිතුමනි. මම වග කීමකින් කියන්නේ. Gulf Air, Air Arabia, Qatar Airways වැනි කොම්පැනි වැඩිපුර ඇති කරන frequencies සඳහා ඔබතුමන්ලා කියා තිබෙනවා, කරුණාකරලා කටුනායකින් දෙන්න බැහැ, අවශ්‍ය නම් ගිහිල්ලා මත්තලින් ගන්න කියලා.

**ගරු පියංකර ජයරත්න මහතා**
(மாண்புமிகு பியங்கர ஜயரத்ன)
(The Hon. Piyankara Jayaratne)
ඒකට එකඟ වෙලා තිබෙනවා.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
ඒ ගොල්ලන් ඒකට දීලා තිබෙන උත්තරය තමයි, "එතැන මඟීන් ප්‍රමාණයක් නැහැ, ඒ නිසා අපට එතැනට යන්න අවශ්‍යතාවක් නැහැ, කරුණාකරලා කටුනායකින් ලබා දෙන්න" කියන එක. ඉතින් ඔබතුමන්ලා අටුව කඩලා පුටුව හදන්න හදනවා වාගේ නේ මේක.

**ගරු පියංකර ජයරත්න මහතා**
(மாண்புமிகு பியங்கர ஜயரத்ன)
(The Hon. Piyankara Jayaratne)
ඒක මම පිළිගන්නේ නැහැ ගරු මන්ත්‍රීතුමනි. දැන් Air Arabia එකෙන් ලිඛිතව අපට දීලා තිබෙනවා, "අප එන්නම්" කියලා.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
දෙන්න බැහැ කිව්වාම තමයි ලිඛිතව ඉල්ලා තිබෙන්නේ. මම වග කීමකින් කියන්නේ.

**ගරු පියංකර ජයරත්න මහතා**
(மாண்புமிகு பியங்கர ஜயரத்ன)
(The Hon. Piyankara Jayaratne)
ගරු මන්ත්‍රීතුමාට මමත් වග කීමකින් කියන්නේ. ලිඛිතව ඒ ගොල්ලෝ අපට එකඟ වෙලා තිබෙනවා.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
ඉස්සර වෙලා මම ගරු ඇමතිතුමාගෙන් වග කීමකින් ප්‍රශ්නයක් අහන්නම්. දැන් යාපනයේ ශ්‍රීලන්කන් ආයතනය කොම්පැනිය ඇරියා. ඔබතුමා එතැන හිටියාද ඇමති වශයෙන් ඒ කොම්පැනිය අරින්න? මම අහනවා, ඔබතුමාට ඒ ගැන කියලා තිබුණාද? නැහැ. ඔබතුමා සිවිල් ගුවන් සේවා අමාත්‍යතුමා. ඇමති දන්නේ නැහැ ශ්‍රීලන්කන් ආයතනය-

**ගරු පියංකර ජයරත්න මහතා**
(மாண்புமிகு பியங்கர ஜயரத்ன)
(The Hon. Piyankara Jayaratne)
ගරු රවි කරුණානායක මන්ත්‍රීතුමනි, ඒක මෙතැනට අදාළ නැහැ. ඩග්ලස් දේවානන්ද ඇමතිතුමා ඒක ඇරියා.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
මට දුකයි. මොකද ඔබතුමා වැඩ කරන්න හදන ඇමතිවරයෙක්. අපි යාපනයේ හිටියා. අපට කිව්වා. ඔබතුමාගේ නම එතැන තිබුණා. නමුත් ඔබතුමාට කියලා තිබුණේ නැහැ. ඉතින් ඒ වාගේ තත්ත්වයක මෙතැන ඔබතුමන්ලාගේ වෙන දේවල් කියන්නේ නැහැ ගරු ඇමතිතුමනි.

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
තුන්වැනි අතුරු ප්‍රශ්නය.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
නැහැ, දෙවැනි අතුරු ප්‍රශ්නය ගරු නියෝජ්‍ය කථානායකතුමනි.

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
තුන්වැනි අතුරු ප්‍රශ්නය. දැන් ඔබතුමා දෙවැනි අතුරු ප්‍රශ්නය ඇහුවේ යාපනය ගැන.

**ගරු පියංකර ජයරත්න මහතා**
(மாண்புமிகு பியங்கர ஜயரத்ன)
(The Hon. Piyankara Jayaratne)
මන්ත්‍රීතුමා ඒක උපදේශක කාරක සභාවේදී අහන්න.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
අන්න එතැන ඇමතිට වැඩිය සභාපතිට powers තිබෙනවා. ඔබතුමාට දීලා තිබෙන මේ දත්ත එතැනින් එවලා තිබෙන්නේ. මේවා අංග සම්පූර්ණව නොවෙයි තිබෙන්නේ. මම ගරු ඇමතිතුමාගෙන් කාරුණිකව ඉල්ලන්නේ අවශ්‍ය නම් අපි ගිහිල්ලා මේ ගැන සාකච්ඡා කරමු කියලායි. මේවා රටේ සල්ලි. අර හම්බන්තොට වරායේ මාස 18ට නැව් 05යි ඇවිල්ලා තිබෙන්නේ. ඒ විධියට මත්තල එයාර්පෝට් එකටත් මාසයකට aircraft දෙක තුනක් එන්න පුළුවන් විධියට කරුණාකරලා හදන්න එපා. මීහින් ගුවන් සමාගමත් හදන කොට අප කිව්වා කරුණාකරලා මෙය හදන්න එපාය කියලා. සජිත් ද වාස් ගුණවර්ධන කිව්වේ මෙට්‍රික් ටොන් -

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
ගරු මන්ත්‍රීතුමා ප්‍රශ්නය අහන්න.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
ප්‍රශ්නය තමයි අහන්නේ ගරු නියෝජ්‍ය කථානායකතුමනි.

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
ඔබතුමාට කථා පවත්වන්න වෙලාව තිබෙනවා. දැන් පස් වරු දෙක පසු වෙලා.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
නැහැ, ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මම මේ ඇමතිතුමාට උදවු කරන්න හදනවා. මොකද සභාපති -

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
ගරු ඇමතිතුමනි, පිළිතුර දෙන්න.

**ගරු පියංකර ජයරත්න මහතා**
(மாண்புமிகு பியங்கர ஜயரத்ன)
(The Hon. Piyankara Jayaratne)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මෙතුමා ඔය දේවල් යුද්ධ කාලයේත් ප්‍රකාශ කළා, කිලිනොච්චි කියලා මැදවච්චියට යනවාය කියලා. ඉතින් අපට කියන්න බැහැ. අප දකිනවා හරියට අප ගුවන් තොටු පොළක් හදද්දී -

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
යන ඒවා තමයි දැන් පේන්න තිබෙන්නේ.

**ගරු පියංකර ජයරත්න මහතා**
(மாண்புமிகு பியங்கர ஜயரத்ன)
(The Hon. Piyankara Jayaratne)
අප දැන් අරගෙන තිබෙන්නේ. අනිවාර්යයෙන්ම අප මත්තල - [බාධා කිරීමක්]

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
ඔබතුමන්ලාට චීනයට යනවා කියලා IMF එකට ගිහිල්ලා සල්ලි ගන්න බැහැ. ඒ හින්දා කරුණාකරලා -

**ගරු පියංකර ජයරත්න මහතා**
(மாண்புமிகு பியங்கர ஜயரத்ன)
(The Hon. Piyankara Jayaratne)
කිලිනොච්චියේ යන එකට මැදවච්චිය ගැන කියලා වැඩක් නැහැ. අපි හරි දේ හරියට කරනවා.

## මහ නැගුම යන්ත්‍රෝපකරණ ආයතනය : සේවකයින්
மகநெகும இயந்திரோபகரண நிறுவனம்: ஊழியர்கள்
MAGA NEGUMA MACHINERY INSTITUTION: EMPLOYEES

1928/'11

12. **ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
වරාය හා මහාමාර්ග අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1) :

(අ) (i) 2006 වර්ෂයේ සිට මේ දක්වා මහ නැගුම යන්ත්‍රෝපකරණ ආයතනයේ සභාපති තනතුරේ සේවය කළ අයගේ නම් කවරේද;

(ii) එම එක් එක් සභාපතිවරයාගේ සේවා කාලය, ඔවුන් ලැබූ වැටුප් සහ වෙනත් දීමනා වෙන් වෙන් වශයෙන් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) මහ නැගුම යන්ත්‍රෝපකරණ ආයතනයේ වර්ෂ 2005 සිට මේ දක්වා සේවය කළ ස්ථිර සේවක සංඛ්‍යාව කොපමණද;

(ii) එම ආයතනයෙන් ඉවත් කළ ස්ථිර සේවක සංඛ්‍යාව කොපමණද;

(iii) ඉවත් කළ ස්ථිර සේවකයින්ගේ නම්, ලිපිනයන් සහ තනතුරු කවරේද;

(iv) එම සේවකයින් ඉවත් කිරීමට හේතු කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) (i) වර්ෂ 2006 සිට මේ දක්වා ඉහත ආයතනයේ සේවය කළ අනියම් සේවක සංඛ්‍යාව කොපමණද;

(ii) ඔවුන් අතරින් සේවය ස්ථිර කරන ලද සහ සේවයෙන් ඉවත් කරන ලද සේවක සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

[ගරු දයාසිරි ජයසේකර මහතා]

துறைமுகங்கள், நெடுஞ்சாலைகள் அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) 2006 முதல் இற்றைவரை மகநெகும இயந்திரோபகரண நிறுவனத்தின் தவிசாளர் பதவியில் பணியாற்றியவர்களின் பெயர்கள் யாவை;

(ii) மேற்படி ஒவ்வொரு தவிசாளரினதும் சேவைக் காலம், அவர்கள் பெற்ற சம்பளம் மற்றும் ஏனைய கொடுப்பனவுகள் தனித்தனியாக யாவை

என்பதை அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) (i) மகநெகும இயந்திரோபகரண நிறுவனத்தில் 2005 ஆம் ஆண்டில் இருந்து இற்றைவரை சேவையாற்றிய நிரந்தர ஊழியர்களின் எண்ணிக்கை யாது;

(ii) அந்நிறுவனத்தில் இருந்து நீக்கப்பட்ட நிரந்தர ஊழியர்களின் எண்ணிக்கை யாது;

(iii) நீக்கப்பட்ட நிரந்தர ஊழியர்களின் பெயர்கள், முகவரிகள் மற்றும் பதவிகள் யாவை;

(iv) அவ்வூழியர்கள் நீக்கப்பட்டமைக்கான காரணங்கள் யாவை

என்பதை அவர் குறிப்பிடுவாரா?

(இ) (i) 2006 ஆம் ஆண்டில் இருந்து இற்றைவரை மேற்படி நிறுவனத்தில் சேவையாற்றிய அமய ஊழியர்களின் எண்ணிக்கை யாது;

(ii) இவர்களில் சேவை நிரந்தரமாக்கப்பட்ட ஊழியர்களின் எண்ணிக்கை மற்றும் நீக்கப்பட்ட ஊழியர்களின் எண்ணிக்கை தனித்தனியாக எவ்வளவு

என்பதை அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஈ) இன்றேல், ஏன்?

asked the Minister of Ports and Highways:

(a) Will he inform this House-

(i) of the names of those who served as Chairmen of the Maga Neguma Machinery Institution from 2006 up to now; and

(ii) separately the period of service of each of the aforesaid Chairmen and salaries and other allowances received by them?

(b) Will he state-

(i) the number of permanent employees who served in Maga Neguma Machinery Institution from the year 2005 up to now;

(ii) the number of permanent employees removed from the aforesaid institution;

(iii) the names, addresses and posts of permanent employees who were removed ; and

(iv) the reason for the removal of aforesaid employees?

(c) Will he inform this House-

(i) of the number of casual employees who served in the above institution from the year 2006 up to now; and

(ii) separately out of them, the number of employees made permanent and the number of employees removed?

(d) If not, why?

**ගරු නිර්මල කොතලාවල මහතා (වරාය හා මහාමාර්ග නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு நிர்மல கொத்தலாவல - துறைமுகங்கள், நெடுஞ் சாலைகள் பிரதி அமைச்சர்)
(The Hon. Nirmala Kotalawala - Deputy Minister of Ports and Highways)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, වරාය හා මහාමාර්ග අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුරු දෙනවා.

(අ) (i) 01. බී.ආර්. පෙරේරා මහතා

02. ජයන්ත ධනපාල මහතා

03. ජාලිය පී. කුලසේකර මහතා

(ii) ඇමුණුම Iහි දක්වා ඇත.

(ආ) (i) 2005.12.31 දිනට - 279

2006.12.31 දිනට - 507

2007.12.31 දිනට - 437

2008.12.31 දිනට - 520

2009.12.31 දිනට - 505

2010.12.31 දිනට - 503

2011.12.31 දිනට - 494

2012 මාර්තු වන විට - 513

(ii) ඉවත් කළ ස්ථිර සේවක සංඛ්‍යාව - 24

ඇමුණුම 2හි දක්වා ඇත.

ඇමුණුම් **සභාගත*** කරමි.

(iv) විනය හේතූන් මත.

(ඇ) (i) අනියම් පදනම මත දීර්ඝ කාලීනව සේවකයන් බඳවා නොගන්නා අතර ව්‍යාපෘතීන්හි අවශ්‍යතාවන් මත දෛනික කුලී පදනම මත පමණක් සේවයෙහි යොදවනු ලබයි.

(ii) අදාළ නොවේ.

(ඈ) පැන නොනඟී.

***සභාමේසය මත තබන ලද ඇමුණුම්:**
*சபாபீடத்தில் வைக்கப்பட்ட இணைப்பு :*
*Annexes tabled:*

ඇමුණුම 1

| නම | සේවා කාලය | වැටුප (මාසික) රු. | වාහන දීමනා (මාසික) රු. | ඉන්ධන දීමනා (මාසික) රු. |
|---|---|---|---|---|
| බී.ආර්. පෙරේරා මහතා | 2006 ජනවාරි සිට 2006 දෙසැම්බර් 21 දක්වා | - | 75,000.00 | - |
| ජයන්ත ධනපාල මහතා | 2006 දෙසැම්බර් 22 සිට 2007 ඔක්තෝම්බර් 08 දක්වා | 100,000.00 | 80,000.00 | නිශ්චිත සීමාවක් නොවීය |
| ජාලිය පී. කුලසේකර මහතා | 2007 ඔක්තෝම්බර් 18 සිට 2012 ජනවාරි 18 දක්වා | - | - | - |

ඇමුණුම 2

| අනු අංකය | සේ.අ. | නම | තනතුර | ලිපිනය |
|---|---|---|---|---|
| 01 | 06 | එම්.එම්.ජේ. රණසිංහ | ගබඩා පාලක | නො.352/2, මිල්ලගහ වත්ත, ගනේමුල්ල |
| 02 | 147 | එස්.ඒ.කේ. රාමනායක | ජ්‍යෙෂ්ඨ ආරක්‍ෂක නිලධාරි | රාමසෙවන,නරාපිරිය යටිගල, බෙලිඅත්ත |
| 03 | 232 | කේ.ඒ. සුරංග එක්සිත් | රියදුරු | නිදහස, මිරිස්වත්ත, බෙලිඅත්ත |
| 04 | 258 | රනිල් සෙනරත් විතාන | ගබඩා පාලක | හෙල්ල ගෙදර, උලහිටියාව, මිද්දෙනිය |
| 05 | 295 | අයි.ඒ.ඩී.එස්.අයි. කුමාර | ආරක්‍ෂක නියාමක | නො.16 ඒ, ශාන්ති මාවත, අලුබෝමුල්ල |
| 06 | 331 | වී.ජී. කරුණාරත්න | ආරක්‍ෂක නියාමක | නො.10, උඩහගෙදර, කුඩගෝමඩිය, කටුවන |
| 07 | 389 | ඩබ්. පේමදාස | යන්ත්‍ර ක්‍රියාකරු | කුඹුකේ ගෙදර, පට්ටියපොල, නෙටොල්පිටිය |
| 08 | 439 | එම්.ඩී. සෝමසිරි | ආරක්‍ෂක නියාමක | නො.77, කුඩගලආර, මිද්දෙණිය |
| 09 | 451 | ටී.ඩී.කේ. ප්‍රසාද් ජයශාන්ත | ආරක්‍ෂක නියාමක | මංචාඩිහේන, දෙහිගහහේන, හදුගල, මාතර |
| 10 | 457 | එන්.වී. මහින්ද | ආරක්‍ෂක නියාමක | 34/ඒ 2, පන්නිවිල ගෙදර, අගුණකොළ පැලැස්ස |
| 11 | 461 | ජේ.ඒ. කසුන් නිලන්ත | සහකාර ගබඩා පාලක | 84/1, මිදිල්ල, බැරගම, අම්බලන්තොට |
| 12 | 491 | ඒ.ජී. අරුණ ශාන්ත | රියදුරු | තේ කොරටුව, මාරගොඩ, තෙලිජ්ජවිල |
| 13 | 493 | කේ.ජී. නිශාන්ත ලක්මාල් | ආරක්‍ෂක නියාමක | නො.523, අලිඹලු ආර, සූරියවැව |
| 14 | 499 | සුදර්ශන සම්පත් රාමනායක | ආරක්‍ෂක නියාමක | 68/2, රාම සෙවන, රත්න |
| 15 | 517 | එස්.පී. සේනසිරි සිල්වා | රියදුරු | යාපහුව, මහව |
| 16 | 575 | එච්.ඒ. චතුර නන්ද | යන්ත්‍ර ක්‍රියාකරු | උලන්කුලම, මරදන්කඩවල |
| 17 | 690 | ඩී. මහින්ද රණතුංග | කම්කරු | නො.11/2, කනගරත්න පාර, ලක්‍ෂපිටිය, මොරටුව |
| 18 | 896 | කේ. විජේපාල | යන්ත්‍ර ක්‍රියාකරු | නො.306/135,මුණසිංහ ගම, මාගම්මන, හෝමාගම |
| 19 | 936 | ඩබ්. සුමුදු චින්තක | සහකාර ගබඩා පාලක | නො.52/1, චින්තක, ගොඩවානහේන, තංගල්ල |
| 20 | 947 | ඩබ්.එච්.කේ. අතුල ලක්මාල් | ලිපිකරු | නො.48/1, කහන්තොට පාර, පිට්ටුගල, මාලබේ |
| 21 | 955 | ජී.ජී. හර්ෂක ප්‍රසාද් | වැඩ පරීක්‍ෂක | දෙල්ගහ හේන, ගැටමාන්න |
| 22 | 966 | ඩබ්.කේ.බී.එන්.කේ. කුලතුංග | ආරක්‍ෂක නියාමක | මීගස්ආර, මැදමුලන, වීරකැටිය |
| 23 | 1051 | ජී.ජී. පුෂ්පකුමාර | ආරක්‍ෂක නියාමක | අලුත්වත්ත, වැලිවින්න පාර, නෙටොල්පිටිය |
| 24 | 1105 | ටී.එස්. සුනිල් ශාන්ත | ආරක්‍ෂක නියාමක | නෙලුම්පත් වැව පාර, අබන්පොල |

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
ගරු නියෝජ්‍ය අමාත්‍යතුමනි, සේවයෙන් ඉවත් කළ 24 දෙනා කොයි කාලයේ බඳවා ගත් අයද කියා කියන්න පුළුවන්ද?

**ගරු නිර්මල කොතලාවල මහතා**
(மாண்புமிகு நிர்மல கொத்தலாவல)
(The Hon. Nirmala Kotalawala)
ගරු මන්ත්‍රීතුමනි, සේවා කාලය නම් පිළිතුරේ සඳහන් කර නැහැ. නමුත් තනතුර, නම, ලිපිනය සහ සේවා අංකය තිබෙනවා.

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
ගරු නියෝජ්‍ය අමාත්‍යතුමනි, මේ 24 දෙනාම එකවර තමයි එකට එකතු කර එළියට දමා තිබෙන්නේ. විශේෂයෙන්ම මේ අය ආරක්ෂක සේවයේ හිටපු අය; ඔබතුමන්ලාගේම ආණ්ඩුවට වැඩ කරපු අය. නමුත් ප්‍රශ්නය තිබෙන්නේ දැන් මේ ගොල්ලන් නඩු පවරා තිබීමයි. යම් කිසි ප්‍රමාණයක් නැවත සේවයට අරගෙන තිබෙනවා. අනෙක් අය මේ නඩුව දිගටම අරගෙන යනවා. හැබැයි, දවස ගණනේ සමාගම මුදල් ගෙවලා නඩුවට නීතිඥයෝ ඉදිරිපත් කරනවා. ඒ නිසා මේ අය ගැන සොයා බලා සාධාරණ විධියකට නැවත සේවයේ පිහිටුවා කටයුතු කරන්න පුළුවන්ද? යම් කිසි ප්‍රමාණයක් නැවත සේවයට ගත්තාට නඩුව දිගටම ක්‍රියාත්මක කර ගෙන යනවා. මා ඔබතුමාගෙන් අහන්නේ මේ සියලුම දෙනා වෙනුවෙන් යම් කිසි සාධාරණ ක්‍රියා මාර්ගයකට යන්න පුළුවන් තත්ත්වයක් තිබේද කියලායි.

**ගරු නිර්මල කොතලාවල මහතා**
(மாண்புமிகு நிர்மல கொத்தலாவல)
(The Hon. Nirmala Kotalawala)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමා සඳහන් කළ පරිදි මේ ගැන සොයා බලන්නම්. ඒ වාගේම අධිකරණයට ගිහින් තිබෙනවා නම් අධිකරණ තීන්දුව එළඹුණාට පසු අදාළ තීන්දුව ගැනීම සඳහා කටයුතු කරන්නම්.

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
ගරු නියෝජ්‍ය අමාත්‍යතුමනි, යම් කිසි පිරිසක් අධිකරණයට ගිහින් වෙන විධියකට කථා කර සාමදානයකට ඇවිත් ඒ ගොල්ලන් සේවයට අරගෙන තිබෙනවා. හැබැයි, නඩුව එහෙමමයි.

**ගරු නිර්මල කොතලාවල මහතා**
(மாண்புமிகு நிர்மல கொத்தலாவல)
(The Hon. Nirmala Kotalawala)
ගරු මන්ත්‍රීතුමනි, සමාගමෙන් එවා තිබෙන පිළිතුරේ සඳහන් වන්නේ විනය හේතූන් මත කියන කාරණයයි. ඒ නිසා ඔබතුමාගේ ඉල්ලීම පරිදි මේ ගැන සාකච්ඡා කරලා සාධාරණයක් ඉෂ්ට කරන්න පුළුවන් නම් ඒ කටයුතු කරන්නම්.

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
බොහොම ස්තුතියි.

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
ප්‍රශ්න අංක 13 - 1644/'11-(1), ගරු බුද්ධික පතිරණ මහතා.

**ගරු බුද්ධික පතිරණ මහතා**
(மாண்புமிகு புத்திக பதிரண)
(The Hon. Buddhika Pathirana)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මා එම ප්‍රශ්නය අහනවා.

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අධ්‍යාපන අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර දීම සඳහා සති දෙකක කාලයක් ඉල්ලා සිටිනවා.

***ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.***
*வினாவை மற்றொரு தினத்திற் சமர்ப்பிக்கக் கட்டளையிடப்பட்டது.*
*Question ordered to stand down.*

## ඉඩම් ගනුදෙනු : ටෙන්ඩර් පටිපාටිය
காணிக் கொடுக்கல் வாங்கல்கள் : கேள்வி நடைமுறை
LANDS TRANSACTIONS : TENDER PROCEDURE

1712/'11

14. **ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
ආර්ථික සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) 2009 වර්ෂයේ සිට මේ දක්වා වූ කාලය තුළ එක් එක් වර්ෂයේදී නිසි ටෙන්ඩර් පටිපාටිය අනුගමනය කිරීමෙන් තොරව විවිධ අරමුණු සඳහා ඉඩම් භාවිතා කරන අය වෙත ලබා දෙන ලද පර්චස් 50 හෝ ඊට වැඩි ඉඩම් මොනවාද;

(ii) එම ඉඩම් භාවිත කරන අය වෙත, එම ඉඩම් ලබා දීමට හේතු කවරේද;

(iii) ඉහත (අ) (i) අනුව දෙන ලද ඉඩම් භාවිතා කිරීම හේතුවෙන් උත්පාදනය කරන ලද රැකියා සංඛ්‍යාව කොපමණද;

(iv) එම දෙන ලද ඉඩම් භාවිතා කිරීම හේතුවෙන් මෙරටට ලැබුණු ප්‍රතිලාභ කවරේද;

(v) ඉහත කී ඉඩම් දීමේ ක්‍රියාවලියේදී ලබා දුන් බදු සහනවල වටිනාකම කොපමණද;

(vi) මෙම ඉඩම් ගනුදෙනු සම්බන්ධයෙන් ටෙන්ඩර් පටිපාටිය අනුගමනය නොකිරීමට හේතු කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

பொருளாதார அபிவிருத்தி அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) 2009 இலிருந்து இற்றைவரைக்கும் உரிய கேள்விப்பத்திரம் கோரல் செயன்முறைகள் இல்லாமல், வேறுபட்ட பயன்படுத்துனர்களுக்கு

கொடுக்கப்பட்டுள்ள 50 பேர்ச்சை விட விசாலமான காணிகளை வருடாந்த அடிப் படையிலும்;

(ii) பயன்படுத்துனர்களுக்கு அக்காணிகளை இவ்வாறு கொடுத்தமைக்கான காரணங்களை யும்;

(iii) அ(i)இன் பிரகாரம் கொடுக்கப்பட்ட அக்காணி யின் பயன்பாட்டின்மூலம் உருவாக்கப்பட்ட வேலைவாய்ப்புக்களின் எண்ணிக்கையையும்;

(iv) கொடுக்கப்பட்ட அக்காணிகளின் பயன்பாட்டின் மூலம் நாட்டுக்குக் கிடைத்த நன்மைகளையும்;

(v) மேற்படி காணிகளைக் கொடுக்கும் செயன் முறையில் விலக்களிக்கப்பட்ட வரியின் மொத்த தொகையையும்;

(vi) இக்காணிகளின் கொடுக்கல் வாங்கல்கள் தொடர்பாக கேள்விப்பத்திரம் கோரல் நடைமுறைகள் ஏன் பின்பற்றப்படவில்லை என்பதையும்

அவர் இச்சபைக்குத் தெரிவிப்பாரா?

(ஆ) இன்றேல், ஏன்?

asked the Minister of Economic Development:

(a) Will he inform this House-

(i) the lands in extent of 50 perches and above that have been given to the different users without following proper tender procedure from 2009 to date on per year basis;

(ii) the reasons for giving those lands to the users;

(iii) the number of jobs created through the use of given lands as per a (i);

(iv) the benefits received by the country from the use of given lands; and

(v) the amount of taxes exempted in the process of giving aforesaid lands; and

(vi) as to why the tender procedure was not followed connected to these land transactions?

(b) If not, why?

**ගරු ලක්ෂ්මන් යාපා අබේවර්ධන මහතා (ආර්ථික සංවර්ධන නියෝජ්‍ය අමාත්‍යතුමා)**

(மாண்புமிகு லக்ஷ்மன் யாப்பா அபேவர்தன - பொருளாதார அபிவிருத்தி பிரதி அமைச்சர்)

(The Hon. Lakshman Yapa Abeywardena - Deputy Minister of Economic Development)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ආර්ථික සංවර්ධන ආමාත්‍යතුමා වෙනුවෙන් එම ප්‍රශ්නයට මම පිළිතුර දෙනවා.

(අ) (i) 1978 අංක 4 දරන මහ කොළඹ ආර්ථික සභා කොමිසම් පනත අනුව පිහිටුවන ලද ආයෝජන මණ්ඩලයේ ප්‍රධාන අරමුණු වනුයේ

(අ) ජනරජයේ ආර්ථික සංවර්ධනය පෝෂණය කිරීම සහ නංවාලීම,

(ආ) ජනරජයේ ආර්ථික පදනම පුළුල් කිරීම හා ශක්තිමත් කිරීම,

(ඇ) ජනරජයේ ඇතුළත විදේශ ආයෝජන උනන්දු කරලීම සහ වැඩිදියුණු කිරීම,

(ඈ) විදේශ විනිමය උපයන ප්‍රභව විවිධ කරලීම සහ අපනයන ඉපයුම් වැඩි කරලීම,

(ඉ) ජනරජයේ ඇතුළත කාර්මික සහ වාණිජ ව්‍යවසා පිහිටුවීම සහ සංවර්ධනය උනන්දු කිරීම සහ පෝෂණය කිරීම,

(ඊ) බලප්‍රදේශයෙහි කටයුතු පරිපාලනය කිරීම හා

(උ) ඉහත දැක්වෙන අරමුණු සියල්ල හෝ ඉන් කිසිවක් ඉටුකර ගැනීම සඳහා අවශ්‍ය විය හැකි හෝ හිතකර විය හැකි වෙනත් සියලු ක්‍රියා කිරීමයි.

ඉහත අරමුණු ඉටු කර ගැනීම සඳහා විදේශ ආයෝජකයන් උනන්දු කරලීම සහ විදේශ විනිමය ඉපයීම සඳහා ආයෝජන දිරිමත් කිරීමට කටයුතු කිරීම ආයෝජන මණ්ඩලයේ ප්‍රධාන කාර්යයකි. ඒ අනුව ආයෝජන දිරිගැන්වීමේ ප්‍රධානම කරුණ වන්නේ කර්මාන්ත සහ ව්‍යවසාය පිහිටුවීම සඳහා යෝග්‍ය ඉඩම් ලබා දීමයි. ඒ සඳහා ආයෝජකයාගේ ශක්‍යතාව, ආයෝජනය කරනු ලබන මුදල් ප්‍රමාණය, රැකියා උත්පාදනය සහ ආර්ථිකමය සංවර්ධනය ආදී කරුණු සලකා බලා බදු පදනමින් ඉඩම් ලබා දීමට ආයෝජන මණ්ඩලය විසින් ක්‍රියා කරනු ලබයි. මෙවන් අවස්ථාවකදී ටෙන්ඩර් පටිපාටිය ප්‍රායෝගිකව අනුගමනය කළ නොහැක. ටෙන්ඩර් පටිපාටිය අනුගමනය කරනුයේ ඉඩමට වැඩි මිලක් ලබා ගැනීමට මිස, ඉඩම ලබා දීම තුළින් ආර්ථික සංවර්ධනයට සහාය දිය හැකි ආයෝජකයන් සොයා ගැනීමට නොවේ. ඉහත කරුණු හේතුවෙන් ආයෝජන මණ්ඩලය පිහිටු වූ දා සිට සියලුම රජයන් විසින් ආයෝජකයන් වෙත බදු සහන මත ඉඩම් ලබා දීමේදී ටෙන්ඩර් පටිපාටිය අනුගමනය කර නොමැත. ඇමුණුම **සභාගත*** කරමි.

(ii) ඇමුණුමෙහි තීරු අංක 05 බලන්න.

(iii) ඇමුණුමෙහි තීරු අංක 04 බලන්න.

(iv) ඇමුණුමෙහි තීරු අංක 05 බලන්න.

(v) ඇමුණුමෙහි තීරු අංක 06 බලන්න.

(vi) ඉහත අ (i) හි සඳහන්ව ඇත.

(ආ) අදාළ නොවේ.

[ගරු රවි කරුණානායක මහතා]

***සභාමේසය මත තබන ලද ඇමුණුම:**

*சபாபீடத்தில் வைக்கப்பட்ட இணைப்பு :*

*Annex tabled:*

ඇමුණුම

| | තීරු අංක 01 | තීරු අංක 02 | තීරු අංක 03 | තීරු අංක 04 | තීරු අංක 05 | තීරු අංක 06 |
|---|---|---|---|---|---|---|
| අනු අංකය | සමාගමේ නම | වර්තමාන තත්ත්වය | ඉඩම් ප්‍රමාණය (ආයෝජන කලාප තුළ ඇති ඉඩම්) | යෝජිත රැකියා | ඉඩම් ලබා දීමට හේතු සහ රටට ලැබුණු ප්‍රතිලාභ | ලබා දුන් බදු සහන සහ යෝජිත ආයෝජන වටිනාකම රුපියල් මිලියන වලින් |
| යටිතල සහසුකම් අංශය | | | | | | |
| 01 | බෙටර් වර්ල්ඩ් ඉන්ටර්නැෂනල් පුද්. සමාගම | ක්‍රියාත්මක කිරීමට කටයුතු සිදුකරමින් පවතී. | අක්කර 04 රූඩ්0 පර්චස් 0 | 07 | සේවකයින් 500ක් සඳහා අනෙකුත් පහසුකම් සමඟ නේවාසික පහසුකම් සැපයීමට | අවුරුදු 05ක බදු විරාමය<br><br>563.00 |
| සංචාරක අංශය | | | | | | |
| 01 | සුවිරීන්දියා ලංකා හෝටෙල් ඇන්ඩ් රිසෝට් | ක්‍රියාත්මක කිරීමට කටයුතු සිදුකරමින් පවතී. | අක්කර 03 රූඩ් 2 පර්චස් 32.20 | 250 | රටට විදේශ සෘජු ආයෝජන ගලා ඒම, සෘජු හා වක්‍ර රැකියා අවස්ථා උත්පාදනය, කාමර ධාරිතාවය වැඩි කිරීමෙන් සංචාරක කර්මාන්තය සඳහා යටිතල පහසුකම් සංවර්ධනය; ව්‍යාපෘතියේ වාණිජ මෙහෙයුම් ක්‍රියාත්මක කෙරෙන විට බදු හා අයකිරීම් තුලින් ආදායම් උත්පාදනය | අවුරුදු 08ක බදු විරාමය<br><br>ප්‍රාග්ධන භාණ්ඩ ආනයනය සඳහා බදු නිදහස් පහසුකම<br><br>2,850.00 |
| 02 | මුල්ඩැට් හෝටෙල් ඇන්ඩ් රිසෝට් පුද්.සමාගම | ක්‍රියාත්මක කිරීමට කටයුතු සිදුකරමින් පවතී | අක්කර 03 රූඩ් 0 පර්චස් 18.90 | 420 | රටට විදේශ සෘජු ආයෝජන ගලා ඒම, සෘජු හා වක්‍ර රැකියා අවස්ථා උත්පාදනය, කාමර ධාරිතාවය වැඩි කිරීමෙන් සංචාරක කර්මාන්තය සඳහා යටිතල පහසුකම් සංවර්ධනය; ව්‍යාපෘතියේ වාණිජ මෙහෙයුම් ක්‍රියාත්මක කෙරෙන විට බදු හා අයකිරීම් තුලින් ආදායම් උත්පාදනය | අවුරුදු 08ක බදු විරාමය<br><br>ප්‍රාග්ධන භාණ්ඩ ආනයනය සඳහා බදු නිදහස් පහසුකම<br><br>5352.00 |
| 03 | මල්කාබාත එකෝ රිසෝට්ස් පුද්.සමාගම | ක්‍රියාත්මක කිරීමට කටයුතු සිදුකරමින් පවතී | අක්කර 09 රූඩ් 3 පර්චස් 32.75 | 170 | සෘජු හා වක්‍ර රැකියා අවස්ථා උත්පාදනය, කාමර ධාරිතාවය වැඩි කිරීමෙන් සංචාරක කර්මාන්තය සඳහා යටිතල පහසුකම් සංවර්ධනය; ව්‍යාපෘතියේ වාණිජ මෙහෙයුම් ක්‍රියාත්මක කෙරෙන විට බදු හා අයකිරීම් තුලින් ආදායම් උත්පාදනය | අවුරුදු 07ක බදු විරාමය<br><br>ප්‍රාග්ධන භාණ්ඩ ආනයනය සඳහා බදු නිදහස් පහසුකම<br><br>600.00 |
| අංශය - | කෘෂිකර්මාන්තය | | | | | |
| 01 | සී.බී.එල්.එක්ස්පෝර්ට්ස් පුද්. සමාගම | ක්‍රියාත්මක කිරීමට කටයුතු සිදුකරමින් පවතී | අක්කර 02 රූඩ් 0 පර්චස් 0 | 100 | සෘජු හා වක්‍ර රැකියා අවස්ථා උත්පාදනය,වාණිජ මෙහෙයුම් වලින් අනතුරුව බදු හා අයකිරීම් තුලින් ආදායම් උත්පාදනය | අවුරුදු 07 ක බදු විරාමය<br><br>ප්‍රාග්ධන භාණ්ඩ ආනයනය සඳහා බදු නිදහස් පහසුකම<br><br>855.00 |
| 02 | ජී.එස්.එල්.නැවුරල්ස් පුද්.සමාගම | වාණිජ මෙහෙයුම් | අක්කර 01 රූඩ් 0 පර්චස් 0 | 09 | රටට විදේශ සෘජු ආයෝජන ගලා ඒම, සෘජු හා වක්‍ර රැකියා අවස්ථා උත්පාදනය, වාණිජ මෙහෙයුම් වලින් අනතුරුව බදු හා අයකිරීම් තුලින් ආදායම් උත්පාදනය | අවුරුදු 05ක බදු විරාමය<br><br>ප්‍රාග්ධන භාණ්ඩ ආනයනය සඳහා බදු නිදහස් පහසුකම<br><br>33.00 |
| 03 | පිලිප්ස් ෆුඩ් ලංකා පුද්.සමාගම | වාණිජ මෙහෙයුම් | අක්කර 01 රූඩ් 0 පර්චස් 0 | 85 | රටට විදේශ සෘජු ආයෝජන ගලා ඒම, සෘජු හා වක්‍ර රැකියා අවස්ථා උත්පාදනය, වාණිජ මෙහෙයුම් වලින් අනතුරුව බදු හා අයකිරීම් තුලින් ආදායම් උත්පාදනය | අවුරුදු 07ක බදු විරාමය<br><br>ප්‍රාග්ධන භාණ්ඩ ආනයනය සඳහා බදු නිදහස් පහසුකම<br><br>28.75 |

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| අංශය- | ප්‍රාදේශිය වැඩසටහන් සහ අපනයන ආශ්‍රිත සේවා | | | | | |
| 01. | ඩිජිටල් ඉන්ජිනියරින් ලංකා පුද්.සමාගම | ක්‍රියාත්මක කිරීමට කටයුතු සිදුකරමින් පවතී | අක්කර 03 රූඩ් 0 පර්චස් 0 | - | රැකියා අවස්ථා උත්පාදනය,විදේශ විනිමය ඉතුරුම් | අවුරුදු 02ක බදු විරාමය<br>44.00 |
| 02 | හෙරිටේජ් ප්‍රීමියර් ෆුඩ්ස් පුද්.සමාගම | ක්‍රියාත්මක කිරීමට කටයුතු සිදුකරමින් පවතී | අක්කර 04 රූඩ් 3 පර්චස් 20.53 | - | රැකියා අවස්ථා උත්පාදනය | අවුරුදු 05ක බදු විරාමය<br>192.00 |
| 03 | කැවින්කෙයාර් ලංකා පුද්.සමාගම | වාණිජ මෙහෙයුම් | අක්කර 03 රූඩ් 0 පර්චස් 0 | 08 | විදේශ සෘජු ආයෝජන, රැකියා අවස්ථා උත්පාදනය | අවුරුදු 03ක බදු විරාමය<br>70.20 |
| 04 | ටයන් ලංකා ස්ටීල් පුද්.සමාගම | වාණිජ මෙහෙයුම් | අක්කර 03 රූඩ් 0 පර්චස් 0.06 | 32 | විදේශ සෘජු ආයෝජන, රැකියා අවස්ථා උත්පාදනය, ආනයන ආදේශනය | අවුරුදු 02 ක බදු විරාමය<br>114.00 |
| 05 | යුනිලිවර් ශ්‍රී ලංකා සමාගම | වාණිජ මෙහෙයුම් | අක්කර 26 රූඩ් 3 පර්චස් 21.85 | 733 | විදේශ සෘජු ආයෝජන, ප්‍රාදේශිය සංවර්ධනය | අවුරුදු 05 ක බදු විරාමය<br>4,296.24 |
| 06 | මැක්සන් මෙෂ් ඉන්ඩස්ට්‍රිස් පුද්.සමාගම | වාණිජ මෙහෙයුම් | අක්කර 2 රූඩ් 1 පර්චස් 9.23 | 200 | රැකියා අවස්ථා උත්පාදනය | අවුරුදු 05 ක බදු විරාමය<br>30.00 |
| 07 | ෆෝ එවර් ස්කින් නැචුරල්ස් පුද්.සමාගම | වාණිජ මෙහෙයුම් | අක්කර 1 රූඩ් 0 පර්චස් 29.50 | 151 | රැකියා අවස්ථා උත්පාදනය | අවුරුදු 08ක බදු විරාමය<br>228.00 |
| 08 | සම්පත් ඇසෝෂියේට් පුද්.සමාගම | වාණිජ මෙහෙයුම් | අක්කර 5 රූඩ් 0 පර්චස් 0 (ඉඩම - කැබිත්ගොල්ලාව, අනුරාධපුර) | 214 | විදේශ විනිමය ඉපයීම්, රැකියා අවස්ථා උත්පාදනය, | අවුරුදු 10ක බදු විරාමය<br>81.00 |
| 09 | රේන්බෝ ෆැෂන්ස් පුද්.සමාගම | වාණිජ මෙහෙයුම් | අක්කර 2 රූඩ් 2 පර්චස් 4.9 (ඉඩම - ඉපලෝගම, අනුරාධපුර) | 458 | විදේශ විනිමය ඉපයීම්, රැකියා අවස්ථා උත්පාදනය | අවුරුදු 10ක බදු විරාමය<br>137.808 |
| අංශය - | අනෙකුත් නිෂ්පාදන | | | | | |
| 01. | පොනික්ස් ඉන්ඩස්ට්‍රිස් සමාගම | ක්‍රියාත්මක කිරීමට කටයුතු සිදුකරමින් පවතී | අක්කර 7 රූඩ් 1 පර්චස් 26.70 | 55 | ආනයන ආදේශනය, රැකියා අවස්ථා උත්පාදනය, | -<br>299.00 |
| 02 | ඉනොඇක් පොලිමර් ලංකා පුද්. සමාගම | ක්‍රියාත්මක කිරීමට කටයුතු සිදුකරමින් පවතී | අක්කර 13 රූඩ් 2 පර්චස් 34.79 | 44 | රටට විදේශ සෘජු ආයෝජන ගලා ඒම, සෘජු හා වක්‍ර රැකියා උත්පාදනය, අපනයන | අවුරුදු 9ක බදු විරාමය<br>1,364.00 |
| 03 | කැලණි සයිකල්ස් පුද්.සමාගම | ක්‍රියාත්මක කිරීමට කටයුතු සිදුකරමින් පවතී | අක්කර 2 රූඩ් 0 පර්චස් 0 | 246 | රටට විදේශ සෘජු ආයෝජන ගලා ඒම, සෘජු හා වක්‍ර රැකියා උත්පාදනය, අපනයන | අවුරුදු 4ක බදු විරාමය<br>159.60 |
| 04 | යුක් කෝපරේෂන් ලංකා පුද්. සමාගම | ක්‍රියාත්මක කිරීමට කටයුතු සිදුකරමින් පවතී | අක්කර 2 රූඩ් 0 පර්චස් 0 | 70 | රටට විදේශ සෘජු ආයෝජන ප්‍රවාහය,සෘජු හා වක්‍ර රැකියා උත්පාදනය, අපනයන | අවුරුදු 7ක බදු විරාමය<br>1,140.00 |
| 05 | සිලෝන් එරෝනෝටිකල් සර්විස් පුද්.සමාගම | ක්‍රියාත්මක කිරීමට කටයුතු සිදුකරමින් | අක්කර 4 රූඩ් 1 පර්චස් 38.80 | 94 | සෘජු හා වක්‍ර රැකියා උත්පාදනය, අපනයන | අවුරුදු 7ක බදු විරාමය<br>1,140.00 |

[ගරු රවි කරුණානායක මහතා]

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| | | පවතී | | | | |
| 06 | දේවාසු සිලිකොන් පුද්.සමාගම | ක්‍රියාත්මක කිරීමට කටයුතු සිදුකරමින් පවතී | අක්කර 2 රූඩ් 0 පර්චස් 0 | 515 | රටට විදේශ සෘජු ආයෝජන ගලා ඒම, සෘජු හා වක්‍ර රැකියා උත්පාදනය, දේශීය අමුද්‍රව්‍ය භාවිතය, අපනයනය | අවුරුදු 6ක බදු විරාමය<br>407.00 |
| 07 | ජේ.ආර්.වී.නිපොන් ලංකා පුද්.සමාගම | ක්‍රියාත්මක කිරීමට කටයුතු සිදුකරමින් පවතී | අක්කර 2 රූඩ් 0 පර්චස් 0 | 114 | රටට විදේශ සෘජු ආයෝජන ගලා ඒම, සෘජු හා වක්‍ර රැකියා උත්පාදනය, අපනයන | අවුරුදු 3ක බදු විරාමය<br>200.00 |
| 08 | ඇන්සෙල් ලංකා පුද්.සමාගම | ක්‍රියාත්මක කිරීමට කටයුතු සිදුකරමින් පවතී | අක්කර 4 රූඩ් 0 පර්චස් 17.02 | 250 | රටට විදේශ සෘජු ආයෝජන ගලා ඒම, සෘජු හා වක්‍ර රැකියා උත්පාදනය, අපනයන | -<br>1,218.80 |
| 09 | නිත්‍යා පේපර් ඇන්ඩ් බෝඩ්ස් පුද්.සමාගම | ක්‍රියාත්මක කිරීමට කටයුතු සිදුකරමින් පවතී | අක්කර 16 රූඩ් 1 පර්චස් 23.95 | 300 | රටට විදේශ සෘජු ආයෝජන ගලා ඒම, සෘජු හා වක්‍ර රැකියා උත්පාදනය, අපනයන | අවුරුදු 7ක බදු විරාමය<br>801.50 |
| 10 | අල්බොත්ඩ් ඔස්ට්‍රේලියා පුද්.සමාගම | ක්‍රියාත්මක කිරීමට කටයුතු සිදුකරමින් පවතී | අක්කර 9 රූඩ් 13 පර්චස් 0.7 | 25 | රටට විදේශ සෘජු ආයෝජන ගලා ඒම, සෘජු හා වක්‍ර රැකියා උත්පාදනය, අපනයන | අවුරුදු 7ක බදු විරාමය<br>570.00 |
| 11 | කුවලිටි පර්ෆියුම්ස් පුද්.සමාගම | වාණිජ මෙහෙයුම් ක්‍රියාත්මක කිරීමට කටයුතු සිදුකරමින් පවතී | අක්කර 1 රූඩ් 0 පර්චස් 27.50 | 75 | රටට විදේශ සෘජු ආයෝජන ගලා ඒම, සෘජු හා වක්‍ර රැකියා උත්පාදනය, අපනයන | අවුරුදු 5ක බදු විරාමය<br>362.93 |
| 12 | ජී.ජී. ඉම්පෙක්ස් ලංකා පුද්.සමාගම | වාණිජ මෙහෙයුම් ආරම්භ ඇත | අක්කර 0 රූඩ් 1 පර්චස් 29.60 | 90 | රටට විදේශ සෘජු ආයෝජන ගලා ඒම, සෘජු හා වක්‍ර රැකියා උත්පාදනය, අපනයන | අවුරුදු 7ක බදු විරාමය<br>115.00 |
| 13 | ජීපී ප්‍රඩක්ට් එස්.එල්. පුද්.සමාගම | වාණිජ මෙහෙයුම් ආරම්භ ඇත | අක්කර 2 රූඩ් 2 පර්චස් 6.35 | 438 | රටට විදේශ සෘජු ආයෝජන ගලා ඒම, සෘජු හා වක්‍ර රැකියා උත්පාදනය, දේශීය අමුද්‍රව්‍ය භාවිතය, අපනයන | -<br>80.16 |
| 14 | ලැන්මික් එක්ස්පෝර්ට්ස් පුද්.සමාගම | වාණිජ මෙහෙයුම් ආරම්භ ඇත | අක්කර 2 රූඩ් 1 පර්චස් 6.89 | 79 | රටට විදේශ සෘජු ආයෝජන ගලා ඒම, සෘජු හා වක්‍ර රැකියා උත්පාදනය, දේශීය අමුද්‍රව්‍ය භාවිතය, අපනයන | අවුරුදු 5ක බදු විරාමය<br>137.00 |
| 15 | ස්ටෝන් ඒෂියා පුද්.සමාගම | වාණිජ මෙහෙයුම් ආරම්භ ඇත | අක්කර 2 රූඩ් 1 පර්චස් 23.65 | 36 | රටට විදේශ සෘජු ආයෝජන ගලා ඒම, අපනයන | අවුරුදු 5ක බදු විරාමය<br>138.00 |
| 16 | බී.එස්.එච්. වෙන්චර්ස් පුද්.සමාගම | වාණිජ මෙහෙයුම් ආරම්භ ඇත | අක්කර 3 රූඩ් 1 පර්චස් 4.20 | 450 | රටට විදේශ සෘජු ආයෝජන ගලා ඒම, සෘජු හා වක්‍ර රැකියා උත්පාදනය, අපනයන | අවුරුදු 7ක බදු විරාමය<br>517.50 |
| 17 | එඩ්ගෙන්ග් පුද්.සමාගම | වාණිජ මෙහෙයුම් ආරම්භ ඇත | අක්කර 1 රූඩ් 0 පර්චස් 0 | 20 | රටට විදේශ සෘජු ආයෝජන ගලා ඒම, අපනයන | අවුරුදු 7ක බදු විරාමය<br>61.798 |
| 18 | බී.ජී.එෆ්.පී. පොලිමෙක් පුද්.සමාගම | වාණිජ මෙහෙයුම් ආරම්භ ඇත | අක්කර 1 රූඩ් 0 පර්චස් 0.40 | 52 | රටට විදේශ සෘජු ආයෝජන ගලා ඒම, සෘජු හා වක්‍ර රැකියා උත්පාදනය, අපනයන | අවුරුදු 3ක බදු විරාමය<br>81.26 |
| 19 | අයි.සී.එල්. රොබුස්ටා පුද්.සමාගම | වාණිජ මෙහෙයුම් | අක්කර 1 රූඩ් 0 පර්චස් 0 | 450 | රටට විදේශ සෘජු ආයෝජන ගලා ඒම, සෘජු හා වක්‍ර රැකියා උත්පාදනය, අපනයන | අවුරුදු 7ක බදු විරාමය<br>275.00 |
| 20 | මෙටල් කොම්පොනන්ට්ස් සර්විසස් පුද්.සමාගම | වාණිජ මෙහෙයුම් ආරම්භ ඇත | අක්කර 1 රූඩ් 1 පර්චස් 4.37 | 50 | රටට විදේශ සෘජු ආයෝජන ගලා ඒම, සෘජු හා වක්‍ර රැකියා උත්පාදනය, අපනයන | අවුරුදු 7ක බදු විරාමය<br>202.50 |
| 21 | ලැන්මාක් ඉංජිනියරින් පුද්.සමාගම | වාණිජ මෙහෙයුම් | අක්කර 0 රූඩ් 3 පර්චස් 38.90 | 230 | ආනයන ආදේශනය, සෘජු හා වක්‍ර රැකියා උත්පාදනය | අවුරුදු 5ක බදු විරාමය |

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)

ඒ වාගේ කොම්පැනි කීයකට ඉඩම් දීලා තිබෙනවාද, ගරු නියෝජ්‍ය ඇමතිතුමනි? පළමුවැනි අතුරු ප්‍රශ්නයට කලින් මම මේ අහන්නේ. ඔබතුමාගේ ඒ වාර්තාව තුළින් කොම්පැනි කීයකට ඉඩම් දීලා තිබෙනවාද?

**ගරු ලක්ෂ්මන් යාපා අබේවර්ධන මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் யாப்பா அபேவர்தன)
(The Hon. Lakshman Yapa Abeywardena)

මේ වන විට අංශ කීපයකට අපි දීලා තිබෙනවා. යටිතල පහසුකම් සඳහා එක කොටසක් -

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)

ගරු නියෝජ්‍ය ඇමතිතුමනි, අනිවාර්යයෙන්ම BOI එක යටතේ මෙවැනි ඉඩම් දෙන්නට අවශ්‍යයි. නමුත් ඉඩම් දෙනකොට මෙහි විවෘත භාවයක් තිබිය යුතුයි. මෙම විවෘත භාවය තුළ ටෙන්ඩර් ක්‍රමය නැති වුණාට යම් විධියකින් unsolicited proposals ආවාම, මේ අය ආරම්භ කරන්න යන කොම්පැනිය මොකක්ද, ඒකෙන් රැකීරක්ෂා කොච්චර ලැබෙනවාද කියන දේවල් ඔක්කෝම ගැන සොයා බැලීමක් කරනවා. නමුත් මැතක ඉඳලා මේවා බලන්නේ නැහැයි කියන එක ඔබතුමා පිළිගන්නවාද? මා හිතන විධියට මේ අවස්ථාවේදී නිකරුණේ ඉඩම්-

**ගරු ලක්ෂ්මන් යාපා අබේවර්ධන මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் யாப்பா அபேவர்தன)
(The Hon. Lakshman Yapa Abeywardena)

මැතකදී තමයි වඩාත්ම හොඳින් අපි පරීක්ෂණ කරලා තිබෙන්නේ. මොකද, මැතක සිට අපි හැම අංශයක් ගැනම බලනවා. අපිට අත් දැකීම් රාශියක් තිබෙනවා. සමහර අවස්ථාවලදී පසු ගිය රජයන් විසින් -

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)

මැතකදී කියලා කිව්වාම අදහස් වන්නේ කොහොමද ගරු නියෝජ්‍ය ඇමතිතුමනි? අපි මෙහෙම කියමු කෝ. අපි ෂැන්ග්‍රි-ලා කොම්පැනිය එළියට එනකන් ඕනෑ විධියකට දුන්නා. ඒක ඔබතුමාම පිළිගන්නවා. ඊට පසුව නොවෙයි. මොකද, 2009 වර්ෂයේ සිට තමයි මම විස්තර ඉල්ලලා තිබෙන්නේ. මේ වාගේ නිකරුණේ ඉඩම් දීලා -

**ගරු ලක්ෂ්මන් යාපා අබේවර්ධන මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் யாப்பா அபேவர்தன)
(The Hon. Lakshman Yapa Abeywardena)

නැහැ, නිකරුණේ ඉඩම් දුන්නේ නැහැ. ඔබතුමාට මා කිව්වා, අක්කරයක් රුපියල් ලක්ෂ 14,000කට වැඩි මුදලකට තමයි ෂැන්ග්‍රි -ලා සමාගමට දුන්නේ කියලා.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)

කොහොමද ඒ පදනම පිළිගන්නේ? සිනමන් ග්‍රෑන්ඩ් කොම්පැනියේ කට්ටිය කියනවා, "අපිට දුන්නා නම් අපි පර්ච් එකක් රුපියල් ලක්ෂ 65කට ගන්නවා" කියලා.

**ගරු ලක්ෂ්මන් යාපා අබේවර්ධන මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் யாப்பா அபேவர்தன)
(The Hon. Lakshman Yapa Abeywardena)

ඔබතුමා දන්නවානේ. මම මේ ඉඩම් දුන්නු හැටි ගැන අතීතයට යන්නේ නැහැ. මම මීට කලින් කිව්වා, අර වැල්ලවත්තේ අක්කර 13ක ඉඩම දීපු ගණන කීයද කියලා. එතකොට හිල්ටන් එක කොච්චර ගණනකටද දුන්නේ කියලා මා කිව්වා.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)

දැන් ඔබතුමා පීලි පනිනවා නේ. 1984ට පසුව ඉඩම් දෙන එකයි, ඊට අවුරුදු 25කට පසුව ඉඩම් දෙන එකයි සංසන්දනය කිරීමේ වටිනාකමක් නැහැ.

**ගරු ලක්ෂ්මන් යාපා අබේවර්ධන මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் யாப்பா அபேவர்தன)
(The Hon. Lakshman Yapa Abeywardena)

අපි ෂැන්ග්‍රි-ලා එක දීපු ගණන, අර කලින් දීපු ඉඩමේ ගණන අනුව බැලුවාම තව අවුරුදු 500කටවත් ඒ මුදල් ගන්න බැහැ. තව අවුරුදු 500ක් තිබුණත් ඒ මුදල ගන්න බැහැ.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)

ඔබතුමා සාපේක්ෂව බලන්න අවශ්‍යයි නේ. මම කිව්වා වාගේ, අද සිනමන් ග්‍රෑන්ඩ් කොම්පැනිය කියනවා, "අපි ලක්ෂ 65කට, 70කට ඒ පර්ච් එකක් ගන්නවා" කියලා. නමුත් ඔබතුමා පර්ච් එකක් වික්කේ ලක්ෂ 55කට.

**ගරු ලක්ෂ්මන් යාපා අබේවර්ධන මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் யாப்பா அபேவர்தன)
(The Hon. Lakshman Yapa Abeywardena)

සිනමන් ග්‍රෑන්ඩ් එක -

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)

ඔබතුමන්ලාගේ ආණ්ඩුව කියනවා, දේශීය නිෂ්පාදනය හුරු කරන්නට ඕනෑ කියලා.

**ගරු ලක්ෂ්මන් යාපා අබේවර්ධන මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் யாப்பா அபேவர்தன)
(The Hon. Lakshman Yapa Abeywardena)

තව ඉඩම් තිබෙනවා. ඕනෑම සමාගමක් ඔය කියන ගණනට ඉඩම් ඉල්ලනවා නම් ගන්න පුළුවන් නේ. තව ඉඩම් තිබෙනවා.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)

ඔබතුමාගේ පිළිතුර අනුව, හෙට කොම්පැනියක් ඇවිල්ලා ඇහුවොත් මේ ඉඩම ගන්න පුළුවන්ද කියලා, ඒක දෙනවාද?

**ගරු ලක්ෂ්මන් යාපා අබේවර්ධන මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் யாப்பா அபேவர்தன)
(The Hon. Lakshman Yapa Abeywardena)

ඔබතුමන්ලා ඔය ලෙඩේ දාපු නිසා තමයි සමහර කොම්පැනි පිටුපස්සට යන්නේ.

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
Order, please! කරුණාකරලා අතුරු ප්‍රශ්නවලට පමණක් සීමා කරන්න. කාලය ඉක්ම ගිහිල්ලායි තිබෙන්නේ.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
ඒක තමයි ගරු නියෝජ්‍ය ඇමතිතුමනි. දැන් ඔබතුමාගේ පිළිතුර තුළින් විවෘත වන ආකාරයට, හෙට කොම්පැනියක් ඇවිල්ලා කිව්වොත්, ගාලුමුවදොර අපට දෙන්න ලක්ෂ 100කට -

**ගරු ලක්ෂ්මන් යාපා අබේවර්ධන මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் யாப்பா அபேவர்தன)
(The Hon. Lakshman Yapa Abeywardena)
නැහැ, එහෙම දෙන්නේ නැහැ.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
එහෙම දෙන්නේ නැද්ද?

**ගරු ලක්ෂ්මන් යාපා අබේවර්ධන මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் யாப்பா அபேவர்தன)
(The Hon. Lakshman Yapa Abeywardena)
නැහැ, එහෙම දෙන්නේ නැහැ. හෝටලයක් දමන්න කියලා වෙනත් සමාගමක් අපෙන් ඉල්ලුවොත් අපි දෙනවාද? ෂැන්ග්‍රි-ලා කියන්නේ ලෝකයේ පළමුවැනි පස්දෙනා අතර ඉන්න සමාගමක්.

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
අතුරු ප්‍රශ්න අංක දෙක.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
ෂැන්ග්‍රි-ලා කොම්පැනියට දුන්නාට පස්සේ ඉන්දියන් ෂෙරටන් කොම්පැනියට කොහොමද දුන්නේ?

**ගරු ලක්ෂ්මන් යාපා අබේවර්ධන මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் யாப்பா அபேவர்தன)
(The Hon. Lakshman Yapa Abeywardena)
ෂෙරටන් කියන්නේත් ඒ වාගේ සමාගමක්. ඉල්ලුවාට අපි නිකම්ම ඉඩම් දෙන්නේ නැහැ. එහෙම නම් කුඩුකාරයොත් ඇවිල්ලා ඉල්ලයි නේ.

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
අතුරු ප්‍රශ්න අංක තුන.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, උත්තර ලැබෙන්නේ නැතුව ඔබතුමා එක, දෙක, තුන කියනවා.

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
කරුණාකරලා අතුරු ප්‍රශ්න තිබෙනවා නම් අහන්න.

**ගරු ලක්ෂ්මන් යාපා අබේවර්ධන මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் யாப்பா அபேவர்தன)
(The Hon. Lakshman Yapa Abeywardena)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, බුහාරි එක ඉල්ලුවොත් අපි දෙනවාද Galle Face එක? [බාධා කිරීමක්] බුහාරි එක ඉල්ලුවාට අපි දෙන්නේ නැහැ.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
ඔබතුමා කිව්වා ෂැන්ග්‍රි-ලා කොම්පැනිය ලෝකයේ තිබෙන කොම්පැනිවලින් හොඳම එකක් කියලා. එහෙම නම් ඉන්දියන් ෂෙරටන් කොම්පැනියට කොහොමද ඒ වාගේම එතැන ඉඩම් ලබා දුන්නේ?

**ගරු ලක්ෂ්මන් යාපා අබේවර්ධන මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் யாப்பா அபேவர்தன)
(The Hon. Lakshman Yapa Abeywardena)
ෂෙරටන් කොම්පැනියත් හොඳම කොම්පැනියක්.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
නැහැ. ෂෙරටන් කොම්පැනිය නොවෙයිනේ ගත්තේ. ඉන්දියන් කොම්පැනිය ගත්තේ.

**ගරු ලක්ෂ්මන් යාපා අබේවර්ධන මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் யாப்பா அபேவர்தன)
(The Hon. Lakshman Yapa Abeywardena)
අපි එකම ඉඩමක්වත් හොඳ නැති කොම්පැනිවලට දීලා නැහැ.

## මග නැගුම යන්ත්‍රෝපකරණ සමාගම : විස්තර
மகநெகும இயந்திரோபகரண கம்பனி: விபரம்
MAGA NEGUMA MACHINERY COMPANY : DETAILS

1930/'11

15. **ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
වරාය හා මහාමාර්ග අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) මග නැගුම යන්ත්‍රෝපකරණ සමාගම පිහිටුවනු ලැබූ දිනය කවරේද;

(ii) එම සමාගමේ කොටස් හිමියන් කවුරුන්ද;

(iii) එක් එක් කොටස් හිමියා සතු කොටස් ප්‍රමාණය කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) මග නැගුම යන්ත්‍රෝපකරණ සමාගම ආරම්භ කිරීමේදී මාර්ග සංවර්ධන අධිකාරියෙන් හෝ එවකට එහි පාලිත සමාගමේ හා ආශ්‍රිත සමාගම්වලින් යන්ත්‍රෝපකරණ හෝ වෙනත් ප්‍රාග්ධන ලබා ගෙන තිබේද;

(ii) එසේ නම්, ලබා ගත් දේ කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

துறைமுகங்கள், நெடுஞ்சாலைகள் அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) மகநெகும இயந்திரோபகரண கம்பனி தாபிக்கப் பட்ட திகதி யாதென்பதையும்;

(ii) அக்கம்பெனியின் பங்குரிமையாளர்கள் யாவர் என்பதையும்

(iii) ஒவ்வொரு பங்குரிமையாளரும் கொண்டுள்ள பங்குகளின் எண்ணிக்கை யாது எனபதையும்

அவர்குறிப்பிடுவாரா?

(ஆ) (i) மகநெகும இயந்திரோபகரண கம்பனி ஆரம்பிக் கப்படுகையில் வீதி அபிவிருத்தி அதிகார சபையிலிருந்து அல்லது அப்போது அதனால் நிருவகிக்கப்பட்ட கம்பெனியிலிருந்து மற்றும் அது சார்ந்த கம்பனிகளிலிருந்து இயந்திர உபகரணங்களோ அல்லது பிற மூலதனங்களோ பெறப்பட்டுள்ளதா என்பதையும்;

(ii) ஆமெனில், பெறப்பட்டவை யாவை என்பதையும்

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(இ) இன்றேல், ஏன்?

asked the Minister of Ports and Highways :

(a) Will he state-

(i) the date on which the Maga Neguma Machinery Company was established;

(ii) the names of the shareholders of this company; and

(iii) the number of shares owned by each shareholder?

(b) Will he inform this House-

(i) whether machinery or other assets have been obtained from the Road Development Authority or its subsidiary company and related companies when the Maga Neguma Machinery Company was established;

(ii) if so, of the things so obtained?

(c) If not, why?

**ගරු නිර්මල කොතලාවල මහතා**
(மாண்புமிகு நிர்மல கொத்தலாவல )
(The Hon. Nirmala Kotalawala)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, වරාය හා මහාමාර්ග අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර දෙනවා.

(අ) (i) 2004 ජූනි 11.

(ii) සමාගමේ මුල් කොටස් හිමියන් පහත සඳහන් කර ඇත.

හිටපු අධ්‍යක්ෂ ජයන්ත ධර්මදාස මහතා

හිටපු සභාපති චමින්ද අතලුව මහතා

මාර්ග සංවර්ධන අධිකාරිය

(iii) හිටපු අධ්‍යක්ෂ ජයන්ත ධර්මදාස මහතා - 1/3

හිටපු සභාපති චමින්ද අතලුව මහතා - 1/3

මාර්ග සංවර්ධන අධිකාරිය - 1/3

(ආ) (i) ලබා දී ඇත.

(ii) මාර්ග සංවර්ධන අධිකාරිය සතුව තිබූ යන්ත්‍රෝපකරණ සහ පෙරමුසු යන්ත්‍රාගාර කුලී පදනම මත ලබා දී ඇති අතර, ප්‍රාග්ධනය ලබා දී නොමැත.

(ඇ) අදාළ නොවේ.

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)

ගරු නියෝජ්‍ය ඇමතිතුමනි, ඔබතුමා (ආ) (ii)ට දුන් පිළිතුර මොකක්ද?

**ගරු නිර්මල කොතලාවල මහතා**
(மாண்புமிகு நிர்மல கொத்தலாவல)
(The Hon. Nirmala Kotalawala)

මාර්ග සංවර්ධන අධිකාරිය සතුව තිබූ යන්ත්‍රෝපකරණ සහ පෙරමුසු යන්ත්‍රාගාර කුලී පදනම මත ලබා දී ඇත.

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)

ගරු නියෝජ්‍ය ඇමතිතුමා, ගත්ත භාණ්ඩවල විස්තරයක් පිළිතුරේ සඳහන් කරලා නැද්ද?

**ගරු නිර්මල කොතලාවල මහතා**
(மாண்புமிகு நிர்மல கொத்தலாவல)
(The Hon. Nirmala Kotalawala)

නැහැ. ඔබතුමා ප්‍රශ්නයෙන් අහලා තිබෙන්නේ, ලබා ගත් දේ කවරේද යන්න සභාවට දන්වන්නෙහිද කියලායි.

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)

මුදල් ප්‍රමාණයක් දන්නේත් නැහැ නේද?

**ගරු නිර්මල කොතලාවල මහතා**
(மாண்புமிகு நிர்மல கொத்தலாவல)
(The Hon. Nirmala Kotalawala)

දක්වලා නැහැ. ගරු මන්ත්‍රීතුමා, ඔබතුමාට ඕනෑ නම් ඒවා දන්වන්න පුළුවන්.

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)

ඔබතුමාට පුළුවන්නම් කරුණාකරලා ඒ ලබා ගත්ත භාණ්ඩ මොනවාද, ඒවායේ වටිනාකම කීයද කියලා මට දන්වන්න. බොහොම ස්තුතියි.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මම පළමුවැනි අතුරු ප්‍රශ්නය අහන්නම්. මේ සමාගම ස්ථාපිත කිරීම සම්බන්ධව ලොකු ප්‍රශ්නයක් තිබෙනවා. දැන් මගේ ළඟ තිබෙනවා එදා මහින්ද රාජපක්ෂ මැතිතුමා ඉදිරිපත් කරපු කැබිනට් පත්‍රිකාව. ඒකේ බොහොම පැහැදිලිව තිබෙන්නේ මේ සමාගම හදන කොට ඉදිකිරීම් කොන්ත්‍රාත්කරුවන්ගේ සංගමය සහ ඉදිකිරීම් කර්මාන්ත සභාව සමඟ ඒකාබද්ධ හවුල් ව්‍යාපාරයකට එළැඹෙන්න කියලායි.

නමුත් මහනැගුම යන්ත්‍රෝපකරණ සමාගම පිහිටුවීමේදීම ඔබතුමන්ලා ලොකු ප්‍රශ්නයක් ඇති කර ගෙන තිබෙනවා. ඒ නිසා තමයි අද මේ ප්‍රශ්නය උද්ගත වෙලා තිබෙන්නේ. COPE එකේදීත් අපි මේ ගැන දිගින් දිගටම ප්‍රශ්න කළා. ඒ නිසා මේ වනකොට ඔබතුමන්ලා කැබිනට් පත්‍රිකාව අනුව හරියට කොටස් ස්ථාපිත

[ගරු දයාසිරි ජයසේකර මහතා]

කරලා, මේ සමාගම ස්ථාපිත කරන්නට අවශ්‍ය කටයුතු කර තිබෙනවාද කියලා මම දැන ගන්න කැමැතියි. මොකද, ඇමතිවරු දවස ගානේ මාත් එක්ක මේ පාර්ලිමේන්තුවේ රණ්ඩු කළේ, කෑ ගැහුවේ මේක පෞද්ගලික ආයතනයක් කියලායි. හැබැයි කොන්ත්‍රාත් දෙනකොට රජයේ කොන්ත්‍රාත් සියල්ලම ඒ අයට නොමිලේම දුන්නා. දැන් මේකෙන් සිද්ධ වෙලා තිබෙන්නේ දැවැන්ත විනාශයක්. ඊ ළඟ ප්‍රශ්නයේදී මම ඒ ගැන අහන්නම්. මේ කැබිනට් පත්‍රිකාව අනුව මේ සමාගම ස්ථාපිත කරලා අවශ්‍ය කටයුතු කරන්න සූදානම්ද කියලා මම ගරු නියෝජ්‍ය ඇමතිතුමාගෙන් අහනවා.

**ගරු නිර්මල කොතලාවල මහතා**
(மாண்புமிகு நிர்மல கொத்தலாவல)
(The Hon. Nirmala Kotalawala)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ගරු මන්ත්‍රීතුමා සඳහන් කරන පරිදි මෙහි කිසි ගැටලුවක් නැහැ. නමුත් අදාළ නීතිමය තත්ත්වය තුළ කටයුතු කිරීමට සියලු කටයුතු සූදානම් කර තිබෙනවා.

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
ඒ කියන්නේ කලින් එවැනි ප්‍රශ්නයක් තිබුණා කියලා ඔබතුමා පිළිගන්නවා?

**ගරු නිර්මල කොතලාවල මහතා**
(மாண்புமிகு நிர்மல கொத்தலாவல)
(The Hon. Nirmala Kotalawala)
කොන්ත්‍රාත් ලබා දීමේදී ප්‍රශ්නයක් තිබුණේ නැහැ.

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
මම කියන්නේ කොන්ත්‍රාත් ගැන නොවෙයි.

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
දෙවන අතුරු ප්‍රශ්නයද ගරු මන්ත්‍රීතුමා?

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
නැහැ. මම මේ පැහැදිලි කර ගැනීමක් කරන්නේ.

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
නැහැ, නැහැ. පැහැදිලි කරන්න වෙලාවක් නැහැ. දෙවන අතුරු ප්‍රශ්නය.

**ගරු නිර්මල කොතලාවල මහතා**
(மாண்புமிகு நிர்மல கொத்தலாவல)
(The Hon. Nirmala Kotalawala)
සමාගම් රෙජිස්ට්‍රාර් සමඟ ඒ අදාළ නීතිමය කටයුතු කරනවා, තුනෙන් එක, තුනෙන් එක වශයෙන් අදාළ කොටස් ප්‍රමාණය සමඟ.

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
නැහැ, නැහැ. මම අහන්නේ ඒක නොවෙයි. ඔබතුමා කියන දේ වැරදියි. ඒ සමාගම හදපු විධියේ වැරැද්දක් තිබෙනවා කියන එකයි මම මේ කියන්නේ.

**ගරු නිර්මල කොතලාවල මහතා**
(மாண்புமிகு நிர்மல கொத்தலாவல)
(The Hon. Nirmala Kotalawala)
ඔබතුමා නේ කියන්නේ.

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
මම නොවෙයි, මේ කැබිනට් පත්‍රිකාව අනුවයි එහෙම කියන්නේ. මෙය ඔබතුමන්ලාගේ ජනාධිපතිතුමා දමපු කැබිනට් පත්‍රිකාව.

**ගරු නිර්මල කොතලාවල මහතා**
(மாண்புமிகு நிர்மல கொத்தலாவல)
(The Hon. Nirmala Kotalawala)
අදාළ කැබිනට් පත්‍රිකාව අනුව කටයුතු කිරීමට අමාත්‍යාංශයත්, මාර්ග සංවර්ධන අධිකාරියත් කටයුතු කරනවා. ඒ ගැන කිසි ගැටලුවක් නැහැ.

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
ඒහෙම වෙලා තිබුණේ නැහැ. ඒකයි මම කියන්නේ.

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
තුන්වන අතුරු ප්‍රශ්නය.

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
තුන්වන අතුරු ප්‍රශ්නය නොවෙයි. මේක පැහැදිලි කර ගැනීමක්.

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
ගරු මන්ත්‍රීතුමනි, පැහැදිලි කරන්න වෙලාවක් නැහැ. අතුරු ප්‍රශ්න අහන්න විතරයි පුළුවන්. දැන් වෙලාව පස්වරු දෙකයි කාලයි.

**ගරු නිර්මල කොතලාවල මහතා**
(மாண்புமிகு நிர்மல கொத்தலாவல)
(The Hon. Nirmala Kotalawala)
ගරු මන්ත්‍රීතුමනි, එහෙම වෙලා නැහැයි කියන්නේ මොකක්ද?

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
කැබිනට් පත්‍රිකාවට අනුව සමාගම පිහිටුවා නැති බව බොහොම පැහැදිලිව කියා තිබෙනවා.

**ගරු නිර්මල කොතලාවල මහතා**
(மாண்புமிகு நிர்மல கொத்தலாவல)
(The Hon. Nirmala Kotalawala)
2004 ජූනි මාසයේ 11 වැනිදා සමාගම පිහිටුවනකොට තිබුණු කැබිනට් පත්‍රිකාව අනුව තමයි කටයුතු කරලා තිබෙන්නේ.

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
වැරදියි. ඒ අනුව කටයුතු කරලා නැහැ. ඔබතුමා ගිහින් අහන්නකෝ. ඔබතුමා දන්නේ නැති නිසායි මම මේ කියන්නේ. කරුණාකරලා ඔබතුමාගේ අමාත්‍යාංශයේ ලේකම්තුමාගෙන් අහලා ඒ අවශ්‍ය කටයුතු කරනවාද නැද්ද කියන එකයි මම අහන්නේ.

**ගරු නිර්මල කොතලාවල මහතා**
(மாண்புமிகு நிர்மல கொத்தலாவல)
(The Hon. Nirmala Kotalawala)
මම කියන්නේ පැහැදිලිවම අදාළ කැබිනට් ප්‍රතිකාව අනුව කටයුතු කරනවා කියන එකයි.

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
හරි. ඒක හරි.

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
දෙවන වටය.

ප්‍රශ්න අංක 1- 0851/'10 - (2), ගරු රවි කරුණානායක මහතා.

[බාධා කිරීම්]

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මම අතුරු ප්‍රශ්නය ඇහුවේ නැහැ. මට ඉඩ දෙන්න. [බාධා කිරීම්]

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මම ඒ ප්‍රශ්නය අහනවා. [බාධා කිරීම්]

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
ගරු සමුපකාර හා අභ්‍යන්තර වෙළෙඳ අමාත්‍යතුමා පිළිතුරු දෙනවාද? [බාධා කිරීම්] ගරු මන්ත්‍රීතුමනි, දැන් වෙලාව නැහැ. ඔබතුමා අතුරු ප්‍රශ්න තුනකට වඩා ඇහුවා. [බාධා කිරීම්]

දෙවන වටය. සමුපකාර හා අභ්‍යන්තර වෙළෙඳ අමාත්‍යතුමා පිළිතුරු දෙනවාද?

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, සමුපකාර හා අභ්‍යන්තර වෙළෙඳ අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුරු දීම සඳහා සතියක කාලයක් ඉල්ලනවා.

***ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.***
*வினாவை மற்றொரு தினத்திற் சமர்ப்பிக்கக் கட்டளையிடப்பட்டது.*
*Question ordered to stand down.*

## සිවිල් ගුවන්සේවා ක්ෂේත්‍රයේ සංවර්ධන ව්‍යාපෘති : ප්‍රතිලාභ
சிவில் விமான சேவைகள் துறை அபிவிருத்திக் கருத்திட்டங்கள் : நன்மைகள்
DEVELOPMENT PROJECTS IN CIVIL AVIATION FIELD : BENEFITS

1683/'11

**3. ගරු අල්හාජ් ඒ.එච්.එම්. අස්වර් මහතා (ගරු එරික් ප්‍රසන්න වීරවර්ධන මහතා වෙනුවට)**
(மாண்புமிகு அல்ஹாஜ் ஏ.எச்.எம். அஸ்வர் - மாண்புமிகு எரிக் பிரசன்ன வீரவர்தன சார்பாக)
(The Hon. Alhaj A.H.M. Azwer on behalf of the Hon. Eric Prasanna Weerawardhana)
සිවිල් ගුවන් සේවා අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (3):

(අ) (i) 2006 වර්ෂයේ සිට මේ දක්වා කාල සීමාව තුළ සිවිල් ගුවන්සේවා ක්ෂේත්‍රයේ ක්‍රියාත්මක කරන ලද සංවර්ධන ව්‍යාපෘති කවරේද;

(ii) එම ව්‍යාපෘති හරහා ජනතාවට ලැබී ඇති ප්‍රතිලාභ කවරේද;

(iii) ඉදිරියේදී සිවිල් ගුවන්සේවා ක්ෂේත්‍රයේ ක්‍රියාත්මක කිරීමට අපේක්ෂිත සංවර්ධන ව්‍යාපෘති කවරේද;

(iv) ඒවායින් අපේක්ෂිත ප්‍රතිඵල කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

சிவில் விமான சேவைகள் அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) 2006ஆம் ஆண்டு தொடக்கம் இற்றைவரையான காலப்பகுதியில் சிவில் விமான சேவைகள் துறையில் நடைமுறைப்படுத்தப்பட்ட அபிவிருத் திக் கருத்திட்டங்கள் யாவை என்பதையும்;

(ii) இக்கருத்திட்டங்களினூடாக மக்களுக்குக் கிடைத்துள்ள நன்மைகள் யாவை என்பதையும்;

(iii) எதிர்காலத்தில் சிவில் விமான சேவைகள் துறையில் நடைமுறைப்படுத்த எதிர்பார்த்துள்ள அபிவிருத்திக் கருத்திட்டங்கள் யாவை என்பதையும்;

(iv) அவற்றிலிருந்து எதிர்பார்க்கப்படுகின்ற நன்மைகள் யாவை என்பதையும்

அவர் இச்சபையில் அறிவிப்பாரா?

(ஆ) இன்றேல், ஏன்?

[ගරු අල්හාජ් ඒ.එච්.එම්. අස්වර් මහතා]

asked the Minister of Civil Aviation:

(a) Will he inform this House of -

(i) the development projects implemented in the field of civil aviation during the period from year 2006 up to now;

(ii) the benefits received by the people through these projects;

(iii) the development projects expected to be implemented in the field of civil aviation in future; and

(iv) the results expected through them?

(b) If not, why?

**ගරු පියංකර ජයරත්න මහතා**
(மாண்புமிகு பியங்கர ஜயரத்ன )
(The Hon. Piyankara Jayaratne)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මා එම ප්‍රශ්නයට පිළිතුර **සභාගත*** කරනවා.

**** සභාමේසය මත තබන ලද පිළිතුර:***
** சபாபீடத்தில் வைக்கப்பட்ட விடை*
** Answer tabled:*

(අ) (i) ඇමුණුම A පරිදි
(ii) ඇමුණුම A පරිදි
(iii) ඇමුණුම B පරිදි
(iv) ඇමුණුම B පරිදි

(ආ) පැන නොනඟී.

****සභාමේසය මත තබන ලද ඇමුණුම:***
*சபாபீடத்தில் வைக்கப்பட்ட இணைப்பு :*
*Annexes tabled:*

ඇමුණුම A

| (අ) | (i) | (ii) |
|---|---|---|
| ආයතනයේ නම | 2006 වර්ෂයේ සිට මේ දක්වා කාල සීමාව තුළ සිවිල් ගුවන්සේවා ක්ෂේත්‍රයේ ක්‍රියාත්මක කරන ලද සංවර්ධන ව්‍යාපෘතීන් | එම ව්‍යාපෘතීන් හරහා ජනතාවට ලැබී ඇති ප්‍රතිලාභ |
| ශ්‍රී ලංකා සිවිල් ගුවන්සේවා අධිකාරිය | 2010 අංක 14 දරණ සිවිල් ගුවන්සේවා පනත සම්මත කරගැනීම. | ජාත්‍යන්තර සම්මුතීන්ට අනුකූලව ශ්‍රී ලංකාවේ ගුවන්සේවා ක්ෂේත්‍රය විධිමත්වීම තුළින් ශ්‍රී ලංකාව, දකුණු ආසියාවේ ගුවන්සේවා මධ්‍යස්ථානයක් බවට සංවර්ධනය වීමෙන් ජනතාවගේ ආදයම් උත්පාදන අවස්ථාව ඉහළයාම සහ විරැකියාව අවමවීම. |
| | "ගුවන්සර" ත්‍රෛමාසික සඟරාව සිංහල, දෙමළ සහ ඉංග්‍රීසි යන භාෂාත්‍රයෙන්ම පළකිරීම සහ දිවයිනේ උසස් පෙළ පන්ති පවත්වනු ලබන පාසල් 279කට නොමිලේ පිටපත් ලබාදීම. | සිංහල,දෙමළ සහ ඉංග්‍රීසි යන භාෂාත්‍රයෙන්ම ඉගෙනුම ලබන දිවයිනේ උසස් පෙළ දරුවන්ට ගුවන්සේවා ක්ෂේත්‍රය පිළිබඳ දැනුම ලබාගත හැකිවීම. |
| | දිවයිනේ දිස්ත්‍රික්ක 25 තුළ පවතින අධ්‍යාපන කලාප 92ක් ආවරණය වන පරිදි "ගුවන්සේවා ක්ෂේත්‍රයෙන් බිඳක් ශ්‍රී ලාංකේය දරුවනට" යන තේමාව යටතේ සම්මන්ත්‍රණ මාලාවක් පැවැත්වීම හා ඊට සමගාමීව උසස් පෙළ සිසුන් අතර ගුවන්සේවා සමාජ (Aviation Clubs) පිහිටුවීම | ශ්‍රී ලාංකේය පාසල් දරුවන්ට ගුවන්සේවා ක්ෂේත්‍රය පිළිබඳ දැනුම ලබාගත හැකිවීම. |
| | "ගුවන්සර" වෙබ් අඩවිය ක්‍රියාත්මක කිරීම. | ඕනෑම අයෙකුට අන්තර්ජාලය ඔස්සේ ගුවන්සේවා ක්ෂේත්‍රය පිළිබඳ දැනුවත් විය හැකිවීම. |
| සී/ස ගුවන්තොටුපල හා ගුවන්සේවා (ශ්‍රී ලංකා) සමාගම | බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන්තොටුපලේ පිහිටි මහජන පිටවීමේ සහ පැමිණීමේ ශාලා, (සාප්පු, බැංකු සහ ආපනශාලා ඇතුළුව) පුළුල් කිරීම. | ගුවන් මගීන්ට, ඔවුන් සමග පැමිණෙන අමුත්තන්ට වැඩි දියුණු කළ අමතර සේවා භුක්තිවිඳීමට හැකිවීම සහ පුද්ගලයන් සඳහා අතිරේක ආදයම් මාර්ග බිහිවීම |
| | බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන්තොටුපලේ පිටවීමේ පර්යන්තය තුළ ව්‍යාපාරික ප්‍රභූන් සඳහා නව ආලින්දයක් ගොඩනැඟීම සහ විශේෂ අමුත්තන් සඳහා දැනට පවත්නාවූ ආලින්දය පුළුල් කිරීම. | මගීන් සඳහාවූ පහසුකම් වැඩි දියුණු වීම. |
| | බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන්තොටුපලේ පැමිණීමේ පර්යන්තය පුළුල් කිරීම සහ නව ගමන් මළු පථයක් (ගමන් මළු පථ අංක 06) එකතු කිරම. | මගීන්ට කෙටි වේලාවකින් ගුවන්තොටුපලින් පිටවීමේ පහසුකම් ලැබීම. |
| | නව ජලය පොම්ප කිරීමේ ස්ථානයක් ඉදි කිරීම හා නයිකන්දේ පිහිටි ජල පොම්පාගාරයට අදාල පයිප්ප පද්ධතිය ඉදිකිරීම. | ගුවන් මගීන් සඳහා ජල පහසුකම් වැඩිවීම. |
| | බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන්තොටුපල තුළ භාණ්ඩ සහ මගී ආරක්ෂක කපොලු ඉදිකිරීම. | ගුවන්තොටුපල මගී ආරක්ෂාව තහවුරු වීම. |
| | පැමිණීමේ සහ පිටවීමේ බාහිර අංගන නවීකරණය කිරීම | ගුවන්තොටුපලෙහි බාහිර පෙනුම අලංකරණය තුළින් මගීන්ට ප්‍රියමනාප ස්ථානයක් නිර්මාණයවීම. |

| | | |
|---|---|---|
| | බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන්තොටුපල සඳහාවූ ගොඩබිම් පිවිසුම් මාර්ගය පිළිසකර කිරීම. | ප්‍රවේශ මාර්ගයේ තත්ත්වය වැඩි දියුණුවීම තුළින් වාහන තදබදය අඩුවීම සහ අලංකාර පෙනුම |
| | බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන්තොටුපල මගීන් හුවමාරුවන ප්‍රදේශය (Transit Area)පුළුල් කිරීම | හුවමාරුවන මගීන් (Transit passengers)සඳහා නව පහසුකම් එකතුවීම. |
| | හුවමාරුවන මගීන් සඳහා හෝටලයක් (Transit Hotel) ඉදිකිරීම. | හුවමාරුවන මගීන් (Transit passengers)සඳහා පහසුකම් සැලසීම සමගම සෘජු හා වක්‍ර රැකියා අවස්ථා බිහිවීම සඳහා උපකාරීවීම, අතිරේක විදේශ විනිමය ලැබීම. |
| | බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන්තොටුපලේ පැමිණීමේ හා පිටවීමේ පර්යන්තය තුළ සේද මාවත (Silk Route) ආලින්ද ඉදිකිරීම. | කොළඹට නොපැමිණෙන එහෙත් ගුවන්තොටුපල පරිහරණය කරන පුද්ගලයින් සඳහා ව්‍යාපාරික හමු පැවැත්වීම සඳහා ඉඩ සැලසීම තුළින් අතිරේක ආදායම් මාර්ග ඉපැයීමට හැකිවීම. |
| | දත්ත ජාලගත කිරීම. | මධ්‍යස්ථාන අතර සම්බන්ධතාවයක් ඇති කිරීම තුළින් තොරතුරු සන්නිවේදනයේ කාර්යක්ෂමතාවය වැඩි දියුණුවීම සහ මෙමගින් අනාගත සංවර්ධන ව්‍යාපෘතිවලට යටිතල පහසුකම් ලැබීම. |
| | ගොඩබිම් සන්නිවේදන පද්ධතියක් තැනීම. | ගුවන්තොටුපල භූමියෙහි පිහිටා ඇති ආයතන අතර තොරතුරු සන්නිවේදනය |
| | ගුවන් ගමන් සේවා පණිවිඩ හුවමාරු පද්ධතියක් ක්‍රියාත්මක කිරීම. | රට රටවල් අතර සිවිල් ගුවන්සේවාවට අදාල පණිවිඩ හුවමාරු කරගැනීමේ හැකියාව |
| | පිදුරුතලාගල රේඩාර් යන්ත්‍රය අළුත්වැඩියා සහ නවීකරණය කිරීම. | රේඩාර් යන්ත්‍රයෙන් ආවරණය වන කලාපය නාවික සැතපුම් 200 සිට 250 දක්වා වැඩිවීම. |
| | රත්මලාන ගුවන්තොටුපල ධාවන පථය පිළිසකර කිරීම. | Cooperate jets සඳහා රත්මලාන ගුවන්තොටුපල යොදගැනීමේ පහසුකම ලැබීම. |
| | ශ්‍රී ලංකාවේ දෙවන ජාත්‍යන්තර ගුවන්තොටුපල මේ වනවිට හම්බන්තොට ඉදිවෙමින් පවතින අතර එය වර්ෂ 2012 වනවිට ක්‍රියාත්මක කිරීම. | වැඩිවන මගීන් සහ ගුවන්යානා හමුවේ බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන්තොටුපලට විකල්ප ගුවන්තොටුපලක් වශයෙන් භාවිතා කළ හැකිවීම, සෘජු හා වක්‍ර රැකියා අවස්ථා බිහිවීම සහ අදල ප්‍රදේශයේ යටිතල පහසුකම් ඇතුළුව එකී ප්‍රදේශයේ පදිංචිකරුවන්ගේ ජීවන මට්ටම සංවර්ධනය වීම. |
| ශ්‍රී ලංකන් ගුවන් සමාගම | කල් බදු ක්‍රමය යටතේ ගුවන්යානා 04 ක් ලබාගැනීම. | ගුවන් මගීන් සඳහා පහසුකම් සහිතව ගුවන් ගමන්වල යෙදීමට හැකිවීම. |
| | නව ගුවන් ගමනාන්ත (New Destinations) සඳහා සෘජු මෙහෙයුම් දියත් කිරීම.(රෝමය, මිලාන්, ෂැංග්හයි, ග්වැංග්ෂු, කොචින්,මොස්කව් සහ සූරිච්) | ශ්‍රී ලාංකිකයන්ට යුරෝපය සහ ඈත පෙරදිග ඇති තම සිත්ගත් ජාත්‍යන්තර ගමනාන්තයන් වෙත සෘජු ගුවන් ගමන්වල යෙදීමට හැකියාව ලැබීම, ශ්‍රී ලංකාවට සංචාරකයන්ගේ පැමිණීම වර්ධනය වීම. |
| | ආධුනික ගුවන් නියමු පුහුණු වැඩසටහන් ආරම්භ කිරීම. | ශ්‍රී ලංකික යෞවන යෞවනියන්ට ගුවන්සේවා ක්ෂේත්‍රය තුළින් තම වෘත්තිය තෝරා ගැනීමට අවස්ථාව උදාවීම. |
| | ගුවන්යානා පියසර අණ දෙන පුහුණු වැඩසටහන පවත්වාගෙන යාම. | ශ්‍රී ලාංකිකයින් හට ගුවන්යානා මෙහෙයුම් කපිතාන්වරුන් බවට පත්වීමේ අවස්ථාව උදාවීම. |
| | ගුවන්යානා මෙහෙයුම් මැදිරි අනුකාරකය (Simulator) ආරම්භ කිරීම. | දේශීය වශයෙන් පුහුණු කළ ගුවන්යානා තාක්ෂණ නිලධාරීන්ගේ සංඛ්‍යාව වැඩිවීම. |
| | ජලතර ගුවන්යානා මෙහෙයුම් ආරම්භ කිරීම. | දෙස් විදෙස් සංචාරකයන්ට කෙටි වේලාවකදී ශ්‍රී ලංකාවේ ඕනෑම ප්‍රදේශයකට යාමට හැකිවීම සහ ව්‍යාපාරික ප්‍රජාවට කෙටි කාලයක් තුළ ශ්‍රී ලංකාවේ විවධ පළාත් වලට පියාසර කිරීමට හැකිවීමෙන් ව්‍යාපාරික ඵලදායීතාව වැඩිවීම. |
| | අන්තර්ජාලය ඔස්සේ ගුවන්යානා ප්‍රවේශ පත්‍ර ලබාගැනීමේ ක්‍රමවේදය සකස් කිරීම. | කාර්ය බහුල ශ්‍රී ලාංකිකයින්ට වඩාත් කාර්යක්ෂමව ගුවන්යානා ප්‍රවේශපත්‍ර මිලදී ගැනීමට අවස්ථාව ලැබීම. |
| | ගුවන්යානා මුළුතැන්ගෙයට නවීනාංගයන්ගෙන් යුත් යන්ත්‍ර හා උපකරණ එක්කිරීම. | ගුවන් මගීන් සඳහා ගුණාත්මකභාවයෙන් ඉහළ ආහාර ලැබීම. |

[ගරු අල්හාජ් ඒ.එච්.එම්. අස්වර් මහතා]

| | | |
|---|---|---|
| | බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන්තොටුපලෙහි කාමර 24කින් යුත් තරු පහේ "සෙරෙන්දිවා" අන්තර් ගුවන්තොටුපල හෝටලය (Transit Hotel) පවත්වා ගෙන යාම. | බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන්තොටුපල හරහා යන ගුවන් මගීන්ට හෝටල් පහසුකම් ලැබීම. |
| මිහින් ලංකා (පුද්.) සමාගම | මිහින් ලංකා පියාසර නොකරන ගුවන් ගමනාන්තයන් වෙත ශ්‍රී ලංකන් ගුවන් සමාගම සමඟ එක්ව කටයුතු කරමින් මගීන්ට පහසුකම් සැලසීම | සංචාරක කර්මාන්තය ප්‍රවර්ධනය සහ විදේශ විනිමය ඉපැයීය හැකිවීම. |
| | නව ගමනාන්ත සඳහා පියාසර කිරීම.(බැංකොක්,ක්වාලලාම්පූර්,ජකර්තා හරහා මැනිලා) | අඩු ආදයම් ලබන ශ්‍රී ලාංකික පුද්ගල කාණ්ඩ සඳහාද විවිධ ගමනාන්තයන් වෙත ගුවන් ගමන්වල යෙදීමේ අවස්ථාව උදාවීම. |
| | ශ්‍රී ලාංකික විශ්‍රාමික ජ්‍යෙෂ්ඨ පුරවැසියන්ට, රාජ්‍ය සේවයේ නියුතුවූවන්ට,ආබාධිත රණවිරුවන්ට, දිවිපිදූ රණවිරු යැපෙන්නන්ට කොටස් වශයෙන් ගෙවා ගුවන් ටිකට්පත් මිලදී ගත හැකි ක්‍රමවේදයක් සකස්කිරීම . | මෙකී කාණ්ඩවල ශ්‍රී ලාංකිකයින්ට තම සිත්ගත් ගමනාන්ත වෙත සංචාරය කිරීමේ, වන්දනා ගමන්යෑමේ අවස්ථාව උදාවීම. |
| නාවික හා ගුවන්සේවා තොරතුරු සහ පර්යේෂණ (පුද්.) සමාගම. | හම්බන්තොට, මත්තල ඉදිකෙරෙමින් පවතින ගුවන්තොටුපල ආශ්‍රිත ශ්‍රම බලකාය හඳුනාගැනීම සහ පුහුණු කිරීම සම්බන්ධව සමීක්ෂණයක් සිදුකිරීම. | වෘත්තීය අධ්‍යාපනය පිළිබඳ එම ප්‍රදේශයේ ජනතාව තුළ සැලකිය යුතු මට්ටමක දැනුමක් නොමැති බව හඳුනා ගැනීමට හැකිවූ බැවින්, එම ප්‍රදේශයේ අවු.18ට වැඩි අ.පො.ස.(සා.පෙළ/උ.පෙළ) හැදෑරූ සහ උපාධිධාරී තරුණ තරුණියන්ට පවත්වන ලද වෘත්තීය මාර්ගෝපදේශ වැඩමුළුවක් හරහා වෘත්තීය දැනුම ලබාගැනීමට අවස්ථාව ලැබීම. |
| | හම්බන්තොට, මත්තල ප්‍රදේශය තුළ මහපොළ අභ්‍යාස ආයතනයක් පිහිටුවීමේ ශක්‍යතාවය හඳුනාගැනීම. | ප්‍රදේශයේ සංවර්ධනයත් සමඟ දියුණුවන සංචාරක ව්‍යාපාරයට අවැසි පරිදි ජනතාවට ජාත්‍යන්තර භාෂා (ඉංග්‍රීසි, ජපන්, ප්‍රංශ, චීන හා ජර්මන් වැනි) ඉගෙනීමට අවස්ථාව ලැබීම. |
| | හම්බන්තොට වරාය හා ගුවන්තොටුපල ඉදිකිරීම සඳහා භූමියෙන් ඉවත් කළ ජනතාව නැවත පදිංචි කිරීමේදී ඇතිවූ ගැටළු පිළිබඳ අධ්‍යයනය | එම ජනතාව මුහුණ දී ඇති ගැටළු පිළිබඳ රජය දැනුවත් වීමෙන් ජනතාවට අවශ්‍ය පහසුකම් කඩිනමින් සපයා ගත හැකිවීම. |
| | අන්තරායකර රසායන ද්‍රව්‍ය භාවිතය පිළිබඳ ගුවන්සේවා අංශ වලට සම්බන්ධ ඉහළ කළමනාකාරීත්වය දැනුවත් කිරීම සඳහා වසර පුරා පැවැත්වෙන එක් දින වැඩමුළු සංවිධානය | ඉහළ කළමනාකාරීත්වය හරහා රසායනික ද්‍රව්‍ය සෘජුව පරිහරණය කරනු ලබන සේවකයින් දැනුවත් කිරීමෙන් රසායනික ද්‍රව්‍ය ආශ්‍රිතව සිදුවන ජීවිත හා දේපළ හානි වළක්වා ගත හැකිවීම. |
| | අකුණු අනතුරු වලින් ආරක්ෂාවීම හා ඇතිවන හානිය අවම කරගැනීම පිළිබඳව ගුවන්සේවා අංශ වලට සම්බන්ධ ඉහළ කළමනාකාරීත්වය දැනුවත් කිරීමේ දේශනයන් සංවිධානය | අකුණු අනතුරු සිදුවීමේ වැඩි අවධානමක් සහිත ගුවන්තොටුපලවල, ඉහළ කළමනාකාරීත්වයද ඔවුන් හරහා සේවකයින්ද අකුණු අනතුරු වළක්වාගැනීම සම්බන්ධව දැනුවත් වීමෙන් ජීවිත හා දේපළ හානි වළක්වා ගත/අවම කරගත හැකි වීම. |
| | කටුනායක, බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන්තොටුපල භාවිතයට ගන්නා ගුවන් මගීන්ගේ පහසුකම් වර්ධනය කිරීමේ හා එහිදී ඔවුන් මුහුණදෙන ගැටළු පිළිබඳ සමීක්ෂණය | ගුවන් මගීන් හට අවශ්‍ය සියළු පහසුකම් ගුවන්තොටුපල පරිශ්‍රය තුළ පවතින්නේද යන්න හඳුනාගැනීම තුළින් එම පහසුකම් සංවර්ධනය හා සංචාරක කර්මාන්තය ප්‍රවර්ධනය. |
| | ශ්‍රී ලංකන් ගුවන් සේවාවේ මගී හා භාණ්ඩ ප්‍රවාහන සේවාවන්හි තත්ත්වය ඉහළ නැංවීම පිළිබඳ සමීක්ෂණය | ශ්‍රී ලංකන් ගුවන් සේවය වඩාත් කාර්යක්ෂමව මගීන්ට පහසුකම් සපයන ගුවන්සේවාවක් බවට පත්කිරීම සඳහා ගත යුතු ක්‍රියාමාර්ග හා සංවර්ධනය කළ යුතු අඩුපාඩුකම් පෙන්වාදීම තුළින් ගුවන් මගීන්ට අපහසුතාවයකින් තොරව තම අවශ්‍යතා කඩිනමින් ඉටුකර ගැනීමට, ගුවන්සේවාවෙහි ගුණාත්මක බව ඉහළයෑමෙන් සංචාරක කර්මාන්තයේ ප්‍රවර්ධනයට හා විදේශ ආයෝජනයන්ට අවස්ථාව සැලසීම. |
| | ශ්‍රී ලංකාවට පැමිණෙන සංචාරකයින් ශ්‍රී ලංකාවේ සංචාරය කරන කාලය තුළ සිදු කරනු ලබන වියදම්වල ස්වභාවය අධ්‍යයනය කිරීම. | ශ්‍රී ලාංකීය ආර්ථිකයට වාසිදායක අයුරින් විදේශීය සංචාරකයින්ගේ වියදම් හසුරුවා ගැනීමට හැකිවීමෙන් ශ්‍රී ලංකාව පුරා පිහිටුවා ඇති සංචාරක හෝටල් ව්‍යාපාරය දියුණුවීම. |
| | ගුවන්තොටුපල හා ගුවන්සේවාවන්හි සේවයේ නියුතු විවිධ අධ්‍යාපන මට්ටම් සහිත සේවකයින් සඳහා ප්‍රවාහන හා සැපයුම්කරණ කළමනාකරණය පිළිබඳ උපාධි හා ඩිප්ලෝමා පාඨමාලා පැවැත්වීම. | සේවකයින් සතුව පවතින දැනුම පුළුල්වීම, ආයතනය තුළ අදාල ක්ෂේත්‍රයන්හි පහසුවෙන් උසස්වීම් ලබාගැනීමට හැකිවීම සහ සේවකයන් අතර තරගකාරීත්වය ඉහළ යාමෙන් කාර්යයන්හි ඵලදායීතාවය වැඩිවීම. |

ඇමුණුම **B**

| ආයතනයේ නම | ඉදිරියේදී සිවිල් ගුවන්සේවා ක්ෂේත්‍රයේ ක්‍රියාත්මක කිරීමට අපේක්ෂිත සංවර්ධන ව්‍යාපෘතීන් | ඒවායින් අපේක්ෂිත ප්‍රතිඵල |
|---|---|---|
| ශ්‍රී ලංකා සිවිල් ගුවන්සේවා අධිකාරිය | නව සිවිල් ගුවන්සේවා පනත ප්‍රකාර ජාතික සිවිල් ගුවන්සේවා සැලැස්මක් (National Civil Aviation Development Plan) සකස් කිරීම. | |
| | නව සිවිල් ගුවන්සේවා පනත ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය වන්නාවූ රෙගුලාසිවල මූලික කෙටුම්පත් සකස් කිරීම. | රට තුළ ජාත්‍යන්තර ප්‍රමිතීන්ට අනුකූලවූ සුරක්ෂිතතාවයෙන් යුතු සිවිල් ගුවන්සේවා කර්මාන්තයක් පවත්වාගෙන යාම , එමගින් කර්මාන්තයේ ප්‍රවර්ධ-නයක් ඇතිකිරීම හා ශ්‍රී ලංකාව ගුවන් කේන්ද්‍රයක් බවට පත්කිරීම. |
| | මත්තල ජාත්‍යන්තර ගුවන්තොටුපල අවට ඉදිකිරීම් පාලනය කිරීම සඳහා කලාප රෙගුලාසි (Zoning Regulations) නිකුත් කිරීම. | |
| | මත්තල ගුවන්තොටුපලෙහි සිවිල් ගුවන්සේවා අධිකාරියෙහි උප කාර්යාලයක් පිහිටුවීම. | |
| | සිවිල් ගුවන්සේවා පාසල් අධ්‍යාපනික වැඩසටහන වැඩි දියුණුකිරීම | ගුවන්සේවා ක්ෂේත්‍රය පිළිබඳ මහජනතාව, විශේෂයෙන්ම පාසල් දරු දැරියන් දැනුවත් කිරීම. |
| සී/ස ගුවන්තොටුපල හා ගුවන්සේවා (ශ්‍රී ලංකා) සමාගම | බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන්තොටුපල සංවර්ධන ව්‍යාපෘතියේ දෙවන අදියරේ දෙවන කොටස ක්‍රියාත්මක කිරීම | ඉදිරියේදී වර්ධනය වන ගුවන් මගී සංඛ්‍යාව හමුවේ දැනට පවතින ගුවන්තොටුපල ඉඩ පහසුකම් ප්‍රමාණවත් නොවන නිසා මෙමගින් මගීන් සඳහා පහසුකම් සැලසීම. |
| | දේශීය ගුවන් ගමන් සඳහා වන ගුවන්තොටුපල (Domestic Airports) ජාලය සංවර්ධනය කිරීම. | ශ්‍රී ලංකාවේ ගුවන්සේවා කර්මාන්තය සංවර්ධනය කිරීම තුළින් මගීන්ට උසස් තත්ත්වයේ පහසුකම් ලබාදීම, සෘජු හා වක්‍ර රැකියා අවස්ථා ජනිත කිරීම සහ ආදායම් ඉපයීම. |
| | බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන්තොටුපල තුළ අභ්‍යන්තර ගුවන් ගමන් සඳහා පර්යන්ත ගොඩනැගිල්ලක් (Domestic Terminal Building) ඉදිකිරීම. | බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන්තොටුපල හරහා සිදුවන ගෘහස්ථ මගී ගමන් සඳහා පහසුකම් සැපයීම. |
| | බාහිර අංගන (Outer porches) සහ පර්යන්ත පිවිසුම් මාර්ග (Walk ways) නවීකරණය කිරීම. | කලාපයේ අනෙකුත් ගුවන්තොටුපලවල තත්ත්වයට සමගාමීව බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන්තොටුපලේ තත්ත්වය වැඩි දියුණු කිරීම. |
| | බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන්තොටුපලේ ගුවන් පථය (Runway) පළල් කිරීම සහ මතුපිට ආස්තරණය කිරීම. (Over laying) | ගුවන්තොටුපල සුරක්ෂිතභාවය, ජාත්‍යන්තර වශයෙන් පිළිගත් සම්මත නීති වලට අනුකූලව පවත්වාගෙන යාම සහ විශාල ගුවන්යානා වලට පැමිණිය හැකි ආකාරයට ගුවන්තොටුපල පහසුකම්වල මට්ටම ඉහළ නැංවීම සහ මගී පහසුකම් වැඩි කිරීම. |
| | සිවිල් ගුවන්සේවා පුහුණු මධ්‍යස්ථානය සඳහා නව ගොඩනැගිල්ලක් ඉදි කිරීම. | ගුවන් ගමන් ක්ෂේත්‍රයේ ජාත්‍යන්තර පුහුණු පාඨමාලා ක්‍රියාත්මක කිරීම. |

[ගරු අල්හාජ් ඒ.එච්.එම්. අස්වර් මහතා]

| | | |
|---|---|---|
| | රථගාල් සහ මාර්ග වැඩි දියුණු කිරීම. | පිවිසුම් මාර්ග සහ රථ ගාල්වල තත්ත්වය වැඩි දියුණු කිරීම. |
| | මගීන් හුවමාරු ප්‍රදේශය (Transit Area)සහ තීරුබදු රහිත සාප්පු සංකීර්ණය (Duty Free Shopping Complex) පිහිටි ප්‍රදේශය පුළුල් කිරීම. | අනෙකුත් ජාත්‍යන්තර ගුවන්තොටුපලවල් වලට සමගාමීව ගුවන්තොටුපලේ තත්ත්වය පවත්වාගෙන යාම සහ රැකියා අවස්ථා නිර්මාණය කිරීම. |
| | ආයතනික මූල පද්ධතියක් (Enterprise Resource Planning System –ERP) ක්‍රියාත්මක කිරීම. | පද්ධති ඒකාබද්ධ කිරීම තුළින් සපයනු ලබන සේවාවන්හි සහ ක්‍රියාවලීන්හි කාර්යක්ෂමතාවය වැඩිකිරීම තුළින් වැඩි ආදායමක් ඉපැයීම. |
| | ගුවන්යානා ගොඩබැස්සවීම සඳහා නව ස්වයංක්‍රිය උපකරණ (Instrument Landing System – ILS) සවිකිරීම. | ගුවන් සංතරණ සේවාවන්හි කාර්යක්ෂමතාබව හා සුරක්ෂිතබව |
| | නවීකරණය කරන ලද ගුවන් ගමන් පාලන පද්ධතියක් (Air Traffic Control System) නැවත සවි කිරීම | අප ගුවන් කලාපය තුළ වැඩි පරාසයක් දක්වා වඩාත් කාර්යක්ෂමව හා සුරක්ෂිත ලෙස ගුවන් ගමන් පාලනය කළ හැකිවීම. |
| | අති විශේෂ අමුත්තන් (VVIP) සඳහා නව ගොඩනැගිල්ලක් ඉදි කිරීම. | මෙරටට පැමිණෙන ලොව අති විශේෂ අමුත්තන් හට වැඩි දියුණු කළ පහසුකම් සැපයීම. |
| | මහල් ගොඩනැගිලි රථගාල ඉදිකිරීම | වාහන නැවැත්වීමේ පහසුකම් සලසාදීම. |
| | බදු රහිත ඇඟලුම් වෙළඳ සංකීර්ණය (tax Free Apparel Shopping Mall)ඉදිකිරීම. | ඇඟලුම් සඳහා රට තුළ බදු රහිත වෙළඳපළක් ලබාදීම. |
| | රත්මලාන ගුවන්තොටුපලේ ගුවන්යානා නවතා තැබීමේ අංගනය (Apron) ආස්තරණයකිරීම.(Over laying) | ව්‍යාපාරික ගුවන්යානා (Corporate jets) ක්‍රියාත්මක කළ හැකි පරිදි ගුවන්යානා නවතා තැබීමේ අංගනය වැඩි දියුණු කිරීම. |
| ශ්‍රී ලංකන් ගුවන් සමාගම | යානා 21 කින් සමන්විත ගුවන්යානා ඇණිය 2015 වන විට යානා 23 දක්වා ව්‍යාප්ත කිරීම. | වත්මන් ගමනාන්තයන්ට, මත්තල ජාත්‍යන්තර ගුවන්තොටුපල ඇතුළු අනාගතයේ පියාසර කිරීමට අපේක්ෂිත ගමනාන්තයන්ට ගුවන් ගමන් වාර වැඩි කිරීම තුළින් ශ්‍රී ලාංකිකයන්ට සේවා නියුක්ති අවස්ථාවන් වැඩි කිරීම සහ ජාතික ආදායමට විශාල ලෙස දායකවීම. |
| | ජලවර ගුවන් මෙහෙයුම් සඳහා ප්‍රධාන මෙහෙයුම් ගගන යාත්‍රාංගනය (Main Water Aerodrome Base) දඩුගම ඔය අසල ඉදිකිරීම. | ගුවන්තොටුපල සිට මෙහෙයුම් සම්බන්ධතාවය සහ මගී සේවාවන් පහසු කිරීම. |
| | දැනට පවතින ක්‍රමය වෙනස් කර ජලවර ගුවන් මෙහෙයුම් සඳහා ශ්‍රී ලංකන් තාක්ෂණික ඉංජිනේරු කණ්ඩායම් ලබාගැනීම | ශ්‍රී ලාංකිකයන්ට සේවා නියුක්ති අවස්ථාවන් ලබාදීම වැඩිකිරීම සහ මෙහෙයුම් වියදම් අඩු කරගැනීම. |
| මිහින් ලංකා (පුද්.) සමාගම | ශ්‍රී ලංකන් ගුවන් සමාගමෙන් A 330 ගුවන්යානයක් ලබාගෙන ජනප්‍රිය ගමනාන්තයක් වන මැනිලා වෙත (බැංකොක්, ක්වාලලාම්පූර්, ජකර්තා හරහා) ගුවන් ගමන් ඇරඹීම. | සංචාරක කර්මාන්තය ප්‍රවර්ධනය සහ විදේශ විනිමය ඉපැයීම. |

| | | |
|---|---|---|
| සී/ස තාවික සහ ගුවන්සේවා තොරතුරු හා පර්යේෂණ (පුද්.) සමාගම | සිවිල් ගුවන්සේවා ක්ෂේත්‍රය සම්බන්ධ උසස් අධ්‍යාපනය ආශ්‍රිතව බිහිවන රැකියා අවස්ථා පිළිබඳ අධ්‍යයනය කිරීම. | අළුතින් ඉදිවන හා නවීකරණය වන ගුවන්තොටුපලවල් ආශ්‍රිතව ඉදිරි වසර 20 ඇතුළත බිහිවන සෘජු හා වක්‍ර රැකියා ප්‍රමාණය හා ඒවායේ ස්වභාවය පුරෝකථනය කිරීම සහ එම ශ්‍රම අවශ්‍යතාවයන්ට සරිලන පරිදි උපාධිධාරීන් හා ඩිප්ලෝමාධාරීන් බිහිකිරීම සඳහා සැලසුම්කිරීම. |
| | කටුනායක ජාත්‍යන්තර ගුවන්තොටුපල සඳහා ආපදා කළමනාකරණ සැලැස්මක් සකස් කිරීම. | මෙරට ගුවන්තොටුපලවල් අන්තර්ජාතික සම්මතයන්ට අනුකූල තත්ත්වයට පත්කිරීම. |
| | මත්තල ගුවන්තොටුපල ආශ්‍රිතව ජනිතවන ආයෝජන අවස්ථා හඳුනාගැනීම. | ආයෝජන ව්‍යාපෘතීන් රටේ සංවර්ධනයට ඵලදායී ලෙස යොදාගැනීම. |

## ද්විතියික පාසල් 1000 ව්‍යාපෘතිය: මිල්ලනිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය
## "இரண்டாம்நிலை பாடசாலைகள் 1000" கருத் திட்டம்: மில்லனிய பி.செ. பிரிவு
## 1000 SECONDARY SCHOOLS PROJECT : MILLANIYA DS DIVISION

1916/'11

7. **ගරු රවි කරුණානායක මහතා -(ගරු ගරු අජිත් පී. පෙරේරා මහතා වෙනුවට)**
(மாண்புமிகு ரவி கருணாநாயக்க - மாண்புமிகு அஜித் பீ. பெரேரா சார்பாக)
(The Hon. Ravi Karunanayake on behalf of the Hon. Ajith P. Perera)
අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (2):

(අ) මිල්ලනිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ ඇති පාසල් අතරින් "ද්විතියික පාසල් 1000" ව්‍යාපෘතිය සඳහා තෝරාගෙන ඇති පාසල් කවරේද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) ක/දොඹගොඩ සීලරතන මහා විද්‍යාලය "ද්විතියික පාසල් 1000" ව්‍යාපෘතිය සඳහා තෝරා ගැනීමට සුදුසු බව එතුමා පිළිගන්නෙහිද?

(ඇ) එසේ නම්, එම පාසල එකී ව්‍යාපෘතිය සඳහා ඇතුළත් කර ගැනීමට පියවර ගන්නේද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

கல்வி அமைச்சரைக் கேட்ட வினா:

(அ) மில்லனிய பிரதேச செயலாளர் பிரிவிலுள்ள பாடசாலைகளில் "இரண்டாம் நிலை பாடசாலைகள் 1000" கருத்திட்டத்திற்காக தெரிவு செய்யப்பட்டுள்ள பாடசாலைகள் யாவை என்பதை அவர் குறிப் பிடுவாரா?

(ஆ) க/தொம்பகொட சீலரதன மகா வித்தியாலயம் "இரண்டாம் நிலை பாடசாலைகள் 1000" கருத் திட்டத்திற்காகத் தெரிவு செய்யப்படுவதற்கு தகுதி யானதென்பதை அவர் ஏற்றுக்கொள்வாரா?

(இ) ஆமெனில் அப் பாடசாலையை குறிப்பிட்ட கருத் திட்டத்தில் சேர்த்துக்கொள்வதற்கு நடவடிக்கை எடுப்பாரா என்பதை அவர் குறிப்பிடுவாரா?

(ஈ) இன்றேல், ஏன்?

asked the Minister of Education:

(a) Will he state the names of the schools that have been selected for "1000 Secondary Schools" project, out of the schools situated in the Millaniya Divisional Secretary's Division?

(b) Will he admit that Ka/Dhombagoda Seelarathana Maha Vidyalaya is suitable to be selected for the "1000 Secondary Schools" project?

(c) If so, will he state whether action will be taken to include the above-mentioned school in the aforesaid project?

(d) If not, why?

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අධ්‍යාපන අමාත්‍යතුමා වෙනුවෙන් මා එම පිළිතුර **සභාගත*** කරනවා.

(අ) ඔව්. ලංකාවේ 1 ඒබී පාසලක්වත් නොමැති ප්‍රාදේශිය ලෙක්ම් කොට්ඨාස 72කි. (1 ඒබී පාසල් යනු විද්‍යා, කලා, වාණිජ යන අංශ තුනෙන්ම උසස් පෙළ පංති පැවැත්වෙන පාසල් වේ.) මිල්ලනිය එවැනි ප්‍රාදේශීය ලේකම කොට්ඨාසයකි. එම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයෙන් පාසල් දෙකක් ඇතුළත් වී ඇති අතර එම ලැයිස්තුව අමුණා ඇත. ( ඇමුණුම* )

(ආ) එම පාසල දැනටමත් තෝරා ගෙන ඇත.

(ඇ) අදාළ නොවේ.

(ඈ) අදාළ නොවේ.

[ගරු රවි කරුණානායක මහතා]

***සභාමේසය මත තබන ලද ඇමුණුම:**
*சபாபீடத்தில் வைக்கப்பட்ட இணைப்பு :*
*Annex tabled:*

"ප්‍රාථමික පාසල් ජාලයක් සඳහා ද්විතියික පාසල් දහසක්" සංවර්ධනය කිරීමේ වැඩසටහන පළමු අදියර සඳහා සංවර්ධනය කිරීමට යෝජිත පාසල්- 2012 පෙබරවාරි

| අනු අංකය | ඡන්ද කොට්ඨාසය | ප්‍රා.ලේකම් කොට්ඨාසය | 2012 වර්ෂයට තෝරාගත් පාසල් | මාධ්‍යය |
|---|---|---|---|---|
| 1. | බණ්ඩාරගම | බණ්ඩාරගම | වෑවිට මෛත්‍රී නවෝදයා මහා විද්‍යාලය (පළාත් පාසලකි) | සිංහල |
| | | | එස් මහින්ද මහා විද්‍යාලය, අළුබෝමුල්ල (පළාත් පාසලකි) | සිංහල |
| 2. | මිල්ලනිය | මිල්ලනිය | දොඹගොඩ සීලරතන මහා විද්‍යාලය ( පළාත් පාසලකි) | සිංහල |
| | | | ශ්‍රී දේවරක්ෂිත මහා විද්‍යාලය (පළාත් පාසලකි) | සිංහල |

## වැවිලි ක්ෂේත්‍රයේ සංවර්ධන ව්‍යාපෘති : ප්‍රතිලාභ
## பெருந்தோட்டத் துறை அபிவிருத்திக் கருத்திட்டங்கள் : நன்மைகள்
## DEVELOPMENT PROJECTS IN PLANTATION FIELD : BENEFITS

1687/'11

10. **ගරු අල්හාජ් ඒ.එච්.එම්. අස්වර් මහතා (ගරු එරික් ප්‍රසන්න වීරවර්ධන මහතා වෙනුවට)**
(மாண்புமிகு அல்ஹாஜ் ஏ.எச்.எம். அஸ்வர் - மாண்புமிகு எரிக் பிரசன்ன வீரவர்தன சார்பாக)
(The Hon. Alhaj A.H.M Azwer on behalf of the Hon. Eric Prasanna Weerawardhana)

වැවිලි කර්මාන්ත අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (3):

(අ) (i) 2006 වර්ෂයේ සිට මේ දක්වා කාල සීමාව තුළ වැවිලි ක්ෂේත්‍රයේ ක්‍රියාත්මක කරන ලද සංවර්ධන ව්‍යාපෘති කවරේද;

(ii) එම ව්‍යාපෘති හරහා ජනතාවට ලැබී ඇති ප්‍රතිලාභ කවරේද;

(iii) ඉදිරියේදී වැවිලි ක්ෂේත්‍රයේ ක්‍රියාත්මක කිරීමට අපේක්ෂිත සංවර්ධන ව්‍යාපෘති කවරේද;

(iv) ඒවායින් අපේක්ෂිත ප්‍රතිඵල කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

பெருந்தோட்டக் கைத்தொழில் அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) 2006 ஆம் ஆண்டு தொடக்கம் இற்றைவரையான காலப்பகுதியில் பெருந்தோட்டத் துறையில் நடைமுறைப்படுத்தப்பட்ட அபிவிருத்திக் கருத் திட்டங்கள் யாவை என்பதையும்;

(ii) இக்கருத்திட்டங்களினூடாக மக்களுக்குக் கிடைத்துள்ள நன்மைகள் யாவை என்பதையும்;

(iii) எதிர்காலத்தில் பெருந்தோட்டத் துறையில் நடை முறைப்படுத்த எதிர்பார்த்துள்ள அபிவிருத்திக் கருத்திட்டங்கள் யாவை என்பதையும்;

(iv) அவற்றிலிருந்து எதிர்பார்க்கப்படுகின்ற நன்மைகள் யாவை என்பதையும்;

அவர் இச்சபையில் அறிவிப்பாரா?

(ஆ) இன்றேல், ஏன்?

asked the Minister of Plantation Industries:

(a) Will he inform this House of -

(i) the development projects implemented in the field of plantation during the period from year 2006 up to now;

(ii) the benefits received by the people through these projects;

(iii) the development projects expected to be implemented in the field of plantation, in future; and

(iv) the results expected through them?

(b) If not, why?

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, වැවිලි කර්මාන්ත අමාත්‍යතුමා වෙනුවෙන් එම ප්‍රශ්නයට පිළිතුර මා **සභාගත*** කරනවා.

**** සභාමේසය මත තබන ලද පිළිතුර:***
** சபாபீடத்தில் வைக்கப்பட்ட விடை :*
** Answer tabled:*

1. (අ) (i)

1. ආසියානු සංවර්ධන බැංකු ණය ආධාර යටතේ ක්‍රියාත්මක වූ වැවිලි සංවර්ධන ව්‍යාපෘතිය (2004 වර්ෂයේ සිට 2009 වර්ෂය දක්වා).

2. ජපාන අන්තර්ජාතික සහයෝගීතා ආයතනයේ ණය ආධාර යටතේ ක්‍රියාත්මක වූ වැවිලි ප්‍රතිසංස්කරණ II ව්‍යාපෘතිය (2004 වර්ෂයේ සිට 2010 වර්ෂය දක්වා).

3. අන්තර්ජාතික කෘෂි කර්ම සංවර්ධන අරමුදල යටතේ ක්‍රියාත්මක වන කුඩා වැවිලි ව්‍යවසායකත්ව සංවර්ධන වැඩසටහන (2007 වර්ෂයේ සිට 2014 වර්ෂය දක්වා).

(ii) ➢ *<u>වැවිලි සංවර්ධන ව්‍යාපෘතිය සහ වැවිලි ප්‍රතිසංස්කරණ II ව්‍යාපෘතිය මගින්</u>*

- විශාල ප්‍රමාණයේ වතු වල අභ්‍යන්තර මාර්ග සංවර්ධනය.
- වතු සේවක නිවාස අලුත්වැඩියාව.
- කර්මාන්තශාලාවල හා ක්ෂේත්‍රයේ වතු සේවක විවේකාගාර පහසුකම් සැලසීම.
- ළමා සංවර්ධන මධ්‍යස්ථාන ඉදි කිරීම.
- සේවකයින්ගේ රැකියා පහසුකිරීමේ උපකරණ සැපයීම (අත්වැක්ටර්, දළු නෙලන කතුරු, කප්පාදු යන්ත්‍ර, දළු කූඩ, ප්ලාස්ටික් ඇසුරුම් ආදිය).

- පහත සඳහන් සමාජ සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.
  - (අ) වතු සේවකයින් අතර මත් ද්‍රව්‍ය භාවිතය අවම කිරීම.
  - (ආ) ගෘහස්ත මුදල් පාලනය පිළිබඳව දැනුවත් කිරීම.
  - (ඇ) වතු නිවාස සමුපකාර සමිති සවිබල ගැන්වීම.
  - (ඈ) වතු සේවකයින් අතර කණ්ඩායම් හැඟීම වැඩිදියුණු කිරීම.
  - (ඉ) ස්ත්‍රී පුරුෂ සමාජභාවය (Gender Equality) පිළිබඳ දැනුවත් කිරීම.

➢ <u>කුඩා වැවිලි ව්‍යවසායකත්ව සංවර්ධන වැඩසටහන</u>

- මොණරාගල දිස්ත්‍රික්කයේ හෙක්ටයාර 4000 ක රබර් වගා කිරීම සඳහා සහනාධාර ලබාදීම සහ ඒ සඳහා අවශ්‍ය රබර් පැල හා පොහොර නොමිලයේ ලබාදීම.
- නුවරඑළිය හා කෑගල්ල මහනුවර දිස්ත්‍රික්ක වල තෝරාගත් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ 07 ක, තේ නැවත වගා කිරීම සඳහා හෙක්ටයාර 275 කට පස සැකසීම, පාංශු සංරක්ෂණය, තේ පැල සිටුවීම ආදී අදියරයන් යටතේ සහනාධාර ලබාදීම සහ අවශ්‍ය තේ පැල නොමිලයේ ලබාදීම.
- ඉහත දිස්ත්‍රික්ක වල හෙක්ටයාර 343 ක තේ පාළු සිටුවීම සඳහා සහනාධාර ලබාදී ඇත.
- බිම් මල් වගාව, කුකුළු පාලනය, එළු පාලනය සහ වානිජ තේ තවාන් පවත්වා ගැනීම ආදී ආදායම් උත්පාදන කටයුතු සඳහා ආධාර ලබාදීම.
- තේ ඉඩම් වල ගම්මිරිස්, ජමනාරං, පැෂන්, වැනිලා, කෝපි, වැනි අන්තර් වගාවන් සිදු කිරීම සඳහා ආධාර ලබාදීම.
- ආදායම් උත්පාදන කටයුතු සඳහා බැංකු ණය ලබාදීම.
- ග්‍රාමීය මාර්ග අළුත්වැඩියා කිරීම.
- ව්‍යවසායකත්ව සමිති පිහිටුවීම සහ බල ගැන්වීම.
- ඉතිරි කිරීම් හා ණය සමිති පිහිටුවීම.

(iii)

- දැනට පවත්නා වාර්ෂික තේ නිෂ්පාදන මට්ටම වූ කි.ග්‍රෑ. මිලියන 330 වර්ෂ 2016 වන විට කි.ග්‍රෑ. මිලියන 340 දක්වා ඉහල නැංවීමට තේ නැවත වගාව අවම වශයෙන් වාර්ෂිකව 2% දක්වා වැඩි කිරීමටද, තේ නව වගාව දිරිගැන්වීමටද කටයුතු කෙරේ. 2012 අයවැය මගින් යෝජිත පරිදි මෙම ව්‍යාපෘතිය සාර්ථක කිරීම සඳහා කුඩා තේ වතු හිමියන් සඳහා දැනට ගෙවනු ලබන හෙක්ටයාරයකට රු.250,000 ක් වූ සහනාධාරය රු.300,000 දක්වා වැඩි කර ඇත. නව වගාව සඳහා වූ පවත්නා හෙක්ටයාරයකට රු.50,000 ක සහනාධාරය රු.150,000 දක්වා වැඩි කර ඇත. තවද වැවිලි සමාගම් වල තේ නැවත වගාව හා පාළු සිටුවීම දිරිගැන්වීම සඳහා 8% ක වාර්ෂික පොළිය යටතේ වසර 7 කින් ගෙවිය හැකි බැංකු ණය යෝජනා ක්‍රමයක් සඳහා මූලික කටයුතු සම්පාදනය කෙරේ.
- කුඩා තේ වතු අංශයේ තේ වගාව (නැවත වගාව හා නව වගාව) පුළුල් කිරීම උදෙසා 2012 වර්ෂයට වෙන් කර තිබූ රු. මිලියන 200 ට අමතරව තවත් රු.මිලියන150 ක් ප්‍රාග්ධන ආයෝජන කුඩා තේ වතු සංවර්ධන අධිකාරිය වෙත ලබා දී ඇත. මේ මගින් 2012 වර්ෂය තුළ හෙක්ටයාර 1200 ක නැවත වගාව හා හෙක්ටයාර 100 ක නව වගාව සංවර්ධනය ආරම්භ කෙරේ.
- 2012 අයවැය මගින් යෝජිත පරිදි තේ වගාව ආශ්‍රිත පර්යේෂණ වැඩිදියුණු කිරීම සඳහා තේ පර්යේෂණ ආයතනය වෙත අමතර ප්‍රතිපාදන සලසා ඇත. එම ව්‍යාපෘතිය සඳහා වෙන් කර ඇති අමතර ප්‍රතිපාදනය රු.මිලියන 43 කි.
- කිලෝවකට රු. 3.50 බැගින් සෙස් බදු වලින් තේ අපනයනකරුවන්ගෙන් ලබාගන්නා වර්ෂයකට රු.මිලියන 1000ක් පමණ වූ විශේෂ ආදායමෙන් ශ්‍රී ලංකාවේ නිපදවන තේ පිළිබඳ ජාත්‍යන්තර වෙළඳපළ ප්‍රවර්ධනය කිරීමට ඉදිරි වර්ෂ 5 සඳහා ව්‍යාපෘතියක් ක්‍රියාත්මක කිරීමට ශ්‍රී ලංකා තේ මණ්ඩලය විසින් කටයුතු කෙරේ.
- සාම්ප්‍රදායික නොවන ප්‍රදේශ වල රබර් වගාව තවදුරටත් පුළුල් කිරීම සඳහා අම්පාර දිස්ත්‍රික්කයේ හෙක්ටයාර 10,000 ක අළුතින් රබර් වගා කිරීම.
  - ➢ මේ යටතේ 2011 වර්ෂයේ හෙක්ටයාර 240ක අලුතින් රබර් වගා කර ඇති අතර, 2012 වර්ෂයේ දී හෙක්ටයාර 500ක් වගා කිරීමට කටයුතු සැලසුම් කර ඇත.
- රබර් කර්මාන්තය ආශ්‍රිත පර්යේෂණ සඳහාත්, උසස් ප්‍රමිතියෙන් යුත් රබර් පැල සැපයීමට පැල තවාන් වැඩිදියුණු කිරීමටත් විශේෂ ව්‍යාපෘතින් ක්‍රියාත්මක කෙරේ.
  - ➢ අම්පාර දිස්ත්‍රික්කයේ පදියතලාවේ අක්කර 50ක නව රබර් පැල තවානක් ස්ථාපිත කෙරේ.
- උතුරු පළාතේ රබර් වගාව ඇරඹීමේ හැකියාව පිළිබඳ පර්යේෂණ මගින් සාර්ථක ප්‍රතිඵල ලැබී ඇත.
  - ➢ මේ යටතේ වව්නියාව, මුලතිව් සහ කිලිනොච්චි දිස්ත්‍රික්ක 3 හි ආදර්ශන වගා 7ක් සාර්ථක වී ඇත.
  - ➢ එහෙයින් රබර් වගාව ව්‍යාප්ත කිරීමට විශේෂ ව්‍යාපෘතියක් මගින් ඉදිරියේදී කටයුතු කෙරේ.

(iv)

***තේ කර්මාන්ත සංවර්ධන ව්‍යාපෘති මගින් අපේක්ෂිත ප්‍රතිඵල වන්නේ :***

- 400,000 ක පමණ වන කුඩා තේ වතු හිමියන් හා ප්‍රාදේශීය වැවිලි සමාගම් තේ නැවත වගාවට හා නව වගාවට උනන්දු කරවීම තුළින් තේ නිෂ්පාදිත මට්ටම ඉහල නැංවීම.
- තේ වගාව හා කර්මාන්තය සම්බන්ධ පර්යේෂණ සඳහා වූ ආයෝජන තුළින් තේ කර්මාන්තයට ගැටළුවක්ව ඇති ඉහල නිෂ්පාදන පිරිවැය අඩු කිරීම හා තේ ඵලදායීතාවය වැඩි කිරීම මගින් වඩාත් ලාභදායී හා තිරසාර කර්මාන්තයක් බවට පත් කිරීම.
- ශ්‍රී ලංකාවේ තේ නිෂ්පාදනයෙන් 90% කට වැඩි ප්‍රමාණයක් අපනයන වෙළඳපළ සඳහා වන අතර (වාර්ෂිකව කි.ග්‍රෑ. මිලියන 300 පමණ) ජාත්‍යන්තර තේ ප්‍රවර්ධන වැඩසටහන තුළින් ශ්‍රී ලංකා පිරිසිදු තේ සඳහා ඉහල මිලක් මෙන්ම පවත්නා වෙළඳපොලවල් රැකගැනීමට හා නව වෙළඳපළවල් සඳහා අවතීර්ණය වීමට හැකියාව ලැබේ. එමගින් තේ අපනයන ආදායම වාර්ෂිකව ඉහළ නැංවීමට හැකියාව ලැබේ.

***රබර් කර්මාන්ත සංවර්ධන ව්‍යාපෘති මගින් අපේක්ෂිත ප්‍රතිඵල වන්නේ:***

- උතුරු පළාතද ඇතුළුව සාම්ප්‍රදායික නොවන ප්‍රදේශ වල රබර් වගාව ව්‍යාප්ත කිරීමෙන් වර්ෂ 2020 වන විට මෙරට රබර් වගාව හෙක්ටයාර 150,000 හා වාර්ෂික රබර් නිෂ්පාදනය කි.ග්‍රෑ. මිලියන 180 ක් දක්වා ඉහල නැංවීම. මේ මගින් ප්‍රාදේශීය වැවිලි සමාගම් වලට ප්‍රතිලාභ අත්වීම හා කුඩා රබර් ඉඩම් හිමියන්ගේ ආර්ථිකය ඉහල නැංවීම සිදුවේ.
- දැනට මෙරට රබර් නිෂ්පාදනයෙන් 70% ක් එනම් කි.ග්‍රෑ. මිලියන 107 ක් අගය එකතු කිරීමේ නිමි භාණ්ඩ නිෂ්පාදනය සඳහා මෙරට කර්මාන්ත වලට යොදා ගැනේ. රබර් නිෂ්පාදනය වැඩිවීමෙන් මෙම ප්‍රතිශතය තවදුරටත් ඉහල නංවා රබර් නිෂ්පාදන කර්මාන්තය වැඩිදියුණු කොට දැනට ලබන අපනයන අගය වූ රුපියල් බිලියන 60 රුපියල් බිලියන 100 දක්වා වැඩි කිරීමේ හැකියාව ලැබීම.

(ආ) අදාළ නොවේ.

## පෞද්ගලිකව දැනුම් දීමෙන් ඇසූ ප්‍රශ්නය
## தனி அறிவித்தல் மூல வினா
## QUESTION BY PRIVATE NOTICE

### පුරාවස්තු සොරකම
### தொல்பொருள் திருட்டு
### THEFT OF ARTEFACTS

**ගරු අනුර දිසානායක මහතා**
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ස්ථාවර නියෝග 23 (2) යටතේ මෙම ප්‍රශ්නය ඉදිරිපත් කිරීමට අවස්ථාව ලබා දීම ගැන මම ඔබතුමාට බෙහෙවින් ස්තුතිවන්ත වෙනවා.

පසු ගිය කාලයේ සිදු වූ පුරාවස්තු සොරකම්, නිදන් හැරීම් හා පුරාවස්තු වෙළෙඳාම් පිළිබඳ මෙම ගරු සභාවේ අවධානය යොමු කරවමි.

පසු ගිය කාලයේ පුරාවස්තු සොරකම්, නිදන් හැරීම් හා පුරාවස්තු වෙළෙඳාම් පිළිබඳ සිදුවීම් විශාල ලෙස ඉහළ ගොස්

[ගරු අනුර දිසානායක මහතා]

තිබේ. පුරාණ විහාරස්ථාන බිඳීම්, බුදු පිළිම විනාශ කිරීම්, ඓතිහාසික පුදබිම් වැනසීම් ඒ අතර විය. මෙම සිදුවීම් පිළිබඳ අත් අඩංගුවට ගැනීම්, පරීක්ෂණ පැවැත්වීම් සිදු නොවූ තරම්ය. පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවේ කිසිදු අවසරයකින් තොරව අනුරාධපුර ඓතිහාසික පුදබිමේ බැකෝ යන්ත්‍ර යොදා විශාල ලෙස පොකුණු සෑරීමද දක්නට ලැබුණි. මෙවැනි සිදුවීම්වල උච්චතම අවස්ථාවක් වූයේ කොළඹ කෞතුකාගාරයේ ඓතිහාසික කඩු කිහිපයක් ඇතුළු මිල කළ නොහැකි පුරාවස්තු සොරකමයි. කෞතුක වටිනාකම් සහිත භාණ්ඩ ආරක්ෂා කිරීම, සංරක්ෂණය කිරීම වෙනුවෙන් පිහිටි ජාතික කෞතුකාගාරයේ සිදු වූ මෙම සොරකම කෞතුක වස්තු සොරකම් කිරීමේ බරපතළභාවය පෙන්නුම් කරයි. එම සොරකමට සම්බන්ධ වූවන් කිසිවකු තවමත් අත් අඩංගුවට ගැනීමට නොහැකි වී ඇත. පසු ගිය මාස 03ක කාලය තුළ පුරාවස්තු සොරකම්, නිදන් හෑරීම්, පුරාවස්තු වෙළෙඳාම් පිළිබඳ 100කට ආසන්න සිදු වීම් වාර්තා වී ඇති බව ජනමාධ්‍ය හෙළිකර සිටී. ලංකාව තුළ පුරාවිද්‍යා වටිනාකමක් සහිත ස්ථාන දෙලක්ෂ පන්දහසක් බව පුරා විද්‍යා දෙපාර්තමේන්තුව සඳහන් කර තිබියදී තත්ත්වය ඉතාමත් බරපතළ වනු ඇති බව පැහැදිලිය.

පුරාවස්තු යනු ජාතියේ අතීත උරුමයන් නොබිඳිය හැකි කොටසක් බවත්, නිදන් ලෙස වැළලී ඇත්තේ ඒවායින් යම් ප්‍රමාණයක් බවත් පැහැදිලිය. සොරකම්, හෑරීම් සහ වෙළෙඳාම් මඟින් රටට අහිමි වෙමින් ඇත්තේ එබඳු උරුමයකි. අනෙක් අතට නිදන්ගත වටිනා දේ ඇතැයි යන මිත්‍යා විශ්වාස හේතුවෙන් විනාශ වී යන දාගැබ්, පිළිම වැනි පුරාවස්තු ප්‍රමාණයද සුළුපටු නොවේ.

මහා පරිමාණයෙන් පුරාවස්තු සොරකම් හා නිදන් හෑරීම් රට පුරා වාර්තා වෙද්දී, මේවා පිටුපස යම් හස්තයක් ඇතැයි සමාජ මතයක් ගොඩනැ තිබිණි. එයට තවත් එක් හේතුවක් වී ඇත්තේ එක් එක් කෞතුක භාණ්ඩ කෙරෙහි විවිධ ජනප්‍රවාද ගොඩනැඟී තිබීමයි. උදාහරණයක් ලෙස, දුටුගැමුණු රජතුමාගේ කඩුව පාවිච්චි කරන්නෙකුට ජීවිත කාලයම රජකම දැරිය හැකි බවට මතයක් පවතී. එම නිසා එවැනි කඩු සොයා යනවා යැයි සමාජ මතයක් ගොඩ නැඟෙමින් තිබිණි.

සමාජය තුළ මෙම නිදන් වස්තු කොල්ලකෑම් පිටුපස යම් ඍජු හස්තයක් ඇතැයි ක්‍රමානුකූලව වර්ධනය වෙමින් තිබූ මතයට විශාල වලංගුභාවයක් පසු ගිය දා විලච්චියේදී සිදු වූ නිදන් හෑරීමේ සිදුවීමෙන් ලැබිණි. පසු ගිය දා අනුරාධපුර විලච්චිය ප්‍රදේශයේදී පොලිස් විශේෂ කාර්ය බලකායේ (එස්.ටී.එෆ්) පිරිසක් බැකෝ යන්ත්‍ර යොදා ගනිමින් නිධානයක් ගොඩ ගනිමින් සිටියදී එම ගම්වාසීන් විසින් එම ස්ථානය වටලා, නිදන් මං කොල්ලකෑමට හවුල් වූ එස්ටීඑෆ් නිලධාරීන් තාවකාලිකව ඔවුන්ගේ භාරයට ගන්නා ලදී. රට තුළ නිදන් මං කොල්ලකෑම් වර්ධනය වෙමින් ආ තත්ත්වය ඉතා හොඳින් රටට හෙළිදරවු කිරීමටත් වරදකරුවන් අත් අඩංගුවට ගෙන දඬුවම් කිරීමටත් මෙම අවස්ථාව ඉවහල් කර ගත යුතුව තිබිණි. එහෙත් රජයේ මැදිහත් වීම සිදු වූයේ පොලිස් නිලධාරීන් එම ප්‍රදේශයට යවා ගම්වාසීන්ගේ ග්‍රහණයෙන් එම නිලධාරි පිරිස හා එයට උපයෝගී කර ගන්නා ලද බැකෝ යන්ත්‍ර නිදහස් කර ගැනීමයි. මෙවැනි නිදන් මං කොල්ලකරුවන්ට එරෙහිව එම ගම්වාසීන් දක්වන ලද ධෛර්යසම්පන්න මැදිහත්වීම මෙම ගරු සභාවේ සියලු දෙනාගේ ඇගැයීමකට භාජන විය යුතුය.

නමුත් පොලිස් මාධ්‍ය ප්‍රකාශක විසින් ප්‍රකාශ කරන ලද්දේ මෙම නිලධාරීන් රාජකාරි කටයුත්තකට ගිය බවය. ඒ පිළිබඳව ප්‍රදේශයේ ආරක්ෂක අංශ දැනුවත් වී සිටි බවක් වාර්තා වූයේ නැත. අනෙක් අතට රාජකාරි කටයුත්තකට ගිය නිලධාරීන් පිරිසක් ගම්වාසීන්ගේ විරෝධතා හමුවේ වරදකාරි හැඟීමෙන් යුතුව තමන් සතුව තිබූ T56 ගිනි අවි කරේ එල්ලා ගෙන පසුපස බලමින් පැන යාමෙන් පිළිබිඹු වූයේද ඔවුන් රහසිගත, නීති විරෝධී කටයුත්තක නියැළී සිටි බවය.

කෙසේ වුවද අවසානයේ සිද්ධියට සම්බන්ධ සියලු දෙනා බැකෝ ආදී උපකරණ සමඟ නිදහස් කර හැරීමෙන් ආණ්ඩුවේ ඉහළම තැන්වල රැකවරණය මෙම පිරිසට ලැබෙන බවට මහජනතාව තුළ වන සැකය තහවුරු වී තිබේ.

80 දශකයේ අගභාගයේ ද ඉහළ ගිය මෙබඳු ආකාරයේ නිදන් සොරකම් සඳහා රාජ්‍ය අනුග්‍රහය ලැබෙන බවට විශ්වාසයක් මහජනතාව තුළ වූ අතර මෑත කාලීන සිදුවීම් විසින් ද නැවතත් එම මතය සමාජගත කරමින් ඇත. ආණ්ඩුව මුහුණ දෙමින් ඇති ආර්ථික අර්බුදයට පිළියමක් ලෙස පුරාවස්තු මුදල් කරලීමේ ව්‍යාපාරයක් ඇත්දැයි සැක හිතෙන තරමට මෙම සොරකම් සහ නිදන් හෑරීම් තීව්‍ර වී ඇති අතර ආණ්ඩුවට මෙම සිදුවීම් සම්බන්ධව වග කීමෙන් නිදහස් විය නොහැක.

මේ හේතුවෙන් පැන නඟින පහත ප්‍රශ්නවලට අදාළ අමාත්‍යවරයා විසින් මෙම ගරු සභාව දැනුවත් කරනු ඇතැයි අපේක්ෂා කරමි.

2005 ජනවාරි මාසයේ සිට මේ දක්වා,

01. වාර්තා වී ඇති පුරාවස්තු සොරකම්, නිදන් හෑරීම් හා පුරාවස්තු වෙළඳාම් කිරීමේ සිදුවීම් ප්‍රමාණය කොපමණද?

02. මේ හේතුවෙන් අත් අඩංගුවට ගෙන ඇති පුද්ගලයින් සංඛ්‍යාව කොපමණද?

03. අත් අඩංගුවට ගැනීම් මඟින් සොයා ගනු ලැබ ඇති පුරාවස්තු මොනවාද?

04. ආන්දෝලනයට තුඩුදුන් විලච්චියේ නිදන් මං කොල්ලකරුවන් සම්බන්ධයෙන් ගෙන ඇති පියවර කවරේද?

05. එම ස්ථානයට STF නිලධාරීන් රාජකාරි කටයුත්තක් සඳහා යන ලද්දේ නම්, ඒ සඳහා පැමිණිල්ලක් ලැබී තිබේද? අදාළ ප්‍රදේශයේ පොලිස් නිලධාරීන් දැනුවත් කර තිබේද? එම STF නිලධාරීන් එම ස්ථානයට යාමට නියෝග ලබා දුන්නේ කවර බලධාරියා විසින්ද? ඔවුන් එම ස්ථානයට යන විටත් බැකෝ යන්ත්‍රයක් තිබුණේද? එම බැකෝ යන්ත්‍රය රැගෙන යන තෙක් අත් අඩංගුවට ගැනීමට නොහැකි වූයේ මන්දැයි යන කරුණු පිළිබඳ මෙම ගරු සභාව දැනුවත් කරනු ඇතැයි බලාපොරොත්තු වෙමි. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, බොහොම ස්තුතියි.

**ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතා (වාරිමාර්ග හා ජල සම්පත් කළමනාකරණ අමාත්‍යතුමා සහ පාර්ලිමේන්තුවේ සභානායකතුමා)**

(மாண்புமிகு நிமல் சிறிபால த சில்வா - நீர்ப்பாசன, நீர்வள முகாமைத்துவ அமைச்சரும் பாராளுமன்றச் சபை முதல்வரும்)

(The Hon. Nimal Siripala de Silva - Minister of Irrigation and Water Resources Management and Leader of the House of Parliament)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ගරු අනුර දිසානායක මන්ත්‍රීතුමා විසින් ස්ථාවර නියෝග 23(2) යටතේ මතු කරන ලද ප්‍රශ්නය අමාත්‍යාංශ ගණනාවකට බලපාන ප්‍රශ්නයක්. විශේෂයෙන්ම ජාතික උරුමයන් පිළිබඳ අමාත්‍යතුමා දැනට විදේශගත වී සිටින නිසා එතුමාගේ අමාත්‍යාංශයෙන් මේ පිළිබඳ විස්තරාත්මක උත්තරයක් අමාත්‍යතුමා විසින්ම ලබා දීමට

බලාපොරොත්තු වන බව දන්වා තිබෙනවා. ඒ නිසා අපි එතුමා දිවයිනට පැමිණීමෙන් පසු අනෙකුත් අමාත්‍යාංශවලිනුත් අදාළ නිරීක්ෂණයන් ගෙන්වා ගතයුතු වෙනවා. විශේෂයෙන්ම ආරක්ෂක අමාත්‍යාංශයෙනුත් මේ පිළිබඳ නිරීක්ෂණ ගෙන්වා ගැනීම අත්‍යවශ්‍ය වෙලා තිබෙනවා, ඔබතුමාට මේ කාරණය පිළිබඳ පූර්ණ පිළිතුරක් සැපයීම සඳහා. ඒ නිසා රජය වෙනුවෙන් මම වග කීමෙන් යුතුව කියනවා, මේ සඳහා ඒ සෑම අමාත්‍යාංශයක් එක්කම සම්බන්ධීකරණය කරලා ඔබතුමා විසින් අසා ඇති මේ ප්‍රශ්න පිළිබඳව උත්තරයක් ඊ ළඟ රැස්වීම් පවත්වනු ලබන සතියේදී අපි ලබා දෙන බව.

**ගරු අනුර දිසානායක මහතා**
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)

ගරු කථානායකතුමනි, දැන් මේ ප්‍රශ්න ටික බැලුවොත් හරි පැහැදිලියි මේ ප්‍රශ්නවලට පිළිතුරු ලබා දිය යුත්තේ රාජ්‍ය ආරක්ෂක අමාත්‍යාංශයෙන්ය කියන එක. ඒ නිසා මෙය තවත් කොහේවත් පැටලෙන්න ඕනෑ නැහැ. විශේෂයෙන් ගත්තොත් වාර්තා වෙච්ච මං කොල්ල ගණන සම්බන්ධ පිළිතුර ආරක්ෂක අමාත්‍යාංශයෙන් දෙන්න ඕනෑ. අත් අඩංගුවට ගෙන ඇති ගණන සම්බන්ධ පිළිතුර ආරක්ෂක අමාත්‍යාංශයෙන් දෙන්න ඕනෑ. අත් අඩංගුවට ගැනීම් මඟින් සොයා ගනු ලැබ ඇති පුරාවස්තු පිළිබඳ විස්තරය ආරක්ෂක අමාත්‍යාංශයෙන් ලබා දිය යුතුයි. මේ සියලු ප්‍රශ්නවලට උත්තර දෙන්න තිබෙන්නේ ආරක්ෂක අමාත්‍යාංශයෙන්. විලච්චියේ STF නිලධාරින් යැව්වේ කවුද, ඔවුන්ට නියෝග දුන්නේ කවුද, ඔවුන් ඒ පොලීසියට වාර්තා කරලා තිබුණාද, ඒ නිලධාරින් ඒ මං කොල්ලය වෙනුවෙන් හවුල් වුණේ කෙසේද, ඒ අය පසු බැස්සේ කොහොමද කියන කරුණු මුළුමනින්ම සෘජුවම ආරක්ෂක අමාත්‍යාංශය හා ගැට ගැහෙන කරුණක්. පුරාවස්තු ජාතික උරුමයන් පිළිබඳ අමාත්‍යාංශයට අයත් බව ඇත්ත, ගරු නියෝජ්‍ය කථානායකතුමනි.

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)

ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමා ප්‍රකාශය කළා. ඒ පිළිබඳ පිළිතුරු ලබා දීමට අවස්ථාවක් ඉල්ලුවා. දැන් ගරු ඩිව් ගුණසේකර මහතාගේ වරප්‍රසාද පිළිබඳ ප්‍රශ්නය.

## වරප්‍රසාද : 2012 මැයි 09 "ඩේලි මිරර්" වාර්තාව
## சிறப்புரிமை: 2012.05.09 ஆந் திகதிய "டெய்லி மிரர்" அறிக்கை
## PRIVILEGE : "DAILY MIRROR" REPORT OF 09TH MAY 2012

**ගරු ඩිව් ගුණසේකර මහතා (මානව සම්පත් පිළිබඳ අමාත්‍යතුමා)**
(மாண்புமிகு டியூ குணசேகர - மனித வளங்கள் அமைச்சர்)
(The Hon. DEW Gunasekara - Minister of Human Resources)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, 2012 මැයි මාසයේ 09 වැනි දින -අද දින- ඩේලි මිරර් පත්තරයේ, තුන්වැනි පිටුවේ, ඊයේ පැවති විවාදය පිළිබඳව ශීර්ෂ පාඨයකින් ප්‍රවෘත්තියක් පළ කරලා තිබෙනවා. ඒකේ තිබෙන්නේ මෙහෙමයි;

> "Not Discharging Duties at COPE Sessions
> D.E.W. Criticizes Ministers"

මෙවැනි ප්‍රකාශයක් මම කළේ නැහැ. මම අද ඒ tape එක අරගෙන බැලුවා, මගේ අතින් එහෙම ප්‍රකාශයක් වෙලා තිබුණාද කියලා. හැබැයි මේ ප්‍රකාශය කළේ වෙන කවුරුවත් නොවෙයි. මේ විවේචනය කළේ මගේ මිත්‍ර මට ඉස්සෙල්ලා කථා කරපු ජෝන් අමරතුංග මන්ත්‍රීතුමායි. එතුමා තමයි ඒක ප්‍රබල ලෙස විවේචනය කළේ. ඒ නිසා මා මේ ගරු සභාවටත්, ඔබතුමාටත් දන්වා සිටිනවා, මම එවැනි ප්‍රකාශයක් කළේ නැහැයි කියලා.

## පාර්ලිමේන්තුවේ කටයුතු
## பாராளுமன்ற அலுவல்
## BUSINESS OF THE PARLIAMENT

**ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතා**
(மாண்புமிகு நிமல் சிறிபால த சில்வா)
(The Hon. Nimal Siripala de Silva)

ගරු කථානායකතුමනි, මා පහත සඳහන් යෝජනාව ඉදිරිපත් කරනවා:

> "න්‍යාය පත්‍රයේ ප්‍රධාන කටයුතුවල අංක 1 දරන විෂය පිළිබඳ වැඩ අද දින රැස්වීමේදී අංක 23 දරන ස්ථාවර නියෝගයෙහි විධිවිධානයන්ගෙන් නිදහස් විය යුතු ය."

*ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.*
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

## පාර්ලිමේන්තුවේ රැස්වීම්
## பாராளுமன்ற அமர்வு
## SITTINGS OF THE PARLIAMENT

**ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතා**
(மாண்புமிகு நிமல் சிறிபால த சில்வா)
(The Hon. Nimal Siripala de Silva)

ගරු කථානායකතුමනි, මා පහත සඳහන් යෝජනාව ඉදිරිපත් කරනවා:

> "ස්ථාවර නියෝග 7 හි විධිවිධානවල සහ 2010.07.09 දින පාර්ලිමේන්තුව විසින් සම්මත කරන ලද යෝජනාවේ කුමක් සඳහන්ව තිබුණ ද, අද දින රැස්වීම් පැවැත්වෙන කාල වේලා අ. භා. 1.00 සිට අ. භා. 7.00 දක්වා විය යුතුය. අ. භා. 3.30 ට ස්ථාවර නියෝග 7(5) ක්‍රියාත්මක විය යුතු ය."

*ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.*
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

## ක්‍රමෝපාය සංවර්ධන ව්‍යාපෘති පනත: නියමය
## செயல்நுணுக்க அபிவிருத்தி கருத்திட்டங்கள் சட்டம்: கட்டளை
## STRATEGIC DEVELOPMENT PROJECTS ACT : ORDER

[අ. භා. 2.28]

**ගරු ලක්ෂ්මන් යාපා අබේවර්ධන මහතා (ආර්ථික සංවර්ධන නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு லக்ஷ்மன் யாப்பா அபேவர்தன - பொருளாதார அபிவிருத்தி பிரதி அமைச்சர்)
(The Hon. Lakshman Yapa Abeywardena - Deputy Minister of Economic Development)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ආර්ථික සංවර්ධන අමාත්‍යතුමා වෙනුවෙන් මා පහත සඳහන් යෝජනාව ඉදිරිපත් කරනවා:

[ගරු ලක්ෂ්මන් යාපා අබේවර්ධන මහතා]

"2008 අංක 14 දරන ක්‍රමෝපාය සංවර්ධන ව්‍යාපෘති පනතේ 3 වැනි වගන්තියේ (4) වැනි උපවගන්තිය යටතේ ආර්ථික සංවර්ධන අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2012 පෙබරවාරි 28 දිනැති අංක 1747/4 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2012.05.08 දින ඉදිරිපත් කරන ලද නියමය අනුමත කළ යුතු ය."

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, විශේෂයෙන්ම ඊයේ දින පාර්ලිමේන්තුවේදී ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායක ගරු දිනේෂ් ගුණවර්ධන මැතිතුමා විසින් ගැසට් පත්‍රය ඉදිරිපත් කළා, 2008 අංක 14 දරන ක්‍රමෝපාය සංවර්ධන ව්‍යාපෘති පනත යටතේ නැඟෙනහිර පළාතේ ත්‍රිකුණාමල පරිපාලන දිස්ත්‍රික්කයේ පිහිටි සාම්පූර්වල මෙගා වොට් 500ක ධාරිතාවකින් යුත් ගල් අඟුරු ආශ්‍රිත බලාගාරයක් ඉදි කිරීමේ ව්‍යාපෘතිය සඳහා.

මම ඔබතුමාගේ අවධානය පළමුවෙන්ම යොමු කරනවා, අද "දිවයින" පත්‍රයේ මේ පිළිබඳව තිබුණු වාර්තාව කෙරෙහි. පළමුවෙන්ම එය නිවැරදි විය යුතුයි. අද "දිවයින" පත්තරයේ "සාම්පූර් ගල් අඟුරු බලාගාරය ඉන්දියානු සමාගමකට පැවරීමට අදාළ ගැසට් නිවේදනය පාර්ලිමේන්තුවට" කියන ශීර්ෂ පාඨය යටතේ වාර්තාවක් පළ වෙලා තිබුණා. ඒක නිවැරදි විය යුතුයි. මෙම ව්‍යාපෘතිය ලංකා විදුලිබල මණ්ඩලයත්, NTPC Limited ඉන්දියානු සමාගමත් සියයට 50 බැගින් දායකත්වය ඇතිව ලංකාවේ සමාගමක් හැටියට "Trincomalee Power Company Limited" කියන නමින් ලියා පදිංචි කරලායි මේ ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරන්නේ. වැරදි මතයක් යන්න පුළුවන්, මේ බලාගාරය සම්පූර්ණයෙන්ම සමාගමකට පැවරීමට අවශ්‍ය ගැසට් නිවේදනයක් නිකුත් කළා කියලා.

මෙම ගරු පාර්ලිමේන්තුවේ සියලු දෙනාම පිළිගන්නා කාරණයක් තමයි ගරු විදුලිබල හා බලශක්ති ඇමතිතුමා විවිධ අවස්ථාවලදී මේ පාර්ලිමේන්තුවේදී විදුලි බලය පිළිබඳ එතුමාගේ පැහැදිලි කිරීම්වලදී ඉතාමත්ම පැහැදිලිව මේ සඳහා යන වියදමත්, ඒ වාගේම අනාගතයේදී ඇති වන තෙල් අර්බුද හමුවේ අපට මුහුණ පාන්නට වන ප්‍රශ්න පිළිබඳවත් විස්තරයක් කරලා තිබෙනවා කියන එක. ඒ නිසා අපි මේ ආයෝජන මේ රටට ගෙන ඒමේදී විශේෂයෙන්ම රටේ ආර්ථිකයට බලපාන ප්‍රධාන ආයෝජන කෙරෙහි අවධානය යොමු කරන්නට ඕනෑ. අපි නිෂ්පාදන ක්ෂේත්‍රයට මොන තරම් ආයෝජන ගෙනාවත් ඒ නිෂ්පාදන ක්ෂේත්‍රයට බලපාන අතුරු ආබාධ තිබෙනවා. විශේෂයෙන් නිෂ්පාදන ක්ෂේත්‍රය වැඩි දියුණු කිරීමේදී වියදම වැඩි වීමේ ක්‍රමවේදයන් අඩු කර ගැනීම සඳහා අපි යම් යම් තීන්දු මේ කාලයේදී ඉක්මනින් ගත යුතුව තිබෙනවා. ඒ අනුව අපට අද මේ රටේ මුහුණ පාන්න සිදු වෙලා තිබෙන ප්‍රධාන ප්‍රශ්නය තමයි විදුලි බලය සඳහා අධික වියදමක් යන එක.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මම ඔබතුමාගේ අවධානයට යොමු කරන්නට කැමැති කාරණයක් තිබෙනවා. විශේෂයෙන් ගිය අවුරුද්දේ, - 2011 වර්ෂයේදී- අපි කිලෝ වොට් units මිලියන 4,622ක්, -ඒ කියන්නේ ප්‍රධාන ජල විදුලි බලාගාරවලින් සියයට 40ක්- ඒ වාගේම සුළු hydropowerවලින් units මිලියන 121ක්, -ඒ කියන්නේ සියයට 1ක දායකත්වයක්- coal powerවලින් සියයට 9ක දායකත්වයක්, oil power generationවලින් සියයට 50ක දායකත්වයක් අරගෙන තිබෙනවා. ඒ ආකාරයෙන් බැලුවාම අපි සියයට 50ක දායකත්වයක් ගිය අවුරුද්දේදී තෙල්වලින් නිෂ්පාදනය කරලා තිබෙනවා. මේ හේතුව නිසා රජය තීන්දු කළා විශේෂයෙන්ම මෙම ව්‍යාපෘතිය කඩිනමින් ක්‍රියාත්මක කළ යුතුයි කියලා.

මෙම ව්‍යාපෘතියේ ආයෝජන වටිනාකම ඇමෙරිකන් ඩොලර් මිලියන 590යි. විශේෂයෙන්ම ණය හිමිකරු ප්‍රාග්ධනය 70:30ක් යන ආකාරයට, පාර්ශ්වකරුවන් හැටියට ලංකා විදුලිබල මණ්ඩලය සියයට 50කුත් -ඇමෙරිකන් ඩොලර් මිලියන 75ක්- සහ NTPC Limited ඉන්දියානු සමාගම සියයට 50කුත් -ඇමෙරිකන් ඩොලර් මිලියන 75ක්- වශයෙන් දායකත්වය ඇතිව ආරම්භ කරනු ලබන මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරනු ලබන්නේ Trincomalee Power Company Limited නමින් ලංකාවේ ලියා පදිංචි සමාගමක්. එහි බලාගාර ධාරිතාව මෙගා වොට් 500ක් වෙනවා. ව්‍යාපෘති කාල සීමාව 2016 වන තුරු, එනම් මාස 60ක කාල සීමාවකින් මෙය නිම කිරීමටත් අවශ්‍ය පියවර ගන්න සූදානම් වෙලා ඉන්නවා.

මේ සමාගම අපි පිළිගත්තේ ඉන්දියානු සමාගමක්ම වුණු පළියට නොවෙයි. 1975 දී ස්ථාපිත කරන ලද මෙම සමාගමේ තිබෙන පසු බිම් වාර්තා අරගෙන බැලුවාම, මෙවැනි ක්‍රියාදාමයක් කිරීමට ලෝකයේ ප්‍රබල සමාගමක් හැටියට, පිළිගත් සමාගමක් හැටියට -විශේෂයෙන්ම අනෙකුත් පසු බිම් සමඟ බැලුවාම, අපේ කලාපයේ තිබෙන සම්බන්ධතාවත් සමඟ බැලුවාම ඉතාමත්ම ඉහළ මට්ටමේ විදුලිය නිෂ්පාදනය කරන සමාගමක් හැටියට- වසර 36ක් පුරා විවිධ ව්‍යාපෘතීන් ක්‍රියාත්මක කර තිබෙන බව පෙනී ගියා. එයින් දැනට මෙම සමාගම මෙගා වොට් 36,000කට අධික විදුලි බලයක් ජනනය කරලා 2017 දී මෙගා වොට් 75,000 දක්වා එය ව්‍යාප්ත කිරීමට සැලසුම් කර තිබෙනවා. මේ විදුලි ජනනයෙන් මෙගා වොට් 27,500කට අධික ප්‍රමාණයක් නිෂ්පාදනය කරන්නේ ගල් අඟුරු යොදා ගෙන. ගල් අඟුරු බලාගාර 15ක් පමණ මෙම සමාගම මඟින් ක්‍රියාත්මක කරනවා. මෙම සමාගමේ මූල්‍ය වාර්තාව අනුව ඇමෙරිකානු ඩොලර් බිලියන 10කට අධික ආදායමක් 2009 දීත්, 2010 වර්ෂයේදීත් ඔවුන් ලබා ගෙන තිබෙනවා. වර්ෂයේ ශුද්ධ ආදායම ඇමෙරිකානු ඩොලර් බිලියන 1.76ක් වෙනවා. මෙම සමාගම දැනට විවිධ ස්තරයන්හි සේවක සේවිකාවන් 26,000ක් සේවය කරන ඉතාමත් ප්‍රබල ඉන්දියානු සමාගමක් හැටියට හඳුනා ගෙන තිබෙනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මෙතෙක් මේ රටේ පාර්ලිමේන්තුවට ක්‍රමවේදයට අනුව මෙවැනි ආයෝජන ගෙනාවේ නැහැ. අපි ගිය වතාවේ මේ පනත පිළිබඳව සාකච්ඡා කරන අවස්ථාවේදී ඉතාමත් පැහැදිලි ලෙස ප්‍රකාශ කළා, මේ ආණ්ඩුව විනිවිදභාවයකින් යුතුව, මේ උත්තරීතර පාර්ලිමේන්තුවට පනත් ගෙනෙන පිළිවෙළට මේ පනත ගෙනැල්ලා තිබෙන බව. අපි මේවා කලින් ක්‍රියාත්මක කරලා හෝ වුවමනා සමාගම් තෝරා ගෙන එහෙම නැත්නම් මේවා ප්‍රසිද්ධ නොකර සිට හෝ එහෙම කිසිම දෙයක් කරලා නැහැ. විනිවිදභාවයක් ඇතුව මේවා ක්‍රියාත්මක කරලා තිබෙනවා.

2008 අංක 14 දරන ක්‍රමෝපාය සංවර්ධන ව්‍යාපෘති පනතේ 3 (2) උපවගන්තියේ විශේෂයෙන්ම ආර්ථික සංවර්ධන විෂය භාර අමාත්‍යවරයා හැටියට ගරු බැසිල් රාජපක්ෂ ඇමතිතුමා මෙම ව්‍යාපෘතිය පිළිබඳව 2011 ඔක්තෝබර් මාසයේ තුන්වැනිදා අති විශේෂ ගැසට් පත්‍රය මහ ජනතාවගේ දැන ගැනීම සඳහා නිකුත් කරලා තිබෙනවා.

ඒ වාගේම එම පනතේ අංක 3(3) උපවගන්තියට අදාළ විධිවිධානවලට අනුව විශේෂයෙන්ම 2012 ජනවාරි මාසයේ 17 වැනිදා අමාත්‍ය මණ්ඩල පත්‍රිකාවක් අපි ඉදිරිපත් කර තිබෙනවා. ඒ වාගේම කැබිනට් අනුමැතියෙන් පස්සේ 3(4) උපවගන්තිය යටතේ මෙම ව්‍යාපෘතියට අදාළ නියමය අංක 1747/4 දරන 2012 පෙබරවාරි මාසයේ 28 වැනි දින අති විශේෂ ගැසට් පත්‍රයේ නියමයක් ලෙස ප්‍රකාශයට පත් කරලා තිබෙනවා. ඒ නිසා අදාළ නියමය ප්‍රකාශයට පත් කිරීමෙන් පස්සේ පනතේ 3(5) උපවගන්තිය ප්‍රකාරව මෙම නියමය අනුමත කිරීම සඳහා මෙම පාර්ලිමේන්තුවට දැන් ගෙනැල්ලා තිබෙනවා. එහෙනම් මේ අනුගමනය කරපු ක්‍රියාමාර්ග හතරම වෙලාවට, පිළිවෙළට ක්‍රියාත්මක කරලා තමයි තමුන්නාන්සේලාට අද මේ විවාදයට මේ නියමය අපි ඉදිරිපත් කරන්නේ.

මෙයින් දෙන බදු සහන ගැන සමහර විට විපක්ෂය කථා කරයි. මෙවැනි විශාල සමාගමක් ආයෝජනයට ගෙනෙන කොට ඒ අයට බදු සහන ලබා දිය යුතුයි. BOI පනත යටතේත් අපි ඒ අවස්ථාව ලබා දීලා තිබෙනවා. මොකද ලෝකයේ ඕනෑම රටක මේ වාගේ ආයෝජනයන් ගෙනෙන කොට ඒ ආයෝජනය කරන රටවල් ඒ බදු සහන නැත්නම් අවුරුදු 25ක්, 30ක්, 50ක්, 60ක් තමන්ගේ මුදල් ආපසු ගන්න බැරිව නිකම්ම ආයෝජනය කරන්නේ නැහැ. ඒ නිසා ඒ බදු සහන අපි දීලා තිබෙනවා.

පසු ගිය කාලයේ විදුලිය ඒකකයකින් අපි අලාභ ලබන ගණන, ඒ වාගේම මහ ජනතාවට දෙන සහනය විදුලිබල හා බලශක්ති ඇමතිතුමා ඉතාමත්ම පැහැදිලිව මේ සභාවට ඉදිරිපත් කළා. ලංකාවේ ඉන්න ජනගහනයත් එක්ක බැලුවාම ඉදිරි කාලය ඇතුළත -මේ අවුරුදු 20ක්, 30ක් කාලයක් ඉස්සරහට- විදුලිය සඳහා අපි මහ ජනතාවට දෙන සහන, ආයතනවලට දෙන සහන මේ ඔක්කොම එක්ක කල්පනා කරලා බැලුවාම -තෙල් මිල වැඩිවීමත් එක්ක- ඒවා සියල්ලේම බර මහ ජනතාව පිටයි යන්නේ. එම තාප බලාගාර ඉදි කිරීම තුළින් වැය වන නිෂ්පාදන වියදම අඩු වීමත් එක්කම අපට පුළුවන් වෙනවා, මිල වැඩි වීමෙන් මහ ජනතාව මත පැටවෙන බර නැති කර ඔවුන්ට සහනයක් ලබා දෙන්න.

නිෂ්පාදන වියදම ගත්තොත්, අද මේ රටේ කර්මාන්තවලට කරන ආයෝජනයට -ඇඟලුම් කර්මාන්තය වෙන්න පුළුවන්, වෙනත් කර්මාන්ත වෙන්න පුළුවන්- ප්‍රශ්නයක් වෙලා තිබෙනවා. ආයෝජනය කිරීමේදී නිෂ්පාදන වියදම අරගෙන බැලුවොත් එය ආයෝජනයට බරපතළ ප්‍රශ්නයක් වෙලා තිබෙනවා. ඒක අපට විතරක් නොවෙයි වෙලා තිබෙන්නේ. ගරු ආචාර්ය හර්ෂ ද සිල්වා මන්ත්‍රීතුමාත් ඒක හොඳින් දන්නා බව මම දන්නවා. තෙල් අර්බුදයත් එක්ක ලෝකයේ විවිධ රටවල්වල විශේෂයෙන්ම නිෂ්පාදන වියදම වැඩි වෙලා තිබෙනවා. නිෂ්පාදන වියදම වැඩි වීම තුළ අපට ජනතාව මත විවිධ ආකාරයේ බදු පටවන්න සිද්ධ වෙනවා. ඒ නිසා අපි මේකට මුහුණ දෙන්න ඕනෑ. අවංකවම කියන්න ඕනෑ, අපි එදා මහවැලිය පටන් ගත්තේ නැත්නම් අද මීට වැඩිය අර්බුදයකට යන බව. ඒ කාලයේ විවේචන තිබුණා. මේ රටේ විවේචන ගැන බැලුවාම පසු ගිය වකවානුව ඇතුළත හැම යෝජනා ක්‍රමයක්ම ක්‍රියාත්මක කිරීමේදී විවිධ බලවේග එළියට බැහැලා විවේචනය කරලා, ඒවා අවුරුදු ගණන් පහු වෙලා ක්‍රියාත්මක කිරීම තුළ සිදු වුණු අලාභය අපි දන්නවා. නිල්වලා යෝජනා ක්‍රමය ගත්තොත්, නිල්වලා යෝජනා ක්‍රමය පිළිබඳව දොස්තර වික්‍රමසිංහ මැතිතුමා යෝජනා කරපු එක ක්‍රියාත්මක වුණා නම් අද අලාභයක් නැතිව දකුණේ විශාල ප්‍රමාණයකගේ ජල ප්‍රශ්නය විසඳන්න පුළුවන්කම තිබුණා. ඒ වාගේම මහවැලිය හදන වෙලාවේ විවිධ ආකාරයෙන් විවේචන ආවා. බලාගාරයක් ඇති කරන්න හැදුවාම ඒකට විවේචන ආවා.

අපි පසු ගිය වකවානුව ඇතුළත ඉනාමලුවේ කණ්ඩලම හෝටලය හදන කොට ආව බලපෑම් මත මේ රටේ විශාල මත ඇති කළා. නමුත්, ඒ ආයෝජනයන් දෙස බැලුවාම එදා අමාරුවෙන් එම ආයෝජන කරපු නිසා අද විශාල මුදල් ප්‍රමාණයක් ඉතිරි වෙන බව පෙනෙනවා. මොකද, මේක ලංකාවට විතරක් බලපාන එකක් නොවෙයි. මහින්ද රාජපක්ෂ රජය යටතේ හෝ එහෙම නැත්නම් වෙන රජයක් යටතේ හෝ මේ ලෝකයේ ඇති වන අර්බුදයට අපි මුහුණ දෙන්න ඕනෑ. අපි මේ අර්බුදයට මුහුණ දෙන්න නම් අපි සියලු දෙනාම -පක්ෂ හෝ විපක්ෂ සියලු දෙනාම- තීන්දු ගත යුතු එක දෙයක් තිබෙනවා. විශේෂයෙන්ම රටේ ජාතික අවශ්‍යතාවන් සඳහා අදාළ දේවල්වලදී රට පිළිබඳව කල්පනා කරලා තීන්දු ගන්න ඕනෑ. ඒක ජාතියට හානියක් නොවනවා නම්, රටට හානියක් නොවනවා නම් ඒ පිළිබඳ තීන්දු ගැනීමේ වගකීම මේ පාර්ලිමේන්තුවට පවරලා තිබෙනවා. ඔබතුමන්ලාට, අපි සියලු දෙනාටම පවරලා තිබෙනවා. අපට දේශපාලන වශයෙන් එළියට බැහැලා කියන්න පුළුවන්. නමුත්, හෙට බලයට පත් වන ආණ්ඩුවක්, අනිද්දා බලයට පත් වන ආණ්ඩුවක් මේ ප්‍රශ්නවලට මුහුණ දෙන්න ඕනෑ. ඒක ඉතිහාසයේ පෙන්වලා දීලා තිබෙනවා. ඉතිහාසයේ ගත්තු සමහර වැරදි තීන්දු නිසා දරුවන්ට, පරම්පරා ගණනාවකට ඒක විඳින්න සිද්ධ වෙලා තිබෙනවා. ඒ නිසා අපි බදු සහන දෙනවා.

මම බදු සහන ගැන දීර්ඝ විස්තරයක් කිරීම අවශ්‍ය වෙන්නේ නැහැ. BOI පනත යටතේ තිබෙන බදු සහන, ඒ වාගේම මේ රටේ මෙවැනි ආයෝජනයන්ට අයින් කළ යුතු බදු සහන සියල්ලම මේ සමාගම්වලට ලබා දෙනවා. ඒ සමාගම් ක්‍රියාත්මක වන විට අවුරුදු 25කට පස්සේ ඒ බදු සහනවලින් අයින් වෙලා ලංකාවේ අනෙක් සමාගම්වල ආකාරයටම ඒ අයට බදු ගෙවන්න සිද්ධ වෙනවා; අනෙක් ආයෝජනයන් කළ සමාගම්වල ආකාරයටම බදු ගෙවන්න සිද්ධ වෙනවා.

මෙම ව්‍යාපෘතියෙන් රටට අත් වන වාසි මොනවාද කියලා අපි බලන්නට ඕනෑ. ඒ වාසි තමයි රටේ යටිතල පහසුකම් වැඩි දියුණු කිරීම සඳහා කරනු ලබන ආයෝජනයක් හැටියට මෙය සැලකීම. ඒකයි මම කිව්වේ, මහවැලිය වාගේම මේ ආයෝජනය අපට වැදගත් වෙනවා කියලා. මොකද, මේවා විශාල ආයෝජන. පළමු වතාවේ මෙගා වොට් 500යි, දෙවැනි වතාවේ මෙගා වොට් 500යි. එතකොට මෙගා වොට් 1,000ක් වුණා. අනාගතයේදී තවත් මෙගා වොට් 600ක් එකතු වෙනවා. එතකොට මෙගා වොට් 1,600යි. එතකොට වසර ගණනක් ඉස්සරහට, අවුරුදු 25ක්, 30ක් ඉස්සරහට යන තෙක් අපට නැවතත් මේ වාගේ ආයෝජනයකට යන්න අවශ්‍ය වන්නේ නැහැ. මොකද සියයට 8ක ආර්ථික වර්ධන වේගයක් පවතින රටකට අනිවාර්යයෙන්ම සියයට 12ක විදුලිය ඉල්ලුමක් එනවා.

පසු ගිය ඉතිහාසය ගැන කල්පනා කරලා බැලුවාම සියයට 12ක විදුලිය ඉල්ලුමක් ඇවිල්ලා තිබෙනවා. ඒ ඉල්ලුම සපුරාලන්න ඕනෑ. ඒක සපුරාලන්න තවත් ජල බලාගාර ඉදි කරන්න අපට බැහැ. කොත්මලේ බලාගාරයෙන් එය අවසන් වුණා. පොඩි පොඩි බලාගාරවලින් නිෂ්පාදනය වන ධාරිතාව මෙගා වොට් එකයි, දෙකයි. පරිසර හානියත් එක්ක, පරිසරයේ තිබෙන ප්‍රශ්නත් එක්ක දැන් ඒවාත් පටන් ගන්න බැරි තත්ත්වයක් ඇති වෙලා තිබෙනවා. ගම් මට්ටමින් ඒවාට විවිධ විරෝධතාවන් එන්න පටන් අරගෙන තිබෙනවා.ඒ නිසා මේ විකල්ප යෝජනාවලට අපි යා යුතුයි. ඒ නිසා තමයි මේ වැඩ පිළිවෙළේ වැදගත්කම මම සඳහන් කළේ. ඒ වාගේම රටේ ආර්ථික සංවර්ධනය අඛණ්ඩව පවත්වා ගෙන යෑමට විදුලි සැපයුම අඛණ්ඩවම සපයන්න ඕනෑ. ඒක ඔබතුමන්ලා අපි සියලු දෙනාම පිළිගන්නවා. මේ වසරේදී මෙගාවොට් 500ක නිෂ්පාදනයක් අපි ආරම්භ කළාම තවත් මෙගාවොට් 500ක නිෂ්පාදන හැකියාවක් මේ බලාගාරයට තිබෙනවා. ඒ වාගේම ඉදිරි අනාගතයේදී තවත් මෙගාවොට් 600ක එකතුවක් කරන්න අපි බලාපොරොත්තු වනවා. ගල්අඟුරු භාවිත කරමින් විදුලි උත්පාදනය කිරීම මඟින් වාර්ෂික විදුලි නිෂ්පාදනය සඳහා භාවිත කරන ඛනිජ තෙල් ආනයනය ක්‍රමක්‍රමයෙන් අඩු කර ගන්න අවස්ථාවකට අපිට ඉදිරියේදී යන්න පුළුවන්.

විශේෂයෙන්ම මෙයින් සිදු වන අහිතකර බලපෑම් ගැන කථා කරන්න පුළුවන්. අපේ විදුලිබල හා බලශක්ති ඇමතිතුමා පරිසර ඇමතිතුමා හැටියටත් සිටියා. විදුලිබල හා බලශක්ති ඇමතිතුමාගේ කථාවේදී, අපි අනුගමනය කරන ක්‍රියාමාර්ගයන් මොනවාද කියලා තමුන්නාන්සේලා ඇහුවොත් එතුමා පැහැදිලි කරලා දෙයි. පරිසරය පිළිබඳ ශක්‍යතා වාර්තාව, ඒ පරිසර නිර්දේශ පිළිගනිමින් ඒවාට විකල්ප යොදමින් අවම හානියක් වන ආකාරයට මේ වැඩ පිළිවෙළ ක්‍රියාත්මක කිරීම තමයි රජයේ අරමුණ. විදුලිබල හා බලශක්ති අමාත්‍යතුමාගේ කථාවේදී එය පැහැදිලි කරයි. මෙය මැතකදී අපි ගත් වැදගත් තීන්දුවක් හැටියට මා දකිනවා. මේ ආයෝජනය තුළ විදුලි නිෂ්පාදනයට ගල් අඟුරු භාවිත කිරීම ඉතා

[ගරු ලක්ෂ්මන් යාපා අබේවර්ධන මහතා]

ඉහළින්ම අගය කරනු ඇතැයි කියලා මා හිතනවා. ඔබතුමන්ලාගේ සහයෝගයත් මේ සඳහා බලාපොරොත්තු වෙමින් ගරු නියෝජ්‍ය කථානායකතුමාට මගේ ස්තුතිය පිරිනමමින් මා නවතිනවා.

***ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදී.***
*வினா எடுத்தியம்பப்பெற்றது.*
*Question proposed.*

[අ. භා. 2.43]

**ගරු ආචාර්ය හර්ෂ ද සිල්වා මහතා**
(மாண்புமிகு கலாநிதி ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha De Silva)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අපේ මිත්‍ර ලක්ෂ්මන් යාපා අබේවර්ධන නියෝජ්‍ය ඇමතිතුමා කථාව නැවැත්තුවේ අපගේ සහයෝගය බලාපොරොත්තු වනවා කියලායි. ගරු නියෝජ්‍ය ඇමතිතුමනි, ඔබතුමන්ලාගේ ආණ්ඩුවට මේ සම්බන්ධයෙන් අපගේ සහයෝගය තිබෙනවා.

ඇත්ත වශයෙන්ම අපි කල්පනා කරලා බැලුවොත් මේ විදුලි බලය පිළිබඳ ලොකු ගැටලුවක් අපට තිබෙනවා. විදුලි බලය නිපදවන්න යන වියදම අපට හැම දාම වැඩි වනවා. අපි ලෝකය පුරා ණය ගන්නවා. කවුරු නැහැයි කියලා කිව්වත් අපි දන්නවා, ජාත්‍යන්තර මූල්‍ය අරමුදලත් එක්ක අත්සන් කළ ගිවිසුමේ එක කොන්දේසියක් තිබුණා, Ceylon Petroleum Corporation එකේයි, Ceylon Electricity Board එකේයි එකතු කළ පාඩුව ගිය අවුරුද්දේ දෙසැම්බර් මාසයේ 31 වන දා වන කොට බින්දුවට ගෙනෙන්න ඕනෑ කියලා. ඒක කර ගන්න බැරි වුණු බව අපි දන්නවා. නැවතත් ඒ කට්ටියත් එක්ක මේ ගැන කථා කරන කොට ඒ කට්ටිය කියන්නේ මේ අවුරුද්දේ අන්තිම වන කොට ඒ ආයතන දෙකේ එකතු කරපු පාඩුව රුපියල් බින්දුව දක්වා පහළට ගෙනෙන්න ඕනෑ කියලායි. ඒකත් එක්ක අපි දන්නවා, ආණ්ඩුවට තනියෙන් මේ වැඩය කරන්න බැහැ කියලා. අපි සන්තෝෂ වන එක දෙයක් තිබෙනවා.

ගරු නියෝජ්‍ය ඇමතිතුමනි, ඔබතුමන්ලා මේ කරන්න යන්නේ public-private partnership එකක් වැනි වැඩක්. සියයට 50ක් විදුලිබල මණ්ඩලයෙනුත්, සියයට 50ක් ඉන්දියාවේ NTPC සමාගමෙනුත් වැය කරමින් තමයි ගරු ඇමතිතුමා මේ ක්‍රියාදාමය ඉස්සරහට ගෙනියන්න ඕනෑ. ඒක තමයි අපි දිගින් දිගටම කිව්වේ. අපි බලන්න ඕනෑ, පෞද්ගලික ආයතන සහ ආණ්ඩුවත් එකක් එකතු වෙලා කරන්න පුළුවන් වැඩ මොනවාද කියලා. නියෝජ්‍ය ඇමතිතුමා කිව්වා, මේ වැඩ කටයුත්ත කරන්න ඩොලර් මිලියන 500ක් වාගේ ගණනක් වැය වනවා කියලා. අපි තනිවම මේ වැඩය කරන්න ගියා නම්, කොහෙන් හෝ වැඩි පොලියට ණයක් ගන්න වෙනවා. එහෙම අරගෙන කරන්න ගියා නම් ජනතාවට තමයි මේ ණය ගෙවන්න සිද්ධ වන්නේ. ආයතන දෙකක් එකතු වෙලා කාර්යක්ෂමව මේ වැඩේ කරනවා නම් ජනතාවට දමන බර අඩු වනවා කියන එක මම පිළිගන්නවා. ඒ නිසා ඒක හොඳ දෙයක් හැටියට අපි දකිනවා. අපි ශුභ පතනවා.

එකක් කියන්න ඕනෑ. මම අහගෙනයි ගරු නියෝජ්‍ය ඇමතිතුමා පත්තරයෙන් කියවනවා -නොරොච්චෝලේ වෙන්න ඕනෑ- "මෙගාවොට් 300ක් හදපු එකට වඩා මෙගාවොට් 150 ඒවා දෙකක් හැදුවා නම් හොඳයි. මොකද, රුපියල් ලක්ෂයක වටිනාකමකින් යුත් part එකක් මාරු කරන්න හෝ මේ බලාගාරය වහන්න වුණාම දවස් 21ක් වහලා තබන්න ඕනෑ." යි කියලා. මම හිතනවා, ඔබතුමන්ලා ඒ ගැන හොඳට බලලා ඇති; engineering studies කරනවා ඇති; අවශ්‍ය විධියට technical plan එක හදලා ඇති කියලා. අනෙක් කරුණ තමයි එයින් යම් කිසි පුද්ගලයන් ප්‍රමාණයක් අවතැන් වනවා නම් අපි බලාපොරොත්තු වනවා, ඔබතුමන්ලා ඒ දේ හරි විධියට සාධාරණ විධියට කරයි කියලා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, තව කරුණක් කියන්න ඕනෑ. ෂැන්ග්‍රි-ලා කොම්පැනියටත් මේ වාගේම ගැසට් එකක් ඉදිරිපත් කළා. ඇත්ත වශයෙන්ම ආණ්ඩුව හොඳ දේවල් කරන කොට හොඳයි කියන්නත් අපට හැකියාවක් තිබෙන්න ඕනෑ. මෙහි යම්කිසි විනිවිදභාවයක් තිබෙනවා. මේ ගැසට් එක පළ කරලා තිබෙනවා. ඒක හොඳයි. එතකොට අපේ ජනතාව දැන ගන්නවා; රට දැන ගන්නවා, මොනවාද අපි මේ කරන්නේ කියලා. එතැනදී කියන්න ඕනෑ, ෂැන්ග්‍රි-ලා ආයතනයට බදු දීම සම්බන්ධව තිබෙන මේ ගැසට් එකේ සඳහන්ව තිබෙනවා, මාස 42ක් ඇතුළත වාණිජමය ක්‍රියාත්මකභාවයකට ඒ හෝටලය ගෙනෙන්න ඕනෑ කියලා. එතකොට 2011 ජනවාරි මාසයේ එය අත්සන් කළාම 2014 ජුනි මාසය වන කොට ෂැන්ග්‍රි-ලා හෝටලය commercial operation එකේ තිබෙන්න ඕනෑ. ඒ කියන්නේ එයට සංචාරකයෝ එන්න ඕනෑ; ඒවායේ swimming pools පාවිච්චි කරන්න ඕනෑ; ඒවායේ restaurants වැඩ කරන්න ඕනෑ. හැබැයි ගරු ඇමතිතුමා, ඊට පස්සේ ආණ්ඩුව මොකක්ද කළේ? ඌන ක්‍රියාකාරී ව්‍යවසායන් හෝ ඌන උපයෝජිත වත්කම් පුනරුදය කිරීමේ පනත ගෙනාවා.

ඌන ක්‍රියාකාරී ව්‍යවසායන් හෝ ඌන උපයෝජිත වත්කම් පුනරුදය කිරීමේ පනත ගෙනැවිත් කිව්වා, ආණ්ඩුවෙන් මොන යම් ක්‍රමයකට හෝ - leasehold හෝ freehold ක්‍රමයට - ඉඩමක් අරගෙන තිබෙනවා නම්, ඒ ඉඩම ඌන උපයෝජනය වෙලා තිබෙනවා නම්, underutilized වෙලා තිබෙනවා නම් ඒක රජයට පවරා ගන්න හැකියාවක් තිබෙනවාය කියලා. මා මෙතැනදී මතක් කරලා දෙන්න ඕනෑ, 2014 ජුනි මාසය වන කොට මේ හෝටලයේ commercial operation එකක් තිබුණේ නැත්නම් ඔබතුමන්ලාගේම නීතියෙන් ඒ ෂැන්ග්‍රි-ලා හෝටලය නැවත රජයට පවරා ගන්න සිද්ධ වනවාය කියන එක. එම නිසා අපි බලාපොරොත්තු වනවා, ඒ දේ සිද්ධ නොවී 2014 ජුනි මාසය වන විට මේ කටයුත්ත ක්‍රියාත්මක වෙයි කියලා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ රටට අවශ්‍ය වන්නේ ආයෝජනයි. මා ඔබතුමාට පෙන්වන්නම්, මා දැන් පොඩ්ඩකට කලින් library එකට ගිහින් ගත්ත කොළඹ කොටස් වෙළෙඳ පොළේ මිල දර්ශකය. මේකෙන් අපට පෙනෙන්නේ ලංකාව කෙරෙහි ආයෝජකයන් තුළ තිබෙන විශ්වාසය බිඳ වැටෙමින් තිබෙනවාය කියන එකයි. මා ළඟ තිබෙන මේ ප්‍රස්තාරය බලන්න. මේ ප්‍රස්තාරය අනුව ඕනෑ කෙනකුට පෙනෙනවා, රුපියල් 7,500ට තිබුණු All Share Price Index එක අවුරුද්දක් ඇතුළත අද වන කොට රුපියල් 5,200 දක්වා අඩු වෙලා තිබෙන බව. අපි කල්පනා කරලා බලන්න ඕනෑ, අපට ආයෝජන අවශ්‍ය නම් මේ NTPC එක වාගේ, Shangri-la එක වාගේ, Sheraton එක වාගේ ආයෝජකයන් තුළ ලංකාව කෙරෙහි විශ්වාසය ගොඩ නඟන්න ඕනෑය කියන එක. ඒ විශ්වාසය ගොඩ නඟන්න නම් අපේ ආර්ථික කළමනාකරණයේ යහ පාලනයක් තිබෙන්න ඕනෑ; හොරකම් කරන ඒවා අඩු වන්න ඕනෑ.

මේ කොටස් වෙළෙඳ පොළ ගැන කථා කරන කොට මාෆියා එකේ කොන දැන් අපට අහු වෙලා තිබෙනවා. දැන් ආර්ථික ඝාතකයෝ දෙදෙනෙක්, තුන්දෙනෙක් මේ දවස්වල භූමිතෙල් ගහපු ගැරඬියන් වාගේ එහාට, මෙහාට දුවනවා මේ අහු වෙලා තිබෙන වැඩ කටයුත්තෙන් පැන ගන්න බැරිව. මොකක් ගැනද, මා මේ කථා කරන්නේ, ගරු නියෝජ්‍ය කථානායකතුමනි? ජාතික ඉතිරි කිරීමේ බැංකුවේ ප්‍රශ්නය පිළිබඳවයි. ඒ ගැන කථා කරන්න ඕනෑ. ඒ ගැන කථා කරන්න අවශ්‍යයි.

ඒ සියල්ලටම කලින් මා මේ කාරණය කියන්න ඕනෑ. එක්සත් ජාතික පක්ෂය හැටියට අපි ඉල්ලනවා, ජාතික ඉතිරි කිරීමේ බැංකුවේ - National Savings Bank එකේ- සභාපතිතුමා එක්කෝ ඉල්ලා අස් වෙන්න ඕනෑ, එහෙම නැත්නම් ආණ්ඩුවෙන් එතුමාව වහාම ඉවත් කරන්න ඕනෑය කියලා. ඒකට හේතුව මේකයි. බැංකුවේ අරමුණට පටහැනිව කවුරුන් හෝ අධ්‍යක්ෂ කෙනෙක් කටයුතු කර තිබෙනවා නම්, ඒ අධ්‍යක්ෂවරයා එතැන ඉන්න සුදුස්සෙක් නොවෙයි කියලා බැංකු පනතේ 42 (2) (d) වගන්තිය යටතේ සඳහන් වෙලා තිබෙනවා. ඊයේ පෙරේදා වනකොට අපි දන්නවා, "මේ ගනුදෙනුව නොකළ යුතුයි. මේ ගනුදෙනුව වැරදි ගනුදෙනුවක්" කියා ගරු ජනාධිපතිතුමා කියා තිබෙන බව. සමහර පත්‍රවල තිබෙනවා, "මේ ගනුදෙනුව අකුළා ගන්න"යි කියා ජනාධිපතිතුමා කිව්වා කියලා. එහෙම නම් අපි දන්නවා, මේ සභාපතිතුමා ජාතික ඉතිරි කිරීමේ බැංකුවේ අරමුණුවලට පටහැනිව මේ වැඩ කටයුත්ත ක්‍රියාත්මක කරලා තිබෙනවාය කියලා ජනාධිපතිතුමා පිළිගෙන තිබෙන බව. එහෙම නම් අපි ජනාධිපතිතුමාගෙන් ඉල්ලා සිටිනවා, ඒ කටයුත්ත ක්‍රියාත්මක කරලා එතුමාව වහාම එතැනින් අයින් කරන්න කියලා.

ඊළඟට මේ ගනුදෙනුව ගැන පොඩි පැහැදිලි කිරීමක් කරන්න අවශ්‍යයි. මෙතැන මොකක්ද වෙලා තිබෙන්නේ? The Finance Company කියන ආයතනයේ රුපියල් 30ට, රුපියල් 31ට තිබුණු කොටස් ජාතික ඉතිරි කිරීමේ බැංකුව අප්‍රේල් මාසයේ 27 වන දා රුපියල් 49.74 බැගින් මිල දී ගෙන තිබෙනවා. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මා මේ පාර්ලිමේන්තුවේ නොයෙකුත් පින්තූර පෙන්වා උත්සාහ කරනවා වෙලා තිබෙන්නේ මොකක්ද කියලා පැහැදිලි කරන්න. දැන් මා ළඟ තිබෙන මේ ප්‍රස්තාරය බලන්න. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඔබතුමා පොඩ්ඩක් මේ ගැන අවධානය යොමු කරන්න. මෙහි තිබෙන්නේ ගිය අවුරුද්දේ ඔක්තෝබර් මාසයේ ඉඳලා The Finance Company එකේ කොටසක මිලයි. මේ බලන්න. ගිය අවුරුද්දේ සැප්තැම්බර් මාසයේ රුපියල් 45ට තිබුණු කොටසක මිල එන්නඑන්න පහළට එනවා; දිගටම පහළට එනවා. පහළට ඇවිල්ලා අප්‍රේල් මාසයේ 27 වන දා රුපියල් 30ට settle වනවා. අවසානයට මෙතැන තිබෙන්නේ රුපියල් 44යි. එතකොට ජාතික ඉතිරි කිරීමේ බැංකුව මොකද කරන්නේ? මේ chart එකෙන් එළියට ගිහිල්ලා, එදාට කලින් දවසේ රුපියල් 30ට තිබුණු කොටස රුපියල් 49.75 ගණනේ මිල දී ගන්නවා. එතැනින් නවතින්නේ නැහැ.

ඊට පස්සේ ඒ කොටසට මොකද වන්නේ කියලා බලන්න. කොටස කඩා ගෙන වැටෙනවා. දැන් පොඩ්ඩකට කලින් මා කොටස් වෙළෙඳ පොළේ website එකෙන් ලබා ගත්තා, The Finance Company එකේ කොටසක මිල කීයද කියලා. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මා ඉතාමත් වග කීමෙනුයි මේ කියන්නේ. රුපියල් 30ට තිබුණු කොටස ජාතික ඉතිරි කිරීමේ බැංකුව අප්‍රේල් මාසයේ 27 වන දා රුපියල් 50ට මිල දී ගත්තා. අද වන කොට ඒ කොටසක මිල රුපියල් 28.90යි. පාඩුව කෝටි 15කට වැඩියි. මේවා ඔක්කෝම මම **සභාගත*** කරනවා ගරු නියෝජ්‍ය කථානායකතුමනි.

එහෙම නම් අද බලන්න ඕනෑ කොහොමද මේ වැඩේ වුණේ කියලා. මේ දේ කරන්න කියලා කවුද කිව්වේ? මේ නියෝග කවුද දුන්නේ? Investment committeesවලින් ඒ වාර්තා ලබා ගත්තාද? ඒ තීරණය ගත්තේ කවුද? සභාපතිතුමාද? අධ්‍යක්ෂවරුන්ද? එහෙමත් නැත්නම් වෙන කවුරු හරිද?

---

**** පුස්තකාලයේ තබා ඇත.***
** நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, සුමනදාස අබේගුණවර්ධන කියලා ජ්‍යෝතිශ්ශාස්ත්‍රය කරන පුද්ගලයෙක් ඉන්නවා. ඔබතුමා සමහර විට දන්නවා ඇති. මම හොයලා බැලුවාම, එතුමා ජාතික ඉතිරි කිරීමේ බැංකුවේ Working Director කෙනෙක් හැටියට පත් කරලා ඉන්නවා. සාමාන්‍යයෙන් අද කාලයේ බැංකුවල Working Directorsලා නැහැ. ඒ කාලයේ හිටියා. නමුත් දැන් කාලයේ නව ක්‍රමවේදයට අනුව Working Directorsලා නැහැ. නමුත් එතුමා Working Director කෙනෙක්. එතුමාගේ SMS system එකක් තිබෙනවා, "My Astro" කියලා. SMS එකක් ගැහුවාම අද හැන්දෑවට දැන ගන්න පුළුවන්, හෙට වෙන කොට මොකද වෙන්නේ කියලා. එතුමා ජ්‍යෝතිශ්ශාස්ත්‍රය හොඳටම දන්නා කෙනෙක්. නමුත් එතුමා දැන ගත්තේ නැද්ද, මේ රුපියල් 50ට ගත්ත කොටස ඊළඟ දවස වන කොට -අද වන කොට- රුපියල් 28.90ට බහිනවා කියලා. මම කියන්නේ නැහැ, ඒ අයගේ ආයෝජන ගැන හිතලා බලන්න ජ්‍යෝතිශ්‍ය විද්‍යාඥයෝ බැංකුවල අධ්‍යක්ෂවරු හැටියට පත් කරන්න අවශ්‍යයි කියලා. නමුත් මම අහන්නේ, කවුද මේ ක්‍රියාවලියට සම්බන්ධ වුණේ; කවුද මේකට වග කියන්න ඕනෑ කියලායි.

දැන් ඉස්සෙල්ලාම බලන්න ඕනෑ, ජාතික ඉතිරි කිරීමේ බැංකුව කොටස් ගත්තේ මොන ආයතනයේද කියලා. මම කිව්වානේ, "ද ෆයිනෑන්ස්" ආයතනයේ කියලා. කරුණාකර මේ ගැන පැහැදිලි කිරීමක් කරන්නය කියලා අපි ගිය මාසයේ 29වැනි දා ඉඳලා ආණ්ඩුවට බල කරනවා; ජාතික ඉතිරි කිරීමේ බැංකුවට බල කරනවා. එහි සභාපතිතුමා තමයි ප්‍රදීප් කාරියවසම් කියන පුද්ගලයා.

***[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]***
*[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது]*
*[Expunged on the order of the Chair.]*

එතුමා කරපු කටයුත්තක් තමයි ගරු ජනාධිපතිතුමා කියලා තියෙන්නේ නවත්වන්නය කියලා. අපි බලාපොරොත්තු වෙනවා, අද හෙට වන කොටම මේ කටයුත්ත ගැන දීර්ඝ ලෙස, ගැඹුරුව හොයලා බලලා එතුමා කාගේ කවුරු වුණත් ඒ අවශ්‍ය නිසි පියවර ගනීවි කියලා. මොකක්ද මේක ගැන අපට තියෙන අමාරුව? සමහරු කියනවා, "ඔයගොල්ලන්ට මොකද? ඔයගොල්ලන් මේක අරගෙන දේශපාලනය කරන්න හදනවා. ඕනෑම බැංකුවක්, ඕනෑම කොටසක්, ඕනෑම මිලක් දීලා ගත්තා නම් ඔයගොල්ලන්ට තිබෙන අමාරුව මොකක්ද" කියලා. අපට තිබෙන අමාරුව මේකයි ගරු නියෝජ්‍ය කථානායකතුමනි. ලංකාවේ බැංකු දුසිම් ගණනක් තිබෙනවා. නමුත් එකම එක බැංකුවයි තියෙන්නේ, ඒ තැන්පත්කරුවන්ගේ අන්තිම තඹ සතය දක්වා ආණ්ඩුවෙන් සහතික කරන. National Savings Bank Act, No. 30 of 1971. - මේ පනතින් තමයි මේ බැංකුව පිහිටුවා තිබෙන්නේ.- එකේ 18වැනි වගන්තියේ තිබෙනවා, තැන්පත්කරුවන්ගේ සියලුම මුදල් ආණ්ඩුවේ සහතික කරනවා කියලා. ඒ නිසා මෙතැන මහජන - [බාධා කිරීමක්]

**ගරු අල්හාජ් ඒ.එච්.එම්. අස්වර් මහතා**
(மாண்புமிகு அல்ஹாஜ் ஏ.எச்.எம். அஸ்வர்)
(The Hon. Alhaj A.H.M. Azwer)
Sir, I rise to a point of Order.

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
What is the point of Order?

**ගරු අල්හාජ් ඒ.එච්.එම්. අස්වර් මහතා**
(மாண்புமிகு அல்ஹாஜ் ஏ.எச்.எம். அஸ்வர்)
(The Hon. Alhaj A.H.M. Azwer)
The Hon. Member is casting aspersions on the

***[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]***
*[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது]*
*[Expunged on the order of the Chair.]*

by drawing her name in and referring to her husband, which cannot be allowed. Sir, according to the Standing Orders, it must be expunged.

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
If there is anything contrary to the Standing Orders, such will be expunged.

**ගරු අල්හාජ් ඒ.එච්.එම්. අස්වර් මහතා**
(மாண்புமிகு அல்ஹாஜ் ஏ.எச்.எம். அஸ்வர்)
(The Hon. Alhaj A.H.M. Azwer)
Sir, there is a dignified way of speaking.

**ගරු ආචාර්ය හර්ෂ ද සිල්වා මහතා**
(மாண்புமிகு கலாநிதி ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha De Silva)
That is not a point of Order. I did not mention -

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
Hon. Member, you continue with your speech. You have only -

Finally, I agree absolutely that action must be taken to reverse, rectify and redress actions that have had adverse political, economic, social and cultural consequences for the Tamil people. But, this also includes the destructive actions of the LTTE and of those Tamil politicians who were in thrall to them and also the actions of those who hark back to terror and intimidation as a way of achieving political goals. I have often told the TNA leadership that their stance at the 2010 Presidential Election was not in the interests of the Tamil people, since it suggested that the Tamil people were secondary to a thirst for revenge. That may not have been the reason for their strange posturing, but they have I believe now recognized that in order to build up trust, politicians should refrain from resorting to vulgar stratagems.

As I have constantly said, anyone who tells us to look after the interests of the Tamil people is only telling us what we should be telling ourselves, for these are our people. But those who engage in posturing simply to weaken the Government are not helping the Tamil people, and I would urge them to rethink their strategies even while I hope our aims will remain the same, namely a prosperous, pluralistic, united Sri Lanka.

Thank you.

**නියෝජ්‍ය කාරක සභාපතිතුමා**
(குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(Mr. Deputy Chairman of Committees)
The next speaker is the Hon. (Ven.) Ellawala Medhananda Thero. You have five minutes.

[අ.භා. 4.37]

**ගරු (පූජ්‍ය) එල්ලාවල මේධානන්ද හිමි**
(மாண்புமிகு (வண.)எல்லாவல மேதானந்த தேரர்)
(The Hon. (Ven.) Ellawala Medhananda Thero)
ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, ද්‍රවිඩ ජාතික සන්ධානයේ ගරු මන්ත්‍රීතුමා ඉදිරිපත් කරපු යෝජනාවේ කියැවුණ කරුණු පිළිබඳව පිළිතුරු කථාවක් කරන්න මට ලැබී තිබෙන විනාඩි පහ කිසිසේත් ප්‍රමාණවත් නැහැ. එතුමා ඉදිරිපත් කරපු යෝජනාවේ ඉතාමත්ම සාවද්‍ය, වැරදි චෝදනා කීපයක් අඩංගු වුණා. සිංහල ජනතාව මේ අයගේ නිජබිම ආක්‍රමණය කරන බව, ඒ භූමියේ කෝවිල් නැති කරලා බෞද්ධ වෙහෙර විහාර හදන බව, උතුරු හා නැඟෙනහිර ප්‍රදේශ තමන්ගේ නිජබිමක්ය කියලා ප්‍රකාශ කිරීම කියන මේ කරුණු තුනම කිසිදු ශාස්ත්‍රීය පදනමක් මත ඔප්පු කරන්නට බැරි සම්පූර්ණ අසත්‍ය කරුණු තුනක් හැටියට මම පැහැදිලිවම ප්‍රකාශ කරනවා.

දෙමළ ජාතික සන්ධානයේ ගරු මන්ත්‍රීතුමන්ලාට මම අභියෝග කරනවා, උතුරු පළාතේ හෝ නැඟෙනහිර පළාතේ හෝ එක කෝවිලක් කඩලා හදලා තිබෙන එක පන්සලක් ගැන මට කෙළින් කියන්න කියලා. නමුත් අපට කියන්න පුළුවන් - [බාධා කිරීමක්] නැහැ, සම්පූර්ණ වැරදියි. [බාධා කිරීම්] ඒ තිබුණු පන්සල්. අද උතුරු නැඟෙනහිර පළාත්වල පදිංචි වී සිටි සිංහල

ජනතාවට කිසිදු තැනක් ලැබිලා නැහැ. පන්සල් නැවත හරිගස්සලා තිබෙන්නේ පැරණි තිබුණු පන්සල් භූමිවලමයි. මම නිදර්ශනයක් කියන්නම්. කොටි සංවිධානය එරාවූර්වල පන්සල සම්පූර්ණයෙන්ම කුඩුපට්ටම් කළා. මේ පන්සල හැදුවේ කවුද? මේ පන්සල හැදුවේ එරාවූර්වල හිටිය සිංහල, දෙමළ සහ මුස්ලිම් කියන ත්‍රිවිධ ජනතාව එකතු වෙලා. අපේ ගරු විනායගමූර්ති මුරලිදරන් නියෝජ්‍ය ඇමතිතුමාත්, මමත්, මුස්ලිම් මන්ත්‍රීතුමාත් ගිහිල්ලා තමයි ඒ පන්සල විවෘත කළේ. ද්‍රවිඩ ජනතාව තමයි බුදු පිළිම වහන්සේලා හිස මත තබා ගෙන ඒ පන්සලට වැඩමෙව්වේ. ඇයි මේ විධියට බොරු කියන්නේ? ඒ පැරණි පන්සල. ඒ පැරණි පන්සලේ තිබුණු, කඩා කුඩුපට්ටම් කරපු බුදු පිළිම කැබලි තවමත් එතැන තිබෙනවා.

අපට කියන්න පුළුවන්, අපේ බෞද්ධ සිද්ධස්ථාන මත මොන තරම් කෝවිල් හදලා තිබෙනවාද කියලා. අපි ඒකට විරුද්ධ නැහැ. අපි ඒවා කඩන්න ගියේ නැහැ. වවුනිකුලම් කෝවිල හදලා තිබෙන්නේ බෞද්ධ සිද්ධස්ථානයක් මත. කනගරායන්කුලම් කෝවිල හදලා තිබෙන්නේ බෞද්ධ සිද්ධස්ථානයක් මත. තිරුකේතීශ්වරම් කෝවිල හදලා තිබෙන්නේ බෞද්ධ සිද්ධස්ථානයක් මත. කෝනේශ්වරම් කෝවිල හදලා තිබෙන්නේ බෞද්ධ සිද්ධස්ථානයක් මත. නමුත් ඒවා කඩන්න කියලා අපි කිසි කෙනකුට කියන්නේ නැහැ. මේ සිංහල, දෙමළ ජනතාව අතර තිබෙන සුහද සම්බන්ධතාව නැති කරන්නේ දේශපාලනය කරන තමුන්නාන්සේලායි. කෙළින්ම මම ඒක තමුන්නාන්සේලාට කියනවා.

ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කයේ නිලාවැලි කිට්ටුව තිබුණු බොරළුකන්ද කියන චෛත්‍ය හාරලා විනාශ කරපු අවස්ථාවේ ඒක පරීක්ෂා කරලා බලන්න අපි එතැනට ගියා. ඒ කන්ද පාමුල ද්‍රවිඩ පවුලක් ඉන්නවා. මේ ඡායාරූපය බලන්න. මේ කට්ටිය ඇවිත් මා එක්ක කථා කළා. මම මේ පවුලට -ඒ දරුවන්ට- ඇඳුම් පැළඳුම් ගන්න මුදල් දුන්නා. ගිහිල්ලා අහන්න. මම මේ ඡායාරූපය හැන්සාඩ්ගත කිරීම සඳහා **සභාගත*** කරනවා.

බලන්න, එදා අපි ඒ ගිය වෙලාවේදී මේ ද්‍රවිඩ පවුලත් සමඟ මොන තරම් සුහද මට්ටමකින් ඔවුන්ට උදව් කරන්න ඉදිරිපත් වුණාද කියලා. පන්සල් හදනවා කියලා ඇයි මේ චෝදනාව කරන්නේ? මේ බෞද්ධ සිද්ධස්ථානයක්. එතැනින් ගත්ත නිධාන පිළිබඳව මා ළඟ ඡායාරූප තිබෙනවා. නිලාවැලි පොලීසිය ඒ පුරාවස්තු භාර අරගෙන තිබෙනවා. මම ගියා කල්විලාන්වලට. එහි නැවත පදිංචි කරලා තිබෙන ද්‍රවිඩ ජනතාව ඇවිල්ලා අපිව වට කර ගත්තා. මොන තරම් සුහද මට්ටමෙන්ද එහෙම කටයුතු කරන්නේ? ඒ පුංචි ළමයින්ට මම රස කැවිලි දුන්නා; මුදලින් ආධාර කළා.

මෙවර මගේ විමධ්‍යගත මුදලින් යාපනයේ කෝවිලක් හදන්න මුදල් වෙන් කර තිබෙනවා. දේශපාලන වාසි සලකා ගෙන තමයි තමුන්නාන්සේලා මේ සිංහල, දෙමළ ජනතාව අතර භේද හදන්නේ. තිස් අවුරුද්දක යුද සාපයෙන් සිංහල ජනතාව විතරක් නොවෙයි ද්‍රවිඩ ජනතාවත් පීඩා වින්දා; මුස්ලිම් ජනතාවත් පීඩා වින්දා. ඒ ජනතාවගේ ජීවිත ගොඩ ගන්න අපේ ජනාධිපතිතුමා කටයුතු කරද්දී තමුන්නාන්සේලා තවදුරටත් ඒ ජනතාව අඳුරට ගෙනියන්න, විනාශයට ගෙනියන්න කටයුතු කරන්නේ ඇයි කියලා මම තමුන්නාන්සේලාගෙන් අහන්න කැමැතියි. කුරිකාට්ටුවාන්වල සිංහල ජනතාව කොච්චර හිටියාද? අද එක්කෙනෙක්වත් ඉන්නවාද කියන්න. ඒ සේරම පැන්නුවා. වරද කාගේද? [බාධා කිරීමක්] දඹුල්ලේ තිබෙන්නේ වෙනම ප්‍රශ්නයක්. ගරු මන්ත්‍රීතුමනි, ඒක වෙනම ප්‍රශ්නයක්. ඒක මේකට අදාළ කාරණයක් නොවෙයි. තමුන්නාන්සේලා මේ වෙලාවේ කළ යුතු වෙන්නේ ජාතිවාදයෙන්, ආගම්වාදයෙන් තොරව අපි කවුරුත් එකට එකතු වෙලා මේ රට හදාගන්න කටයුතු කරන එකයි. ඒ කාර්යයට ඉදිරිපත් වෙන්න කියලා මම තමුන්නාන්සේලාට ගෞරවයෙන් ආරාධනා කරනවා.

සිංහල ජනතාව ඒ ප්‍රදේශ ආක්‍රමණය කරනවාය කියන කතාව සම්පූර්ණ අසත්‍යයක්. උතුරු පළාතත්, නැඟෙනහිර පළාතත් තමුන්නාන්සේලාගේ නිජබිම කියලා ඔප්පු කිරීම සඳහා ඒ පළාත් දෙකෙන් එක නිදර්ශනයක් හෝ ඉදිරිපත් කරන්න කියලා මම කියනවා. තමුන්නාන්සේලාට පුළුවන්ද එහෙම ඉදිරිපත් කරන්න?

**නියෝජ්‍ය කාරක සභාපතිතුමා**
(குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(Mr. Deputy Chairman of Committees)
Please wind up.

**ගරු (පූජ්‍ය) එල්ලාවල මේධානන්ද හිමි**
(மாண்புமிகு (வண.)எல்லாவல மேதானந்த தேரர்)
(The Hon. (Ven.) Ellawala Medhananda Thero)
මෙය අපේත්, තමුන්නාන්සේලාගේත් රට. අපි කවුරුත් එකතු වෙලා මේ රට හදා ගන්න කටයුතු කරමු. ජාතිවාදය අවුස්සලා, ආගම්වාදය අවුස්සලා තමුන්නාන්සේලා දෙමළ ජනතාව තවත් වළ පල්ලට ගෙන යන්න එපා. සහෝදරයෝ වාගේ කටයුතු කරන්න අපි හැම වෙලාවේම සූදානම්. සාමාන්‍ය දෙමළ ජනතාව අපිත් එක්ක එකතු වෙලා කටයුතු කරන්න සූදානම්. තමුන්නාන්සේලා පවා නොගිය, යුද්ධය තිබුණු පළාත්වල මේ කාල පරිච්ඡේදය තුළ මම සැරිසරා තිබෙනවා. මම ඒ ප්‍රදේශවල ජනතාවගෙන් ඇහුවා, තමුන්නාන්සේලා ඒ ප්‍රදේශවලට ආවාද කියලා. තමුන්නාන්සේලා ඒ පැත්ත පළාතේවත් ආවේ නැහැ කියලා කිව්වා. නමුත් අපි ඒ පළාත්වලට ගිහින් තිබෙනවා. එහෙම ගිහින් තමයි අපි කටයුතු කරන්නේ. ඒ නිසා මේ අහිංසක දෙමළ ජනතාව නොමඟ යවලා ඒ අය තවත් වළ පල්ලට යවන්න කටයුතු කරන්න එපා කියමින්, ජනාධිපතිතුමාගේ මේ රට සංවර්ධනය කිරීමේ කාර්යයට සහයෝගය දක්වලා දෙමළ ජනතාව වැටී සිටින ප්‍රපාතයෙන් ගොඩ ගන්න කටයුතු කරන්න කියලා තමුන්නාන්සේලාගෙන් ඉල්ලමින් මගේ වචන ස්වල්පය අවසන් කරනවා.

[අ.භා. 4.45]

**ගරු විජිත හේරත් මහතා**
(மாண்புமிகு விஜித ஹேரத்)
(The Hon. Vijitha Herath)
ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, වසර ගණනාවක් තිස්සේ දිග්ගැස්සුණු යුද්ධයක් අවසන් කරලා හරියටම වසර තුනක් ගත වෙන මොහොතක තමයි අපි මේ ගත කරන්නේ. මේ ආණ්ඩුව, එදා යුද්ධය අවසන් වුණාට පස්සේ ඇති වෙච්ච අලුත් තත්ත්වය නිවැරදිව තේරුම් අරගෙන එයට මැදිහත් වුණේ නැහැ. ඒ නිසා තමයි අවුරුදු තුනකට පසුව මෙවැනි යෝජනාවක් මේ පාර්ලිමේන්තුවට එන්නේ. මෙවැනි යෝජනාවක් පිළිබඳව සාකච්ඡා කරන්න මේ පාර්ලිමේන්තුවේ ඉඩ වෙන් කරන්න වුණේ, ඒ අලුත් පරිච්ඡේදය තේරුම් අරගෙන සැබෑ ජාතික සංහිඳියාව ඇති කරන්න වර්තමාන ආණ්ඩුව ක්‍රියා නොකරපු නිසායි.

එදා, 2009 මැයි 19 වැනි දා යුද්ධය අවසන් වුණාට පස්සේ අපේ රටේ ජනතාව තුළ ආකල්පමය වෙනසක් ඇති වුණා. ඒ වෙනස තීරණාත්මක ලෙස වර්ධනය කිරීමේ ප්‍රධාන වගකීම මේ ආණ්ඩුව මත පැටවුණා. නමුත් ආණ්ඩුව එය ඉටු කළේ නැහැ. මැයි මාසයේ 19 වැනි දා යුද්ධය අවසන් වුණාට පස්සේ, හරියටම ඊට දවස් හතක් ගියාට පස්සේ, මැයි මාසයේ 27 වැනි දා ජනතා විමුක්ති පෙරමුණේ අපි ආණ්ඩුවටත්, රටේ ජනතාවටත්,

---

**** පුස්තකාලයේ තබා ඇත.***
** நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

[ගරු විජිත හේරත් මහතා]

විශේෂයෙන්ම ජනාධිපතිතුමාටත් යෝජනා මාලාවක් ඉදිරිපත් කළා. ඒකෙන් අපි ඉතා පැහැදිලිව කිව්වා, "අවතැන් කඳවුරුවල ඉන්න ජනතාවගේ ප්‍රශ්නය රටේ ප්‍රධාන ජාතික ප්‍රශ්නය ලෙස සලකා, පුමුඛතම ප්‍රශ්නය ලෙස සලකා එයට වහාම මැදිහත් වෙන්න" කියලා. "තුන් මාසයක් ඇතුළත අවතැන් කඳවුරුවල ඉන්න ජනතාවගේ නම් ලැයිස්තු සකස් කරන්න, හය මාසයක් ඇතුළත ඒ අය නැවත පදිංචි කිරීම සඳහා අවශ්‍ය කඩිනම් ක්‍රියාමාර්ගවලට යන්න" කියලා අපි කිව්වා. මේ පාර්ලිමේන්තුව නියෝජනය කරන සියලු දේශපාලන පක්ෂවල නියෝජිතයන්ගෙන් සමන්විත කාර්ය සාධන බලකායක් වහාම පිහිටුවන්න කිව්වා. දකුණේ ජනතාව, බස්නාහිර ජනතාව ස්වේච්ඡාවෙන් යන්න කැමැතියි උතුරට. එහෙම ගිහින් ඒ විනාශ වෙච්ච උතුරු සහ නැඟෙනහිර පළාත ගොඩ ගන්න සූදානමින් ඉන්නවාය කියන පණිවුඩය අපි එදා දුන්නා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, ඒ වාගේම අපි පැහැදිලිව කිව්වා, ඒ යුද්ධය නිසා සිත් තැවුල් ඇති වෙච්ච, සිත් බිඳීම් ඇති වෙච්ච ඒ සියලු ජනතාව යථා තත්ත්වයට පත් කිරීම සඳහා ජාතික සමගිය ගොඩ නැඟීමේ අර්ථයෙන්, සත්‍ය හා ප්‍රතිසන්ධාන කොමිසමක් වහාම පිහිටුවන්න කියලා. Truth and Reconciliation Commission එකක් පිහිටුවන්න කියලා යුද්ධය අවසන් වෙලා දවස් හතක් ගියාට පස්සේ, 2009 මැයි මාසයේ 27 වන දා අපි ඉතා පැහැදිලිව කිව්වා. නමුත් මේ ආණ්ඩුව ඒවා කිසි ආකාරයකට ගණන් ගත්තේ නැහැ. පසු කාලයේ මොකක්ද වුණේ?

ඇමෙරිකාවේ කොංග්‍රස් මණ්ඩලයේ මන්ත්‍රීවරු 38 දෙනෙක් යෝජනාවක් අත්සන් කරලා භාර දුන්නාට පස්සේ, හිලරි ක්ලින්ටන් ලංකාවේ ඇමෙරිකානු තානාපති හරහා ආණ්ඩුවට කිව්වාට පස්සේ තමයි ඔය LLRC කොමිසම පිහිටෙව්වේ. ඒක තමයි වෙච්ච දේ. මොකක්ද ඒකෙන් වුණේ? ඒකෙන් ඇමෙරිකාවට, ඉන්දියාවට මේ රටට මැදිහත් වන්න අවශ්‍ය පාර විවෘත කළා.

අද බලන්න, තත්ත්වය. යුද්ධය ඉවර වෙලා අවුරුදු තුනක් ගත වුණාට පස්සේ ඉන්දියානු විපක්ෂ නායිකාව ලංකාවට ඇවිල්ලා අවතැන් කඳවුරුවලට ගියා. අවතැන් කඳවුරුවලට ගිහින් බලලා, නිරීක්ෂණය කරලා අවසානයේදී මාධ්‍ය සාකච්ඡාවක් තියලා මොකක්ද කිව්වේ? හමුදාව උතුරේ සිවිල් ජන ජීවිතයට ඇඟිලි ගහනවා, බාධා කරනවා, වහාම ඒක නතර කරන්න කිව්වා. යුරෝපා සංගමයේ නියෝජිතවරිය ලංකාවට ඇවිල්ලා, රටින් පිටත් වුණාට පස්සේ මොකක්ද කිව්වේ? ඒ උතුරු සහ නැඟෙනහිර පළාත්වල ජනතාවගේ ඉඩම් අයිතිය වහාම ඔවුන්ට ලබා දෙන්න, ඒ අය නැවත පදිංචි කිරීම කඩිනමින් කරන්න, මේ වන විට අත් අඩංගුවේ ඉන්න ඒ සැකකරුවන් වහාම නිදහස් කරන්න කියන එක තමයි කිව්වේ.

ඒ තැනට යුරෝපා සංගමයේ නියෝජිතවරියට ප්‍රකාශ නිකුත් කරන්න කවුද පාර හැදුවේ? වර්තමාන ආණ්ඩුවයි ඒක කළේ. අඩුම ගණනේ යුද්ධය අවසන් වෙලා අවුරුදු තුනක් ගත වෙලාත් ඒ අත් අඩංගුවේ ඉන්න තරුණ පිරිසගේ නම් ලැයිස්තුවක් මේ පාර්ලිමේන්තුවට ඉදිරිපත් කර ගන්න බැරි වුණා. අපි පුන පුනා කිව්වා ඒවා වසන් කරන්න එපා, හංගන්න එපා, ඒ පවුලේ ඥාතීන්ට, දෙමව්පියන්ට ඒ අය ගැන දැන ගැනීමේ අයිතියත් තිබෙනවා කියලා. ඒ අයිතිය ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ තිබෙනවා; නීතියේ තිබෙනවා. එම නිසා ඒ අයිතිය පවුලේ සාමාජිකයන්ට ලබා දෙන්න කියලා අපි කිව්වා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, නමුත් ආණ්ඩුව අද වන තුරු ඒ සම්බන්ධයෙන් ක්‍රියා මාර්ගයක් ගත්තේ නැහැ. අද මොකක්ද මේ සිද්ධ වෙමින් තිබෙන්නේ? ජාතික සංහිඳියාව ඇති කිරීම නොවෙයි මේ සිද්ධ වෙමින් තිබෙන්නේ. පාලම් බෝක්කු හැදුවාට ජාතික සංහිඳියාව ඇති වන්නේ නැහැ. පාලම් බෝක්කුවලින් ජාතික සංහිඳියාව ගේන්න බැහැ. එහෙම හිතනවා නම් ඒක මෝඩකමක්. ඒ නිසා ඉතා පැහැදිලිව ඒ ජනතාවගේ ගරුත්වය ආරක්ෂා කරන්න. ඒ ගරුත්වය ආරක්ෂා නොකර පාලම් බෝක්කු හදලා පමණක් කවදාවත් ජාතික සංහිඳියාව හදන්න බැහැ.

යුද්ධය අවසන් කිරීම සඳහා හමුදාව, ඒ ආරක්ෂක අංශවල අය කරපු කැප කිරීම් පිළිබඳව අපේ ගෞරවය තිබෙනවා. ඒ අයගේ කැප කිරීම් නිසා අද බෙදුම්වාදී යුදධයක් අවසන් කර තිබෙනවා. හැබැයි ඒ නිසාම ආණ්ඩුවේ හමුදාව විසින් සිදු කරන සියලුම වැරදි අනුමත කරන්න යන්න එපා. ඒක වැරදියි.

මීට කලින් කථා කළ මන්ත්‍රීතුමෙක් කිව්වා, හමුදාව සමහර වැරදි කරන්නේ නැහැ කියලා. මම ඒ ගැන කනගාටු වෙනවා. එහෙම වැරදි කෙරෙන තැන්වලදී ආණ්ඩුවේ වග කීමක් තමයි ඒවා හරියට දැකලා, ඒ වැරදි කළ අයට දඬුවම් දීලා ඒවා නිවැරදි කරන එක. එහෙම නැත්නම් ජාතික සංහිඳියාව හදන්න බැහැ. වෙන ඈතක යන්න ඕනෑ නැහැ. ඊයේ හැන්දෑවේ - 08 වන දා - මුලතිව් විශ්වමඩු ප්‍රදේශයේ කුමාරස්වාමි පුරම් කියන ගම්මානයේ පදිංචි අවුරුදු 17ක් වයස එස්. ක්‍රිෂ්ණකුමාර් කියන තරුණයාට වෙඩි තිබ්බා. ඊයේ හවස! ඇයි ඒ වෙඩි තිබ්බේ? ඒ ආසන්නයේ හමුදාවේ සොල්දාදුවෝ හදපු වෙසක් කූඩු වගයක් තිබුණා. මේ තරුණයා හරක් රංචුවක් දක්කා ගෙන ගියා. ඒ හරක් අර වෙසක් කූඩුවක් කැඩුවා. හමුදාවෙන් හදපු වෙසක් කූඩුව තමයි හරක් අතින් කැඩිලා තිබෙන්නේ. එහෙම වුණාය කියලා ඒ ක්‍රිෂ්ණකුමාර් තරුණයාට ඊයේ හැන්දෑවේ වෙඩි තිබ්බා. වෙඩි තියලා පැය ගණනක් ගත වුණත්, ඔහුව රෝහල් ගත කෙළේ නැහැ. ගිලන් රථයක් නැහැ කියලා පැය ගණනක් බලා ගෙන හිටියා. Ambulance එකක් නැහැයි කියලා ඔහුව රෝහල් ගත කළේ නැහැ. පසුව හෙලිකොප්ටරයකින් අනුරාධපුර රෝහලට ගෙනාවා. දැන් අනුරාධපුර රෝහලේ ඉන්නවා. ඊයේ හවසයි එස්. ක්‍රිෂ්ණකුමාර් ගෙනාවේ. ඒ තරුණයා දක්කා ගෙන ගිය හරක් ඒ වෙසක් කූඩුවක් කැඩුවයි කියලා ඒ තරුණයාට වෙඩි තියලා තිබෙනවා.

දැන් මොකක්ද වෙලා තිබෙන්නේ? දැන් බලපෑම් කරලා ඒ තරුණයාට කියලා තිබෙනවා, මේ සිද්ධිය පිළිබඳව කිසිවකුටත් අනාවරණය කරන්න එපා කියලා. මේක කාටවත් කියන්න එපා කියලා තිබෙනවා. පවුලේ අයට විතරයි බලන්න දෙන්නේ. වෙන කාටවත් බලන්න දෙන්නෙත් නැහැ. වහාම පරීක්ෂණයක් කරන්න. මොකක්ද මේ සිද්ධිය? මේකෙන් කාටද අපකීර්තියක් එන්නේ? මේවා හංගන්න බැහැ. තමුන්නාන්සේලා හිතනවා නම් පවුලේ අයට විතරක් බලන්න දීලා මේක හංගන්න පුළුවන් කියලා ඒ යුගය අවසානයි. දැන් මේවා අනාවරණය වෙනවා. කොයි තරම් තහංචි, බාධක දැම්මත් විද්‍යුත් මාධ්‍ය, වෙනත් මාධ්‍ය ඒවා අනාවරණය කරනවා. ඊයේ හවස වෙච්ච ඒ සිද්ධිය හරහා මොකක්ද අපි ලබා දෙන ජාතික සංහිඳියාව? වෙසක් උත්සවය. වෙසක් කූඩුව. ඒ ආගම් ඇදහීමේ අයිතිය, නිදහස කාටත් තිබෙන්න ඕනෑ. ඒක පිළිබඳ බාධාවක් නැහැ. හැබැයි වෙසක් කූඩුවක් හරකෙක් කැඩුවයි කියලා තරුණයෙකුට වෙඩි තිබ්බා නම් එතැන බරපතළ වැරැද්දක් තිබෙනවා.

ඒ තරුණයාට වෙඩි තැබීමේ සිද්ධිය නිසා ඒ ප්‍රදේශයේ දෙමළ ජනතාව ජාතික සංහිඳියාවකට බලාපොරොත්තු තියා ගන්නවාද? ජාතික සමගියක් පිළිබඳ බලාපොරොත්තු ඇති කර ගන්නවාද? නැහැ. ඒ ප්‍රදේශයේ දෙමළ ජනතාව තුළ මතු වන්නේ වෛරය පමණයි. ඒ වෛරය, ක්‍රෝධය මේ වෙලාවේ යටපත් වෙලා තියෙයි, හමුදාමය බලය නිසා. හැබැයි හිතන්න එපා ඒක සදාකාලිකව යට වෙලා තියෙයි කියා.

මේ වැරැද්දම තමයි ඉතිහාසයේ කළේ. මේ වැරැද්දම තමයි 50 දශකයේ, 60 දශකයේ කළේ. එදා 50 දශකයේ සිංහල භාෂාව රාජ්‍ය භාෂාව කරපු වෙලාවේ ඒ දෙමළ ජනතාවගේ භාෂාව පිළිබඳව නොසලකා කටයුතු කරපු වෙලාවේ, තමන්ගේ ඡන්දය ගැන හිතලා, බලය ගැන හිතලා තීන්දු ගත්ත වෙලාවේ දුර දිග කල්පනා කළේ නැහැ. ඒවායේ ආදීනව, ඒවායේ ප්‍රතිඵල අපි දැක්කා. අවුරුදු තුනක් ගත වුණා. භාෂා ප්‍රතිපත්තිය ගැන කථා කළා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, ජනාධිපතිතුමා මේ අවුරුද්ද -2012- ආරම්භයේදීම ඉන්දියානු හිටපු ජනාධිපතිතුමා ආපු වෙලාවේ -අබ්දුල් කලාම් මැතිතුමා ආපු වෙලාවේ- මහා ප්‍රදර්ශන, උත්සව තියලා කිව්වා, 2012 වර්ෂය කියන්නේ ත්‍රෛභාෂා වර්ෂය කියලා. මම දැන ගන්න කැමැතියි, මේ ආණ්ඩුවේ ඇමතිතුමන්ලාගෙන් ත්‍රෛභාෂා වර්ෂය වෙනුවෙන් මොනවාද මේ ආණ්ඩුව මේ වන කල් කරලා තිබෙන්නේ කියලා. මේ ත්‍රෛභාෂා වර්ෂය ගැන කථා කරනවා. අවුරුදු තුනක් ගත වෙලා තිබෙනවා, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ භාෂා පිළිබඳව තිබෙන වගන්තිය -ඒ බරපතළ වැරැද්ද- නිවැරදි කරන්න තවම බැරි වුණා. ඒ වගන්තියේ "Tamil shall also be an official language" කියලා තිබෙනවා. "Also" කියන වචනය පාවිච්චි කරලා ඇති කරලා තිබෙන discrimination එක වෙනස් කරන්න බැරි වුණා, මේ ආණ්ඩුවට. එහෙම නම් කොහොමද ජාතික සංහිඳියාව ගෙනෙන්නේ? ඒ නිසා ඉතා බරපතළ-

**ගරු වාසුදේව නානායක්කාර මහතා (ජාතික භාෂා හා සමාජ ඒකාබද්ධතා අමාත්‍යතුමා)**
(மாண்புமிகு வாசுதேவ நாணாயக்கார - தேசிய மொழிகள், சமூக ஒருமைப்பாட்டு அமைச்சர்)
(The Hon. Vasudeva Nanayakkara - Minister of National Languages and Social Integration)
භාෂා තුනම රාජ්‍ය භාෂා බවට පත් කරලා තිබෙනවා.

**ගරු විජිත හේරත් මහතා**
(மாண்புமிகு விஜித ஹேரத்)
(The Hon. Vijitha Herath)
දැන් වෙනස් කරලාද තිබෙන්නේ?

**ගරු වාසුදේව නානායක්කාර මහතා**
(மாண்புமிகு வாசுதேவ நாணாயக்கார)
(The Hon. Vasudeva Nanayakkara)
දහතුන්වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය යටතේ- [බාධා කිරීමක්] ඒක ප්‍රකාශයට පත් කරලා තිබෙනවා.

**ගරු විජිත හේරත් මහතා**
(மாண்புமிகு விஜித ஹேரத்)
(The Hon. Vijitha Herath)
කොහේද තිබෙන්නේ?

**ගරු වාසුදේව නානායක්කාර මහතා**
(மாண்புமிகு வாசுதேவ நாணாயக்கார)
(The Hon. Vasudeva Nanayakkara)
දහතුන්වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයේ.

**ගරු විජිත හේරත් මහතා**
(மாண்புமிகு விஜித ஹேரத்)
(The Hon. Vijitha Herath)
No. The word, "also" is there.

**ගරු වාසුදේව නානායක්කාර මහතා**
(மாண்புமிகு வாசுதேவ நாணாயக்கார)
(The Hon. Vasudeva Nanayakkara)
බලන්න කෝ. ඔබතුමා කථා කරන්නේ-You are making the point about the reasonable use of Tamil. I am referring to the Thirteenth Amendment.

**ගරු විජිත හේරත් මහතා**
(மாண்புமிகு விஜித ஹேரத்)
(The Hon. Vijitha Herath)
ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, ඉන්දියාවේ සුෂ්මා ස්වරාජ්ට ඒ අවතැන් කඳවුරු බලන්න යන්න දෙනවා. හැබැයි ශ්‍රී ලංකාවේ ඡන්දයෙන් පත් වෙච්ච මන්ත්‍රීවරුන්ට බලන්න යන්න දුන්නේ නැහැ. අද වෙන කල් කිසිදු මන්ත්‍රීවරයකුට බලන්න දුන්නේ නැහැ. බලන්න ගිය මන්ත්‍රීවරුන්ට ආරක්ෂක අංශයෙන් බාධා කළා. ඒකයි තත්ත්වය. හැබැයි සුෂ්මා ස්වරාජ් ආපු වෙලාවේ ඒ අවතැන් කඳවුරු බලන්න දුන්නා. ලංකාවේ ඡන්දයෙන් බලයට පත් වෙච්ච පාර්ලිමේන්තුව නියෝජනය කරන මන්ත්‍රීවරුන්ට බලන්න යන්න දෙන්නේ නැහැ.

**නියෝජ්‍ය කාරක සභාපතිතුමා**
(குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(Mr. Deputy Chairman of Committees)
Hon. Member, please wind up now. දැන් අවසන් කරන්න, ගරු මන්ත්‍රීතුමා.

**ගරු විජිත හේරත් මහතා**
(மாண்புமிகு விஜித ஹேரத்)
(The Hon. Vijitha Herath)
මෙවැනි දේවල් තුළින් ජාතික සංහිඳියාවක් හදන්න බැහැ. ඒ නිසා දැන්වත් මේ තත්ත්වය වෙනස් කරන්න වහාම මැදිහත් වෙන්න. ජාතික සංහිඳියාව කියන්නේ සිංහල, දෙමළ සහ මුස්ලිම් සියලු ජනතාවගේ අයිතීන් ආරක්ෂා කිරීමයි. ඒ තුළින් ඒ අයගේ dignity එක ආරක්ෂා කළොත් විතරයි ජාතික සංහිඳියාව ඇති කරන්න පුළුවන් වන්නේ. ඒක අවධාරණය කරමින් මම නතර වෙනවා.

**නියෝජ්‍ය කාරක සභාපතිතුමා**
(குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(Mr. Deputy Chairman of Committees)
Hon. (Dr.) (Mrs.) Sudharshini Fernandopulle, you have ten minutes.

[අ.භා. 4.56]

**ගරු (වෛද්‍ය) සුදර්ශිනී ප්‍රනාන්දුපුල්ලේ මහත්මිය**
(மாண்புமிகு (வைத்திய கலாநிதி) (திருமதி) சுதர்ஷினி பர்னாந்துபுள்ளே)
(The Hon. (Dr.) (Mrs.) Sudharshini Fernandopulle)
ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මම ඇත්තටම මේ විවාදයට සම්බන්ධ වන්නේ ඉතාමත්ම කනගාටුවෙන් යුතු හදවතකින්. මොකද උතුරු, නැගෙනහිර වසර 30ක් තිබිච්ච මේ ප්‍රශ්නය ගැන නිතර, නිතර පිල්වලට බෙදිලා විවාද කර ගැනීමෙන් අපට ලැබෙන ප්‍රතිඵලයක් නැහැ කියන එක තමයි මම නම් හිතන්නේ. මොකද අපි සුව වන තුවාලය නැවත පාරා ගැනීමකුයි කරන්නේ. ඒ නිසා ප්‍රතිසංධානගතවීමට තිබෙන ඉඩකඩ මේ නිසා අවම වෙයි කියලා මම හිතනවා.

මේ වෙලාවේ අපි සියලු දෙනාගේම යුතුකම වෙන්න ඕනෑ දෙමළ සහ සිංහල ජනතාවට ශ්‍රී ලාංකීය ජනතාව හැටියට ජීවත් වෙන්න පුළුවන් වාතාවරණයක් නිර්මාණය කිරීමයි. අපි පසු ගිය

[ගරු (වෛද්‍ය) සුදර්ශිනී ප්‍රනාන්දුපුල්ලේ මහත්මිය

ඉතිහාසයේ වුණු දේවල් කථා කරන්න කරන්න, එකිනෙකාට චෝදනා කරන්න කරන්න මේ තිබෙන අවස්ථාව බිඳිලා යනවා. ඒකෙන් විපතට, පීඩාවට පත් වෙන්නේ අහිංසක ජනතාවමයි. විශේෂයෙන් උතුරු -නැඟෙනහිර ඉන්න ජනතාවමයි කියන එකයි මම හිතන්නේ. විශේෂයෙන්ම ජාත්‍යන්තර මැදිහත් වීම් තුළදී අපට තිබෙන අවස්ථාවන් තවත් ඈත් වෙලා යනවා. ඒ නිසා දේශපාලනය කරන අය හැටියට, මහ ජනතාවගේ නියෝජිතයෝ හැටියට අපට යුතුකමක් තිබෙනවා. ඒ ඉතිහාසය පැත්තකට දාලා අපට මේ ලැබිලා තිබෙන අවස්ථාවෙන් ජනතාව වෙනුවෙන් යෝජනා ඉදිරිපත් කරලා, මෙය කරන්නේ කොහොමද කියන එක ගැන කථා කළොත් මීට වැඩිය සාර්ථක ප්‍රතිඵල නෙළා ගන්න පුළුවන් වෙයි කියා මම විශ්වාස කරනවා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, ඒ වාගේම මෙම යෝජනාවේදී අපේ ගරු මන්ත්‍රීතුමා සඳහන් කරලා තිබෙනවා, යුද්ධයේ අවසන් අවස්ථාවලදී අදියර කිහිපයකදී දහස් ගණන් දෙමළ ජනතාව මරා දැමුණා කියලා. ඇත්තටම මම ඒ වාක්‍යයට කොහොමවත් එකඟ වෙන්නේ නැහැ. මොකද, හිතලා මතලා, ආණ්ඩුවක් හැටියට අහවලා දෙමළයි කියලා හිතලා කොයිම අවස්ථාවකවත් මේ දෙමළ ජනතාව මරුමුවට පත් කළේ නැහැ. එහෙම කථා කරනවා නම් අපට කථා කරන්නට පුළුවන් දෙපැත්තේම වෙච්ච අසාධාරණකම් ගැන. දෙපැත්තේම ජනතාවට හිරිහැර වුණා. මම ළඟ ලැයිස්තුවක් තිබෙනවා. මම ඒ ලැයිස්තුව ගැන කථා කරන්නේ නැහැ. අහිංසක ජනතාව -උතුරේ වේවා, දකුණේ වේවා- අවුරුදු 30ක් තිබුණු යුද්ධය නිසා ජීවිත අහිමි කර ගත්තා. ඒ වේදනාව තිබෙන්නේ ඔවුන් නැති වෙච්ච පවුල්වල උදවියටයි. ජීවිතය තිබෙන තාක් කල් ඒ ජනතාවට ඒ වේදනාව තිබෙනවා.

අද උතුරේ වැන්දඹු ජනතාව කොපමණ ඉන්නවාද? ඒ ආකාරයට වැන්දඹු භාවයට පත් වීමේ ඉඩකඩ අද සම්පූර්ණයෙන්ම නැති වෙලා තිබෙනවා. දෙමවුපියන් අහිමි වුණු දරුවෝ විශාල වශයෙන් හිටියා. ඒ දෙමවුපියන් අහිමි වෙයි කියන තර්ජනය අද සම්පූර්ණයෙන් නැති වෙලා තිබෙනවා. ඒ වාගේම දරුවන්ට ඉස්කෝලයට යන්න බැරිව, අධ්‍යාපනය ලබා ගන්න තිබුණු අවස්ථා සම්පූර්ණයෙන්ම ඇහිරිලා තිබුණා. අවුරුදු දොළහේ, දහතුනේ දරුවන්ට තුවක්කු දීලා යුද්ධයට යවලා ඔවුන්ගේ අනාගතය අඳුරු කළ ඒ අතීතය අමතක කරලා අද ඒ දරුවෝ සැනසීමෙන් ජීවත් වෙනවා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මේ අවස්ථාවේදී මම කියන්න ඕනෑ කාරණයක් තිබෙනවා. ඒ යුද්ධය අවසන් වෙන අවසාන අවස්ථාවල යම් යම් ජීවිත අහිමි වුණා. ඒවා ලංකාවේ යුද්ධයට පමණක් සීමා වුණු දේවල් නොවෙයි. අද ඇෆ්ඝනිස්ථානයට ගිහින් ඇමෙරිකාව යුද්ධ කරන විට, බෝම්බ දාන විට අහිංසක ජීවිත විශාල වශයෙන් විනාශ වුණා. අපි කනගාටු වෙනවා. අපි කියන්නේ නැහැ ඒවා හරියි කියලා. උතුරේ විනාශ වුණත්, දකුණේ විනාශ වුණත්, ඇෆ්ඝනිස්ථානයේ විනාශ වුණත්, ඇමෙරිකාවේ විනාශ වුණත් ඒවා ජීවිත. ඒ නිසා අපි ඒ ගැන කනගාටු වෙනවා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, ඒ වාගේම කියන්නට ඕනෑ කාරණයක් තිබෙනවා. ඒ මානුෂීය මෙහෙයුමේ අවසාන අවස්ථාවේදී අහිංසක ජනතාව අතරට ත්‍රස්තවාදීන් ආවා. ත්‍රස්තවාදියා තුවක්කුව අයින් කළාම සාමාන්‍ය පුරවැසියෙක් වෙනවා. ඔහු නැවත තුවක්කුව ගත්තාම තමයි ත්‍රස්තවාදියෙක් වෙන්නේ. අහිංසක සිවිල් ජනතාව මිනිස් පලිහක් හැටියට පාවිච්චි කිරීම නිසා යම් යම් පීඩාකාරී තත්ත්වයන් ඇති වුණා. ඒ අවස්ථාවට මුහුණ දීපු කාන්තාවක් මට කර්තර් දේවස්ථානයට ගිය වෙලාවකදී හමු වුණා. ඇය මට පවසා සිටියා, අවසන් අවස්ථාවේදී ඔවුන් ආරක්ෂාව පතා මඩු කඳවුරට ගිය වෙලාවේ ත්‍රස්තවාදීන් ඔවුන්ව මුලතිවු ප්‍රදේශයට රැගෙන ගිහින් හිර කර ගෙන සිටි බව; -ඔවුන්ට දවසකට එක වේලයි ආහාර ලබා දීලා තිබෙන්නේ- ඔවුන්ට නිදහස් වෙලා යන්න දුන්නේ නැති බව. ඒ නිදහස් වෙලා යන අයට වෙඩි තබා තිබෙනවා. ඒ කළපුව රතු පාට වුණාය කියලා ඒ කාන්තාව මට කිව්වා. ඒ අතීතය ගැන කථා කළොත් අපි සියලු දෙනාටම වේදනාකාරී හැඟීම්, අත් දැකීම් තිබෙනවා. ඒ නිසා අනාගතයේදී මේ දෙමළ ජනතාව වෙනුවෙන් සාධාරණයක් ඉෂ්ට කරන්නේ කොහොමද කියන එක අපි සියලු දෙනාම එකතු වෙලා කල්පනා කළොත් මීට වැඩිය ඵලදායී වැඩක් කරන්න පුළුවන් කියලා මම හිතනවා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, ඒ වාගේම ඒ අවස්ථාවේදී අවතැන් වෙච්ච ජනතාවට මේ රජය සලකපු ආකාරය අපි දැක්කා. මාත් ඒකේ පාර්ශ්වකාරයෙක්. දකුණේ ඉඳලා බස් යවලා ඒ අහිංසක ජනතාව මුදවා ගෙන වවුනියාවේ අවතැන් කඳවුරුවලට ගෙනැල්ලා ඒ ජනතාවට ඉන්න හිටින්න නවාතැන් පහසුකම් සලසා දුන්නා; -යම් යම් අඩුපාඩු වෙන්න ඇති- ජලය, සනීපාරක්ෂක පහසුකම් සලසා දුන්නා. ඒ වාගේම ඔවුන් සඳහා සෞඛ්‍ය පහසුකම් වාගේ දේවල් අඛණ්ඩව ලබා දීමට රජය කටයුතු කළා. ප්‍රසූතිකාගාර ඇති කරලා, ඒ අවට තිබෙන රෝහල් සවි බල ගන්වලා, වෛද්‍යවරු සහ වැඩිපුර කාර්ය මණ්ඩල යොදවලා ඒ ජනතාව වෙනුවෙන්, දරුවන් වෙනුවෙන්, අම්මලා වෙනුවෙන් මේ රජය විශාල සේවාවක් කළා. ඒ කඳවුරුවලට එන කොට සියයට 37ක් පමණ දරුවෝ හිටියේ දවස් දෙක තුනක් ආහාර ගන්නේ නැතිව මන්ද පෝෂණ තත්ත්වයෙන්; moderate and severe wasting. ඒ සියයට 37ක් වූ එම සංඛ්‍යාව මාස 6ක් වාගේ ඇතුළතදී සියයට 14ට වඩා අඩු තත්ත්වයකට ගෙනෙන්නට රජයට හැකියාව ලැබුණාය කියන එක මේ අවස්ථාවේ මා සන්තෝෂයෙන් මතක් කරන්න ඕනෑ. ඒ වාගේ විශිෂ්ට සේවාවක් වුණා.

අද බලන්න, සියයට 90කට වඩා නැවත පදිංචි කිරීම් කරලා තියෙනවා. එදා කිලිනොච්චි රෝහල සම්පූර්ණයෙන්ම ත්‍රස්තවාදීන්ගේ ග්‍රහණය යටතේයි තිබුණේ. දැන් ඒ රෝහල නැවත යථාවත් කරලා ජනතා අයිතියට පවරලා තියෙනවා. එදා යටිතල පහසුකම් සම්පූර්ණයෙන්ම විනාශ වෙලා තිබුණා. අද යටිතල පහසුකම් සංවර්ධනය වෙලා තියෙනවා. විශේෂයෙන්ම සෞඛ්‍ය පහසුකම් ඇති කරලා, රෝහල් ඇති කරලා, ග්‍රාමෝදය health centres ඇති කරලා බිඳිලා තිබ්බ සෞඛ්‍ය සේවාව නැවත යථාවත් කරන්න රජය කටයුතු කරලා තියෙනවා. ඒ වාගේම තමයි මිනිස් සම්පත. එදා උතුරු නැඟෙනහිරට වෛද්‍යවරු යවා ගන්න බැරි වුණා.

මට මතකයි, සෞඛ්‍ය අධ්‍යක්ෂ ජනරාල්තුමා කිව්වා, යාපනය විශ්වවිද්‍යාලයෙන් pass out වන ද්‍රවිඩ වෛද්‍යවරුන්ට ස්වේච්ඡාවෙන්ම එහි යන්න කියලා. නමුත් ඒ කිසි කෙනෙක් ස්වේච්ඡාවෙන් ඉදිරිපත් වුණේ නැහැ. නමුත් අද වන කොට ඒ මිනිස් සම්පත -වෛද්‍යවරු වේවා, හෙදියන් වේවා, radiographers වාගේ අවශ්‍ය සියලුම cadres- යාපන දිස්ත්‍රික්කයේ රෝහල්වලට -මන්නාරමට, කිලිනොච්චියට, මුලතිව්වලට- යවලා තියෙනවා. එයින් බහුතරයක් ඉන්නේ සිංහල අය. මෙය හිතාමතා කරන දෙයක් නොවෙයි. නමුත් මේ ජනතාවට සේවය ලබා දීමට අවශ්‍ය කරන මිනිස් සම්පත අද යවලා තියෙනවා. ඉස්සර සෞඛ්‍ය වෛද්‍ය නිලධාරි කාර්යාල තිබුණේ නැහැ. අද සෞඛ්‍ය වෛද්‍ය නිලධාරි කාර්යාල ස්ථාපිත කරලා, සෞඛ්‍ය මධ්‍යස්ථාන ස්ථාපිත කරලා ජනතාවට සාමාන්‍ය විධියට තමුන්ගේ කටයුතු කර ගන්න පුළුවන් වාතාවරණය ඇති කරලා තියෙනවා. ඒ වාගේම එදා අවතැන් වෙච්ච කඳවුරුවල හිටපු දරුවන්ට මනෝ සමාජයීය රැකවරණය ලබා දෙන්නටත්, ඔවුන්ට ඒ තිබ්බ කටුක අත් දැකීම්වලින් ඔවුන්ව මුදා ගෙන යථා තත්ත්වයට ගෙනෙන්න අවශ්‍ය ඒ තාවකාලික ළමා සංවර්ධන මධ්‍යස්ථාන ළමා හා කාන්තා කටයුතු අමාත්‍යාංශයෙන් ඉදි කළා. ඒ වාගේම ඔවුන්ගේ අධ්‍යාපනය කර ගෙන යන්න අවස්ථාව සලසන්න පාසල් ආරම්භ කරලා ඒවා විධිමත් කරන්න අද රජය පූර්ණ කැපවීමකින් කටයුතු කරනවා.

අවුරුදු 30ක් තිස්සේ විනාශ වෙච්ච යටිතල පහසුකම් සංවර්ධනය කිරීම සම්පූර්ණයෙන්ම ඇනහිටි ඒ දිස්ත්‍රික්කවල අවුරුදු තුනක් ඇතුළත ඒ සියලු දේවල්ම යථා තත්ත්වයට ඇවිල්ලා තියෙනවා. නීතිය වල් වැදිලා තිබුණ ඒ දිස්ත්‍රික්කවල සියයට සියයක් නැවත නීතිය ක්‍රියාත්මක වෙයි කියලා අපට අවුරුදු තුනකින් බලාපොරොත්තු වන්න බැහැ.

ඒ නිසා මම කියන්නේ මේක අපට හොඳම අවස්ථාවක් කියලායි. අප සියලු දෙනාම එකතු වෙලා කටයුතු කළ යුතුයි. අනිවාර්යයෙන්ම ඔවුන් අපේ ශ්‍රී ලාංකීය ජන කොටසක්. අතිගරු ජනාධිපතිතුමාගේ අවංක කැපවීම තියෙනවා, මේ ජනතාව සඳහා සාධාරණයක් ඉෂ්ට කරන්න. ඒ නිසා මේ හොඳම අවස්ථාවේ අප සියලු දෙනාම එකතු වුණොත් අපට ඒකීය ශ්‍රී ලංකාවක් තුළ ශ්‍රී ලාංකිකයෝ හැටියට ජීවත් වීමේ අයිතිය ඉක්මනින්ම උදා කර ගන්න පුළුවන් කියන බව මතක් කරමින් මගේ වචන ස්වල්පය අවසන් කරනවා.

**නියෝජ්‍ය කාරක සභාපතිතුමා**
(குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(Mr. Deputy Chairman of Committees)
The next speaker is Hon. Suresh Premachandran. You have 18 minutes.

[பி.ப. 5.05]

**ගරු සුරේෂ් ප්‍රේමචන්ද්‍රන් මහතා**
(மாண்புமிகு சுரேஷ் பிரேமச்சந்திரன்)
(The Hon. Suresh Premachandran)
கௌரவ குழுக்களின் பிரதித் தவிசாளர் அவர்களே, இன்று இச்சபையிலே வடக்கு,கிழக்கில் இடம்பெயர்ந்து வாழும் மக்களின் அவலங்கள் மற்றும் மீள்குடியேற்றம் தொடர்பாக நடைபெறும் ஒத்திவைப்புப் பிரேரணை மீதான விவாதத்திலே பல விடயங்கள் சொல்லப்பட்டிருக்கின்றன. நான் அவ்விவாதத்துக்குச் செல்வதற்கு முன்னர் கௌரவ உறுப்பினர் மேதானந்த தேரர் அவர்களுடைய கூற்றுக்குப் பதிலளிக்கலாம் என நினைக்கின்றேன். திரு.போல் பீரிஸ் என்னும் சிங்கள historian எழுதியுள்ள புத்தகத்திலே, விஜயன் இந்த நாட்டுக்கு வந்தபொழுது இந்த நாட்டிலே திருக்கேதீஸ்வரம், திருக்கோணேஸ்வரம், முன்னேஸ்வரம், நகுலேஸ்வரம், தொண்டீஸ்வரம் என்னும் ஐந்து ஈஸ்வரங்கள் இருந்ததாகக் குறிப்பிட்டிருக்கிறார். ஆனால், கௌரவ மேதானந்த தேரர் அவர்கள், இன்று இச்சபையிலே, இந்த ஈஸ்வரங்கள் இருக்கும் இடங்களிலே ஏற்கெனவே புத்த கோவில்கள் இருந்ததாகவும் அவை உடைத்துத் தகர்க்கப்பட்ட பின்னர் அவ்விடத்திலே இந்த இந்துக் கோவில்கள் கட்டப்பட்டுள்ளதாகவும் ஒரு புதுக்கதை சொன்னார். ஆகவே, அவர்களுடைய மகாவம் சத்தையும் திரு. போல் பீரிஸ் அவர்கள் எழுதிய history யையும் வாசித்தால் கௌரவ மேதானந்த தேரர் அவர்கள் உண்மை யான சரித்திரத்தைப் புரிந்துகொள்வாரென நினைக்கின்றேன்.

இன்று கிட்டத்தட்ட மூன்று இலட்சம் மக்களைத் தாங்கள் மீளக் குடியேற்றி விட்டதாக அரசாங்கம் சொல்லிக் கொண்டிருக்கிறது. அதாவது, முக்கியமாக வவுனியாவிலுள்ள செட்டிகுளம் -மெனிக்பாம், முகாமிலே ஏறக்குறைய 5,000 - 6,000 பேர்தான் இருக்கின்றார்கள். ஏனைய அனைவரும் குடியேற்றப்பட்டுவிட்டார்கள் என்று சொல்லப்படுகின்றது. ஆனால், உண்மையிலே வடக்கு, கிழக்கை எடுத்துப் பார்த்தால், யாழ்ப்பாணத்திலே பத்தாயிரம் குடும்பங்களைச் சேர்ந்த 41,000 பேர் தாங்கள் வலிகாமம் வடக்கு பிரதேச செயலாளரிடம் பதிவுசெய்துவிட்டு மீள்குடியேறுவதற்காகக் காத்திருப்பதாகத் தெரிகின்றது. இவர்கள் ஏறத்தாழ 25 வருட காலமாகத் தமது பிரதேசத்துக்குப் போவதற்காகக் காத்திருக்கின்றார்கள்.

ஆரம்பத்தில் பேசிய கௌரவ சம்பந்தன் அவர்கள், "திருகோணமலையிலுள்ள சம்பூர் பிரதேசத்தைச் சேர்ந்த ஐயாயிரத்துக்கும் மேற்பட்ட மக்கள் தமது காணிகளிலே மீள்குடியேறுவதற்காக ஏறத்தாழ ஆறு வருடங்களுக்கு மேலாகக் காத்திருக்கின்றார்கள்" எனக் குறிப்பிட்டார். அதேபோல், மன்னாரிலுள்ள முள்ளிக்குளத்தைச் சேர்ந்த மக்கள் தமது பிரதேசத்தில் குடியேறுவதற்காக கடந்த மூன்று வருடங்களுக்கு மேலாகக் காத்திருக்கின்றார்கள். முல்லைத்தீவிலுள்ள முள்ளிவாய்க்கால் பிரதேசத்தைச் சேர்ந்த மக்கள் அங்கு மீள்குடியேறுவதற்காக மூன்று வருடங்களுக்கு மேலாகக் காத்திருக்கின்றார்கள். ஆகவே, இங்கே மீள் குடியேற்றம் யாவும் முடிந்துவிட்டதாகச் சொல்லுவது உண்மைக்குப் பொருந்தாத விடயம். இவர்கள் வவுனியா விலுள்ள செட்டிகுளம் மெனிக்பாம் முகாமைக் காண்பித்து, அங்கு ஐயாயிரம் பேர் மாத்திரம்தான் மீள்குடியேறுவதற்காகக் காத்திருக்கின்றார்கள்; ஏனைய அனைவரும் மீள்குடியேற்றப் பட்டுவிட்டார்கள் என்று கூறி, ஒரு பொய்யான pictureஐ உருவாக்கப் பார்க்கின்றார்கள்.

இன்றைய தமிழ் பத்திரிகை ஒன்றில், "பலாலியில் ஒரு சிறு பகுதியைத் தவிர அதியுயர் பாதுகாப்பு வலயம் என்று ஒன்று இல்லை" என Defence Secretary அவர்கள் கூறியுள்ளதாகக் குறிப்பிடப்பட்டிருக்கிறது. அவர் குறிப்பிடுகின்ற அந்தச் சிறு பகுதிக்குள்தான் நாற்பத்தையாயிரம் பேர் குடியேற வேண்டியிருக்கிறது. அந்தச் சிறுபகுதி முள்ளுக்கம்பி வேலி போட்டு அடைக்கப்பட்டிருக்கிறது. முள்ளுக்கம்பி வேலிக்கு வெளியில் உள்ள மக்களுக்கு முள்ளுக்கம்பி வேலிக்குட்பட்ட பகுதிக்குள்ளே காணிகள் இருக்கின்றன. ஆனால், அவர்கள் அங்கே செல்ல முடியாது. இவ்வாறான ஒரு நிலைமை இன்று நடைமுறையில் காணப்படுகிறது. ஆனால், வலிகாமம் வடக்கில் மீள்குடியேற்றப்பட்டுள்ள மக்களில் எத்தனை பேர் இன்று நீங்கள் சொல்கின்ற தற்காலிக வீடுகள்கூட இல்லாத நிலையில் உள்ளனர் என்பது நிச்சயமாக கௌரவ அமைச்சர் டக்ளஸ் தேவானந்தா அவர்களுக்குத் தெரியும். கடந்த வாரம் நாங்கள் முல்லைத்தீவிலுள்ள கொக்கிளாய், கொக்குத் தொடுவாய், கருநாற்றுக்கேணி போன்ற இடங்களுக்குச் சென்றிருந்தோம். அப்பிரதேசத்தைச் சேர்ந்த மக்கள் மீள்குடி யேறுவதற்கென அங்கு அனுப்பப்பட்டு ஏறத்தாழ ஆறு மாதங்கள் கடந்துள்ளன. ஆனால், இன்றுவரையில் அவர்கள் வாழ்வதற்குத் தற்காலிக வீடுகள் எதுவும் கொடுக்கப் படவில்லை. ஆகவே, அவர்கள் எவ்வாறு அங்கு இருப்பது? கொக்கிளாய், கொக்குத்தொடுவாய் போன்ற பிரதேசங்களில் உள்ள கிணறுகள் சிறியவை. இப்பொழுது அவை இராணுவத்தினரால் மலசலகூட pit ஆகப் பயன்படுத்தப் படுகிறது. சில கிணறுகளுக்குள் குப்பை கொட்டி நிரப்பப் பட்டுள்ளது. அங்குள்ள மக்கள் இன்று தமது கிணறுகளைத் தேடிக் கண்டுபிடிக்க வேண்டியிருக்கின்றது. இவ்வாறான நிலைதான் அங்கு இருக்கின்றது.

கொக்கிளாய், கொக்குத்தொடுவாய், கருநாற்றுக்கேணி போன்ற பிரதேசங்களில் மீள்குடியேறிய மக்களுக்குச் சொந்தமான விவசாயக் காணிகள் முந்திரிக்குளம் என்று சொல்லப்படுகின்ற பகுதியில்தான் இருக்கின்றது. அது மணலாற்றுடன் சேர்ந்த ஒரு பகுதியாகும். அப்பகுதியிலுள்ள ஏறத்தாழ 7,000 ஏக்கர் நிலம் அந்த மக்களுக்கு உரித்தானது. இவர்கள் 1984களில் அம்மண்ணிலிருந்து விரட்டப்பட்டார்கள். அவர்கள் அங்கிருந்து வெளியேறியவுடன் என்ன நடந்தது என்றால், அவ்வளவு விவசாய நிலமும் சிங்கள மக்களால்

[ගරු සුරේෂ් ප්‍රේමචන්ද්‍රන් මහතා]

விவசாயம் செய்யப்பட்டு வருகிறது. சரி பரவாயில்லை. அங்கு தமிழ் மக்கள் இல்லை; ஆனபடியால், சிங்கள மக்கள் விவசாயம் செய்கிறார்கள். நல்ல விடயம்! இப்பொழுது அந்த மக்கள் தங்களுடைய சொந்த நிலங்களுக்குச் சென்றபின்னர் அந்த நிலங்களை அவர்களிடம் மீள ஒப்படைக்க முடியுமா? முடியாதா? என்பதுதான் அங்குள்ள பிரச்சினை! அங்கு சென்ற மக்களுக்கு விவசாயம் செய்வதற்கு நிலங்கள் எதுவும் இல்லையென்றால், நீங்கள் அவர்களை அங்கு மீளக் குடியமர்த்தியதில் எந்தப் பிரயோசனமும் இல்லை. அவர்கள் கூலிவேலை தேடி, வேறு இடங்களுக்குப் போகவேண்டிய நிலைதான் காணப்படுகின்றது. இவ்வாறே, கௌரவ சேனாதிராஜா அவர்களும் ஒரு விடயத்தைக் கூறினார். அதாவது, வேறு பகுதிகளிலிருந்து கொண்டுவரப்பட்டு நாயாற்றில் குடியமர்த்தப்பட்ட சிங்கள மீனவர்கள், தற்பொழுது அந்த மண்ணுக்குரிய தமிழ் மக்கள் அங்கு மீளக் குடியேறும்போது அதற்கு மறுப்புத் தெரிவிக்கின்றார்கள். அப்பகுதியில் ஏறத்தாழ 250 சிங்களக் குடும்பங்களைக் கொண்டுசென்று புதிதாகக் குடியேற்றியதுடன் அவர்களுக்கு மீன்பிடிக்கவும் அனுமதி வழங்கப்பட்டிருக்கின்றது. ஆனால், அந்த மண்ணைச் சேர்ந்த தமிழ் மக்கள் அங்கு மீன்பிடிப்பதற்கு அனுமதிக்கப்படவில்லை.

இதே நிலைதான், கொக்கிளாயிலும் கொக்குத் தொடுவாயிலும் காணப்படுகின்றது. அதைவிட, மீன்பிடிப் பதற்கு என்ன, என்ன தடைகள் இருக்கின்றனவோ, அத்தனை தடைகளும் கொக்கிளாய் ஆற்றில் அவர்களால் மீறப் பட்டுள்ளன. ஆற்றில் வெளிச்சம் பிடித்து மீன்பிடித்தல், தங்கூசி வலை மற்றும் சுருக்குவலையைப் பயன்படுத்தி மீன்பிடித்தல் உட்பட பல தடைசெய்யப்பட்ட செயற்பாடுகள் - அதாவது, கடற்றொழில், நீரக வளமூலங்கள் அபிவிருத்தி அமைச்சினால் தடைசெய்யப்பட்ட அத்தனை செயற்பாடுகளும் அங்கு நடைபெறுகின்றன. இதனை நாங்கள் தட்டிக்கேட்டால், அங்கு இவ்வாறான செயற்பாடுகள் எதுவும் நடைபெறவில்லை என்று சொல்கின்றார்கள். நீங்கள் அப்பிரதேச மக்களை எந்தவித வாழ்வாதார வசதிகளையும் வழங்காமல் வெறுமனே அங்கு கொண்டுபோய் விடுவது என்பது மீள்குடியேற்றமல்ல. அந்த மக்களுக்குரிய விவசாய நிலங்களை மீளப் பெற்றுக் கொடுங்கள்! அவர்களுக்கு மீன்பிடிப்பதற்கு அனுமதி வழங்குங்கள்! அவர்கள் அங்கு தொடர்ந்து வாழ்வதற்குரிய வசதிகளைச் செய்து கொடுங்கள்! குறைந்தபட்சம் தற்காலிக வீடுகளையாவது வழங்குங்கள்! இன்று வலிகாமம் வடக்கிலுள்ள பல பிரிவுகளைச் சேர்ந்த மக்களுக்கு தற்காலிக வீடுகள்கூட வழங்கப்படாமல் இருக்கின்றது. அதேபோன்று முல்லைத்தீவிலும் வழங்கப்படவில்லை. தயவுசெய்து இவற்றை அந்த மக்களுக்குப் பெற்றுக்கொடுங்கள். இவ் வாறான அடிப்படை வசதிகளை அவர்களுக்கு வழங்காமல், நாங்கள் இங்கு வெறுமனே பேசிக் கொண்டிருப்பதில் அர்த்தமில்லை. நீங்கள் வலிகாமம் வடக்குப் பகுதிக்குச் சென்று பார்த்தால் தெரியும். அங்கு ஏறத்தாழ 8,000 ஏக்கர் காணிகளில் இராணுவத்தினர் விவசாயம் செய்கின்றார்கள். இவை அந்த மக்களுக்கு உரித்தான காணிகள்!

Asian Development Bank கொடுத்த நிதியில் யாழ்ப் பாணத்தில் அல்லை - வல்லை என்ற ஒரு வீதி அமைக்கப் படுகின்றது. ஆனால், அந்த வீதியின் இரு முனைகளிலும் வேலைகள் முடிவடைந்திருந்தாலும் ஏறத்தாழ 4 கி.மீ. தூரமான பகுதி பூர்த்தி செய்யப்படாமல் இருக்கின்றது. ஏனென்றால், அது அதியுயர் பாதுகாப்பு வலயத்துக்குள் இருப்பதால். தமது area விற்கூடாக அந்த வீதி செல்வதற்கு இராணுவத்தினர் அனுமதி கொடுக்கவில்லை. அதனால் ADB loanஇல் அமைக்கப்படும் அந்த வீதிகூட முழுமைபெறாமல் இருக்கின்றது. அரசாங்கம் பணத்தைக் கடனாகப் பெற்று அதை வீதி அமைப்பதற்குக் கொடுத்தாலும் அந்த வீதியைப் பூர்த்தி செய்ய முடியாத ஒரு நிலைதான் காணப்படுகின்றது.

அடுத்து, இன்று மன்னாரில் அமைக்கப்பட்டிருக்கின்ற பௌத்த விகாரை பிரச்சினைக்குரிய ஒரு விடயமாக மாறியிருக்கிறது. கந்தையா வைத்தியநாதன் என்பவருக்கு உரித்தான 3 ஏக்கர் காணியை பௌத்த பிக்கு ஒருவர் கேட்டுக்கொண்டதற்கிணங்க ஸ்டான்லி டி மெல் என்ற Divisional Secretary அந்தக் காணியின் உரிமையை மாற்றி எழுதிக் கொடுத்திருக்கிறார். அதனுடைய உறுதி உரிமையாள ரிடம் இருக்கிறது. அந்த பௌத்த விகாரை இருந்த இடத்தில் ஒரு சிறிய பிள்ளையார் சிலை நிறுவப்பட்டிருந்தது. இப்பொழுது அந்தச் சிலை அங்கில்லை. ஏறத்தாழ 1,600 கி.கிராம் நிறைகொண்ட புத்தர் சிலை அந்த இடத்தில் வைக்கப்பட்டிருக்கிறது. அந்த பௌத்த பிக்குவுக்கு இந்தக் காணியின் உரிமையை மாற்றிக் கொடுப்பதற்கு முன்னர் அவர் ஒரு படிவத்தை நிரப்பிக் கொடுத்திருக்கிறார். அந்த படிவத்தில் கேட்கப்பட்டிருக்கும் கேள்விகளையும் அதற்கு அவர் கொடுத்திருக்கும் பதில்களையும் பார்த்தால் நிச்சயமாக சிரிப்புத்தான் வரும். அதாவது, "இந்த ஆலயம் எப்பொழுது ஆரம்பிக்கப்பட்டது?" என்ற கேள்விக்கு அந்த பௌத்த பிக்கு கொடுத்திருக்கின்ற பதில், "தெரியாது" என்பதாகும். அடுத்து, "இந்த ஆலயத்துக்கான நிர்வாகம் உள்ளதா?" என்பதற்கு, "இனிமேல்தான் நிர்வாகத்தை ஆரம்பிக்க வேண்டும்" என்று அவர் பதிலளித்திருக்கிறார். "ஆலயத்தைப் பயன்படுத்தும் குடும்பங்கள் எத்தனை?" என்ற கேள்விக்கு, "இனிமேல்தான் குடும்பங்களைக் குடியேற்ற வேண்டும்" என்று பதில் கொடுக்கப்பட்டிருக்கிறது. இதன் பின்னணியில்தான் ஸ்டான்லி டி மெல் என்ற Divisional Secretary அந்த காணியை பௌத்த பிக்குவுக்கு இவ்வாறு மாற்றிக் கொடுத்திருக்கிறார். அது வைத்தியநாதன் என்பவருடைய சொந்தக் காணியாக இருந்தும் Divisional Secretary அந்த காணியை வழங்கியிருக்கிறார். அப்படியென்றால், அவருக்கு அழுத்தம் கொடுக்கப்பட்டிருக்கிறதா? அவர் என்ன காரணத்துக்காக அப்படிச் செய்தார்? இது வெறுமனே விட்டுவிடக்கூடிய ஒரு பிரச்சினையல்ல, இது தவறுதலாக நடக்கின்ற ஒரு விடயமுமல்ல. திட்டமிட்ட வகையில், அமைச்சர்களுடைய அங்கீகாரத்துடன், பௌத்த பிக்குகள் அதிகாரிகளை மிரட்டிச் செய்கின்ற வேலைகள்! ஆகவேதான் இதைப்பற்றி இங்கு கேள்வி எழுப்புவதற்குரிய நியாயங்கள் எழுந்திருக்கின்றன.

இதேபோன்ற நிலைமை கொக்கிளாயில் தனியொருவருக் குச் சொந்தமான காணிக்கும் ஏற்பட்டிருக்கின்றது. 100 வருடங்கள் பழைமை வாய்ந்த காணி உறுதி அவரிடம் இருக்கிறது. அதை நான் கடந்த வாரம் பார்த்தேன். கரைதுறைப்பற்று பிரதேச செயலாளரான தயானந்த என்பவர் காணி உரிமையாளரிடம் எதுவுமே கேட்காமல் அவருடைய அந்தக் காணியை பௌத்த பிக்கு ஒருவருக்கு மாற்றி எழுதிக்கொடுத்திருக்கிறார். ஒரு வாரத்திற்குள்ளே அந்தக் காணியுடன் சம்பந்தப்பட்ட சகல பெயர்களும் மாற்றப்பட்டு விட்டன. இப்போது அந்தப் பிக்கு அங்கிருக்கின்ற அரச மரத்தின்கீழ் புத்தர் சிலையொன்றை வைத்து வணங்கிக் கொண்டிருக்கிறார். எவ்வளவு மோசடித்தனம்! வயதான அந்த தமிழ்க் குடிமகன் 100 வருடங்கள் பழைமை வாய்ந்த, கிழிந்துபோன உறுதியை வைத்துக்கொண்டு ஏங்கிக் கொண்டிருக்கிறார். "பாருங்கள் தம்பி, என்னுடைய காணிக்கே என்னால் போக முடியாத நிலை! இராணுவத்தினரும் அந்த பௌத்த பிக்குவும் அங்கிருக்கும்போது நான் எப்படிப் போகமுடியும்?" என்று அவர் என்னிடம் கூறினார்.

இது ஒருபுறமிருக்க, அங்கு கொக்குத்தொடுவாயிலுள்ள 32 ஏக்கர் காணி - அங்கு இல்மனைட் படிவு இருப்பதாலோ என்னவோ - அது அரசுடைமையாக்கப்பட்டு தேவையான எல்லைகளும் வகுக்கப்பட்டு வருகின்றன. அங்கு நமது ஜனாதிபதியுடைய மகனான கௌரவ நாமல் ராஜபக்ஷ அவர்களும் போயிருக்கிறார். அது ஒரு private காணி, State காணி அல்ல! தாய் ஒருவர் என்னிடம் வந்து, "தம்பி, என்னுடைய காணியும் அந்த எல்லைக்குள்தான் இருக்கிறது; நான் அங்கு போவதற்கு இராணுவத்தினர் விடுகிறார் களில்லை; அதை அரசாங்கம் எடுத்துவிட்டது. இரண்டு வருடங்களுக்குப் பின்னர் வாருங்கள்; compensation வழங்குவது பற்றி யோசிப்போம் என்று சொல்கிறார்கள்" என்று கூறினார். என்னென்ன வடிவங்களில் எல்லாம் இவை நடைபெறுகின்றனவென்பதைத் தயவுசெய்து நீங்கள் சிந்தித்துப் பாருங்கள்! அரசாங்கத்தின்மீது குற்றஞ்சாட்ட வேண்டுமென்பதற்காக இந்த விடயங்களை நாங்கள் சொல்லவில்லை. This is the reality; this is what is happening. இதுதான் நடக்கின்றது. ஏதோ நாங்கள் இனவாதம் பேசுகின்றோம்; எல்லாவற்றையும் எடுத்த எடுப்பிலே எதிர்க்கின்றோமென்று நீங்கள் நினைக்கக் கூடாது. நிச்சயமாக அப்படியல்ல. நான் சொல்வது பொய்யாக இருந்தால் அந்த இடத்துக்கு நீங்கள் போய் பாருங்கள்! [*Interruption.*] Yes, that is good. We are doing everything very well. That is a different matter. The LTTE had a very good May Day rally at that time.

**ගරු මන්ත්‍රීවරයෙක්**
(மாண்புமிகு உறுப்பினர் ஒருவர்)
(An Hon. Member)

Why are you thinking about the LTTE now? They are no more; they are finished.

**ගරු සුරේෂ් ප්‍රේමචන්ද්‍රන් මහතා**
(மாண்புமிகு சுரேஷ் பிரேமச்சந்திரன்)
(The Hon. Suresh Premachandran)

Sir, நாங்கள் இங்கு வந்து இராணுவத்தைப் பற்றிப் பேசினால் ஏதோ நாங்கள் இராணுவத்திற்கு எதிராகப் பேசுவதாகக் கூறுகின்றார்கள். இன்று ஓமந்தையில் இருந்து அல்லது வவுனியாவிலிருந்து யாழ்ப்பாணம் போவதற்கு முன்பாக நீங்கள் குறைந்தபட்சம் பத்து brigade headquarters இருப்பதைக் காணலாம். அதாவது அங்கு 555 ஆவது brigade வரவேற்கின்றது, 666 ஆவது brigade வரவேற்கின்றது அல்லது மூன்று divisions வரவேற்கின்றது, அல்லது STF வரவேற்கின்றது, கம்பனி வரவேற்கின்றது, றெஜிமென்ட் வரவேற்கின்றது. ஆனால், அங்கு தமிழர்கள் வரவேற்பது கிடையாது! ஏன்? அங்கு தமிழர்கள் இருக்க முடியாது, இராணுவம்தான் இருக்கின்றது! ஆகவே, அங்கு வரவேற்பவர்கள் எல்லாம் அவர்கள்தான்! நாங்கள் இப்படிச் சொன்னால் இராணுவத்திற்கு எதிராகப் பேசுகின்றோம் என்று கூறுகின்றார்கள். இன்று A-9 பாதையில் மாத்திரமல்ல, A-32 என்று அழைக்கப்படும் மன்னார் - பூநகரி road இலும் இவ்வாறு காணப்படுகின்றது. பரந்தன் - முல்லைத்தீவு road இல் பாருங்கள்! முல்லைத்தீவு - மாங்குளம் road இல் பாருங்கள்! முல்லைத்தீவு - கொக்கிளாய் road இல் பாருங்கள்! அங்கெல்லாம் இவ்வாறு எத்தனையோ divisions வரவேற்கின்றது! எத்தனையோ brigades வரவேற்கின்றது! இன்று Defence Secretary கோட்டாபய ராஜபக்ஷ அவர்கள் சொல்கின்றார், "இராணுவத்தை நாங்கள் படிப்படியாகக் குறைக்கின்றோம்" என்று. எங்கே குறைத்திருக்கின்றார்கள்? அவ்வாறான ஓர் இடத்தைச் சொல்லட்டும் பார்க்கலாம்! ஆனால், நாங்கள் இங்கு இந்த விஷயங்களைச் சொல்கின்றபொழுது சில சமயம் எல்லோரும் நினைக் கின்றார்கள் நாங்கள் பொய் பேசுகின்றோம் என்று.

முல்லைத்தீவு மாவட்டத்தில் மணலாறு என்ற ஒரு கிராமம் இருப்பது உங்களுக்குத் தெரியும். அது இப்பொழுது வெலி ஓயா என்று சொல்லப்படுகின்றது. எந்தெந்தக் கிராமங்களில் mines clear பண்ண வேண்டும் என்பதை mapஐப் பார்த்துத்தான் demining group இனர் தீர்மானிப்பார்கள். ஆனால், demining group வெலி ஓயாவுக்குப் போனால் அந்த mapஇல் இருக்கின்ற கிராமம் ஒன்றும் அங்கு இருக்காது. ஏனென்றால் அந்தக் கிராமங்களின் பெயர்கள் எல்லாம் சிங்களப் பெயர்களாக மாறிவிட்டன! எனவே, demining group திரும்பி வந்துவிடும். "There is no such village like that." - That is the report. ஆகவே, இன்று அப்படியான ஒரு நிலைமைதான் அங்கு காணப்படுகின்றது. முன்னர் 23 - 25 சிங்கள மக்கள் இருந்த இந்த வெலி ஓயா கிராமம் யுத்தம் நடக்கின்ற காலகட்டத்தில் "for administrative purposes" என்ற காரணங்காட்டி அனுராதபுரம் மாவட்டத்திற்குள் உள்வாங்கப் பட்டது. அதன் தொடர்ச்சியாக அங்கு ஒன்பதாயிரம் மக்கள் குடியேற்றப்பட்டார்கள். Okay. நல்ல விஷயம்! ஆனால், மூன்று மாதங்களுக்கு முன்னர் முல்லைத்தீவு GA க்கும் தெரியாமல் அந்தக் கிராமம் ஒன்பதாயிரம் சிங்கள மக்களுடன் மீண்டும் முல்லைத்தீவுடன் இணைக்கப்பட்டது. அதாவது overnight ஒன்பதாயிரம் சிங்கள மக்கள் முல்லைத்தீவு மாவட்டத்திற்குள் கொண்டுவரப்பட்டார்கள். இதை என்ன காரணத்திற்காகச் செய்கின்றீர்கள்? ஏன் செய்கின்றீர்கள்? இப்படி நாங்கள் கேட்டால் இது இனவாதமா? அப்படியானால் நீங்கள் demographic pattern ஐ மாற்ற முயற்சி செய்கின்றீர்களா, இல்லையா? இவைதானே அடிப்படைப் பிரச்சினைகள்! நீங்கள் reconciliation பற்றி வாய்கிழியக் கத்துகின்றீர்கள், நாங்கள் ஏதோ இதற்கு ஒத்துவரவில்லை என்று சொல்கின்றீர்கள். ஆனால், reconciliation க்காக நீங்கள் என்ன செய்திருக்கின்றீர்கள்?

**නියෝජ්‍ය කාරක සභාපතිතුමා**
(குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(Mr. Deputy Chairman of Committees)

Hon. Premachandran, please wind up now.

**ගරු සුරේෂ් ප්‍රේමචන්ද්‍රන් මහතා**
(மாண்புமிகு சுரேஷ் பிரேமச்சந்திரன்)
(The Hon. Suresh Premachandran)

I will wind up, Sir.

இந்த யுத்தம் முடிவடைந்து மூன்று வருடங்களுக்குப் பிற்பாடுகூட, தமிழ் மக்களை accommodate பண்ணுவதற்கு You are not ready. You are not ready to accommodate the Tamil people. ஆனால், நீங்கள் மேலும் மேலும் அவர்களை நோகடிக்கின்றீர்கள். அவர்களை அந்த மண்ணில் இருந்து விரட்டுகின்றீர்கள். உண்மையாகவே நீங்கள் அவர்களைச் சாகடிக்கின்ற நிலைக்குக் கொண்டுபோகின்றீர்கள். இப்பொழுது இங்கே எனது நண்பரான கௌரவ டக்ளஸ் தேவானந்தா உட்பட கௌரவ வாசுதேவ நாணாயக்கார, கௌரவ நிமல் சிறிபால டி சில்வா, கௌரவ தினேஷ் குணவர்தன எனப் பல அமைச்சர்கள் இருக்கின்றீர்கள். தயவுசெய்து நீங்கள் அனைவரும் reconciliation ஏற்படுவதற்கு சரியான நடவடிக்கை எடுங்கள் என்று கேட்டு, விடைபெறுகின்றேன்.

[பி.ப. 5.23]

**ගරු ඩග්ලස් දේවානන්ද මහතා (සම්ප්‍රදායික කර්මාන්ත හා කුඩා ව්‍යවසාය සංවර්ධන අමාත්‍යතුමා)**
(மாண்புமிகு டக்ளஸ் தேவானந்தா - பாரம்பரிய கைத்தொழில்கள், சிறு தொழில்முயற்சி அபிவிருத்தி அமைச்சர்)
(The Hon. Douglas Devananda - Minister of Traditional Industries and Small Enterprise Development)

கௌரவ குழுக்களின் பிரதித் தவிசாளர் அவர்களே, தெல்லிப்பளை பிரதேச செயலகப் பிரிவில் "கோவிலடி, அரசடி வீதி, மாவிட்டபுரம்" என்ற விலாசத்தைக்கொண்ட பாராளு மன்ற உறுப்பினர் மாண்புமிகு மாவை. சோ. சேனாதிராஜா அவர்களால் முன்வைக்கப்பட்ட இன்றைய ஒத்திவைப்புப் பிரேரணை மீதான விவாதத்தில் பேசுவதில் நான் மிகவும் சந்தோசமடைகின்றேன். ஏனென்றால், நீலிக்கண்ணீர் வடிக்கின்ற அல்லது பொய்களையே தளமாகக்கொண்டு சுயலாப அரசியலுக்காக இவர்கள் அடிக்கடி இவ்வாறான பிரேரணைகளைக் கொண்டுவருகிறார்கள். அந்தவகையில், அதை அம்பலப்படுத்துவதற்காக அல்லது அதன் மறுபக்கம் என்ன என்பதைச் சொல்வதற்காக இதில் கலந்துகொள்வதில் நான் சந்தோசமடைகின்றேன். இங்கு பல கருத்துக்கள் தமிழ்த் தேசியக் கூட்டமைப்பினரால் சொல்லப்பட்டிருக்கின்றது. பிரச்சினைகள் இல்லையென்று நான் சொல்ல வரவில்லை. ஆனால், அதை மிகைப்படுத்திக் கூறும் வகையிலான, பிரச்சினைகளுக்கு தீர்வுகாண முயலாத வகையிலான ஒரு செயற்பாட்டையே அவர்கள் கொண்டிருக்கிறார்கள். அவர்களுக்குப் பிரச்சினையைத் தீர்ப்பதில் எந்தவிதமான நாட்டமோ, விருப்பமோ இல்லை. பிரச்சினைகள் தீர்ந்துவிட்டால் தங்களுடைய அரசியல் வாழ்வு அடிபட்டுப் போய்விடும் என்பதுதான் அவர்களுடைய எண்ணமும் செயற்பாடாகவும் இருக்கின்றது. அந்தவகையில், கடந்த காலங்களைப்போல் அவர்கள் பலவகையான பொய்யான கருத்துக்களைச் சபையில் முன்வைத்து வருகிறார்கள்.

இந்தப் பிரேரணையைக் கொண்டுவந்த மாண்புமிகு மாவை. சோ. சேனாதிராஜா அவர்கள், தான் அகதியாக இருப்பதாகவும் தன்னுடைய சொந்த இடத்துக்குப் போகமுடியாமல் இருப்பதாகவும் குறிப்பிட்டார். ஆனால், நான் ஏற்கெனவே சொன்னதுபோல், கோவிலடி, அரசடி வீதி, மாவிட்டபுரம், தெல்லிப்பளையை விலாசமாகக்கொண்ட அவருடைய இருப்பிடம் அமைந்துள்ள இடம் போன வருடம் மே மாதமே மக்களுடைய பாவனைக்காக விடுவிக்கப்பட்டு விட்டது. ஆனால் அவர் இங்கு சொல்லுகின்றார், தான் அகதியாக இருக்கின்றேன்; தன்னுடைய இடத்துக்குப் போகமுடியாமல் இருக்கின்றது என்று. [இடையீடு] நான் கதைத்து முடித்த பிறகு நீங்கள் கதைப்பது நல்லது. ஏனென்றால், நீங்கள் கதைக்கும்போது நான் பேசாமலிருந்தேன். நீங்கள் பொய் புனைகிறீர்கள் என்பதற்காகத்தான் நான் இவற்றைச் சொல்லவருகின்றேன். ஆகவே, தயவுசெய்து அமைதியாகக் கேட்டுக்கொள்ளுங்கள்! நீங்கள் பேசும்போது நான் பேசாமல்தானே இருந்தேன்! [இடையீடு] நீங்கள் நான் சார்ந்த அரசாங்கத்தைப் பற்றித்தானே பேசுகிறீர்கள். அதைப்பற்றித்தானே பொய் கூறுகிறீர்கள். அதில் நான் அங்கம் வகிக்கின்றபடியினால் அதற்குப் பதில் சொல்வது என்னுடைய கடமையும் பொறுப்பும் ஆகும். [இடையீடு] அதில் நான் அங்கம் வகிக்கின்றேன். இந்த அரசாங்கத்தில் நம்பிக்கையுள்ளதால்தான் நான் இங்கு பேசுகின்றேன். [இடையீடு] நீங்களும் எலும்புத்துண்டு தூக்கினீர்கள்தானே! இப்போதும் புலம்பெயர்ந்த மக்களிடம் தூக்கிக்கொண்டுதானே இருக்கிறீர்கள். உங்களுக்குப் பிரச்சினையை தீர்ப்பதற்கு விருப்பமில்லை. ஏனென்றால், பிரச்சினை தீர்ந்தால் புலம்பெயர்ந்த மக்களிடம் எலும்புத்துண்டைப் பெறமுடியாது என்பதற்காகத்தான் இப்படிக் கதைக்கிறீர்கள். கடந்த காலத்தில் எவ்வளவு சந்தர்ப்பங்கள் கிடைத்தன! இலங்கை - இந்திய ஒப்பந்தம் ஒரு பொன்னான வாய்ப்பு; அதைக் கெடுத்துக்கொண்டீர்கள். அதற்குப்பிறகு எவ்வளவோ வாய்ப்புகள் கிடைத்தன. அவை அனைத்தையும் உங்களுடைய சுயலாபத்துக்காகக் கெடுத்தீர்கள். இங்கே மண்டையன் குழுத் தலைவர் இருக்கிறார். இந்த மண்டையன் குழுத் தலைவர் அந்தக் காலத்தில் என்ன செய்தார் என்று உங்களுக்குத் தெரியும். புலிகளுடைய பெயரால் தினமும் எத்தனையோ பேரைக் கொன்றொழித்தார். [இடையீடு] இன்றைக்குப் "பல்லுப் பிடுங்கிய பாம்பு போல" இருக்கிறார். எங்களுக்கும் அவைகளைப்பற்றிச் சொல்ல முடியும். இப்பொழுது அதுவல்ல பிரச்சினை. நான் உங்களிடம் ஒவ்வொரு சந்தர்ப்பத்திலும் கேட்டுக்கொள்வது என்னவென்றால், மக்களுடைய பிரச்சினை யைத் தீர்ப்பதற்காகக் கிடைக்கின்ற சந்தர்ப்பங்களைப் பயன்படுத்திக் கொள்ளுங்கள் என்பதைத்தான். உங்களுக்குப் பிரச்சினையைத் தீர்க்க விருப்பமில்லை; பிரச்சினை தீர்ந்தால் உங்களுக்கு அரசியல் இல்லை. [இடையீடு] நாங்கள் பிரச்சினையைத் தீர்ப்பதற்காகத்தான் மக்களுடைய சார்பில் அரசாங்கத்தில் அங்கம் வகிக்கின்றோம். எங்களுக்கு மக்கள் வாக்களித்திருக்கிறார்கள். எல்லோரையும்விட அதிக பெரும் பான்மை விருப்பு வாக்கு எனக்குக் கிடைத்திருந்தது. அந்த வகையில் எனக்குப் பிரச்சினையைத் தீர்ப்பதற்கான உரிமை இருக்கின்றது. ஆனால், நீங்கள் பிரச்சினையைத் தீர்க்க விடாமல் அதனைக் குழப்பிக்கொண்டு இருக்கின்றீர்கள். [இடையீடு] நீங்கள் பிரச்சினையைத் தீர்க்கவிடாமல், பேச்சுவார்த்தை என்று சொல்லிக்கொண்டு கடந்த காலங்களில்

**නියෝජ්‍ය කාරක සභාපතිතුමා**
(குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(Mr. Deputy Chairman of Committees)
Order, please!

**ගරු ඩග්ලස් දේවානන්ද මහතා**
(மாண்புமிகு டக்ளஸ் தேவானந்தா)
(The Hon. Douglas Devananda)

அவுஸ்திரேலியாவுக்குப் போனீர்கள்; அமெரிக்காவுக்குப் போனீர்கள்; நியூசிலாந்துக்குப் போனீர்கள். எத்தனை இடங்களுக்குப் போனாலும், நீங்கள் பிரச்சினையைத் தீர்க்க விரும்பவில்லை. ஏனெனில், உங்களுக்குப் பிரச்சினை தீர்ந்தால் - யாரும் களவெடுக்காவிட்டால், யாரும் கொள்ளையடிக்காவிட்டால் உங்களுக்கு - உழைப்பதற்கு - பேசுவதற்கு வழக்கு இல்லை. ஆனபடியினால், நீங்கள் கொள்ளையடிப்பதற்கும் களவெடுப்பதற்கும் ஊக்குவிப்பீர்கள். [இடையீடு] அவர்களுக்காக நீங்கள் வாதாடுவீர்கள். அதுதான் உங்களுடைய தொழில்! உங்களுடைய தொழிலுக்காக அப்பாவி மக்கள்மீது பிரச்சினைகளைத் திணிக்கவேண்டாம். நீங்கள் அப்பாவி மக்கள்மீது பிரச்சினை களைத் திணித்து, அந்த மக்களுடைய வாழ்க்கையைப் பாழடிக்கின்றீர்கள். [இடையீடு] நீங்கள் அந்தப் பெண்கள் பாடசாலைக்குச் சென்று என்ன செய்தீர்கள் என்று எங்களுக்குத் தெரியும்தானே. நாங்கள் அப்பொழுது, உடனடி யாக அந்த விடயத்தில் தலையிட்டபடியால்தான் அப்பெண் பிள்ளைகள் பாதுகாக்கப்பட்டார்கள். [இடையீடு]

**නියෝජ්‍ය කාරක සභාපතිතුමා**
(குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(Mr. Deputy Chairman of Committees)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මා මේ කියන කාරණයට ඔබතුමාම සාක්ෂි දරනවා ඇති. ඔබතුමා මා සමඟ ඔවුන් කළ සංචාර ගණනාවකට සහභාගි වුණා. නුවරඑළියේ ගිය වෙලාවේ ඔවුන් පුදුම වුණා. ඔවුන් කිව්වා, අපි වව්නියාවෙන් මෙහාට ආවේ නැහැ කියලා. නුවරඑළියේ දේශගුණය, බදුල්ලේ දේශගුණය, ඒ දිය ඇලිවල සුන්දරත්වය, පරිසරයේ සුන්දරත්වය මෙහෙමයි කියලා අපි කවදාවත් හිතුවේ නැහැ කිව්වා. ඒ වාගේම දකුණේ සිංහල මිනිස්සු අපට මෙහෙම ආදරය කරන අය බව දැන ගත්තා නම් අපි කවදාවත් ඔවුන්ට විරුද්ධව ආයුධ උස්සන්නේ නැහැ කියලා කිව්වා. මෙන්න මේක තමයි තත්ත්වය මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. මිනිස්සු කෲරත්වයට අදින්න පුළුවන්. නොදැනුවත්කම තිබෙන තාක් කල් එතැනට තල්ලු කරන්න පුළුවන්. ඒ කෲරත්වයේ ප්‍රතිවිපාක උතුරේ මෙන්ම දකුණේත් දැකපු අය හැටියට අපි ඉතාම පරිස්සම් වෙන්න ඕනෑ. මේ රට යළි එතැනට තල්ලු කිරීම නොවෙයි කළ යුත්තේ. අපේ සියලු ජාතීන් එකට එකතු වෙලා මේ රට ගොඩ නහා ගැනීමේ පරම වග කීමක් අපට තිබෙනවා.

සමහර වෙලාවට ජාතික වශයෙන් ධනපති පන්ති එක්සත්කම් ඇති වෙයි. මේ යන විධිය අනුව ඒක අපට තේරෙනවා. TNA එකේ ගරු සේනාධිරාජා මන්ත්‍රීතුමා මේ යෝජනාව ඉදිරිපත් කළා. එක්සත් ජාතික පක්ෂයේ ගරු ආර්. යෝගරාජන් මන්ත්‍රීතුමා එය ස්ථිර කළා. මේක තමයි සමාජ දේශපාලනය. අපි ප්‍රශ්න දෙස බලන්නේ පන්ති කෝණයකින්. අපි ජාතිවාදී විධියටවත්, ආගම්වාදී විධියටවත්, එහෙම නැත්නම් වෙනත් අවස්ථාවාදී විධියටවත් ප්‍රශ්න දිහා බලන අය නොවෙයි. ඒ නිසා මේ ප්‍රශ්න දිහා බලන කොට අපි තේරුම් අරගෙන තිබෙනවා, අපි සියලු දෙනාම කවර ජාතිකයන් වුවත් අපි වමේ දේශපාලනය කරන අය හැටියට අපි පැගෙන පීඩිත පන්තියේ සමාජ ප්‍රශ්නවලට එකට ඉඳගෙන උත්තර දෙන්න ඕනෑ බව.

රටට එරෙහි වන අධිරාජ්‍යවාදී බලවේගවලට එරෙහිව, කුමන්ත්‍රණකාරී බලවේගවලට එරෙහිව මුහුණ දෙන්න සිද්ධ වෙනවා. මම කියනවා, මේකෙන් බේරෙන්න පුළුවන් කිසිවෙක් නැහැ කියලා. අපට දිනා ගන්න බැරි බලය, අපට ගන්න බැරි බලය, අපට උදුරා ගන්න බැරි බලය බටහිර අතකින් හෝ අපට අරන් දෙනවා නම්, අපි ඔවුන්ට ගැතිකම් කරනවා කියලා කවුරු හරි හිතනවා නම් ඒක මුළාවක් මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. එහෙම නම් අපි අද ලෝක අත් දැකීම් අරගෙන බලන කොට වඩා භයානක සතුරා අධිරාජ්‍යවාදය කියලා හැමදාමත් දැකපු අය හැටියට මේ රටවල් ඇතුළේ නොසන්සුන්කම හදන්න, මේ රටවල් ඇතුළේ බෙදීම් හදන්න, මේ රටවල් ඇතුළේ ආර්ථික පරායීනකම් හදන්න ගෙනියන බලවේගවලින් රට ආරක්ෂා කිරීම ප්‍රමුඛ කාර්ය භාරයක් වෙනවා. ඒකට ජාති, ආගම්, කුල වශයෙන් බෙදිලා බැහැ. තාවකාලිකව සතුටු වෙන්න පුළුවන්. බටහිර රටවල් මැදිහත් වෙලා, බටහිර බලපෑමකින් අපේ රටට දඬුවම් කරන්න හදනවාය කියලා කල්පනා කරන කෙනකුට සතුටු වෙන්න පුළුවන්. ඒක තාවකාලික සතුටක් විතරයි. අපි පළමුව තේරුම් ගත යුත්තේ අපේ සතුරන් සහ මිතුරන් කවුද කියන එකයි. සතුරු-මිතුරු පටලැවිල්ලක් තිබෙන කිසිම තැනක අපට ජයග්‍රහණ නැහැ.

ලංකාවේ මේ ඛේදනීය ඉරණමට, පසුගාමී සංවර්ධනයන්ට, පසු කාලයේ ඇති වෙච්ච අවාසනාවන්ත සිදුවීම්වලට බලපාපු ප්‍රධාන සාධකය වන්නේ අන්ත අවස්ථාවාදය මතු කරපු කුහක ජාතිවාදයයි. ඒ කුහක ජාතිවාදය තවදුරටත් ඒ විධියටම නැතුව වෙනත් විධියකට ගෙනියන්න බටහිර බලවේගවලට ඕනෑකම් තිබෙයි; විවිධ උපායයන් පාවිච්චි කරයි. අපි අතර ගොඩනැඟෙන සන්ධානයේ සංහිඳියාව, මිත්‍රත්වය විනාශ කරන්න ඔවුන් කුමන්ත්‍රණකාරීව හැසිරෙයි. අපි ඒවාට යට වෙනවාද කියලා මම අහනවා. අපි ඒවා පරාජය කළ යුතුයි නේද? අපි ඒවා පරාජය කළ යුතුයි. අද මේ රටේ පවතින පසේ -භූමියේ- දේශපාලනය දිහා විතරක් බලලා තමන්ට උතුරෙන් ආසනයක් ගන්න, නැඟෙනහිරින් තව බලයක් ගන්න අපි කුහක විධියට දේශපාලනය කළොත්, එහි පළවිපාක මත ඉතිහාසයේ මීට පෙර හිටපු අන්ත අවස්ථාවාදීන්ගේ ක්‍රියා මාර්ගයේ දෙවැනි වරම ඉටු කිරීමේ අවාසනාවන්ත තත්ත්වයට පත් කරන මිනිසුන්ගේ ඉතිහාසයට අප එකතු වෙයි. ඒ නිසා මේ රට ගොඩ නඟන්න අපට වග කීමක් තිබෙනවා මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමා දන්නවා, අපි රජයක් හැටියට රුපියල් බිලියන 251ක් උතුරට වැය කළ බව. එසේ වැය කළේ නිකම් ද? උතුරේ අද වේගවත් සංවර්ධනයක් වෙනවා. අද පළාත් වශයෙන් අරගෙන බැලුවාම, උතුරු වසන්තයත් එක්ක උතුරු පළාතේ ඇති වෙච්ච පිබිදීම නැහැයි කියලා කාටවත් කියන්න පුළුවන්ද? ඇයි, මෙය පිළිගන්නේ නැත්තේ? ඇයි, ලෝකයේ කිසිම රටක නැති පුනරුත්ථාපනයක් මේ රටේ සිදු වෙනවායි කියලා කාටවත් කට ඇරලා කියන්න බැරි?

ආයුධ ගත්ත තරුණ තරුණියෝ සිය දෙනකු මම පාර්ලිමේන්තුවට එක්ක ගෙන ආවා. ඒ අය පාර්ලිමේන්තුවට එක්ක ගෙන ඇවිල්ලා, පාර්ලිමේන්තුවේ ඉතිහාස කථාව පැහැදිලි කරලා දීලා ඔවුන්ට මෙය බලන්න ඉඩ දුන්නා. මොන රටේද, ආණ්ඩුවක් පෙරළන්න ආයුධ අතට ගත්ත කොල්ලෝ කෙල්ලෝ පාර්ලිමේන්තුවට එක්ක ගෙන ඇවිල්ලා අගමැතිතුමා එක්ක කථා කරන්න, කථානායකතුමා එක්ක කථා කරන්න අවස්ථාවන් සලසා දුන්නේ? ඒ වෙලාවේ කවුද ඒක අගය කළේ? ඒ වෙලාවේ ඒකටත් කිව්වා, "වැදගත් නැති ඇඳුමක් අන්දවා ගෙන එක්ක ආවා" කියලා. ඒක විවේචනය කෙරුවා. නැහැ, අපි සත්‍යයට මුහුණ දෙන්න ඕනෑ. අපි එකතු වෙන්න ඕනෑ. හරි දේට හරියි කියලා කියන්න පුළුවන්කම තිබෙන්න ඕනෑ. වැරදි දේ විවේචනය කරමු. ඒකට ප්‍රශ්නයක් නැහැ. අපට දැවැන්ත වග කීමක් තිබෙනවා. පුංචි රටක අපි එකට සිටියත්, ජාත්‍යන්තර වශයෙන් අපට තිබෙන දැවැන්ත වගකීමේ පුංචි පංගුකාරයෝ හැටියට මේ රට එකට තියා ගෙන එක්සත්කම එකට තියා ගෙන අපේ ප්‍රශ්න විසඳා ගනිමු කියලා මම මේ වෙලාවේ ඉල්ලා සිටිනවා.

ගැටලු විසඳා ගන්න මහ පාදලා තිබෙනවා. අතිගරු ජනාධිපතිතුමා තේරීම් කාරක සභාවක් යෝජනා කර තිබෙනවා. එකට එකතු වෙමු; වාඩි වෙමු; තිබෙන ප්‍රශ්න කථා කරමු. මේ පාර්ලිමේන්තුවට යෝජනාවක් ගෙනාවායි කියන එකේ ප්‍රශ්නයක් නැහැ. ඒ යෝජනාව සංවාද කරන්න ඕනෑ. ඒකේ කිසි ප්‍රශ්නයක් නැහැ. ඒ සංවාදය අවශ්‍යයි. සංවාදය සංවර්ධනයේ රීතියක්. ඒක අවශ්‍යයි. මේ හැම ප්‍රශ්නයක් තුළම ප්‍රතිවිරෝධ තිබෙන්න පුළුවන්. නමුත් අපි දේශපාලන නායකයෝ හැටියට ඒ ප්‍රතිවිරෝධ හරියට තේරුම් අරගනිමින් නියම උත්තරය හොයන්න එකට වාඩි වෙන්න ඕනෑ. වෙන විකල්පයක් නැහැ. ඒ නිසා අපි ආරාධනා කරනවා, අපි සියලු දෙනාම එකට එකට එකතු වෙමු; එකට වාඩි වෙමු; තිබෙන ප්‍රශ්න හඳුනා ගනිමු කියා. ප්‍රශ්න වර්ධනය කිරීම නොවෙයි, ප්‍රශ්න වර්ධනය කරලා ප්‍රතිවිරෝධ ඇති කිරීම නොවෙයි කළ යුත්තේ. අපි හිතනවා, අපි ප්‍රතිවිරෝධයන් මතු කරලා තාවකාලික ජයග්‍රහණ ලබනවා කියලා. හැබැයි, මේ ප්‍රතිවිරෝධ ප්‍රතිසට්ටන බවට පත් කරන්න ක්‍රියා කරනවා නම් ඒක රටේ අවාසනාව. ඒ නිසා අපි එකට එකතු වෙලා රටේ තිබෙන ප්‍රශ්න, සියලු ජාතීන්ගේ ප්‍රශ්න රට ඉදිරියට ගෙන යන්න අවශ්‍ය වන විධියට තේරුම් අරගනිමින්, ප්‍රබුද්ධ විධියට කටයුතු කරන්න ගෙන යන හැම ක්‍රියාවලියකටම අපේ පූර්ණ සහයෝගය දෙන බව ප්‍රකාශ කරමින්, වැඩියෙන් වෙලාවක් දීම ගැන ඔබතුමාට ස්තුතිවන්ත වෙමින් මම නිහඬ වනවා.

[பி.ப. 6.19]

**ගරු එස්. විනෝ මහතා**
(மாண்புமிகு எஸ். வினோ)
(The Hon. S. Vino)#

கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, யுத்தம் முடிவடைந்து மூன்று வருடம் நிறைந்த பின்பும்கூட வடக்கு, கிழக்கில் வாழ்கின்ற தமிழ் மக்களுடைய பிரச்சினைகள் தீர்க்கப்படவில்லை. அரசியல் தீர்வு விடயமாக இருந்தாலும் சரி, அந்த மக்களுடைய அன்றாடப் பிரச்சினைகளாக இருந்தாலும் சரி, அவை தீர்க்கப்படாததன் காரணமாக எங்களுடைய இனத்தினுடைய, எங்களது மதங்களினுடைய சுதந்திரம் பறிக்கப்பட்டுக் கொண்டிருக்கின்ற ஒரு சூழ்நிலையிலேதான் இந்தப் பிரேரணை கொண்டுவரப் பட்டிருக்கின்றது.

இங்கு குறிப்பாக திருக்கேதீஸ்வரப் பிரச்சினை பற்றிக் குறிப்பிடப்பட்டது. திருக்கேதீஸ்வரம் என்பது தமிழ் இந்துக்களைப் பொறுத்தவரையிலே ஒரு புனித பூமி. பல ஆண்டுகளுக்கு முன்பிருந்தே அந்த ஆலயமும் அந்த ஆலயச் சூழலும் இந்துக்களால் நிர்வகிக்கப்பட்டுக் கொண்டிருக் கின்றது. ஆனால், அங்கு அண்மையிலே புதிதாக புத்தர் சிலை ஒன்று முளைத்துள்ளது. அது அங்கே அந்த மக்களினுடைய வழிபாட்டுக்கு இடையூறாக இருக்கின்றது. அந்தப் புனிதத் தன்மையைக் கெடுத்துவிடுகின்ற ஒரு கைங்கரியமாகத்தான் இந்தச் செயற்பாடு நடைபெற்றிருக்கின்றது.

உண்மையிலேயே தமிழ்த் தேசியக் கூட்டமைப்பினர் ஆகிய நாங்கள் எமது இந்து மக்களினுடைய உணர்வுகளை புரிந்துகொண்டு குரல் கொடுக்கும் அளவுக்கு, இங்குள்ள தமிழ் அமைச்சர்கள் அம்மக்களின் உணர்வுகளைப் புரிந்துகொள்ளா திருப்பதும் இவை தொடர்பில் முதுகெலும்பு அற்றவர்கள்போல் நெஞ்சுரமில்லாமல் அரசாங்கத்துக்கு அழுத்தம் கொடுக்க மறுப்பதும் வேதனை அளிக்கின்ற விடயங்களாகும்.

இந்த நேரத்திலே நான் இன்னுமொரு விடயத்தையும் குறிப்பிட விரும்புகின்றேன். இடம்பெயர்ந்துள்ள இலட்சக் கணக்கான மக்கள் இன்னமும் மீளக்குடியேறாத நிலையில் இருக்கின்றவேளையிலே, அண்மையில் இந்தியாவிலிருந்து இலங்கைக்கு வந்த குழுவினரிடம், "96 சதவீதமான மக்கள் மீள்குடியமர்த்தப்பட்டுவிட்டார்கள்; இன்னமும் 4 சதவீதமான வர்கள் மட்டுமே மீள்குடியமர்த்தப்பட இருக்கிறார்கள்" என இலங்கை அரசாங்க தரப்பினரால் தெரிவிக்கப்பட்டது. ஆனால், முகாம்களில் இருக்கும் 4 சதவீதமான மக்கள் மாத்திரமல்ல, உறவினர்கள் வீடுகளிலும் இடம்பெயர்ந்து தமிழ்நாட்டிலுள்ள முகாம்களில் இருக்கின்ற எழுபத்தையா யிரத்துக்கும் மேற்பட்ட மக்களும் அதற்கு வெளியில் வாழ்கின்ற சுமார் ஓரிலட்சத்து இருபத்தையாயிரம் மக்களும் மீளக்குடியமரவேண்டிய நிலையில் இருக்கின்றார்கள். அதைவிட ஐரோப்பிய நாடுகள், கனடா, அவுஸ்திரேலியா போன்றவற்றில் புலம்பெயர்ந்துள்ள பத்து இலட்சத்துக்கும் மேற்பட்ட மக்களும் இந்த நாட்டிலே இயல்பு நிலைமை தோன்றினால் நிச்சயமாக தமது சொந்தப் பிரதேசங்களிலுள்ள காணிகளிலே குடியேறுவதற்குத் தயாராகத்தான் இருக்கின் றார்கள். யுத்தம் முடிவடைந்து நாடு இயல்பு நிலைக்குத் திரும்பிய பின்னர் தாங்கள் எல்லோரும் தமது சொந்த நிலங்களிலே வாழலாம் என்ன எண்ணத்துடனேயே இந்த மக்கள் எண்ணியிருந்தார்கள். ஆனால், யுத்தம் முடிவடைந்த பின்னரும் அம்மக்கள் இங்கு வாழ்வதற்குரிய சூழ்நிலையை இந்த அரசாங்கம் இன்னமும் ஏற்படுத்திக் கொடுக்காத காரணத்தினால் அல்லது கொடுக்க மறுத்துள்ள காரணத் தினால்தான் ஏறக்குறைய வெளிநாடுகளில் இடம்பெயர்ந்து வாழ்கின்ற பன்னிரண்டு இலட்சம் மக்களும் இங்கு மீளக்குடியேறி வாழ்வதற்குத் தயங்குகின்ற நிலைமை காணப்படுகின்றது. ஆகவே, இடம்பெயர்ந்து ஆங்காங்கே வாழ்கின்ற ஒட்டுமொத்தத் தமிழ் மக்களும் தமது சொந்தக் கிராமங்களிலே மீளகுடியேறுகின்றபொழுதுதான் மீள் குடியேற்றம் முழுமைபெறும்.

இங்கு கௌரவ அமைச்சர் டக்ளஸ் தேவானந்தா அவர்கள் கௌரவ மாவை சேனாதிராஜா அவர்களுக்குச் சொந்தமான நிலம் விடுவிக்கப்பட்டுள்ளது எனத் தெரிவித்தார். ஆனால், நான் நினைக்கின்றேன், அவரது பகுதியில் மீள்குடியேற்றம் செய்யப்பட்டாலும் அவர் தனது கிராமத்திலுள்ள வீட்டை இழந்துள்ள நிலைமை காணப்படுகின்றது. ஆனால், இப்பாராளுமன்றத்திலுள்ள உறுப்பினர்களுள் சொந்தக் கிராமத்திலுள்ள வீட்டுக்குச் செல்ல முடியாத நிலையில் உள்ள உறுப்பினர் என்று சொன்னால், அது நானாகத்தான் இருக்குமென நினைக்கிறேன். இதற்கு அமைச்சர் டக்ளஸ் தேவானந்தா அவர்கள் என்ன பதில் சொல்வாரோ தெரியவில்லை. புதுக்குடியிருப்பு இன்னமும் மீள்குடியேற்றம் செய்யப்படாத ஒரு கிராமமாகத்தான் இருக்கிறது. இரண்டு மாதத்துக்குள்ளே அனைவரும் மீள்குடியேற்றம் செய்யப் படுவார்கள் என்று இந்திய அரசாங்கத்துக்கு உறுதிமொழி அளிக்கப்பட்டது. ஆனால், இரண்டு மாதங்கள் கடந்துள்ள நிலையிலும் அவர்கள் அவர்களுடைய சொந்தக் கிராமங் களிலே குடியமர்த்தப்படுவார்களா அல்லது முள்ளிவாய்க்கால், அம்பலவன்பொக்கணை கிராம மக்களை கோம்பாவிலிலே உள்ள திம்பிலி என்ற கிராமத்திலே தற்காலிகமாகக் குடியேற்றம் செய்யப்பட்டதைப்போன்று அம்மக்களும் தற்காலிகமாகத்தான் குடியேற்றம் செய்யப்படுவார்களா என்பது தெரியவில்லை. ஆகவே, அம்மக்களை அவர்களு டைய சொந்தக் கிராமத்திலே சொந்த வீடுகளிலே குடியேற்றுவதுதான் மீள்குடியேற்றம் என்பதை அரசாங்கம் விளங்கிக் கொள்ள வேண்டும்.

இப்பொழுது வன்னியிலே வட மாகாண சபையின் பொதுச்சேவை ஆணைக்குழுவினால் சிற்றூழியர்களை

[ගරු එස්. විනෝ මහතා]

நியமிப்பதற்கான நேர்முகப்பரீட்சைகள் நடைபெற்றுக் கொண்டிருக்கின்றன. குறிப்பாக வட மாகாணத்திலே அதிகாரம் செலுத்துகின்ற அமைச்சர் ஒருவர் - இது அமைச்சர் டக்ளஸ் தேவானந்தா அவர்களுக்குப் பொருந்துமோ தெரியாது. யாழ்ப்பாணத்திலே எத்தகைய நிலைபரம் இருக்கிறதோ தெரியவில்லை - வன்னிப்பகுதியிலே அமைச்சர்

***[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]***
*[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது]*
*[Expunged on the order of the Chair.]*

தான் கொடுக்கின்ற பட்டியலின் பிரகாரம்தான் நிய மனங்கள் வழங்கப்பட வேண்டும் என அங்குள்ள அதிகாரிகளை மிரட்டி அவர்களுக்கு அழுத்தங்கள் கொடுக்கின்ற நிலைமை காணப்படுவதாகத் தெரிவிக்கப்படுகின்றது.

**ගරු හුනෛයිස් ෆාරූක් මහතා**
(மாண்புமிகு ஹுனைஸ் பாறூக்)
(The Hon. Hunais Farook)
கௌரவ அமைச்சரின் பெயரைக் குறிப்பிட்டு அவர் அவ்வாறு செய்தார் எனக் கூறுவது தவறு.

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
ஏதாவது தவறு இருந்தால் நாங்கள் அதனைத் திருத்திக்கொள்கின்றோம்.

**ගරු එස්. විනෝ මහතා**
(மாண்புமிகு எஸ். வினோ)
(The Hon. S. Vino)#
நான் நிச்சயமாக உறுதிப்படுத்தப்பட்ட தகவல்களைத்தான் இச்சபையில் தெரிவிக்கின்றேன் என்பதை மாண்புமிகு ஹுனைஸ் பாறூக் அவர்களுக்குத் தெரிவித்துக் கொள் கின்றேன்.

அதேபோன்றுதான் வவுனியா அரசினர் வைத்திய சாலையிலே ஏறக்குறைய 100 க்கு மேற்பட்ட இளம் பெண்கள் சுமார் பதினைந்து வருட காலமாக தொண்டர்களாக வைத்திய சேவை புரிந்துகொண்டிருக்கின்றார்கள். ஆனால், இப்பொழுது அமைச்சர் அத்தொண்டர்கள் அனைவரையும் நீக்கிவிட்டு, அரசியல் நியமனத்தைப் போன்று தங்களுடைய கட்சிக்காகப் பணி செய்தவர்களையும் தங்களுக்கு வேண்டியவர்களையும் அங்கு கொண்டுசென்று புதிதாக நியமிக்கின்ற நிலைமை காணப்படுகிறது. இது முல்லைத்தீவு, வவுனியா, மன்னார் ஆகிய மூன்று மாவட்டங்களிலும் குறிப்பிட்ட அந்த அமைச்சர் அவர்கள் இவ்வாறாக அதிகாரம் செலுத்திக்கொண்டிருக் கின்றார். ஆகவே, இந்த நேர்முகப்பரீட்சை உடனடியாக நிறுத்தப்பட வேண்டும். அங்கு நேர்மையான முறையிலே அந்த நியமனங்கள் வழங்கப்படுவதற்கு இந்த அரசாங்கம் ஒரு தீர்க்கமான முடிவெடுக்க வேண்டும். கடந்த காலங்களிலே சேவை மனப்பான்மையுடன் கடமையாற்றிய அந்த பாதிக்கப்பட்ட ஊழியர்களுக்குச் சந்தர்ப்பம் வழங்கப்பட வேண்டும் என்று கேட்டு, விடைபெறுகின்றேன். நன்றி.

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
ඊළඟට ගරු ගුණරත්න වීරකෝන් ඇමතිතුමා.

කරුණාකර ඊට ප්‍රථම, ගරු හුනෛයිස් ෆාරූක් මන්ත්‍රීතුමාගේ නම මූලාසනය සඳහා යෝජනා කරන්න.

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, "ගරු හුනෛයිස් ෆාරූක් මහතා මූලාසනය ගත යුතුය"යි මා යෝජනා කරනවා.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

***අනතුරුව ගරු අල්හාජ් ඒ.එච්.එම්. අස්වර් මහතා මූලාසනයෙන් ඉවත් වුයෙන්, ගරු හුනෛයිස් ෆාරූක් මහතා මූලාසනාරූඪ විය.***
*அதன் பிறகு, மாண்புமிகு அல்ஹாஜ் ஏ.எச்.எம். அஸ்வர் அவர்கள் அக்கிராசனத்தினின்று அகலவே மாண்புமிகு ஹுனைஸ் பாறூக் அவர்கள் தலைமை வகித்தார்கள்.*
*Whereupon* THE HON. ALHAJ A.H.M. AZWER *left the Chair and* THE HON. HUNAIS FAROOK *took the Chair.*

[අ.භා. 6.27]

**ගරු ගුණරත්න වීරකෝන් මහතා (නැවත පදිංචි කිරීමේ අමාත්‍යතුමා)**
(மாண்புமிகு குணரத்ன வீரகோன் - மீள்குடியேற்ற அமைச்சர்)
(The Hon. Gunaratne Weerakoon - Minister of Resettlement)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපේ පාර්ලිමේන්තුවේ සිටින පැරණිතම දේශපාලනඥයකු වාගේම ඉතා ප්‍රවීණ දේශපාලනඥයකු වන, යුද්ධය පැවැති කාල සීමාව තුළත්, සාමය පැවැති කාල සීමාව තුළත් දේශපාලනය කරලා බොහෝ අත් දැකීම් තිබෙන, අපි බොහෝ ගරු කරන ගරු මාවෛ සෝ. සේනාධිරාජා මන්ත්‍රීතුමා තමයි අද මේ ගරු සභාවට මෙම කල් තැබීමේ යෝජනාව ඉදිරිපත් කරලා තිබෙන්නේ. මා එතුමාව හඳුනා ගත්තේ මා මෙම අමාත්‍යාංශය භාර ගත්තාට පසුවයි.

එදා මහා ගං වතුර ආපු වෙලාවේ උතුරේ නැවත පදිංචි කරපු පවුල් 10,000ක් මුළුමනින්ම අනාථ වුණා. ඒ අයගේ තාවකාලික නිවාස ගං වතුරට අහු වෙලා විනාශ වුණා. ඒ වෙලාවේ ඒ අයට වහාම සහන සලසන්න කියලා ගරු මාවෛ සෝ. සේනාධිරාජා මන්ත්‍රීතුමාත්, ගරු ආර්. සම්පන්දන් මන්ත්‍රීතුමාත් මේ ගරු සභාවේදී කරුණු ඉදිරිපත් කළ බව මට මතකයි. ඒ කාරණය පිළිබඳව අපි ජනාධිපතිතුමාට කරුණු ඉදිරිපත් කරලා රුපියල් මිලියන 45ක මුදලක් එක වර වෙන් කර ගෙන, මාත්, මගේ නියෝජ්‍ය ඇමතිතුමාත් උතුරු ප්‍රදේශයට ගිහිල්ලා, සෙට්ටිකුලම්වලින් ආරම්භ කරලා යාපනයේ මරදන්කර්නි දක්වා දවස් 8ක් තිස්සේ වියළි සලාක ද්‍රව්‍ය බෙදීම සිදු කළා. ඒ වියළි සලාක මල්ලක් රුපියල් 4,500ක් වටිනවා. ඒ අවස්ථාවේදී ගරු මාවෛ සෝ. සේනාධිරාජා මන්ත්‍රීතුමාත්, ගරු අඩෛක්කලනාදන් මන්ත්‍රීතුමාත් ගං වතුර මැද ගිහිල්ලා ජනතාවට සහන සැලසීමට සහයෝගයෙන් වැඩ කළා.

එපමණක් නොවෙයි. මා එතුමන්ලාව අමාත්‍යාංශයට කැඳවා මේ වැඩසටහන ගැන දැනුවත් කරලා ඉල්ලීමක් කළා, "ජනතාව නැවත පදිංචි කරන හැම අවස්ථාවකදීම මා ඔබතුමන්ලාට ආරාධනා කරනවා. ඒ අවස්ථාවලට සහභාගි වන්න" කියලා. ඒ ගං වතුර ඇති වුණු වෙලාවේදී එතුමා දිගින් දිගටම ඒ කටයුතුවලට සහභාගි වුණා. අපේ ඩග්ලස් දේවානන්ද ඇමතිතුමාත් සහභාගි වුණා. අපි සියලු දෙනාම එකතු වෙලා ඒ වෙලාවේ රුපියල් කෝටි හතරහමාරක් වටිනා සලාක ද්‍රව්‍ය ජනතාවට ලබා දුන්නා. එම අවස්ථාව අප අතර අවබෝධයක් සහ අප අතර සහයෝගයක් ඇති වුණු අවස්ථාවක් හැටියට මා දකිනවා.

කෙසේ වෙතත්, අපේ ගරු මන්ත්‍රීතුමා ඉදිරිපත් කර තිබෙන මේ යෝජනාවේ මුල් ඡේදවල සඳහන් කරුණු "තුවාලය නැවත පෑරීමක්" සඳහා යොදපු කරුණු විධියටයි මා විශ්වාස කරන්නේ. මා හිතන හැටියට එතුමා වාගේ ප්‍රවීණ දේශපාලනඥයකු එසේ කිරීම වටින්නේ නැහැ. එවැනි වචන ගණනාවක් මේ යෝජනාවේ සඳහන් කර තිබෙනවා. මා ඒ ගැන කථා කරන්නේ නැහැ. කොහොම වුණත් එතුමා ඉදිරිපත් කර තිබෙන යෝජනාව පිළිබඳව මා ඉතාම සන්තෝෂ වනවා, නැවත පදිංචි කිරීමේ ඇමතිවරයා හැටියට. මොකද, අපි මේ අමාත්‍යාංශය තුළින් කරන ලද කාර්ය භාරය පිළිබඳව ඇගැයීමක් කරලා, අඩු පාඩුවක් තිබෙනවා නම් එය හදා ගන්නට හොඳ අවස්ථාවක් අපට ලැබිලා තිබෙන නිසා. යුද්ධය අවසාන වෙලා වසර තුනක් ගත වෙලා තිබෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අවුරුදු 30ක් තිස්සේ තිබුණු යුද්ධයේදී දකුණේත්, උතුරේත් භෞතික සම්පත්, මානව සම්පත් විශාල වශයෙන් විනාශ වුණා. අවුරුදු 30ක කාලය තුළ විනාශ වුණු දේවල් පුනරුත්ථාපනය කිරීම අවුරුදු දෙකකින්, තුනකින් කරන්න පුළුවන් කියා මා විශ්වාස කරන්නේ නැහැ. එසේ කරන්න පුළුවන් කියා කියනවා නම් ඒක ප්‍රායෝගික නැහැ. අපි මේ පිළිබඳව වරින් වර සාකච්ඡා කළා. මා පෞද්ගලිකව විශ්වාස කරන දේ තමයි, මෙම සංවර්ධන කටයුතු, මෙම නැවත පදිංචි කිරීම් කටයුතු යම් ඉමක් දක්වා අවසාන කරලා ඒ ජනතාවට ස්ථාවර නිවාස හදා දීමට අඩුම තරමින් වසර 10ක්වත්  යාවි කියන එක. කවුරු හෝ කියනවා නම් මේ කටයුතු ඉක්මන් කරන්න ඕනෑ,  කරලා නැහැ කියලා ඒක සාධනීය විවේචනයක් නොවන බවයි මගේ හැඟීම. ඒ නිසා, අපේ ගරු මන්ත්‍රීතුමා ඉදිරිපත් කළ කරුණුවලින් නැවත පදිංචි කිරීම  කියන කාරණය ගැන පමණක් කථා කරන්නයි මා බලාපොරොත්තු වන්නේ.

විශේෂයෙන් අපේ අමාත්‍යාංශයට පැවරිලා තියෙන්නේ, ඒ ජනතාවගේ මුල් ගම් බිම් නිදහස් කරලා නැත්නම් දිසාපතිතුමා ලබා දෙන ඉඩම්වල නැවත තාවකාලිකව පදිංචි කිරීමේ කාර්යය. ස්ථාවර නිවාස සෑදීම සඳහා විශේෂ වැඩ පිළිවෙළක් එනතුරු අපට මේ කාර්යයට මැදිහත් වෙන්න වෙලා තියෙනවා. දැනට අපට ප්‍රධාන කාරණයක් හැටියට තියෙන්නේ සෙට්ටිකුලම් ප්‍රදේශයේ තියෙන සහන ගම්මාන දෙකේ ඉන්න පවුල් 1,800ක් පමණ ප්‍රමාණය පදිංචි කිරීමයි. ඒකට හේතුව, පසු ගිය දවසේ ඇති වුණු ටෝනාඩෝ අකුණු කුනාටුව නිසා ඒ කඳවුරේ තිබුණු නිවාස නවසිය ගණනක් මුළුමනින්ම කඩා ගෙන යාමයි.  හමුදාව සමඟ එකතු වෙලා දවස් දෙකක් තුළ ඒවා නැවත ඒ තහඩුවලින්ම හදලා ඒ අයට රැකවරණ සලසන්න අපට පුළුවන්කම ලැබුණා.

ඉන්දියානු නියෝජිත පිරිස ඒ කඳවුරට ආවා. ඉන්දියානු නියෝජිත පිරිසත්, නියෝජ්‍ය ඇමතිතුමාත්, අපේ අමාත්‍යාංශයේ නිලධාරිනුත් -අපි සියලු දෙනාම- ඒ කඳවුරේ තියෙන ගහක් යට වාඩි වෙලා,  ඒ කඳවුරේ තියෙන තත්ත්වය ගැන, පදිංචි කිරීම් ගැන කථා කළා, අපි නොවෙයි පැහැදිලි කිරීම කළේ. වවුනියාවේ දිසාපතිතුමිය වන චාල්ස් මැතිනිය තමයි පැහැදිලි කිරීම කළේ. අපි මැදිහත් වුණේ නැහැ පැහැදිලි කිරීමට. ඉන් අනතුරුව ඉන්දියානු නියෝජිත පිරිස ඒ කඳවුරේ විවෘත සංචාරයක් කළා. ඒ විවෘත සංචාරයේදී මහජනතාව සමඟ අදහස් හුවමාරු කර ගත්තා. ඒකෙදී කිසිම බාධාවක් තිබුණේ නැහැ. සියලුම මාධ්‍ය -BBC මාධ්‍ය පවා- ඒ ස්ථානයට ගියා.  ඒ අවශ්‍ය කටයුතු යොදන වැඩ පිළිවෙළ ඒ අවස්ථාවේදී  සාකච්ඡා කළා.

මා මෙහිදී කාරණයක් කියන්නට ඕනෑ. සත්‍ය ලෙසම මෙම කඳවුරේ ඉන්න පවුල් 1,800කට අයත් සාමාජික සංඛ්‍යාව 6,000ක් පමණ වනවා. දැනට අපට පදිංචි කරන්න තිබෙන්නේ ඒ ප්‍රමාණය පමණයි.

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
Hon. Minister, you have one more minute.

**ගරු ගුණරත්න වීරකෝන් මහතා**
(மாண்புமிகு குணரத்ன வீரகோன்)
(The Hon. Gunaratne Weerakoon)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මට තව කරුණු ගොඩක් කියන්න තිබෙනවා. කොහොම වුණත්  නැවත පදිංචි කිරීම පිළිබඳ සැලැස්ම මා මේ අවස්ථාවේදී  **සභාගත*** කරනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ගරු මන්ත්‍රීතුමන්ලා ගණනාවක් මේ පිළිබඳව අදහස් දැක්වූවා. විශේෂයෙන් රංගා මන්ත්‍රීතුමා, ඒ වාගේම විනෝ මන්ත්‍රීතුමා, සෙල්වරාසා මන්ත්‍රීතුමා මේ පිළිබඳව බොහොම සාධනීය අදහස් දැක්වුවා. ඒ නිසා ඔබතුමන්ලා සමඟ  සාකච්ඡා කරමින් නැවත පදිංචි කිරීමේ වැඩ පිළිවෙළ ඉස්සරහට ගෙන යන්න අප බලාපොරොත්තු වෙනවා. ඒ සඳහා සහයෝගය ලබා දෙන ලෙස  ඉල්ලා සිටිනවා.  එහිදී අඩු පාඩුවක් තියෙනවා නම් පෙන්වා දෙන්න පුළුවන්.

විශේෂයෙන් සාම්පූර්වල  පසු ගිය දිනවල වර්ග අඩි 450ක් පමණ වන ගෙවල් 56ක් අලුතින්ම හදලා පවුල් 56ක් අපි පදිංචි කළා. තව පදිංචි කරන්න තියෙනවා. ඒ ගම්මාන තෝරා ගෙනයි තියෙන්නේ. ඒ අයගේ කැමැත්තෙන් තොරව කවදාවත් ඒ ප්‍රදේශවල පදිංචි කිරීම අපි කරන්නේ නැහැ. ඒ අය කැමැත්ත ප්‍රකාශ කරලා ඒ අයගේ ලියුම් දීපු නිසා තමයි නැවත අපි ස්ථාවර ගෙවල් හදන්න, ඉතාම හොඳ ගෙවල් හදන්න කටයුතු කළේ. ඒ ප්‍රදේශයට ගිය වෙලාවේ මට දැන ගන්න ලැබුණා අපේ ගරු සම්පන්දන් මන්ත්‍රීතුමාත් ඒ ගෙවල් 56 බලන්න එක්තරා අවස්ථාවක ගිහිල්ලා තිබුණාය කියලා. මම දන්නේ නැහැ, එතැන ඉන්න අයයි ප්‍රකාශ කළේ. ඒ නිසා  සාම්පූර්වල පදිංචි කිරීමේ කටයුතුත් ඉස්සරහට ගෙන යන්න,  ඒ අහිංසක ජනතාව වෙනුවෙන් මේ කාර්යය ඉෂ්ට කරන්න ඒ කටයුතු කරන්න ඔබතුමන්ලා සියලු දෙනාම අපි සමඟ අවබෝධයෙන් යුතුව එකතු වෙන්නය කියන ඉල්ලීම කරන අතරම, මේ පිළිබඳව අදහස් දක්වපු හැම දෙනාටම නැවත පදිංචි කිරීමේ අමාත්‍යාංශය හැටියට මගේ ස්තුතිය  පුද  කරනවා.

මූලාසනානරූඪ ගරු මන්ත්‍රීතුමනි, මෙම යෝජනාව ඉදිරිපත් කිරීම හොඳයි කියලායි මම දකින්නේ. මේ යෝජනාව ඉදිරිපත් කිරීම හොඳ දෙයක්. අපි කරන වැඩවල අඩු පාඩුකම් තියෙනවා නම් ඒ ගැන කථා කරලා අපට මේ වැඩ පිළිවෙළ ඉදිරියට ගෙන යන්නට පුළුවන්. ඔබ සැම දෙනාට බොහොම ස්තුතියි.

[பி.ப. 6.36]

**ගරු අල්හාජ් ඒ.එච්.එම්. අස්වර් මහතා**
(மாண்புமிகு அல்ஹாஜ் ஏ.எச்.எம். அஸ்வர்)
(The Hon. Alhaj A.H.M. Azwer)
கௌரவ தலைமை தாங்கும் உறுப்பினர் அவர்களே, எமது அன்புக்குரிய நண்பர் - senior Member மாவை சேனாதிராஜா அவர்கள் இச்சபையில் முன்வைத்துள்ள பிரேரணையின் ஆரம்பத்திலே, "சொல்லப்பட்ட ஆயுதப்போராட்டம் நடைபெற்றபொழுது" எனக் குறிப்பிட்டார். அவர்கள் ஆயுதப்போராட்டம் நடைபெற்றது - தாம் ஆயுதம்

---

**** ලියවිල්ල ඉදිරිපත් නොකරන ලදී.***
*ஆவணம் சமர்ப்பிக்கப்படவில்லை.*
*Document not tendered.*

[ගරු අල්හාජ් ඒ.එච්.එම්. අස්වර් මහතා]

தூக்கினார்கள் என்பதை ஒத்துக்கொண்டிருக்கின்றார்கள். அத்துடன், "ஆயிரக்கணக்கான தமிழர்களும் ஏனையவர்களும் வடக்குக் கிழக்கிலுள்ள தமது வதிவிடங்களிலிருந்து இடம் பெயர்ந்துள்ளார்கள்." எனக் குறிப்பிட்டார். "ஏனையவர்கள்" என்று யாரைக் குறிப்பிட்டீர்கள்? அவர்கள் ஆந்திரப் பிரதேசத்தவர்களா, கன்னடப் பிரதேசத்தவர்களா? ஏன் உங்களுக்கு "முஸ்லிம்கள்" எனக் குறிப்பிடுவதற்குக் கூச்சம்? என்று நான் கேட்க விரும்புகின்றேன். 20 ஆண்டுகளுக்கு முன்னர் அங்கிருந்து எழுபத்தையாயிரம் முஸ்லிம்கள் விரட்டப்பட்டார்கள்.

Seventy five thousand people were chased away from there saying that it was their land of birth and they were to rule that land. Our Muslims were also there. Scantily dressed they gathered whatever they could and ran away. You know the whole history. Yet, there was not a word of protest or sympathy from the TNA.

The other day, the Hon. Sushma Swaraj, Leader of the Opposition of Lok Sabha came here. She met our Parliamentarians under the leadership of the Hon. Nimal Siripala de Silva, the Hon. Leader of the House and, Sir, you were also there. I told this to her face; “Seventy five thousand people were chased away from Jaffna. Your government is constructing 50,000 houses and they are not prepared to give one house to the Muslims”. Is this fair? Is this justice? Is this moral rectitude? I am asking you, Hon. Sampanthan, the Leader of the TNA, because you are a senior person. I told that to her face. Neither the Leader of the TNA nor anybody in that group protested when the Muslims were chased away from the North at that time. Now they are - நீலிக்கண்ணீர் வடிக்கின்றார்கள் - shedding crocodile tears in this House. Therefore, I tell the Government of India, through this House, that a fair quota of these Indian houses should be given to the Muslims also. There is no other way.

When Babri Mosque in Ayodhya, India, was destroyed, Karunanidhi -

அன்று கறுப்புக் கண்ணாடி மு. கருணாநிதி ஐயா அவர்கள் சும்மா இருந்தார். இப்பொழுது, அவர் அவருடைய கண்ணுக்கு எட்டாத தூரத்திலுள்ள - அவருடைய கறுப்புக் கண்ணாடியால் பார்க்க முடியாத தூரத்திலுள்ள - தம்புள்ளைப் பள்ளிவாசல் பற்றிப் பேசுகின்றார். இது என்ன வெட்கக்கேடான விடயம்! காத்தான்குடியிலே - [இடையீடு] நீங்கள் அமருங்கள்! கொஞ்சம் பொறுமையாக இருங்கள்! காத்தான்குடியிலுள்ள ஹுஸைன் பள்ளிவாசலில் முஸ்லிம் சகோதரர்கள் கொன்று குவிக்கப்பட்டபொழுது, ஐயா அவர்கள் தமிழ் நாட்டிலே என்ன செய்து கொண்டிருந்தார்? அவருக்கு நேரமிருக்கவில்லையா? நீங்கள் கருணாநிதி அவர்களை defend பண்ணவா எழுந்து நிற்கின்றீர்கள்? என்று கேட்க விரும்புகின்றேன். ஏறாவூர், அழிஞ்சிப்பொத்தானை மற்றும் பள்ளித்திடலில் முஸ்லிம்கள் படுகொலை செய்யப்பட்டார்கள். இவர்கள் யாரால் படுகொலை செய்யப்பட்டார்கள்? விடுதலைப் புலிகளினால் தான் படுகொலை செய்யப்பட்டார்கள். [இடையீடு]

You are a proxy of the “*puli*”.

Sir, do you know Mr. Cho S. Ramaswamy? He is a redoubtable Editor of the Tamil Weekly “Thuglak” and a former Rajya Sabha Member. He has given an interview to the media there. One question that was asked from him was, “Tamil parties here and across the world are demanding that India support the US Resolution against Sri Lanka in the UN Human Rights Council. What do you think?” - [*Interruption.*] Listen to what Mr. Cho S. Ramaswamy says. He says, "I doubt these people realize that the US Resolution does not condemn Sri Lanka as such. The Resolution says that recommendations of the Lessons Learnt and Reconciliation Commission - LLRC - appointed by Colombo, which was something like the South African Truth and Reconciliation Commission, should be implemented. The US Resolution also insists that there must be a settlement of the Tamil problem”. We understand that.

There is another question asked: "What do you think should be done to bring to book the perpetrators of war crimes?" Mr. Ramaswamy replies, "There was no war in Sri Lanka. Is there a war between the Naxalites and the Indian government? Is there a war between the Islamic militants and the Indian State?" What a timely question he is posing!

Then, Sir, another question posed to him was: "But, there were thousands of civilians killed in this war, or whatever you call it, in Sri Lanka?" His answer was: "Because the civilians were used by the Liberation Tigers of Tamil Eelam - LTTE - as shields. Nobody speaks of that now". ஐயா சோ. இராமசாமி அவர்கள் கூறுகின்றார்: "They can use civilians; they can use children as shields and as suicide bombers".

So, what has happened in this country has been mirrored by Mr. Cho S. Ramaswamy properly and orderly.

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)

Hon. Member, your time is over. Please wind up.

**ගරු අල්හාජ් ඒ.එච්.එම්. අස්වර් මහතා**
(மாண்புமிகு அல்ஹாஜ் ஏ.எச்.எம். அஸ்வர்)
(The Hon. Alhaj A.H.M. Azwer)

Okay. The last question asked from Cho was; “Do you think Tamil nationalism is going overboard?” I am asking the same question from the TNA today.

The reply given was: “There is no doubt about that. It has been doing that persistently for many years. The insurgents need not follow any rules but the State should always be mindful of international law or rules of war et cetera. How is that possible? In that case, no State can put down terrorism”. So, Mr. Ramaswamy, the well-known advocate and editor says that no State can put down terrorism and it is as if we are asking the State not to act

against terrorism. Now, this is the position, Sir, as far as the war is concerned.

The other day, I attended the 35th death anniversary of Mr. S.J.V. Chelvanayakam. It was a fine commemoration event held at the Kathiresan Hall, Bambalapitiya.

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
Hon. Member, please wind up your speech.

**ගරු අල්හාජ් ඒ.එච්.එම්. අස්වර් මහතා**
(மாண்புமிகு அல்ஹாஜ் ஏ.எச்.எம். அஸ்வர்)
(The Hon. Alhaj A.H.M. Azwer)
Give me one more minute, Sir. கலாநிதி சிறி பத்மநாதன்,- தலைவர், பேராசிரியர், வரலாற்றுத்துறை பேராதனைப் பல்கலைக்கழகம் delivered the memorial speech. What did he say? He said, "The Muslims' rights are guaranteed". He mentioned the names of two people who built up the Federal Party. One is, 'சொல்லின் செல்வர்' C. Rajadurai, Former Minister of Regional Development and Hindu Cultural Affairs and the other is, சொல்லின் செல்வர் of Maruthamunai in the Eastern Province, Senator S.Z.M. Mashoor Moulana. He said: "A guarantee was extended to the Muslim community by Chelvanayakam?" I was listening to him.

Hon. Sampanthan, you must also guarantee those rights to the Muslims.

Therefore, Sir, I condemn unequivocally that the Hon. Rajadurai, the man who built up the Federal Party in the North and the East, was insulted when he visited Jaffna for the *Thanthai* Chelvanayakam Commemoration meeting. But, there was not a word of protest by the TNA except from some people in the Eastern Province. There, you see the difference. Therefore, Sir, this is what is happening. The North and the East are divided. Build a united TNA first.

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
Hon. Member, you will have to wind up now.

**ගරු අල්හාජ් ඒ.එච්.එම්. අස්වර් මහතා**
(மாண்புமிகு அல்ஹாஜ் ஏ.எச்.எம். அஸ்வர்)
(The Hon. Alhaj A.H.M. Azwer)
Sir, I will finish in a minute.

'சுடர் ஒளி' பத்திரிகையில் அநேகமாக எங்களுடைய செய்திகளைப் பிரசுரிக்கமாட்டார்கள். அதனைப் பற்றி கௌரவ உறுப்பினர் சரவணபவன் அவர்களிடத்திலும் அதனுடைய ஆசிரியரிடத்திலும் நான் முறையிட்டிருக் கின்றேன். என்றாலும், இன்று பிரசுரமாகியுள்ள "முசுப்பாத்தி முத்தர்" என்ற பகுதியில் மிகவும் அழகாக பின்வருமாறு எழுதப்பட்டிருக்கின்றது. அதாவது, -

கிழக்கு மாகாண அரசியல் பிரமுகர்கள் அண்மையில இந்தியாவுக்கு விஜயம் செய்தாங்கள் இராசாத்தி. அவங்க அங்கு தங்கட வேலையை முடிச்சுக்கொண்ட பிறகு பிரபல நடிகைகளையும் சந்திச்சாங்களாமடி குஞ்சு. ஒரு சிலர் நடிகைகளின் நேரடித் தரிசனத்தையும் பெற்றுக் கொண்டாங்களாமடி இராசாத்தி. இதுக்குமேல என்னை ஒண்டும் கேளாதடி பிளீஸ் குஞ்சு .... அட பார்த்தீய(ப)#

...... "*சீதா*" ராமா எல்லாம் உனக்கு வெளிச்சம்..........

This is the problem of the Tamil people. You look after the Tamil people. You build up a united party in the North before you come and sermonize us. I Thank you, Sir.

[අ.භා. 6.44]

**ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතා (වාරිමාර්ග හා ජල සම්පත් කළමනාකරණ අමාත්‍යතුමා සහ පාර්ලිමේන්තුවේ සභානායකතුමා )**
(மாண்புமிகு நிமல் சிறிபால த சில்வா - நீர்ப்பாசன, நீர்வள முகாமைத்துவ அமைச்சரும் பாராளுமன்றச் சபை முதல்வரும்)
(The Hon. Nimal Siripala de Silva - Minister of Irrigation and Water Resources Management and Leader of the House of Parliament)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද අපේ හිතවත් ගරු මාවෙයි සෝ. සේනාධිරාජා මන්ත්‍රීතුමා විසින් ඉදිරිපත් කරන ලද සභාව කල් තැබීමේ යෝජනාවේදී රජය වෙනුවෙන් වචන ස්වල්පයක් කථා කිරීමට අවස්ථාවක් ලැබීම පිළිබඳව මම සතුටු වනවා.

එතුමාගේ යෝජනාව එක්තරා ආකාරයකින් ජනවාර්ගික සංහිඳියාව ඇති කිරීමට වඩා, එය තවත් දුරස් කිරීමට අදාළ වන යම් යම් කරුණු කාරණාවලින් සමන්විත වුණත්, මම ඒ පිළිබඳව අරගලයක් ඇති කර ගන්නට බලාපොරොත්තු වන්නේ නැහැ. මොකද, අතිගරු මහින්ද රාජපක්ෂ ජනාධිපතිතුමාගේ රජයේ අරමුණ තිස් වසරක ත්‍රස්තවාදී ගැටුමෙන් පස්සේ අප විසින් ලබා ගන්නා ලද නිදහස, දකුණට මෙන්ම උතුරටත්, නැගෙනහිරටත් බෙදා දීමයි. ඒ අභිප්‍රාය හා බලාපොරොත්තුව තමයි අප වෙත තිබෙන්නේ. ඒ නිසා අපේ ගරු රාජීව විජේසිංහ මන්ත්‍රීතුමා ඇතුළු අනෙකුත් කථිකයන් පෙන්වා දුන් පරිදි මේ යෝජනාවේ තිබෙන සමහර කරුණු යම් ආකාරයකට ප්‍රකෝපකාරී වන කරුණු වුණත්, ඒවා පිළිබඳව මොහොතකට අමතක කොට, මේ යෝජනාවේ ඇති යම් යම් හරයන් හා යථාර්ථයන් පිළිබඳව වචන ස්වල්පයක් කථා කිරීමට කැමැතියි. විශේෂයෙන්ම දැනට ඉන්දියාවේ හා ලෝකය පුරා රටවල ඉන්න සරණාගතයින්ට නැවත ලංකාවට පැමිණීමට අවශ්‍ය වාතාවරණය උතුරේ ඇති කර දෙන ලෙස එතුමාගේ යෝජනාවෙන් ඉල්ලා සිටිනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපේ ජනාධිපතිතුමාට හා රජයට පින් සිදු වන්න පසුගිය දා එක්සත් ජාතික පක්ෂයත්, ඒ වාගේම ද්‍රවිඩ ජාතික සන්ධානයත් එකතු වෙලා ඉතාම සාර්ථක - මම කියනවා සාර්ථක කියලා- මැයි රැළියක් යාපනයේ පැවැත්වූවා. මම කියන්නේ කවදාවත් මැයි රැළියක් පවත්වනවා තබා, හතර පස් දෙනකුටවත් එකතු වන්නට නිදහසක් නොතිබුණ ප්‍රදේශයක, පූර්ණ වශයෙන්ම ඒ දේශපාලන නිදහස ආවර්ජනය කරන්නට, ඒ නිදහස භුක්ති විඳින්නට අවශ්‍ය වාතාවරණය හදලා දුන්නා කියන එකයි. ගරු සම්පන්දන් මැතිතුමා සිංහ කොඩිය ඔසවා ගෙන ඉන්න කොට මම තරම් සතුටු වුණු වෙනත් කෙනෙක් නැතිව ඇති. ඒක කියන්නට ඕනෑ. අපි ඒ ගැන ඉතාම සතුටු වුණා. එම ප්‍රදේශයේ දේශපාලන නායකයකු වශයෙන් ඔබතුමා ඒ දුන්න

[ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතා]

ආදර්ශය ජාතික සංහිඳියාව සඳහා ඉතාමත්ම වැදගත් වන බව ප්‍රකාශ කරන්නට කැමැතියි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒ නිසා දකුණේ අපි තමුන්නාන්සේලාගේ මේ ක්‍රියාවලියන් දෙස බලන්නේ ඉතාම යථාර්ථවාදී ලෙසයි. ඒ නිසා දැන් ඒ වාතාවරණය ඇති වෙලා තිබෙනවා. ගරු සම්පන්දන් මැතිතුමාට අද යාපනයට ගිහිල්ලා සිංහ කොඩිය ඔසවන්නට පුළුවන් නම්, යුරෝපයේ ඉන්න ඩයස්පෝරාවට, කැනඩාවේ ඉන්න ඩයස්පෝරාවට, ඉන්දියාවේ සරණාගත කඳවුරුවල ඉන්න අයට යාපනයට එන්න බැරිකමක් නැහැ. මේ තුළින්ම පෙන්වා දීලා තිබෙනවා, යාපනයේ මොන තරම් සාමකාමී වාතාවරණයක් අපි ඇති කර තිබෙනවාද කියලා. ඒ වාගේම යටිතල පහසුකම් හදලා දීලා තිබෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ගරු ඩග්ලස් දේවානන්ද ඇමතිතුමා එහෙන් මැයි දින රැළියක් පැවැත්වුවා. ගරු රනිල් වික්‍රමසිංහ මැතිතුමා ගිහිල්ලා එතුමාවත් මුණ ගැහුණා. බලන්න, අද මේ රටේ දේශපාලන පක්ෂ උතුර හා දකුණත් එක්ක මොන තරම් සංහිඳියාවක් ඇති වෙලා තිබෙනවාද කියන එක. ඒ නිසා ආයෙත් අමුතුවෙන් තවත් තත්ත්වයක් නිර්මාණය කිරීමට අවශ්‍ය නැහැ.

මම කියනවා, ඉන්දියාවේ ඉන්න සරණාගතයින් එනවා නම් ශ්‍රී ලංකාවේ රජය ඉතාම සතුටින් ඔවුන් භාර ගැනීමට සූදානම් වෙලා ඉන්නවා කියලා. අපි ඒ එක්කෙනෙක්වත් හරවා යවන්නේ නැහැ. ඒ අයත් අපේ පුරවැසියන්. අපි කැමැති නැහැ, ඔවුන් ඉන්දියාවේ සරණාගත කඳවුරුවල ඉන්න එකට. නමුත් ප්‍රශ්නය තිබෙන්නේ වෙනත් දෙයක්. යුරෝපයේ ඉන්න සරණාගතයින්ගෙන් කී දෙනෙක් ලංකාවට එන්න කැමැතිද? අද යුරෝවලින් පඩි ලබා ගෙන, පවුම්වලින් පඩි ලබා ගෙන, ඩොලර්වලින් පඩි ලබා ගෙන තමන්ගේ ළමයින් සුවිශේෂී විශ්වවිද්‍යාලවලට යවමින් ඉන්න අය මෙහාට එන්න ඕනෑ කියලා ඉල්ලන්නේ බොරුවට. අර කථාවක් තිබෙනවා, "ඇත්තට නිදා ගෙන ඉන්න එක්කෙනා ඇහැරවන්න පුළුවන්, නමුත් බොරුවට නිදා ගෙන ඉන්න එක්කෙනා ඇහැරවන්න බැහැ" යි කියලා. එන්න ඕනෑ අයට එන්න ඕනෑ තරම් ඉඩ දීලා තිබෙනවා. ඒ සඳහා අවශ්‍ය වාතාවරණය අපි හදලා දීලා තිබෙනවා. ඒ නිසා මම කියන්නට කැමැතියි, ඒ අවශ්‍ය වාතාවරණය අප සාදා දීලා තිබෙනවායි කියන එක.

දෙවෙනි කාරණය, නැවත පදිංචි කිරීම පිළිබඳව දැනට තිබෙන ගැටලු හා එහි තත්ත්වය පිළිබඳව අපේ චන්ද්‍රසිරි ගජදීර ඇමතිතුමාත් ඒ වාගේම අපේ ගුණරත්න වීරකෝන් ඇමතිතුමාත් ඉතා පැහැදිලිව කියලා දුන්නා. මෙවැනි අවතැන්වීම් සිදු වුණේ අපේ රටේ විතරක් නොවෙයි. නමුත් සංසන්දනාත්මකව ශ්‍රී ලංකාවේ නැවත පදිංචි කිරීම ඉතාම විශිෂ්ටයි. මට ඉන්දීය නියෝජිත පිරිස මුණ ගැහුණා; කැනේඩියානු පාර්ලිමේන්තු නියෝජිත පිරිසත් මුණ ගැහුණා; ඊළඟට යුරෝපීය පාර්ලිමේන්තුවේ නියෝජිත පිරිසත් මුණ ගැහුණා. ඔවුන් හැම දෙනාම කියා සිටියේ නැවත පදිංචි කිරීම හා උතුරේ භෞතික සංවර්ධනය පිළිබඳව මේ රජය කර ඇති සේවය ඉතාම විශිෂ්ට බවයි. ඒ නිසා අපට අමුතුවෙන් සහතිකයක් අවශ්‍ය නැහැ. අද අන්තර්ජාතික වශයෙන් ඒ හැම දෙනාම ශ්‍රී ලංකා රජය විසින් කරන ලද නැවත පදිංචි කිරීම පිළිබඳ වූ ඒ ක්‍රියාවලිය පැසසුමට ලක් කරනවා මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

අපට ජය ගන්නට තව hurdles කීපයක් තිබෙනවා. ඉතුරු බිම් බෝම්බ ටික අයින් කරලා, ඉන්දියානු රජය මඟින් දීලා තිබෙන ගෙවල් ප්‍රමාණය හදා ගන්න අප හැම වෙලාවේම අපේ සහයෝගය ලබා දීලා තිබෙනවා. ඒ ටික ඉෂ්ට වුණාම අපට මේ ප්‍රශ්න බොහෝ දුරට නිරාකරණය කර ගන්න පුළුවන් වෙයි. අපේ අමාත්‍යවරු ඒ සඳහා කැපවීමෙන් හා උනන්දුවෙන් වැඩ කරනවා; කටයුතු කරනවා. අවුරුදු 30ක යුද්ධය තුළින් වෙච්ච විනාශය අවුරුදු 3කින් සම්පූර්ණයෙන් අවසන් කරන්න පුළුවන්කමක් නැහැ. නමුත් අප ආඩම්බර වෙනවා ශ්‍රී ලංකාව වැනි කුඩා රාජ්‍යයක් මේ තිබෙන සියලුම අභියෝග අභිභවා ගෙන මේ කටයුත්ත ඉෂ්ට කර තිබීම පිළිබඳව.

අපේ ගරු යෝගරාජන් මන්ත්‍රීතුමා ඉල්ලුවා, "උතුරේ මැතිවරණ පවත්වන්න" කියලා. එතුමාට විතරක් නොවෙයි, අපටත් ඕනෑකම තිබෙනවා උතුරේ මැතිවරණ පවත්වන්න. මම කියන්න කැමැතියි, රජයට උතුරේ මැතිවරණය පවත්වන්න අවශ්‍යයි කියා. ඔබතුමන්ලා දන්නවා අප නැඟෙනහිර පළාතේ මැතිවරණය පැවැත්වූ බව. මේ විදේශීය දූත පිරිස් එන කොට මාත් අතිගරු ජනාධිපතිතුමා එක්ක ඒ මේසයේම වාඩි වෙලා ඔවුන් සමඟ සාකච්ඡා කරපු කෙනෙක්. විශේෂයෙන්ම ජපානයේ අගමැතිතුමා, උප අගමැතිතුමා ආපු වෙලාවේ ඇහුවා, "උතුරේ මැතිවරණය තියන්නේ කවදාද?" කියලා. ජනාධිපතිතුමා කිව්වා, "අප නැඟෙනහිර පළාතේ මැතිවරණය පැවැත්වුවා ඉක්මන් වැඩියි කියා ජාත්‍යන්තරය අපට කිව්වා; ඇයි ඉක්මනින් මැතිවරණය තිබ්බේ කියලා ඇහුවා; අපි හොඳ වැඩක් කරලා ජාත්‍යන්තරයෙන් බැණුම් ඇහුවා; ජාත්‍යන්තරය ඒක අගය කළේ නැහැ; ඒ නිසා මැතිවරණ තියන කොට ටිකක් කල්පනා කරලා බලලා, බැණුම් අහන්නේ නැති වෙන්න කරන්න ඕනෑ; කොච්චර හොඳ වැඩක් වුණත් ඒක නිසි ලෙස හා ක්‍රමානුකූලව තියන්න ඕනෑ." කියලා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, විශේෂයෙන්ම උතුරේ ඉන්න ජනගහනයෙන් විශාල පිරිසක් වෙනත් රටවලට ගිහින් පදිංචි වෙලා ඉන්නවා. අප ඒ රටවලට කියනවා -ඇමෙරිකාවට කියනවා, එංගලන්තයට කියනවා, ප්‍රංශයට කියනවා, නෝර්වේ රාජ්‍යයට කියනවා- ඒ රටවලට ගිහින් ඉන්න අපේ ජනතාවගේ නම් ගම් ටික, ඒ ඉන්න සංඛ්‍යාව පිළිබඳ විස්තර ටික දෙන්න කියලා. නමුත් දෙන්නේ නැහැ. ඒ නිසා තමයි මේ අය අතුරුදහන් වුණාද, මිය ගියාද කියලා නිගමනය කරලා ගණනක් හදා ගන්න බැරි වෙලා තිබෙන්නේ. ජාත්‍යන්තරය අපට ඒකට උදවු කරන්නේ නැහැ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒ නිසා අපට අද අපේ සංගණනය පවත්වන්න සිදු වෙලා තිබෙනවා. දැන් ඒ ජන සංගණනය පැවැත්වුවා. ඒ සංගණනයේ ප්‍රතිඵල අනුව අපට ඇත්ත වශයෙන්ම උතුරු පළාතේ ජීවත් වෙලා ඉන්න ජනගහනය, ඡන්ද දායකයින්ගේ ප්‍රමාණය නිසි ලෙස නිර්ණය කරන්න පුළුවන්. ඒ අනුව මැතිවරණ කොමසාරිස්වරයාට පුළුවන් වෙනවා තමන්ගේ ඡන්ද ලැයිස්තුව හරියට හදා ගන්න. නැත්නම් මැතිවරණ තියලා ඉවර වුණාම කියන්නේ, "මෙතැන හිටියා ලක්ෂ 10ක් ඡන්ද දායකයෝ, ඡන්දයට ආවේ ලක්ෂ 4යි, සියයට 40යි ඡන්දය දීලා තිබෙන්නේ, මේක වලංගු මැතිවරණයක් නොවෙයි, මේ මැතිවරණය ජනතාව ප්‍රතික්ෂේප කරලා" කියලායි.

ඇයි මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අප හොඳ දෙයක් කරන්න ගිහිල්ලා බැණුම් අහන්නේ? හොඳ කරන්න ගිහිල්ලා බැණුම් අහ ගන්න ඕනෑ නැහැ නේ. ඒ නිසා සංගණනය අවසන් වෙලා සාධාරණ කාල සීමාවක් තුළ රජය උතුරේ මැතිවරණය පවත්වනවාය, ඒකට ලෑස්ති වෙන්නය කියලා මම කියන්න කැමැතියි. උතුරේ ජනතාවට අප ඒ අයිතිය දෙන්න ඕනෑ. ඒක ජනතාවගේ අයිතිවාසිකමක්. ඒ පිළිබඳව ජනාධිපතිතුමාගේත්, අපේ රජයේත් කිසිම පැකිළීමක් නැහැ මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. නමුත් මෙය ක්‍රමානුකූලව තිබෙන්න ඕනෑ. අපට කවුරු ජයග්‍රහණය කළත් කමක් නැහැ. ශක්තිමත් නායකයෝ අපටත් ඉන්නවා. ගරු ඩග්ලස් දේවානන්ද මැතිතුමා ඉන්නවා. තව කණ්ඩායම් ඉන්නවා. ඒ නිසා ප්‍රජාතන්ත්‍රවාදී මැතිවරණයකින් ජයග්‍රහණය කරන කණ්ඩායමට බලය අයිති වෙයි. ඒ ගැන අපට කිසිම දුකක් නැහැ. මොකද, අප ප්‍රජාතන්ත්‍රවාදය ගරු කරන පක්ෂයක්.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, විශේෂයෙන්ම අප කියන්නට ඕනෑ, බලය බෙදීම පිළිබඳව දැන් හුඟක් කථා වෙනවාය කියලා. මේ දවස්වල කොයි පත්තරයක් ගත්තත් ඒ සම්බන්ධ පාර්ලිමේන්තු කමිටුව රැස් වෙන්නේ කවදාද කියලා අහනවා. මට දවසකට telephone calls 20ක් 25ක් එනවා, පුවත් පත් ආයතනවලින් සහ එක එක අයගෙන්. මා හැම වෙලාවේම කියන්නේ, "The ball is in Mr. Sampanthan's court" කියලා. මොකද අපට හෙට හරි පාර්ලිමේන්තු කාරක සභාව කැඳවන්න පුළුවන්. නමුත් එතුමන්ලා නැතිව ඒ කොමිටිය පැවැත්වීමේ තේරුමක් නැහැ. අප ඒ විධියට ඔබතුමන්ලාට ගරු කරලා තිබෙනවා.

එක්සත් ජාතික පක්ෂය ඉතා පැහැදිලි ප්‍රකාශයක් කරලා තිබෙනවා, ඔවුන් මේ කොමිටියට සහභාගි වීමට කැමැතියි කියලා. ඒ නිසා මේක කල් දමන්නේ නැතිව විවෘතව සහභාගි වෙන්න. ඔබතුමන්ලාගේ පක්ෂයේ නියෝජිතයෝ කවුද කියලා හෙට අනිද්දා වන විට කථානායකතුමාට නම් ටික එවන්න. අනවශ්‍ය රණ්ඩුවක් කර ගන්නේ නැතිව, එක එක් කෙනාට චෝදනා කර ගන්නේ නැතිව අප වාඩි වෙලා කථා කරමු. එසේ කථා කරන්න රජය සූදානම්. රජයේ අනිකුත් පාර්ශ්වයන්, පක්ෂ ඒ සඳහා සූදානමින් ඉන්නවා.

මේ පණිවුඩයත් මා පාර්ලිමේන්තුව තුළින් ඔබතුමන්ලාට දෙන්න කැමැතියි. විවාද කර කර හිටපු කාලය තුළදී මේ කමිටුව රැස් වුණා නම් දැන් මාස තුනක් විතර ගිහිල්ලා. මේ පාර්ලිමේන්තු කමිටුව රැස් වෙලා - ඔබතුමන්ලාගේ හා අපේ අදහස් අතර පරස්පර විරෝධිතාවන්, නොගැළපෙන තැන් රාශියක් තිබෙන්න පුළුවන්. ඒ වාගේම ගැළපෙන තැනුත් රාශියක් තිබෙන්නට පුළුවන්- අපි බලමු, යම් ආකාරයක එකඟතාවකට අපට පත් වන්න පුළුවන්ද කියලා. මොකද දකුණේ එකඟතාවක් නැතිව අප දෙන විසඳුම කවදාවත් පවත්වා ගෙන යා නොහැකියි. It will not be a sustainable solution. ඒ නිසා තමයි අපේ ජනාධිපතිතුමා කිව්වේ, පාර්ලිමේන්තු කාරක සභාව තමයි මේ සඳහා විසඳුමක් සොයා ගැනීමට තිබෙන ඉතාම හොඳ ස්ථානය කියලා. ඒ මාර්ගය විවෘතව තිබෙනවා. ඒ මාර්ගය අප කිසිසේත්ම වහලා නැහැ.

අප බලාපොරොත්තු වනවා, අප විශ්වාස කරනවා, ඉතා ඉක්මනින් මේ සාකච්ඡා ආරම්භ කිරීමට පුළුවන් වෙයි කියා. ඒ සඳහා අතිගරු ජනාධිපතිතුමා ඉතාම කැමැත්තෙන් හා බලාපොරොත්තුවෙන් ඉන්නවා. මහින්ද රාජපක්ෂ ජනාධිපතිතුමා වැනි දකුණේ ජනාදරයට ලක් වූ, ජනප්‍රියත්වයට ලක් වූ නායකයෙක් ඉන්න අවස්ථාවක තමයි මේ ප්‍රශ්නයට විසඳුම ලබා ගත යුත්තේ. මීට පෙර ඒ විසඳුම ලබා ගන්න තිබුණු අවස්ථාවන් සියල්ල එල්ටීටීඊ සංවිධානය අත් හැර දාලා ගියා. ඒවාට පයින් ගැහුවා. නැවතත් එවැනි තත්ත්වයක් අපි ඇති කර ගන්නේ නැතිව, මේ ඉතාම සුදුසු අවස්ථාවේදී මෙවැනි සංවාදයකට ලක් වෙලා විසඳුම ලබා ගනිමු.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒ ප්‍රශ්නයේ තිබෙන වැදගත්කම අප දන්නවා. උතුරේ ජනතාවට කෑමබීම, පාරවල් විතරක් නොවෙයි, ඊටත් වඩා දේශපාලන විසඳුමක අවශ්‍යතාව තිබෙන බව අප තේරුම් අරගෙන තිබෙනවා. එක අතකින් අපට අත් පුඩියක් ගහන්න බැහැ; අත් දෙකම ඕනෑ. ඒ නිසා ඔබතුමන්ලාත් මීටත් වඩා නම්‍යශීලී වෙලා මේ සඳහා අවශ්‍ය කටයුතු කිරීම සඳහා ඉදිරිපත් වන ලෙස ඉල්ලා සිටිමින් මේ විවාදයට සහභාගි වුණු සියලුම දෙනාටම ස්තුතිය පුද කරමින් මගේ කථාව අවසන් කරනවා. බොහොම ස්තුතියි.

***එකල්හි වේලාව අ.භා. 7.00 වුයෙන් මූලාසනාරූඪ මන්ත්‍රීතුමා විසින් ප්‍රශ්නය නොවිමසා පාර්ලිමේන්තුව කල් තබන ලදී.***

***පාර්ලිමේන්තුව ඊට අනුකූලව, 2012 මැයි 10 වන බ්‍රහස්පතින්දා අ.භා. 1.00 වන තෙක් කල් ගියේ ය.***

*அப்பொழுது, பி.ப 7.00.மணியாகிவிடவே, தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள் வினா விடுக்காமலேயே பாராளுமன்றத்தை ஒத்திவைத்தார்.*

*அதன்படி பாராளுமன்றம், 2012 மே 10, வியாழக்கிழமை பி.ப.1.00 மணிவரை ஒத்திவைக்கப்பட்டது*

*It being 7.00 p.m..,* MR. PRESIDING MEMBER *adjourned Parliament without Question put.*

*Adjourned accordingly until 1.00 p.m. on Thursday, 10th May, 2012.*

**සැ.යු.**

මෙම වාර්තාවේ අවසාන මුද්‍රණය සඳහා ස්වකීය නිවැරදි කළ යුතු තැන් දක්වනු රිසි මන්ත්‍රීන් මීන් පිටපතක් ගෙන නිවැරදි කළ යුතු ආකාරය එහි පැහැදිලිව ලකුණු කොට, පිටපත ලැබී දෙසතියක් නොඉක්මවා **හැන්සාඩ්** සංස්කාරක වෙත ලැබෙන සේ එවිය යුතුය.

குறிப்பு

உறுப்பினர் இறுதிப் பதிப்பிற் செய்யவிரும்பும் பிழை திருத்தங்களைத் தமது பிரதியில் தெளிவாகக் குறித்து அதனைப் பிழை திருத்தப்படாத பிரதி கிடைத்த இரு வாரங்களுள் **ஹன்சாட்** பதிப்பாசிரியருக்கு அனுப்புதல் வேண்டும்.

**NOTE**

Corrections which Members suggest for the Final Print should be clearly marked in their copy and sent to be Editor of HANSARD within two weeks of receipt of the uncorrected copy.

---

**Contents of Proceedings :**

**Final set of manuscripts**
**Received from Parliament :**

**Printed copies dispatched :**

**දායක මුදල් : පාර්ලිමේන්තු විවාද වාර්තාවල වාර්ෂික දායක මිල රු. 2178කි. පිටපතක් ගෙන්වා ගැනීම අවශ්‍ය නම් ගාස්තුව රු. 18.15කි. තැපැල් ගාස්තුව රු. 2.50කි. කොළඹ 6, කිරුළපන, පාමංකඩ පාර, අංක 102, පියසිරි ගොඩනැගිල්ලේ රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරී වෙත සෑම වර්ෂයකම නොවැම්බර් 30 දාට ප්‍රථම දායක මුදල් ගෙවා ඉදිරි වර්ෂයේ දායකත්වය ලබා ගෙන විවාද වාර්තා ලබාගත හැකිය. නියමිත දිනෙන් පසුව එවනු ලබන දායක ඉල්ලුම් පත් භාර ගනු නොලැබේ.**

**சந்தா ;** ஹன்சாட் அதிகார அறிக்கையின் வருடாந்த சந்தா ரூபா 2,178. ஹன்சாட் தனிப்பிரதி ரூபா 18.15. தபாற் செலவு ரூபா 2.50. வருடாந்த சந்தா முற்பணமாக **அத்தியட்சகர், அரசாங்க வெளியீட்டலுவலகம், இல. 102, பியசிறி கட்டிடம், பாமன்கடை வீதி, கிருளப்பனை, கொழும்பு 6** என்ற விலாசத்திற்கு அனுப்பி பிரதிகளைப் பெற்றுக்கொள்ளலாம். ஒவ்வோராண்டும் நவம்பர் 30 ஆந் தேதிக்கு முன் சந்தாப்பணம் அனுப்பப்பட வேண்டும். பிந்திக் கிடைக்கும் சந்தா விண்ணப்பங்கள் ஏற்றுக்கொள்ளப்படமாட்டா.

**Subscriptions :** The annual subscription for Official Report of Hansard is Rs. 2,178. A single copy of Hansard is available for Rs. 18.15. (Postage Rs. 2.50) Copies can be obtained by remitting in advance an annual subscription fee to the SUPERINTENDENT, GOVERNMENT PUBLICATIONS BUREAU, No. 102,Piyasiri Building, Pamankada Road, Kirulapone, Colombo 6. The fee should reach him on or before November 30 each year . Late applications for subscriptions will not be accepted.

---

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.